# ගුණනය වීමේ

# ක්‍රමවේද

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


| | | |
|---|---|---|
| | අත්පොත භාවිත කරන ආකාරය | i |
| | කණ්ඩායම් වැඩ සඳහා යෝජනා | ii |
| | හැඳින්වීම | 1 |
| | පාඨමාලාවේ අරමුණු | 3 |
| 1 | මිනිසුන් අල්ලන්නන් | 4 |
| 2 | කුඩා දේවල දවස | 12 |
| 3 | ගුණනය වීම පිළිබඳ උපමා කතා | 30 |
| 4 | එකට එකක් එකතු කළ විට දෙකට වඩා වැඩිවේ | 39 |
| 5 | සභා වර්ධනය සඳහා හැඳින්වීමක් | 50 |
| 6 | අභ්‍යන්තර වර්ධනය | 61 |
| 7 | ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වීම | 77 |
| 8 | දුරස්ථ සේවා තුළින් වර්ධනය වීම | 99 |
| 9 | සම්බන්ධවීම තුළින් වර්ධනය වීම | 107 |
| 10 | තිරණද ගෝලයන්ද? | 122 |
| 11 | ඇන හිටින ලද වර්ධනය | 141 |
| 12 | දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය | 152 |
| | ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු | 167 |

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ.

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩසිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඩමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කලු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**මොඩියුලය** : ගුණනය වීම
**පාඨමාලාව** : ගුණනය වීමේ ක්‍රමවේද

# හැඳින්වීම

ලෝකයේ මැවීම පිළිබඳව හා පළමු මිනිසා හා ස්ත්‍රිය මැවීම පිළිබඳව බයිබලය වාර්තා කරයි (උත්පත්ති 1). මෙම අලුතින්ම මවන ලද මිනිසුන්ට දෙවියන්වහන්සේ විසින් දෙනු ලැබූ පළමු ආඥාව නම් ගුණනය වීමට වේ.

> **දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූ සේක. පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කළ සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට කියන සේක්: නුඹලා බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණ කොට ඒක යටත් කර ගනිව්. ... (උත්පත්ති 1:27-28)**

මෙම ක්‍රියාවලිය භෞතිකව ගුණනය වීම සඳහා පමණක් නොව, එය ආත්මිකව ද සිදුවිය යුතුය. ආදම් සහ ඒව භෞතිකව ගුණනය වන විට ඔවුන් වැනිම වූ තවත් අයගෙන් ලෝකය පිරවීමට ඔවුන්ට හැකියාව තිබුණි. එනම් දෙවියන්වහන්සේ දැන සිටි හා උන්වහන්සේ හා සමඟ සහභාගීත්වය ඇතිව ජීවත් වන මිනිසුන්ගෙනි. ඔවුන් භෞතිකව මෙන්ම ආත්මිකව ද තමාට සමාන ආකාරයේ අයට උපත දෙනු ඇත.

මනුෂ්‍යයා පාපයට වැටීම නිසා මෙම ක්‍රියාවලියට බාධා ඇති විය (උත්පත්ති 3). පාපයේ ප්‍රතිඵලයක් ලෙස භෞතික ගුණනය වීමට බාධා ඇති කරන භෞතික මරණය ඇති විය (උත්පත්ති 2:17). එසේම ඒ හේතුවෙන් ආත්මික මරණය එනම්, පව්කාර මනුෂ්‍යයා ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේගෙන් වෙන් වීමද සිදුවිය. මෙය ආත්මික ගුණනය වීමට බාධා කළේය.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට බොහෝ සෙයින් ප්‍රේම කළ නිසා, මෙම භයානක ආත්මික මරණයෙන් මිනිසුන් ගළවා ගැනීමට උන්වහන්සේ විශේෂ සැලැස්මක් පිළියෙල කළ සේක. සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා මැරෙන්නට දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එවූ සේක. අප වෙනුවට යේසුස්වහන්සේ මරණ දඬුවම විඳි සේක. ඉන්පසු උන්වහන්සේ මරණයෙන් නැවත නැගිටීම තුළින් මරණය පරාජය කළ සේක (යොහන් 20).

සෑම තනි පුද්ගලයෙකු විසින්ම පාපයට සමාව අයදීමෙන් හා යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් දෙවියන්වහන්සේගේ ගැළවීමේ සැලැස්ම තෝරා ගත යුතුව ඇත.*[1] පාපයට සමාව දෙන ලදුව යේසුස්වහන්සේගේ ඇදහිලිවන්තයෙකු වශයෙන්, ඔබ ආත්මික මරණයෙන් ගළවනු ලැබ සිටී.

භෞතික ශරීරය කවදා හෝ අවසන මරණයට පත්වුවද, ඔබ තවදුරටත් ආත්මිකව ජීවත් වනු ඇති අතර සදාකාලිකව ජීවත් වන නව ශරීරයක් ඔබට ලැබෙනු ඇත.

> **... මොහොතකින් ඇසිපිය හෙළන ක්ෂණයකින්, අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව. ... මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගිටිනු ලබන්නෝය. අපිද වෙනස් කරනු ලබන්නෙමුව. ... මරණය ජයෙන් ගිලිනා ලද්දේයැයි ලියා තිබෙන වචනය සම්පූර්ණ වේ. (1 කොරින්ති 15:51,52,54)**

ඔබ යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගත්විට, එය දෙවියන්වහන්සේ විසින් නැවත වරක් මවනු ලැබීමකට සමානය. බයිබලය එය හඳුන්වනුයේ "නැවත ඉපදීම" යනුවෙනි.

> **යේසුස්වහන්සේ උත්තර දෙමින් සැබවක් සැබවක් නුඹට කියමි- යමෙක් අලුතින් නුපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කී සේක. (යොහන් 3:3)**

---

[1] හාවස්ට්ටයිම් ඉන්ටර්නැෂනල් ආයතනයේ *"ඇදහිල්ලේ අත්තිවාරම්"* යන පාඨමාලාව ගැළවීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම සවිස්තරාත්මකව පැහැදිලි කරයි.

“නැවත ඉපදීම” යනුවෙන් අදහස් වන්නේ භෞතික ඉපදීමක් නොවේ. එයින් අදහස් වන්නේ ආත්මික උපතකි. ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවියෙකු ලෙස ඔබව ආත්මිකව යළිත් මවනු ලැබේ. ඔබ “අලුත්” අයෙක් වන්නේ ඔබ තවදුරටත් පාපයේ ජීවත් වන්නේ සහ පැරණි පව්කාර ජීවන රටාව අනුගමනය කරන්නේ නැති බැවිනි.

> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

ලෝකය ආරම්භයේදී තමන් විසින් අලුතින්ම මවන ලද මනුෂ්‍යයන්ට දෙවියන්වහන්සේ දුන් පළමු ආඥාව ගුණනය වීමය. නැවත මවනු ලැබූ “නැවත - ඉපදීම” ලද ඇදහිලිවන්තයන්ට ද උන්වහන්සේගේ පළමු ආඥාව එයමය. අප ආත්මිකව ගුණනය වෙමින් අප වැනි අයගෙන් ලෝකය පිරවිය යුතුය. එනම්, දෙවියන්වහන්සේට ප්‍රේම කරන හා උන්වහන්සේ සමඟ සහභාගීත්වය දරන මිනිසුන්ගෙන් වේ.

යේසුස්වහන්සේ මුලින්ම මනුෂ්‍යයන් තමන්වහන්සේ අනුගමනය කරන ලෙස පැවසූ විට එය, ආත්මික ගුණනය වීම උදෙසා වූ කැඳවීමකි (ලූක් 5:10). ඇදහිලිවන්තයන්ට උන්වහන්සේ දුන් අවසාන ආඥාව නම් ආත්මිකව ගුණනය වීමයි (ක්‍රියා 1:8). ශුභාරංචිය නොමැතිව පාපයේ මියැදෙන දහස් ගණනක් වූ මිනිසුන්ගේ අභියෝගය ජය ගැනීමට නම්, සෑම ඇදහිලිවන්තයෙක්ම පල දැරිය යුතු අතර ආත්මික ගුණනය වීමේ ප්‍රතිපත්ති ඉගෙන ගත යුතුය.

දෙවියන්වහන්සේගේ ආඥාවට කීකරු වෙමින් ගුණනය වීමේ හැකියාව ඔබට ලබාදෙන ආකාරයේ ආත්මිකව තමා මෙන් අන් අය බෝ කිරීමේ බයිබලීය ක්‍රමයන් මෙම පාඨමාලාව තුළින් බෙදා ගැනේ. තනි පුද්ගලයෙකු ලෙස මෙන්ම ප්‍රාදේශීය සභාව නමැති සංදර්භය තුළ සාමූහිකවද ආත්මිකව ගුණනය වන ආකාරය ඔබ විසින් ඉගෙන ගනු ඇත. මෙම පාඨමාලාව තුළ උගන්වන බයිබලීය ප්‍රතිපත්තීන් ඔබ අදාළ කර ගතහොත්, පුහුණුවක් හා පෙලඹවීමක් ඇති ඇදහිලිවන්තයන් දහස් ගණනක ගුණනය වීම සඳහා ඔබට වගකීමට හැකි වනු ඇත.

ඔබ හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් පිළිවෙළින් හදාරන්නේ නම්, දෙවන මොඩියුලය සම්පූර්ණ කිරීම තුළින් පුහුණු කරනු ලැබූ ගුණනය වන ආත්මික ශ්‍රම බලකායක් කෙරෙහි අවධානය යොමු කරන තෙවන මොඩියුලයේ තෙවන පාඨමාලාව මෙයයි.

තෙවන මොඩියුලයේ ඇති පාඨමාලාවන් නම්, *“බයිබලීය ලෝක දැක්මක් වර්ධනය කිරීම”, “ඉගැන්වීමේ ක්‍රමවේද”, “ගුණනය වීමේ ක්‍රමවේද”* හා *“බලයේ මූලධර්ම”ය.* මෙම පාඨමාලාවන් තුළින් ලෝකයේ ආත්මික අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීමක් කරන අතරම බයිබලීය ඉගැන්වීම හා දේශනා කිරීම, ගුණනය වීම හා ආත්මික බලය පැවරීම තුළින් එම අවශ්‍යතාවන් ඉටු කරන ආකාරයද පැහැදිලි කරයි.

# පාඨමාලාවේ අරමුණු

## පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් :

- ගුණනය වීම පිළිබඳ බයිබලීය ක්‍රමවේද අදාළ කර ගැනීම තුළින් ආත්මිකව නව උත්පාදන ඇතිකිරීම
- නව ගිවිසුම් උපමා තුළ උගන්වා ඇති ගුණනය වීමේ ප්‍රතිපත්ති සාරාංශ ගත කිරීමට
- සිය ගණනක් නව ඇදහිලිවන්තයින් නගා සිටුවීම සඳහා එක් ඇදහිලිවන්තයෙකුට ගුණනය විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- ඔබගේ නිවස ආත්මික ගුණනය වන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට
- සභාව තුළ අභ්‍යන්තර ගුණනය වීම උදෙසා වූ ප්‍රතිපත්ති සාරාංශ කිරීමට
- සභාව ව්‍යප්ත වෙමින් ගුණනය වීම පිළිබඳ ප්‍රතිපත්ති සාරාංශ කිරීමට
- සභාව දුරස්ථ ලෙස ගුණනය වීම පිළිබඳ පිළිබඳ ප්‍රතිපත්ති සාරාංශ කිරීමට
- සභාව සම්බන්ධ විම තුළින් ගුණනය වීම පිළිබඳ පිළිබඳ ප්‍රතිපත්ති සාරාංශ කිරීමට
- දෙවියන්වහන්සේ වෙතට හැරුණු අයව තීරණයෙන් ඔබ්බට ගෙන ගොස් ගෝලයන් බවට පත් කිරීමට
- ආත්මික ගුණනය වීමට බාධා කරන කරුණු හඳුනා ගැනීමට
- ආත්මික ගුණනය වීමේ මධ්‍යස්ථානයක් ලෙස හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයක් පිහිටුවීමට ඔබට හැකිවනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## මිනිසුන් අල්ලන්නන්

### අරමුණු

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් :

- ප්‍රධාන බයිබල් පදය මතකයෙන් ලිවීමට
- යේසුස්වහන්සේ විසින් තම අනුගාමිකයන්ට ලබා දුන් පළමු හා අවසාන ආඥාවන් හඳුනා ගැනීමට
- "ගුණනය වීම" යන්න අර්ථ දැක්වීමට
- ආත්මික ගුණනය වීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- "ක්‍රමය" යන්න නිර්වචනය කිරීමට
- "ක්‍රම වේදයන්" යන්න නිර්වචනය කිරීමට
- "ආත්මික ගුණනය වීමේ ක්‍රමවේදයන්" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- ස්වාභාවික මසුන් ඇල්ලීමේ ප්‍රතිපත්තිවලට අදාළ ආත්මිකව මිනිසුන් ඇල්ලීමට භාවිත කරගත හැකි ප්‍රතිපත්ති පැහැදිලි කිරීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **මා අනුව එන්න. මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් වෙන්ට සලස්වන්නෙමියි ඔවුන්ට කී සේක. (මාර්ක් 1:17)**

### හැඳින්වීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත තම ප්‍රසිද්ධ සේවය ආරම්භ කිරීමේදී තමන්ගේ මුල් ගෝලයන් වීමට උන්වහන්සේගේ මනුෂ්‍යයන් කිහිප දෙනෙකු කැඳවූ සේක.

> **මා අනුව එන්න. මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් වෙන්ට සලස්වන්නෙමියි ඔවුන්ට කී සේක. (මාර්ක් 1:17)**

උන්වහන්සේ මෙම මනුෂ්‍යයන්ට දුන් පළමු ආඥාව වුයේ ආත්මිකව ගුණනය වීමටයි. ඔවුන් උන්වහන්සේ අනුගමනය කළහොත් උන්වහන්සේ ඔවුන්ව "මනුෂ්‍යයන් අල්ලන්නන්" බවට පත් කරනු ඇත. ඔවුන් "මසුන් අල්ලාගත් පරිදි" ආත්මිකව අනෙක් පුරුෂයන් හා ස්ත්‍රීන් දිනා ගැනීම උදෙසා ක්‍රියා කරනු ඇත.

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දුන් අවසාන පණිවුඩය ආත්මිකව ප්‍රතිනිෂ්පාදනයක් ඇති කිරීම උදෙසා වූ කැඳවීමකි.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. උන්වහන්සේ මේ කාරණා කී කල්හි, ඔවුන් බලා සිටියදීම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී, ඔවුන්ට නොපෙනී ගිය සේක. (ක්‍රියා 1:8-9)**

යේසුස්වහන්සේ විසින් දෙනු ලැබූ මෙම මහත් ආඥාව ගෝලයන් සම්පූර්ණ කිරීමට හැකි වන්නේ කෙසේද? මෙම කුඩා කණ්ඩායම මුළු ලෝකයම වෙත ළඟා වීමට තරම් ගුණනය විය හැක්කේ කෙසේද?

## ගුණනය වීමේ ක්‍රම

ආත්මිකව ප්‍රතිනිෂ්පාදනය කිරිම සඳහා තම ගෝලයන්ට දුන් ආඥාව සම්පූර්ණ කිරීමට හැකිවන විශේෂ ක්‍රම යේසුස්වහන්සේ එළිදරව් කළ සේක. මේවායින් පළමු හා ඉතාම වැදගත් ක්‍රමය ක්‍රියා 1:8හි සඳහන් ආඥාවේ කොටසක් ලෙස දක්වා ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් බලය ලබා දීම තුළින් ගෝලයන් ගුණනය වනු ඇත. යේසුස්වහන්සේගේ අනුගාමිකයන් ගුණනය වීමට පටන් ගෙන ශුභාරංචිය ලෝකයට ගෙන යාමත් සමඟ අනෙකුත් ක්‍රමයන් එළිදරව් කරනු ලැබීය. ක්‍රියා පොත තුළ සහ නව ගිවිසුම් යැවුම් පත්‍ර තුළ මෙම ක්‍රමයන් වාර්තා වේ.

මෙම පාඨමාලාව මෙම ගුණනය වීමේ ක්‍රමයන් පැහැදිලි කරයි. ආත්මිකව ප්‍රතිනිෂ්පාදනය කිරිමට හා දෙවියන්වහන්සේගේ ආඥාව සම්පූර්ණ කරන ආකාරය එය ඔබට උගන්වයි. නමුත් පළමුව ගුණනය වීම යනු කුමක්දැයි ඔබ තේරුම් ගත යුතුයි. "ගුණනය වීම" යනු තමන් වැනිම තවත් අය බිහි කිරීම හරහා ගණනින් වැඩි වීමයි. ගුණනය වීමේ ක්‍රමවේදය යනු ගුණනය වීමේ ක්‍රියාවලියයි. යමක් ගුණනය වන විට එය නැවත නැවත එම ආකාරයෙන්ම බිහිවීම සිදුවේ.

ස්වාභාවික ලෝකය තුළ මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් දරුවන් ලැබීම තුළින් බෝවීම සිදු කරති. ඔවුන් භෞතිකව ගුණනය වෙති. ආත්මික ගුණනය සිදුවන්නේ ආත්මික බෝවීම හරහාය. අන් අය සමඟ ශුභාරංචිය බෙදා ගැනිම, ඔවුන්ව ඇදහිලිවන්තයන් බවට පත්වීමට මඟ පෙන්වීම හා ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් බවට පත් කිරීම හරහා ඇදහිලිවන්තයෙකු බෝවීම සිදු කරයි.

ආත්මිකව ගුණනය විම උදෙසාවූ දෙවියන්වහන්සේගේ ක්‍රමයන් බයිබලය එළිදරව් කරයි. "ක්‍රමයක්" යනු නිශ්චිත ඉලක්කයක් අත්පත් කර ගැනීම උදෙසා වූ සැලැස්මකි. "ක්‍රමවේදයක්" යනු ඉලක්කයක් වෙත ළඟාවීමට ඒකාබද්ධ කළ හැකි ක්‍රම පද්ධතියකි.

"ගුණනය වීමේ ක්‍රමවේදයන්" යනු ඇදහිලිවන්යන්ට ආත්මික ප්‍රතිනිෂ්පාදනය කිරීමේ ඉලක්කය වෙත ළඟා වීමේ හැකියාව ලබා දෙන ක්‍රමයන්ය. ඉලක්කය කිසිදා වෙනස් නොවේ. අප ආත්මිකව අප වැනිම වූ අය බිහි කරමින් මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන යා යුතුය. මෙම ඉලක්කය වෙත ළඟා විය හැකි එකිනෙකට වෙනස් වූ ක්‍රම රැසක් තිබේ. මේවා නම් ඔබට ගුණනය වීමේ හැකියාව ලබාදෙන "ක්‍රමවේදයන්" හෝ විවිධ සැලසුම්ය.

මිනිසා දෙවියන්වහන්සේගේ ගුණනය වීමේ ක්‍රමවේදයන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරන විට එහි ප්‍රතිඵලය ආත්මිකව ඔහු වැනිම වූ තවත් අය බිහිවීමයි. සභාව නමැති ගර්භාෂය තුළ ඇදහිලිවන්තයෝ ආත්මිකව තමන් වැනිම වූ අය බිහි කරති.

## ක්‍රියා කිරීම උදෙසා වූ කැඳවීම

යේසුස්වහන්සේ මුලින්ම ගෝලයන් ලෙස කැඳවූ මිනිසුන් මසුන් අල්ලන්නන් විය. ඔවුන් ක්‍රියාශීලි මිනිසුන් වූහ. ඔවුන් මසුන් ඇල්ලුවේ වරකට එක මත්ස්‍යයා බැගින් නොවේ. ඔවුහු විශාල දැල් උපයෝගි කර ගනිමින් සියලු ආකාරයේ මසුන් රැසක් අල්ලා ගත්හ.

යේසුස්වහන්සේ ඔවුන්ට "මනුෂ්‍යයන් අල්ලන්නන්" වීමට කැඳවීම දුන්විට ආත්මික ගුණනය සඳහාත් උන්වහන්සේ ඒ හා සමාන සැලැස්මක් එළිදරව් කළ සේක. උන්වහන්සේගේ අනුගාමිකයන් සෑම ජාතියකටම, සංස්කෘතියකටම, භාෂාවකටම හා ජාතික පසුබිමකටම අයත් මිනිසුන් හා ස්ත්‍රීන් අල්ලා ගත යුතු විය. ඔවුන්ගේ ආත්මික "දැල්" පිරී යා යුතු විය.

යේසුස්වහන්සේ මනුෂ්‍යයන් කැඳවූයේ ක්‍රියා කිරීමටයි. උන්වහන්සේ ඔවුන්ව මනුෂ්‍යයන් අල්ලන්නන් කරවන බව උන්වහන්සේ පැවසූ සේක. ඔවුන් දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ බලා සිටින්නන් පමණක් නොවනු ඇත. මනුෂ්‍යයන් හා ස්ත්‍රීන්ගේ සදාකාලික ආත්මයන් උදෙසා ඔවුන් මසුන් ඇල්ලීම කරන විට ඔවුන් එයට සහභාගිවන්නන් වනු ඇත.

යේසුස්වහන්සේගේ කැඳවීම තවමත් එසේමය. අපද මනුෂ්‍යයන් අල්ලන්නන් විය යුතුය. අප මසුන් අල්ලන්නේ නැතිනම් අප යේසුස්වහන්සේ අනුගමනය කරන්නේද නැත.

# මනුෂ්‍යයන් අල්ලන්නන්

තමන්වහන්සේගේ අනුගාමිකයන් කැඳවීම සඳහා යේසුස්වහන්සේ මසුන් ඇල්ලීමේ නිදර්ශනය පාවිච්චි කළේ ඇයි?

පළමුව, ඔවුන්ට පහසුවෙන්ම තේරුම් ගත හැකි වූ නිදර්ශනය එය විය. මෙම මිනිසුන් තම ජීවිකාව කරගත්තේ මසුන් ඇල්ලීමෙන්ය. ඔවුන් තම කාලය හා ශක්තිය වැය කළ කාර්යය එය විය. යේසුස්වහන්සේ මනුෂ්‍යයන් අල්ලන්නන් කිරීමට ඔවුන්ව කැඳවූ විට, ඔවුන් ස්වාභාවික ලෝකය තුළ මසුන් ඇල්ලූ ආකාරයටම, ආත්මිකව මනුෂ්‍යයන් "ඇල්ලිය" හැකි බව ඔවුන්ට තේරුම් ගත හැකි විය. මෙම කැඳවීම තුළ ඔවුන්ගෙන් ඉල්ලා සිටින කැපවීමද ඔවුන්ට තේරුම් ගත හැකි විය. ආත්මිකව මසුන් ඇල්ලීම සඳහා ඔවුන්ගේ කාලය හා ශක්තිය කැප කිරීම අවශ්‍ය විය.

දෙවනුව, යේසුස්වහන්සේ තම අනුගාමිකයන් කැඳවීමට මසුන් ඇල්ලීම පිළිබඳ උදාහරණය යොදා ගත්තේ ස්වාභාවිකව මසුන් ඇල්ලීම සඳහා යොදා ගන්නා ප්‍රතිපත්තීන් ආත්මිකව මනුෂ්‍යයන් ඇල්ලීමේදීද යොදා ගත හැකි බැවිනි. මෙම ප්‍රතිපත්තිවලින් සමහරක් පහත දැක්වේ:

## මසුන් සිටින ස්ථානයට ඔබ යා යුතුය:

ඔබට මසුන් ඇල්ලීමට අවශ්‍ය නම් මසුන් සිටින ස්ථානයට ඔබ යා යුතුය. මසුන් සිටින ස්ථානය ජලය වේ. කන්දක් මුදුනේ සිට හෝ කාන්තාරයක් මැද සිට ඔබට කෙදිනකවත් මසුන් අල්ලා ගත නොහැකිය.

ඇදහිලිවන්තයෙකු ලෙස, ආත්මිකව මසුන් සිටින ස්ථානයට ඔබ යා යුතුය. මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් ජීවත්වන්නේ ලෝකයේය. නොඇදහිලිවන්තයන් ඔබ වෙතට පැමිණෙන ලෙස ඔබට සභාව නමැති ගොඩනැගිල්ල තුළට වී සිටිය නොහැකිය. ඔබ වෙළඳපොළට, පාසල්වලට හා කාර්යාලවලට ගොස් ගැළවීම නොලත් මිනිසුන් හමුවන ඕනෑම තැනකදී "මසුන් ඇල්ලීම" සිදු කළ යුතුය.

## ඔබ පරිසරය විශ්ලේෂණය කළ යුතුය :

ඔබ ස්වාභාවික ලෝකයේ මසුන් අල්ලන විට, පරිසරය ගැන සැලකිලිමත් වීම වැදගත්ය. ජලයේ දිශාව හා ගැඹුර ඔබ විසින් නිරීක්ෂණය කළ යුතුය. එය කරදියද මිරිදියද යන්න ඔබ දැන සිටිය යුතුය. සුළඟ හමන්නේ කෙසේදැයි ඔබ නිරීක්ෂණය කළ යුතුය. මෙම සියලුම ස්වාභාවික කරුණු ඔබ මසුන් ඇල්ලීමට යොදා ගන්නා ඇමේ ස්වරූපය සහ ක්‍රමයන් තීරණය කරයි.

ස්වාභාවික ලෝකය තුළද තත්ත්වය එසේමය. ඔබට මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් හමුවන පරිසරය ඔබ විසින් විශ්ලේෂණය කළ යුතුය. ඔවුන්ගේ අවශ්‍යතාවන් මොනවාද? ඔවුන්ගේ ජීවිතවල සිදුවන්නේ මොනවාද? ඔවුන්ගේ ආත්ම අල්ලා ගැනීමට යොදාගන්නා ක්‍රමය තීරණය කිරීමේදී මේවා ඔබට උපකාරී වනු ඇත.

යොහන් 4 සඳහන් ළිඳ ළඟ සිටි ස්ත්‍රිය යේසුස්වහන්සේට හමුවූ විට, තමන්වහන්සේ ඇය හමුවූ පරිසරය උන්වහන්සේ විශ්ලේෂණය කළ සේක. ඇය ස්වාභාවික ජලය සොයමින් සිටියාය. උන්වහන්සේ ඇය සතු ආත්මික අවශ්‍යතාව ඇයට හඳුන්වා දීමට මෙම ස්වාභාවික අවශ්‍යතාව පාවිච්චි කළ සේක. උන්වහන්සේ යොදාගත් ක්‍රමය විසින් ඇය දෙවියන්වහන්සේගේ රාජ්‍යය වෙත "ඉක්මණින් ගෙන එනු" ලැබිය.

ස්වාභාවික ලෝකය තුළ ඔබ මිරිදිය මසුන් ඇල්ලීම සඳහා යොදාගන්නා ක්‍රමයන් කරදියේදී යොදා ගත්තද ඔබට කිසිදා කරදිය මසුන් හසු නොවනු ඇත. මිරිදිය මසුන් කරදියෙහි ජීවත් නොවේ. ඔවුන් ජීවත්වන්නේ මිරිදියෙහිය.

ආත්මික ලෝකය තුළ ඔබ පරිසරය විශ්ලේෂණය නොකළහොත්, මිනිසුන් සිටින්නේ කොහේද යන්න හා ඔවුන්ට ළඟාවන්නේ කෙසේද යන්න ඔබ නොදන්නා බැවින් ඔබ "කරදියෙහි මිරිදිය මසුන් ඇල්ලීමෙහි" නිරත වනු ඇත.

## ඔබ විවිධ ක්‍රම පාවිච්චි කළ යුතුය :

හොඳ මසුන් අල්ලන්නෙකු මසුන් ඇල්ලීමට විවිධ ක්‍රම යොදා ගනියි. මසුන් ආකර්ෂණය කර ගැනීමට ඔහු විවිධාකාරයේ ඇම යොදා ගනියි. ඔහු බිලිපිත්ත, දැල, හෙල්ල හෝ කූඩ වැනි විවිධාකාරයේ මසුන් ඇල්ලීමේ ක්‍රම ඔහු විසින් යොදා ගනියි. විවිධාකාරයේ මසුන් ආකර්ෂණය කර ගත හැක්කේ විවිධාකාරයේ ක්‍රමවලිනි. හොඳ මසුන් අල්ලන්නෙකු විවිධාකාරයේ ක්‍රම පාවිච්චි කරන්නේ මේ හේතුවෙනි.

මසුන් අල්ලන්නෙකුට මසුන් ඇල්ලීම පිළිබඳව ලියැවී ඇති පොත්වලින් මෙම ක්‍රම සමහරක් ඉගෙන ගත හැකිය. අනෙකුත් ක්‍රම ඔහු ඉගෙන ගන්නේ අත්දැකීමෙන් හා නිරීක්ෂණයෙන්ය. ඔහු පාවිච්චි කරන ක්‍රම වෙනස් වේ, නමුත් ඉලක්කය සැමවිටම සමානය. ... එනම් මසුන් ඇල්ලීමයි.

ඔබට බලපෑමක් කළ හැකි ආකාරයේ ආත්මික මසුන් අල්ලන්නෙකු වීමට අවශ්‍ය නම්, ඔබ විවිධාකාරයේ ක්‍රම පාවිච්චි කළ යුතුය. විවිධ පුද්ගලයන් ශුභාරංචියට ආකර්ෂණය වන්නේ විවිධ ක්‍රමවලිනි. ඇතැම් අය ශුභාරංචියට "ඇතුළු වන්නේ" ඉගැන්වීමෙන් හා දේශනා කිරීමෙන් හෝ අවශ්‍යතාවන් ඇති අවස්ථාවේදී ඔවුන්ට සැනසිම ගෙන ඒම තුළින්ය. තවත් අයව "අල්ලා ගත යුතු" වන්නේ විවිධ ක්‍රමවලිනි.

ආත්මික මසුන් ඇල්ලීම සඳහා වූ ක්‍රම විවිධාකාර වේ, නමුත් ඉලක්කය සැමවිටම සමානය. ... මනුෂ්‍යයන්ගේ හා ස්ත්‍රීන්ගේ ආත්ම දිනා ගැනීමය.

## ඔබ පිටතට දමා ඇතුළට ඇදගත යුතුය :

ස්වාභාවික ලෝකය තුළ ඔබ බිලිපිත්තක්, දැලක් හෝ හෙල්ලයක් පාවිච්චි කළද ඔබ එය ජලයට විසිකර නැවත එය ඇතුලට ඇදගත යුතුය.

ස්වාභාවික ලෝකයේදී ඔබ ජලයට විසි කරන ආකාරය ඉතා වැදගත්ය. ඔබේ විසි කිරීම ඉලක්කයටම සිදු කළ යුතුය. ඔබ මසුන් අල්ලාගත් පසු එය ගොඩට ගැනීම ප්‍රවේසමෙන් කිරීමට වග බලා ගත යුතුය.

ආත්මික ලෝකය තුළ, අප දෙවියන්වහන්සේගේ වචනය "පිටතට විසි කළ විට" එය හිස්ව ආපසු නොපැමිණෙන බවට අපට පොරොන්දු වී තිබේ. මනුෂ්‍යයන්ගේ හා ස්ත්‍රීන්ගේ හදවත් හා ජීවිත තුළ එහි අරමුණ එය විසින් ඉටු කරගනු ඇත (යෙසායා 55:11). ඔබ දෙවියන්වහන්සේගේ වචනය පාවිච්චි කරන විට, හැමවිටම ඔබ ඉලක්කයක් ඇතිව සිටිනු ඇත. නිරායාසයෙන්ම එය මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් "අල්ලා ගනු" ඇත.

## නිවැරදි කාලයේදී ක්‍රියා කිරීම වැදගත්ය :

ස්වාභාවික ලෝකය තුළදී දවසේ කවර වේලාවද හා වසරේ කවර ඍතුවද යන්න මසුන් ඇල්ලීම කෙරෙහි බලපායි. ඇතැම් මසුන් සංක්‍රමණය වන අතර ඇතැම් කාලයන් තුළදී ඇතැම් ප්‍රදේශවලදී අල්ලා ගත නොහැක. විශාල මසුන් දවස ආරම්භයේදී ආහාර ලබා ගැනීම සඳහා ජලය මතුපිටට එන බැවින් එහිදී ඔවුන් අල්ලා ගත හැකිය. ඔබ වැරදි කාලයේදී හෝ වැරදි වේලාවේදී මසුන් අල්ලන්නට ගියහොත්, ඔබට බොහෝසේ මසුන් අල්ලා ගත නොහැකිය.

ආත්මික මසුන් අල්ලා ගැනීමේදීද නිවැරදි කාලයේදී ක්‍රියා කිරීම වැදගත්ය. ලෝකයේ ප්‍රතිචාරයක් දක්වන මසුන් එනම් ආත්මිකව "සපාකමින්" සිටින මසුන් ඇති ප්‍රදේශවල මසුන් ඇල්ලීම කොතරම් වැදගත්ද යන්න මෙම පාඨමාලාව තුළ පසුව ඔබ ඉගෙන ගනු ඇත.

## ඔබ ඉවසිලිවන්ත විය යුතුය:

ස්වාභාවික ලෝකයේ මසුන් අල්ලන්නෙකු ඉවසිලිවන්ත විය යුතුය. මාලුවා ඇම කන තුරු හෝ දැල තුළට එනතුරු ඔහු බලා සිටිය යුතුය. ආත්මික ලෝකය තුළද එය සත්‍යයකි :

**එබැවින් සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේගේ ඊම දක්වා ඉවසන්න. බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසමින් ගොවියා පොළොවේ අනර්ඝ ඵල ගැන බලා සිටී. (යාකොබ් 5:7)**

## ආත්මිකව තමන් වැනිම අය බිහි කිරීම

ස්වාභාවික ලෝකය තුළ මසුන් ඇල්ලීමේ ප්‍රතිඵලය මසුන් ගුණනය වීමයි. ආත්මික ලෝකය තුළ මසුන් ඇල්ලීමේ ප්‍රතිඵලය දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුළ මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් ගුණනය වීමයි. ස්වාභාවික බෝවීමේ ප්‍රතිඵලය මිනිසුන් ගුණනය වීමයි. ආත්මික බෝවීමේ ප්‍රතිඵලය ආත්මික මිනිසුන් ගුණනය වීමයි.

ස්වාභාවික බෝවීම ජීවියේ ප්‍රතිඵලයයි. ආත්මික බෝවීමද, ජීවයේ ප්‍රතිඵලයයි. මනුෂ්‍යයන්ගේ වැඩසටහන් හා ප්‍රචාරණයන් තුළින් එය සිදු නොවේ. ආත්මික බෝවීම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන් ගලන ආත්මික ජීවනයෙනි.

ස්වාභාවික ශරීරය තුළ බෝවීම ආරම්භ වන්නේ, ස්ත්‍රියකගේ ගර්භාෂ තුළ තනි ජීවී සෛලයකිනි. සම්පූර්ණ ශරීරයක් සෑදෙන තුරු එම සෛලය ගුණනය වන අතර එවිට නව දරුවෙකු උපදී.

ආත්මික වර්ධනයද ඒ හා සමානය. එය ආරම්භ වන්නේ එක් මනුෂ්‍යයෙක් හෝ ස්ත්‍රියක් තුළින් ගලන දෙවියන්වහන්සේගේ ජීවනයෙනි. එය සභාව නමැති ආත්මික "ගර්භාෂය" තුළ ගුණනය වේ. ඊළඟ පරිච්ඡේදය තුළදී "කුඩා දේවල්වල දවස" යන්න ඔබ ඉගෙන ගන්නා විට ආත්මික බෝවීම ආරම්භ වන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගනු ඇත.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දුන් පළමු හා අන්තිම ආඥාවන් මොනවාද?

3. ගුණනය වීම යනු කුමක්ද?

4. ඇදහිලිවන්තයන් ආත්මිකව ගුණනය වන්නේ කෙසේද?

5. "ක්‍රමය" යන්න නිර්වචනය කරන්න.

6. "ක්‍රමවේදයන්" යන්න නිර්වචනය කරන්න.

7. ආත්මික "ගුණනය වීමේ ක්‍රමවේදයන්" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

____________________________________________________________

____________________________________________________________

8. ආත්මිකව මසුන් ඇල්ලීමට අදාළ කර ගත හැකි ස්වාභාවිකව මසුන් ඇල්ලීමේදී යොදා ගන්නා ප්‍රතිපත්තීන් සාරාංශ කරන්න.

____________________________________________________________

____________________________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ආත්මිකව ගුණනය වීම සඳහා වූ යේසුස්වහන්සේගේ කැඳවීම විකල්පයක් හෝ යෝජනාවක් නොවේ. එය ආඥාවකි. මහා ආඥාව පිළිබඳ විවිධ බයිබල් පද සංසන්දනය කරන පහත වගුව අධ්‍යයනය කරන්න. සෑම පදයක්ම ඔබේ බයිබලයෙන් බලන්න. ආඥාව සම්පූර්ණ කිරීමට ඔබට ඇති ආධිපත්‍යය හඳුනා ගන්න. ඔබගේ සේවය ව්‍යප්ත වි ඇති ප්‍රමාණය, එහි පණිවුඩය හා ගුණනය වීමේ ක්‍රියාවලිය තුළ ඔබ විසින් ඉටු කළ යුතු ක්‍රියාකාරකම් හඳුනා ගන්න.

| **බයිබල් කොටස** | **ආධිපත්‍යය** | **ප්‍රමාණය** | **පණිවුඩය** | **ක්‍රියාකාරකම්** |
|---|---|---|---|---|
| මතෙව් 28:1-20 | සියලු ආධිපත්‍යය | සියලු ජාතීන් | යේසුස්වහන්සේ අණකළ සියලු දේවල් | ගොස් බව්තීස්ම කර ඉගැන්වීමෙන් ගෝලයන් කරන්න. |
| මාර්ක් 16:15 | යේසුස්වහන්සේ ගේ නාමය | සකල ලෝකය සියලු සත්ත්වයන් වෙත | ශුභාරංචිය | ගොස් දේශනාකරන්න. රෝගීන් සුව කරන්න. |
| ලූක් 24:46-49 | යේසුස්වහන්සේගේ නාමය | යෙරුසලමේ පටන් සියලු ජාතීන් | පසුතැවිලිවීමට හා පව් කමාවට | දේශනා කරන්න. ප්‍රකාශ කරන්න හා සාක්ෂි දරන්න. |
| යොහාන් 20:21 | පියාණන්වහන්සේ විසින් තමන්වහන් සේ එවන ලද ආකාරයටම යේසුස්වහන්සේ විසින් එවන ලදී. | (සේවයේ ප්‍රමාණය, පණිවුඩය හා ක්‍රියාකාරකම් "යේසුස්වහන්සේ" හා සමාන විය යුතුය.) | | |
| ක්‍රියා 1:8 | ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය | යෙරුසලම ජුදා දේශය සමාරිය හා ලෝකයේ සියලු කොටස් | ක්‍රිස්තුස්වහන්සේ | සාක්ෂි දරන්න. |

# දෙවන පරිච්ඡේදය

## කුඩා දේවල දවස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ගුණනය වීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති සාරාංශගත කිරීමට
- ආත්මික වර්ධනය සිදුවන විවිධ ආකාරයන් හඳුනා ගැනීමට
- ගුණනය වීම ගැන අවධානය යොමු කිරීම ආත්මික දෙයක් බව පෙන්වන බයිබල් පද ලැයිස්තුගත කිරීමට,
- ගණනින් වර්ධනය වීම පිළිබඳ වැරදි අවධානය පෙන්නුම් කරන කරුණු හඳුනා ගැනීමට,

ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**''මක්නිසාද කුඩා දේවල දවස හෙළාදැක්කේ කවුද?'' (සෙකරියා 4:10).**

### හැඳින්වීම

මනුෂ්‍ය ශරීරයක වර්ධනය ආරම්භ වන්නේ පුරුෂයෙකු හා ස්ත්‍රියක අතර ඇතිවන ඉතා සමීප සම්බන්ධතාවක ප්‍රතිඵලයක් වන ජීවී සෛලයකිනි. තවත් මනුෂ්‍ය ජීවියෙකු නිර්මාණය වන තුරු එම සෛලය මවගේ ගර්භාෂය තුළ ගුණනය වේ. පරිණත තත්වයට පත්වූවිට, එම නව මනුෂ්‍යයාටද ගුණනය වීමේ හැකියාව ඇත.

ආත්මික වර්ධනය ආරම්භ වන්නේ එක් පුද්ගලයෙකු හා ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අතර සම්බන්ධතාවයෙනි. යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගත් පුද්ගලයාගේ ප්‍රාණය හා ආත්මය තුළට ආත්මික ජීවනය ගලා එයි. සභාව නැමති ආත්මික ගර්භාෂය තුළ නිර්මාණය වන එම ජීවයේ ආරම්භක තත්වය, නව ගෝලයෙකු නිර්මාණය වන තුරු වර්ධනය වේ. අන් අය ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඒමට මඟපෙන්වීම තුළින් තමා වැනි තවත් අය බිහි කිරීමේ හැකියාව එම ගෝලයාට තිබේ.

ස්වාභාවික ලෝකය තුළ මෙන්ම ආත්මික ලෝකය තුළ වුවද, ගුණනය වීම ආරම්භ වන්නේ එක් ජීවී සෛලයකිනි. දෙවියන්වහන්සේ මෙලෙස පවසන්නේ ඒ හේතුවෙනි.

**''මක්නිසාද කුඩා දේවල දවස හෙළාදැක්කේ කවුද?'' (සෙකරියා 4:10).**

මෙම පරිච්ඡේදයේදී ඔබ කුඩා දේවල්වලින් පටන් ගනු ඇත. ගුණනය වීම සම්බන්ධ මූලික ප්‍රතිපත්ති සහ ආත්මික වර්ධනය සිදුවන විවිධ ආකාරයන් ඔබ විසින් ඉගෙන ගනු ඇත. ආත්මික ගුණනය වීම පිළිබඳව දෙවියන්වහන්සේ දක්වන සැලකිල්ල සහ ගණනින් වර්ධනය වීම පිළිබඳ වැරදි අවධානය පෙන්නුම් කරන කරුණු ඔබ ඉගෙන ගනු ඇත. ඔබ මූලික ප්‍රතිපත්ති ඉගෙන ගනු ඇත. මහත් එළිදරව් කිරීම් පදනම් වී ඇත්තේ එම කුඩා දේවල් මතය.

### ගුණනය වීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති

ක්‍රමවේදයන් ඉගෙන ගැනීම හා අදාළ කරගැනීම සඳහා ආත්මික ගුණනය වීම පිළිබඳව මූලික ප්‍රතිපත්ති ඔබ ඉගෙනගත යුතුය. ගුණනය වීම පිළිබඳ බයිබලීය ප්‍රතිපත්ති වෙනස් නොවේ, නමුත් ඔබ ගුණනය වන ක්‍රමවේදයන් වෙනස් විය හැකිය. ක්‍රමවේදයන් වෙනස් වන නමුත් අරමුණ හැමවිටම නොවෙනස්ව පවතී.

දෙවියන්වහන්සේගේ අරමුණු සහ ප්‍රතිපත්තීන් හැමවිටම එක ලෙසම පවතී. නමුත් එම අරමුණු වෙත ළඟා වන උපක්‍රම වෙනස් වේ. ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේගේ අරමුණ වූයේ . . .

> **" එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවලද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේට තුළ ඒකරාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය" (එපීස 1:9-10).**

තමන්වහන්සේගේ සෙනඟගේ ආත්මික ජීවිතය හා ජාතීන් අතර ඓතිහාසික තත්වයන් වෙනස් වන විට, තමන්වහන්සේගේ අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය වන පරිදි උන්වහන්සේ තම උපක්‍රමයන් වෙනස් කළ සේක. උදාහරණයක් ලෙස, ඉශ්‍රායෙල් පවුල්වල පියවරු තම ආත්මික යුතුකම් ඉටු කිරීමට අසමත් වූ විට, දෙවියන්වහන්සේ පූජකවරු නැඟිටවූ සේක. පූජකවරු දූෂණය වූ විට, උන්වහන්සේ ආත්මික නායකයන් ලෙස ප්‍රොපේතවරු නැඟිටවූ සේක.

යේසුස්වහන්සේ සේවය කිරීමේ විවිධ ක්‍රම පාවිච්චි කළ සේක. උන්වහන්සේ සියලු මනුෂ්‍යයන් සමඟ එකම ආකාරයකට ක්‍රියා නොකළ සේක. උන්වහන්සේගේ ක්‍රම විවිධ විය, නමුත් උන්වහන්සේගේ අරමුණු එකම විය . . . එනම් පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ ජීවිත වෙත ළඟා වී ඒවා වෙනස් කිරීමය.

ඔබ ගුණනය වීමට පටන් ගැනීමට පෙර "කුඩා දේවල දවසේදී" තේරුම් ගත යුතු මූලික ප්‍රතිපත්ති සමහරක් පහත දක්වේ :

## දෙවියන්වහන්සේ සමූහයන් ගැන සළකන සේක :

දෙවියන්වහන්සේ හැම විටම සළකා ඇත්තේ මුළු මහත් ලෝකයම ගැන වේ :

> **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහන් 3:16).**

දෙවියන්වහන්සේ . . .

> ". . . **සියල්ලන්ම පසුතැවිලි වනවාට මිස කිසිවෙක් විනාශ වනවාට උන්වහන්සේ නොකැමතිව නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක"** (2 පේතෘස් 3:9).

යේසුස්වහන්සේ පහත සඳහන් වචන පවසන විට මේ ආකාරයේම සැලකිල්ලක් පෙන්වූ සේක :

> **"මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ සොයන්ටද ගළවාගන්ටද ආයේයයි කීසේක" (ලූක් 19:10).**

> ". . . **මක්නිසාද මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමි" (මතෙව් 9:13).**

දෙවියන්වහන්සේ සමූහයන් ගැන සළකන සේක. උන්වහන්සේ සංඛ්‍යාවන් ගැන සළකන සේක. තමන් වැනිම වූ අය බිහි කරමින් ශුභාරංචිය ව්‍යාප්ත කරන ඇදහිලිවන්තයන්ගේ ගුණනය වීම ගැන උන්වහන්සේ සලකන සේක. ගුණනය වීමේ ක්‍රම පිළිබඳ ඔබේ අධ්‍යයනය ආරම්භ කරන විට ඔබත් දෙවියන්වහන්සේ සැලකිලිමත් වන කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. එනම් මුළු මහත් ලෝකයටම ශුභාරංචි පණිවුඩය ගෙන යාමයි.

## වර්ධනය දෙන්නේ දෙවියන්වහන්සේය :

දෙවියන්වහන්සේගෙන් වෙන්ව ආත්මික ගුණනය වීම ළඟා කරගත නොහැකිය. වර්ධනය දෙන්නේ දෙවියන්වහන්සේය.

**"'. . . වර්ධනය දුන්නේ දෙවියන්වහන්සේය" (1 කොරින්ති 3:6).**

## මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්ති සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය :

ජීවිතයේ හා සේවයේ සෑම ක්ෂේත්‍රයක් වෙතම අදාළ කරගත හැකි ප්‍රතිපත්තීන් දේව වචනයේ සඳහන් වේ. දෙවියන්වහන්සේ ක්‍රියා කරනුයේ මෙම ප්‍රතිපත්ති හා එක්ව ක්‍රියා කිරීමට දන්නා මනුෂ්‍යයන් තුළිනි. ලෝකයේ ආරම්භයේ පටන්ම, දෙවියන්වහන්සේ පොළොව මත ක්‍රියා කර ඇත්තේ මනුෂ්‍යයා තුළිනි. උද්‍යානය බලාගැනීමේ කාර්යය උන්වහන්සේ ආදම්ට හා ඒවට පැවරූ සේක. ගංවතුර කාලයේදී පෘථිවියේ ජීවය ආරක්ෂා කිරීමට නෝවා නම් මනුෂ්‍යයා උන්වහන්සේ පාවිච්චි කළසේක.

ඉශ්‍රායෙල් සෙනඟ තුළින් ලෝකයේ ජාතීන්ට තමන්වහන්සේ එළිදරව් කරනු පිණිස ඉශ්‍රායෙල් ජාතිය ගොඩනැඟීමට උන්වහන්සේ ආබ්‍රහම් පාවිච්චි කළසේක. එසේම පරණ ගිවිසුම් කාලයේදී තම සැළසුම ඉටු කරගැනීමට උන්වහන්සේ ප්‍රොපේතවරු, රජවරු හා විනිශ්චයකාරවරු පාවිච්චි කළසේක.

නව ගිවිසුම තුළ, යොහන් බව්තිස්ත නම් මනුෂ්‍යයෙක් "ස්වාමීන්වහන්සේට පෙරමඟ සකස් කළසේක". යේසුස්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයන් සමඟ තම සේවය ආරම්භ කළ අතර උන්වහන්සේ යළි ස්වර්ගයට යන විට ශුභාරංචියේ ඉරණම ඔවුන් අතෙහිම රඳවා ගියසේක. මුළු බයිබලයම සැළකූ විට එය දෙවියන්වහන්සේගේ අරමුණු ඉටු කිරීම සඳහා මනුෂ්‍යයා උන්වහන්සේගේ ප්‍රතිපත්ති සමඟ එක්ව ක්‍රියා කළ ආකාරය පිළිබඳ වාර්තාවකි.

ආත්මික ගුණනය වීමේදී මෙය සත්‍යයකි. ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයා මඟහැර යන්නේ නැත. උන්වහන්සේගේ ගුණනය වීමේ ප්‍රතිපත්ති තේරුම් ගන්නා සහ ඒවා සමඟ එක්ව ක්‍රියා කරන මනුෂ්‍යයන් උන්වහන්සේ පාවිච්චි කරන සේක. මෙම සහයෝගී සම්බන්ධතාවය පාවුල් සාරාංශගත කරයි :

**"මම හිටෙවුවෙමි, අපොල්ලොස් වතුර වත්කළේය: නුමුත් වර්ධනය දුන්නේ දෙවියන්වහන්සේය" (1 කොරින්ති 3:6).**

දෙවියන්වහන්සේගේ සැළැස්ම තුළ ඇදහිලිවන්තයන් තම වගකීම් ඉටුකිරීමේ අවශ්‍යතාවය පාවුල් අවධාරණය කරයි.

**"මක්නිසාද: ස්වාමීන්වහන්සේගේ නාමයට යාච්ඤාකරන කවුරු නුමුත් ගළවනු ලබන්නේය. එසේ නම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤාකරන්නේ කොහොමද? තමුන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනාකරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද?" (රෝම 10:13-14).**

## ගුණනය වීමේ කේන්ද්‍රය යේසුස්වහන්සේය :

යේසුස්වහන්සේ මෙසේ කී සේක :

**"මම වනාහි භූමියෙන් ඔසවනු ලැබුවොත් සියල්ලන් මා වෙතට ඇදගන්නෙමියි කීසේක" (යොහන් 12:32).**

යේසුස්වහන්සේ මෙහිදී කතා කරනුයේ සියලු මනුෂ්‍ය වර්ගයාගේ පව් උදෙසා උන්වහන්සේ කුරුසිය වෙත ඔසවනු ලැබීම පිළිබඳව වේ. උන්වහන්සේගේ මරණය තුළින්, ශුභාරංචියේ බලය තුළින් උන්වහන්සේට සියලු දෙනා ආකර්ෂණය කරගත හැකිය. ඔබ ශුභාරංචි පණිවුඩය බෙදා ගන්නා විට, යේසුස්වහන්සේ උසස් කරනු ලැබේ. ඔබේ ජීවිතය තුළත් ඔබේ සභාව තුළත් උන්වහන්සේ

ඔසවනු ලැබූ විට, ශුභාරංචි පණිවුඩයේ බලයෙන් මනුෂ්‍යයන් ආකර්ෂණය කරගනු ලැබේ. යේසුස්වහන්සේ ඔසවනු ලබන විට ගුණනය වීම සහතිකවම සිදු වනු ඇත.

## වර්ධනයට හේතු වන්නේ දෙවියන්වහන්සේගේ වචනයයි :

මතෙව් 13:1-9 හි යේසුස්වහන්සේ වර්ධනය පිළිබඳ උපමා කතාවක් වදාළ සේක. මතෙව් 13:18-23 හි උන්වහන්සේ උපමා කතාව තේරුම් කළ සේක. ඔබේ බයිබලයෙන් මෙම කොටස් කියවන්න. මෙම උපමා කතාව තුළදී, බීජය සංකේතවත් කළේ දේව වචනයයි. අප උන්වහන්සේගේ වචනය නැමති බීජය පැළ කරන විට එය නිකරුණේ සිදු වන්නක් නොවන බව දෙවියන්වහන්සේ පොරොන්දු වී තිබේ.

> **''මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය සිදුකොට, මා නියමකළ කාරණය සඵලකරනවා ඇත'' (යෙසායා 55:11).**
>
> ''. . . **මක්නිසාද මාගේ වචනය ඉෂ්ටකරන පිණිස මම ඒ ගැන පිබිද සිටිමි''(යෙරමියා 1:12).**

පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ ජීවිත වෙනස් කරන්නේ දෙවියන්වහන්සේගේ වචනයයි. එම වෙනසේ ප්‍රතිඵලය දේව වචනය මත පදනම් වූ වර්ධනය වීම හා ගුණනය වීමයි.

## ගුණනය වීමේ හැකියාව ලබා දෙන්නේ ශුද්ධාත්මයාණන්ය :

යේසුස්වහන්සේ තම ගෝලයන් සමඟ දෙසූ අවසන් පණිවුඩයේදී උන්වහන්සේ මෙසේ පැවසූසේක :

> **''නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක'' (ක්‍රියා 1:8).**

ශුද්ධාත්මයාණන්ගේ බලය ගුණනය වීමේ හැකියාව ලබා දෙයි. ශුද්ධාත්මයාණන්ගේ දීමනා ගුණනය වීම සඳහා පිළියෙල කරයි. ශුද්ධාත්මයාණන්ගේ ඵල තුළින් තමන් වැනිම වූ තවත් අය බිහිකිරීමේ හැකියාව ලැබේ. ආත්මික ගුණනය වීමේදී ශුද්ධාත්මයාණන්ගේ භූමිකාව පිළිබඳව මෙම පාඨමාලාව තුළ පසුව අප පරීක්ෂා කර බලනු ඇත.

## ගුණනය වීම යනු පොදු වගකීමකි :

මුල් කාලීන සභාවේ, ශුභාරංචිය බෙදා ගැනීම සම්පූර්ණකාලීන සභාපාලකවරුන්ට, දිවැසිවරුන්ට, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ට හා ගුරුවරුන්ට පමණක් සීමා කර තිබුණේ නැත. නව ගිවිසුමේ සිටි සෑම ඇදහිලිවන්තයෙකුටම ආත්මිකව තමන් වැනිම වූ අය බිහිකිරීමේ හැකියාව තිබුනි. ලෝකයට ශුභාරංචිය ගෙන යාමට නම්, මුල් සභාවේ මෙම උපක්‍රමය වෙත අප යළි ගමන් කළ යුතුය. ආත්මික ගුණනය වීම උදෙසා වූ වගකීම ගිහි පුද්ගලයන් හා පූජකයන් යන දෙපක්ෂයම හවුලේ දැරිය යුතුය. ලෝක ජනගහනය වර්ධනය වීම නිසා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සියලු දෙනා විසින්ම සේවය කිරීම උදෙසා නව ගිවිසුමේ පැවති සැළැස්ම වෙත යළි ගමන් කිරීම අවශ්‍ය වී තිබේ. මඳ උත්සහය හා අර්ධ ලෙස කැපවූ හදවත් ඇතිව අපට ලෝකය දෙවියන්වහන්සේ වෙත ගෙන ආ නොහැකිය.

මුළු ලෝකයටම පහසුවෙන් ශුභාරංචිය ගෙන යාමට ප්‍රමාණවත් තරම් කිතුනුවන් පිරිසක් ලෝකයේ සිටී. අඩුව පවතින්නේ ගුණනය වීම උදෙසා වූ අවස්ථාවන් හඳුනාගැනීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට සමත් උද්‍යෝගිමත් පුද්ගලයන් පිරිසකි.

යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට දී ඇති ආඥාව නම් ''ගොස්'' මුළු ලෝකයටම ශුභාරංචි පණිවුඩය ගෙන යාමයි. ''යන්න'' කියා ආඥාවක් ලැබෙන තුරු ඔබ බලා සිටිය යුතු නොවේ. මන්ද එය දැනටමත් ලබා දී තිබේ. ශුභාරංචිය බෙදා ගැනීම සම්බන්ධව දී ඇති ආඥාව නම්, ''යන්න''

හා නැවතිය යුතු ස්ථාන සොයා ගැනීම වන අතර, ''යන්න'' කියන තුරු නැවතී බලා සිටීම නොවේ.

## වර්ධනය විය හැකි ආකාරයන්

සභාවට වර්ධනය විය හැකි හෝ ගුණනය විය හැකි ආකාර හතරක් පිළිබඳව බයිබලය කතා කරයි :

### භූගෝලීය වර්ධනය වීම :

භූගෝලීය වර්ධනය පිළිබඳව යේසුස්වහන්සේ අනාගත වාක්‍ය පවසා ඇත :

> **''නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක'' (ක්‍රියා 1:8).**

ලෝකයේ ජාතීන් පුරා භූගෝලීයව වර්ධනය විය යුතු විය.

### ගණනින් වර්ධනය වීම :

සභාව භූගෝලීයව වර්ධනය වන විට එය ගණනින් වර්ධනය වීම අත්දකිනු ඇත. මුල් සභාව ගණනින් වර්ධනය වීම පිළිබඳව ක්‍රියා පොතෙහි සඳහන් වේ. උදාහරණයක් ලෙස ක්‍රියා 1:15; අනුව සභාව 12 සිට 120 දක්වාද, ක්‍රියා 2:41; අනුව 3,000 දක්වාද, ක්‍රියා 4:4 අනුව 5,000 දක්වා ද වර්ධනය වී තිබේ.

### ජන වර්ග අනුව වර්ධනය වීම :

මුල් කාලීන සභාව ජන වර්ග අනුව වර්ධනය වීම ද අත්දකින ලදී. ජුදෙව්වන්ගෙන් ඔබ්බට අන්‍යජාතීන් ද ඇතුළත් වන පරිදි (සියලු ජාතීන්ට අයත් මනුෂ්‍යයන්) ශුභාරංචිය ව්‍යාප්ත විය.

### ආත්මික වර්ධනය :

ආත්මික ගුණනය වීමේ දී අවධානය යොමු කරන එකම කරුණු ගණනින් වර්ධනය වීම පමණක් නොවේ. අභ්‍යන්තර ආත්මික වර්ධනය ද වැදගත් බව මෙම පාඩමාලාව තුළ ඉදිරියේදී ඔබ ඉගෙන ගනු ඇත. යේසුස්වහන්සේගේ අනුගාමිකයන් ප්‍රමාණයෙන් මෙන්ම ආත්මික ගුණත්වයෙන්ද වර්ධනය විය යුතුය :

> **''එහෙත් අපගේ ස්වාමි වූ ගැළවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද, උන්වහන්සේ දැනගැන්මෙහිද වර්ධනය වෙයල්ලා ... '' (2 පේතෘස් 3:18).**

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් අප පහත ආකාර අය වීමයි . . .

> **''ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය'' (එපීස 4:15).**

## ගණනින් වර්ධනය වීම පිළිබඳ අවධානය යොමු කිරීම.

ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීම වැරදි යැයි විශ්වාස කිරීම නිසා ඇතැම් අය ආත්මික ගුණනය වීම හා සභාව වර්ධනය වීම පිළිබඳ විෂය නොසළකා හරිති. නමුත් දෙවියන්වහන්සේ ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කළ අවස්ථා පිළිබඳව බයිබලයේ වාර්තා වී ඇත. උදාහරණ ලෙස, ගණන් කථාව 1:1-3; 2:23-24; 26:1-4; එළිදරව් 7:9; 20:8; උත්පත්ති 22:17; හා හෙබ්‍රෙව් 6:14 බලන්න.

ගණනින් වර්ධනය වීම පිළිබඳ උපමා කතා රැසක් යේසුස්වහන්සේ වදාළ සේක. වෙනත් පරිච්ඡේදයකදී ඔබ ඒවා ඉගෙන ගනු ඇත. ස්වර්ගයෙහි ද ප්‍රවේසම් සහගතව ගණන් පිළිබඳ වාර්තා තබා ගන්නා බව උන්වහන්සේ පැවසූ සේක :

> **"එලෙසම පශ්චාත්තාපය ඕනෑ නැති ධර්මිෂ්ඨයන් අනූනවදෙනෙකුට වඩා පශ්චාත්තාපවන්නාවූ එක පව්කාරයෙකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය වන්නේයයි නුඹලාට කියමි"** (ලූක් 15:7).

ක්‍රියා පොතෙහි මුල් සභාව පිළිබඳ වර්තා තුළ ගුණනය වීම ගැන අවධානය යොමු කර තිබේ. සභාවේ වර්ධනය පිළිබඳ සාරාංශගත වාර්තාවක් ක්‍රියා 1:15; 2:41; 4:4; 6:7; 9:31; 12:24; 16:5; 19:20 හා 28:30-31 හි සඳහන් වේ.

වැරදි දේවල් ඉස්මතු කර දැක්වීම පිළිබඳ ප්‍රශ්න කිහිපයක් හේතුවෙන් ඔබ ආත්මික ගුණනය වීම පිළිබඳ විෂය නොසළකා හැරිය යුතු නොවේ. ඒ වෙනුවට ඔබ ප්‍රශ්න හඳුනාගෙන ඒවා සමඟ ගනුදෙනු කළ යුතුය. පහත කරුණු පවතින විට ගුණනය වීම පිළිබඳ වැරදි අදහසක් ඇති වේ:

## ආත්මික වර්ධනයට වඩා ප්‍රමාණයෙන් වර්ධනය වීම වැදගත් :

සමූහයා ආකර්ෂණය කර ගැනීම උදෙසා ආත්මික වර්ධනයේ ප්‍රමිතීන් පහත් කළ හොත්, එහිදී සංඛ්‍යාත්මක වර්ධනය කෙරෙහි වැරදි ලෙස අවධානය යොමු කිරීමක් සිදුවේ. මහත් සමූහයක් ආකර්ෂණය කරගැනීම සඳහා ඇතැම් දේව සේවකයෝ මිනිසුන් ඇසීමට කැමති දේවල් පමණක් ප්‍රකාශ කරති. බයිබලය මෙයට අනතුරු අඟවයි . . .

> **"මක්නිසාද ඔවුන් සාරවත් ඉගැන්වීම් නොඉවසා, කසන කන් ඇතුව, තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ට ගුරුවරුන් රැස්කරගෙන, සත්‍යයට කන් නොදී, ප්‍රබන්ධවලට හැරී යන කාලය පැමිණෙන්නේය"** (2 තිමෝති 4:3-4)

## උඩඟුකම ක්‍රියාව සඳහා උනන්දුකරවන හේතුව බවට පත් වූ විට :

1 ලේකම් 21:18 කියවන්න. මෙහිදී දාවිත් සංඛ්‍යාව කෙරෙහි දැක්වූ සැලකිල්ල සාතන් විසින් උනන්දු කරවනු ලැබූ ක්‍රියාවක් වූ අතර එය උඩඟුකමේ ක්‍රියාවකි. විශාල සංඛ්‍යාවක් සිටීම නිසා ඔබ උඩඟු වීමට පටන් ගත් විට එය සංඛ්‍යාව කෙරෙහි වැරදි ලෙස අවධානය යොමු කිරීමකි.

## භේද ඇති විට :

"භේද" නමින් හඳුන්වන මාංශයේ පාපයකි. මෙය ගලාති 5:20 හි සඳහන් වේ. "භේද" වීම යනු එක්තරා ආකාරයක ඊර්ෂ්‍යාවක් වන අතර එය ඇති වන්නේ අන් අය විසින් අත්පත් කරගෙන ඇති තත්වයන් හා සමාන වීමේ හෝ ඒවා අබිබවා යාමේ අරමුණ ඇතිව ඔවුන්ව අනුකරණය කිරීමෙන් වේ. විශාල සේවයන් ගැන ඔබට ඊර්ෂ්‍යාවක් ඇති වී ඔබ ඒවා අනුකරණය කිරීමට පටන්ගත් විට, සංඛ්‍යාව පිළිබඳව ඔබට ඇත්තේ වැරදි අවධානයකි.

## දේව රාජ්‍යයේ වර්ධනය වෙනුවට සභාවේ වර්ධනය ඉස්මතු කර දැක්වීම :

ආත්මික ගුණනය වීමේ අරමුණ නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට නව ඇදහිලිවන්තයන් දිනා ගනිමින් ඔවුන් දේව රාජ්‍යය තුළ වගකීමක් දැරිය හැකි, තමන් වැනිම තවත් අය බිහිකිරීමේ හැකියාව ඇති තත්වයට පත්වන තුරු ඔවුන් ගෝලයන් ලෙස පුහුණු කිරීමයි. සභාවේ වර්ධනය හා දේවරාජ්‍යයේ වර්ධනය අතර වෙනසක් ඇත. එක් සභාවක් දෙකට බෙදී එහි සාමාජිකයන් 100 ක් වෙනත් දෙවන සභාවකට එකතු වුවහොත්, එකී දෙවන සභාව වර්ධනය වන නමුත් එහිදී දේව රාජ්‍ය වර්ධනය වීමක් සිදු නොවේ. ගුණනයවීමක් සිදු වී නැත. සිදු වී ඇත්තේ දැනටමත් සිටින සාමාජිකයන් හුවමාරු වීමක් පමණි.

ගුණනය වීමේ අරමුණ නම් වෙනත් සභාවකින් නව සාමාජිකයන් ඇදගැනීම නොවේ, එහි අරමුණ නම් ශුභාරංචිය අසා නැති අය වෙත එය ගෙන යාමයි. දේව රාජ්‍යයේ වර්ධනය වෙනුවට සභාවේ වර්ධනය ගැන සිතන විට සංඛ්‍යාව පිළිබඳව යොමු කරන අවධානය දෝෂ සහගත වේ.

## තනි පුද්ගලයන් නොසළකා හරිනු ලබන විට :

පොළොවේ තම සේවය තුළදී යේසුස්වහන්සේ සමූහයන්ට සේවය කළ සේක (ලූක් 6:17; 7:11; 8:37; 9:14-16; 14:26; 23:27; යොහන් 6:2). නමුත් යේසුස්වහන්සේ කිසිවිටෙකත් සමූහයා නිසා තනි පුද්ගලයන් නොසළකා හැරියේ නැත. තනි පුද්ගලයන්ට සේවය කිරීම සඳහා උන්වහන්සේ ඔවුන්ව සමූහයන්ගෙන් පිටතට කැඳවූ සේක (යොහන් 5:3-13; මාර්ක් 5:24-34). යොහන් 4 දී, යේසුස්වහන්සේ එක් කාන්තාවකට සේවය කළ අතර ඇය මුළු මහත් ගම්මානයක්ම ස්වාමීන්වහන්සේ වෙත ගෙන ආවාය.

පිලිප් විසින් සමාරිය නම් නගරයේදී දේශනා කරන ලද මහත් පිබිදීමක් පිළිබඳව ක්‍රියා 8 හි වාර්තා වේ. මෙම රැස්වීම් අතරතුරදී දෙවියන්වහන්සේ පිලිප්ට කතා කර සමාරිය අතහැර යෙරුසලම හා ගාසා අතර කාන්තාරයට යන ලෙස පැවසූ සේක.

පිලිප් ක්ෂණිකවම තමන් කරමින් සිටි සේවය අතහැර ගියේය. ඔහු ඉතා ජනගහනයක් සිටි නගරයකින් හුදෙකලා කාන්තාරයකට ගිය සේක. යෙරුසලමේ සිට නිවස බලා යමින් සිටි එක් තනි ඉතියෝපියානුවෙකුට සේවය කිරීම සඳහා ඔහු සමූහය අතහැර ගියේය. මෙම තනි පුද්ගලයා ඇතැම් විට මුළු මහත් අප්‍රිකා මහද්වීපයේම ශුභාරංචිය ප්‍රකාශ කිරීම පිළිබඳ වගකීම දරන්නා විය හැකිය.

අවුරුදු ගණනාවකට පෙර බ්‍රිතාන්‍යයේ ලන්ඩන් හි පැවති මිශනාරී රැස්වීමකට අයහපත් කාලගුණය නිසා පැමිණියේ දෙදෙනෙක් පමණි. විදේශයකින් පැමිණ සිටි දේව සේවකයා උතුරු ඇමරිකාවේ සිටි ඉන්දියානුවන්ට ප්‍රබල ඉල්ලීමක් කර තිබූ නමුත් පැමිණ ඇත්තේ ස්වල්ප දෙනෙකු නිසා තම කාලය නාස්ති වන බව ඔහු සිතුවේය. නමුත් එම පුද්ගලයන් දෙදෙනාගෙන් අයෙක් දෙවියන්වහන්සේගේ කැඳවීම අසා තම ජීවිතය උන්වහන්සේට යටත් කළේය. මසක් ඇතුළත දී ඔහු තම ව්‍යාපාර විකුණා උතුරු ඇමරිකාවේ සිටි ඉන්දියානුවන් අතර සේවය කිරීමට සූදානමින් සිටියේය. මෙම පුද්ගලයන් අතර ඔහු වසර 35 ක් බලවත් සේවයක් කළේය. ඔහුගේ නම ඩේවිඩ් බ්‍රේයිනාර්ඩ් ය.

කුඩා දේවල් නොසළකා හැරීමෙන් වළකින්න. මතක තබා ගන්න. හිරුට කිසිදාක කළ නොහැකි දෙයක් කුඩා ඉටි පන්දමකට කළ හැකිය . . . එයට රාත්‍රියේ එළිය දීමට හැකිය.

## මනුෂ්‍යයන් වෙත වූ අවධානය දේවල් වෙත මාරුවීම :

ගුණනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සභාව වර්ධනය වන විට ඇතැම් විට මනුෂ්‍යයන් වෙත වූ අවධානය ද්‍රව්‍ය වෙත මාරු වේ. වර්ධනය නිසා, විශාල සභා ගොඩනැඟිල්ලක් අවශ්‍ය විය හැකි අතර, එවිට ගෝලයන් ගුණනය වීම උදෙසා යෙදවූ උත්සාහයන් ගොඩනැඟිලි වැඩටසටහන් වෙත මාරු වීම සිදු විය හැකිය. වර්ධනය නිසා එකතු වූ අයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා වූ ගොඩනැඟිල්ලක් වෙත ඔබේ මූලික අවධානය යොමු වූ විට, සංඛ්‍යාවන් ඔබගේ මූලික ඉලක්කය වෙත ඔබට තිබූ අවධානය නැති වීමක් සිදුවේ.

දෙවියන්වහන්සේ ගොඩනැඟිලිවලට වඩා පුද්ගලයන් පිළිබඳව උනන්දු වේ. දෙවියන්වහන්සේ ලෝකය තුළ කළ සේවයන් පිළිබඳ බයිබලීය වාර්තාවන් මනුෂ්‍යයන් පිළිබඳව අවධානය යොමු කරයි. ගුණනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මනුෂ්‍යයන් වෙත වූ අවධානය ගොඩනැඟිලි වැනි ද්‍රව්‍යමය දේවල් වෙත මාරු වූ විට, ප්‍රමුඛතා වැරදි වේ.

## සංඛ්‍යාවන් මත පදනම්ව අන් අයව විනිශ්චය කරනු ලැබේ :

කිසිදාක සංඛ්‍යාව අනුව තවත් පුද්ගලයෙකුගේ හෝ සේවයක ආත්මිකභාවය විනිශ්චය නොකරන්න. විශාල සංඛ්‍යාවක් යනු සැමවිටම ආත්මිකත්වය නිරූපණය කරන සංකේතයක් නොවේ. සංඛ්‍යාත්මකව සාර්ථක වීම යනු ඇතැම් විට සභාව සභාවක් වී නොමැති බවට වන නිහඬ

සාක්ෂියකි. ඇතැම් විට, දෙවියන්වහන්සේගේ වචනයට හා ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේටත් විශ්වාසවන්ත වූ විට, මිනිසුන් ආකර්ෂණය වනවාට වඩා මිනිසුන් අයින් වීම සිදුවිය හැකිය. උදාහරණයක් ලෙස, යේසුස්වහන්සේ තම මරණය පිළිබඳ ජනප්‍රිය නොවූ පණිවුඩය දේශනා කිරීමට පටන් ගත් විට, උන්වහන්සේගේ අනුගාමිකයන් බොහෝ දෙනෙකු උන්වහන්සේ අතහැර ගියහ (යොහන් 6:52-64).

වර්ධනය සිදු නොවීමට හේතුවන වෙනත් හේතු ද තිබේ. ස්වභාවික ලෝකයේ වර්ධන චක්‍ර පවතින පරිදි ආත්මික වර්ධනය සඳහා ද නිශ්චිත කාලයක් ඇති බව බයිබලය වාර්තා කරයි. ස්වාභාවික ලෝකය තුළ දී ඇතැම් ශාක වර්ග ඇතැම් කාලවලදී බෝවීමක් සිදු නොවේ. එම ගස්වල කොළ හෝ එල නොමැතිව පොළොවේ සිටෙවූ වියළි දණ්ඩක් සේ පෙනෙනු ඇත. නමුත් නිශ්චිත කාලයේදී, මෙම ගස්වල මල් පිපී කොළ හා එල හටගනී.

ආත්මික ලෝකය තුළ ද සත්‍ය එයම වේ. ඇතැම් කාලවලදී ලෝකයේ ඇතැම් නිශ්චිත ප්‍රදේශ වඩා වැඩියෙන් ශුභාරංචිය පිළිගනු ඇත. වර්ධනය පිළිබඳ රටාවන් අධ්‍යයනය කිරීම තුළින් ඔබේ ආත්මික බලවේග ''අස්වැන්න නෙළීමට සුදුසු'' කුඹුරු වෙත යොමු කිරීමට ඔබට හැකිය.

දෙවියන්වහන්සේගේ අංකනය පිළිබඳ ක්‍රමවේදය මනුෂ්‍යයාගේ ක්‍රමය හා සමාන නොවේ, ගණනින් වැඩි වීම සඳහා අප විසින් එකතු කරනු ලැබේ. නමුත් ඇතැම් විට දෙවියන්වහන්සේ එකතු කරන පිණිස අඩු කරනු ඇත. පාපය නිසා අනනියස් හා සප්පිරා සභාවෙන් ඉවත් කරනු ලැබූ විට (ක්‍රියා 5) ඇදහිලිවන්තයන් එකතු කරනු ලැබීය (ක්‍රියා 5:14). ඇතැම් විට දෙවියන්වහන්සේ ගුණනය වීම සඳහා බෙදීම යොදා ගනී. පාවුල් හා බාර්ණබස් වෙන් වූ විට, දෙවියන්වහන්සේ ශුභාරංචි බලවේග ගුණනය විය (ක්‍රියා 15:36-41). ඇතැම් අවස්ථාවලදී මහත් අරමුණක් වෙත ළඟා වීම සඳහා දෙවියන්වහන්සේ විසින් සංඛ්‍යාව අඩු කරනු ලැබේ. විනිශ්චයකාරයාගේ පොතෙහි 7 වන පරිච්ඡේදයේ සඳහන් ගිඩියොන්ගේ කතාව කියවන්න.

කිසිදිනක සංඛ්‍යාව මත පදනම්ව කිසිඳු සේවකයෙකු හෝ තනි පුද්ගලයෙකු විනිශ්චය නොකරන්න. කුඩා දේවල් ''සුළු කොට'' නොසිතන්න. කුඩා දරුවකු තම රොටී සහ කුඩා මසුන් දෙදෙනා යේසුස්වහන්සේට පූජා කළ විට, එය කුසගිනිව සිටි සමූහයකගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට ප්‍රමාණවත් විය. දෙවියන්වහන්සේ තවමත් නොවැදගත් දේවල් තෝරාගෙන, ඒවාට ආශිර්වාද කර තමන්වහන්සේගේ මහිමය උදෙසා ඒවා බලවත් ලෙස පාවිච්චි කරන සේක.

## ගොයම් මිටි අත දරා ඉදිරියට පැමිණෙන්න

සංඛ්‍යාවන් පිළිබඳව වැරදි අවධානයක් යොමු වීමට හැකි යැයි ඇති බිය හේතුවෙන් ගුණනය වීමේ ක්‍රමවේද පිළිබඳව කරන අධ්‍යයනයන්වලින් හා ඒවා අදාළ කරගැනීමෙන් වැළකිය යුතු නොවේ. ඔබට දී ඇති දේවල් ඔබ ගුණනය කරනු ඇතැයි දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන බවත් බිය වීම නිසා වන නිදහසට කාරණා භාරගනු නොලබන බවත් තලෙන්ත පිළිබඳ උපමාව (මතෙව් 25:14-30) පැහැදිලි කරයි. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක :

> **''තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි-නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා'' (යොහන් 4:35).**

ලෝකයේ ආත්මික කුඹුරු වෙත දෙවියන්වහන්සේ ගොයම් නෙළන්නන් යැවූ විට, උන්වහන්සේට අවශ්‍ය ඔවුන් ගොයම් මිටි අත දරා ඉදිරියට ඒම මිස නිදහසට කරුණු ගෙනහැර පෑම නොවේ :

> **''කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය. ඔහු බීජ මල්ල රැගෙන හඬමින් පිටත්ව යන්නේ නුමුත්, තමාගේ ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් එන්නේය'' (ගීතාවලිය 126:5-6).**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

___

2. මෙම පාඩම තුළ උගන්වනු ලැබූ ගුණනය වීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති සාරාංශගත කරන්න.

___

3. ආත්මික වර්ධනය සිදුවිය හැකි ආකාර හතරක් හඳුනාගන්න.

___

___

___

___

4. ගුණනය වීම කෙරෙහි දක්වන අවධානය බයිබලයට අනුකූල බව දක්වන බයිබල් පද කිහිපයක් ලැයිස්තුගත කරන්න.

___

5. මෙම පාඩම තුළ සාකච්ඡා කරන ලද ගුණනින් වර්ධනය වීම පිළිබඳ වැරදි අවධානයක් යොමු කර ඇති බව හෙළි කරන කරුණු සාරාංශගත කරන්න.

___

6. සත්‍ය හෝ අසත්‍ය : ප්‍රකාශය සත්‍ය නම් එය ඉදිරිපිට ඇති හිඩැස මත ''සත්‍ය'' යන්න ලියන්න. ප්‍රකාශය අසත්‍ය නම් එය ඉදිරිපිට ඇති හිඩස මත ''අසත්‍ය'' යන්න ලියන්න:

   a. ___________ සංඛ්‍යාව ගැන අවධානය යොමු කිරීම ආත්මික නොවේ.
   b. ___________ සභාවක් වර්ධනය නොවේ නම්, ඔවුන් ආත්මික නොවේ.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

බයිබලයේ ක්‍රියා පොත මුල් සභාවේ ගුණනය වීම පිළිබඳ කතාව පවසයි. නව ගිවිසුමේ මෙම පොත අධ්‍යයනය කිරීමට පහත සටහන පාවිච්චි කරන්න. යෙරුසලමේ සිට යුදය, සමාරිය හා පොළවේ සියලු සීමා දක්වා ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ස්වාමීන්වහන්සේ විසින් ලබාදුන් ක්‍රියා 1:8 හි සඳහන් සැළැස්ම මෙම සටහන තුළ අනුගමනය කරයි.

**ක්‍රියා පොතෙහි කර්තෘ :** ලූක්

**පොත ලියන ලද්දේ කවුරු උදෙසාද :** තියෝපිලස් වෙත නිශ්චිතව ආමන්ත්‍රණය කර තිබුණ ද එය ලියා ඇත්තේ සියලු ඇදහිලිවන්තයන් උදෙසාය.

**පොතෙහි අරමුණ :** ක්‍රියා 1:1-2 හි මෙය සඳහන් වේ. පොත තුළ අවධානය යොමු කරනුයේ යේසුස්වහන්සේගේ ඔසවා ගැනීමෙන් අනතුරුව උන්වහන්සේ තම ආත්මික ශරීරය වන සභාව තුළින් දිගටම කරගෙන ගිය හා උගන්වනු ලැබූ දේවල් පිළිබඳව වේ.

**ප්‍රධාන පදය :** ක්‍රියා 1:8

## සටහන

**හැඳින්වීම**
ක්‍රියා 1:1-11

1. හැඳින්වීම 1:1-2

    A. යොමුව : තියෝපිලස් 1:1
    B. සැලකිල්ල යොමු වනුයේ : තම ඔසවා ගැනීමෙන් අනතුරුව යේසුස්වහන්සේ තම ආත්මික ශරීරය වන සභාව තුළින් කරනු ලැබූ හා උගන්වනු ලැබූ දේවල් : 1:1-2

11. උත්ථානවීමෙන් පසු යේසුස්වහන්සේගේ සේවය 1:3

    A. කාලය : දින හතළිහයි 1:3
    B. අරමුණ : ඔප්පු කිරීමේ සාක්ෂි දැක්වීම 1:3
    C. පණිවුඩය : දෙවියන්වහන්සේගේ රාජ්‍යය 1:3

111. යේසුස්වහන්සේ අවසන් වරට තම ගෝලයන් හමුවීම 1:4-8

    A. ගෝලයන්ට දුන් ආඥාව 1:4-5
    B. ගෝලයන්ගේ ප්‍රශ්නය 1:6
    C. ගෝලයන්ට අනතුරු ඇඟවීම් 1:7
    D. ගෝලයන්ට භාරදුන් කාර්යය 1:8

1V. යේසුස්වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබීම 1:9-11.

    A. ඔසවාගැනීම පිළිබඳ විස්තරය 1:9.
    B. උන්වහන්සේගේ දෙවන පැමිණීම ප්‍රකාශ කිරීම 1:10-11.

**පළමු කොටස : යෙරුසලමේ සාක්ෂි දැරීම නිර්මාණය කිරීම.**
ක්‍රියා 1:12- 2:4

1. සාක්ෂි දැරීම නිර්මාණය කිරීම 1:12- 2:4.

   A. ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් යෙරුසලමේ බලා සිටිම 1:12-26
      1. ගෝලයන්ගේ රැස්වීම 1:12-15.
         a. ඔවුන් රැස්වූ ස්ථානය 1:12-13
         b. ඔවුන්ගේ සංඛ්‍යාව හා නම් 1:13-15
         c. ඔවුන්ගේ අරමුණ 1:14.
      2. ගෝලයන්ට දෙන ලද උපදේශය 1:15-22.
         a. කථිකයා : පේතෘස් 1:15.
         b. පණිවුඩය : 1:16-22.
            (1). පසුබිම 1:16-20.
            (2). උපදෙස් 1:21-22.
      3. ගෝලයන්ගේ ප්‍රතිචාරය 1:23-26.
         a. නම් කිරීම 1:23.
         b. යාච්ඤාව 1:14-25.
         c. තෝරාගැනීම 1:26.

   B. ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම වීම 2:1-4.
      1. අවස්ථාව 2:1.
      2. සෙනඟ 2:1.
      3. ස්ථානය : 2:1.
      4. සිද්ධිය : 2:2-4.
         a. සුළඟ : 2:2.
         b. ගිනි වැනි දිව් : 2:3.
         c. අන්‍ය භාෂාවලින් කතා කිරීම 2:4.

**දෙවන කොටස : යෙරුසලමේ සාක්ෂි දැරීම ක්‍රියාත්මක කිරීම.**
ක්‍රියා 2:5-7

1. පළමු සාක්ෂි දැරීම : 2:4-40.

   A. සාක්ෂි දැරීම සිදු කළ ආකාරය :2:4-8.
   B. සාක්ෂි දැරීමට දැක්වූ ප්‍රතිචාරය : 2:7-13.
   C. පේතෘස්ගේ දේශනාව 2:14-36.
      1. කාලය පිළිබඳ අනාගතවාක්‍යය : 2:17.
      2. ආත්මය පිළිබඳ අනාගත වාක්‍ය 2:17-18.
      3. සිද්ධිය පිළිබඳ අනාගත වාක්‍ය 2:19-20.
      4. ගැළවීම පිළිබඳ අනාගත වාක්‍ය : 2:21.
      5. යේසුස්වහන්සේගේ කාර්යය : 2:22-36.
         a. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ විසින් ඒත්තු ගන්වනු ලැබ තිබේ. 2:22.
         b. යේසුස්වහන්සේ කුරුසපත් කරනු ලැබීය 2:23.
         c. යේසුස්වහන්සේ මරණින් නැගිටුණු සේක : 2:24-32.
         d. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණතින් උසස් කර තිබේ: 2:33-35.
         e. යේසුස්වහන්සේ දැන් ස්වාමින්වහන්සේ හා ක්‍රිස්තුස්වහන්සේය : 2:36.

   D. පණිවුඩය සඳහා ප්‍රතිචාරය : 2:37-40.
      1. වරද වටහා ගැනීම : 2:37.
      2. සොයා බැලීම : 2:37.
      3. උපදෙස් : 2:38.
      4. පොරොන්දු : 2:38-39.

5. අනුශාසනය : 2:40.

11. පළමු ප්‍රාදේශිය සභාව : 2:41-47.

A. පළමු සභාවේ සාමාජිකත්වය : 2:41.
1. ඔවුන්ගේ අනන්‍යතාව : ඔව්හු වචනය ලබාගත්හ.
2. ඔවුන්ගේ සංඛ්‍යාව : 3,000.
B. පළමු සභාවේ ආත්මික චාරිත්‍ර : 2:42.
1. අපෝස්තළුවරුන්ගේ ධර්මය.
2. ශුද්ධවන්තයන්ගේ සහභාගිත්වය.
3. ශුද්ධ වු සහභාගිකම.
4. යාච්ඥාව.
C. පළමු සභාවේ ජිවන රටාව : 2:44-46.
1. ස්වෙච්ඡාවෙන් පොදුවේ තබා ගැනීමේ ක්‍රමය : 2:44-45.
2. දිනපතා නමස්කාරය හා සාක්ෂි දැරීම : 2:46.
3. නිවැස්වල සහභාගිත්වය : 2:46.
4. එක්සත්කම : 2:46.
D. ප්‍රාදේශිය සභාවේ සාක්ෂිදැරීම : 2:46-47.
1. සාක්ෂිදැරීමේ ස්වභාවය : 2:46-47.
2. සාක්ෂිදැරීමේ ප්‍රතිඵල : 2:47.

111. පළමු භාස්කම : 3:1-26.
A. භාස්කම විස්තර කිරීම : 3:1-11.
1. පසුබිම : 3:1.
2. මනුෂ්‍යයා හා ඔහුගේ අවශ්‍යතාව : 3:2-3.
3. පණිවුඩය : 3:4-6.
4. භාස්කම : 3:7-8.
5. සමුහයාගේ ප්‍රතිචාරය : 3:9-11.
B. භාස්කම තේරුම් කිරීම : 3:12-18.
1. මනුෂ්‍යයා සුවය ලැබුවේ ප්‍රේරිතයින්ගේ බලයෙන් නොවේ : 3:12.
2. මනුෂ්‍යයන් සුව කරනු ලැබුවේ දෙවියන්වහන්සේ විසින් වූ අතර උන්වහන්සේගේ අරමුණ යේසුස්වහන්සේ මහිමයට පත් කිරීමයි : 3:13-15.
3. මනුෂ්‍යයා සුවය ලැබුවේ යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි වූ ඇදහිල්ලෙනි : 3:16.
4. මනුෂ්‍යයා සුවය ලැබුවේ අනාගතවාක්‍ය ඉෂ්ඨ වීම නිරූපණය කිරීම උදෙසාය : 3:17-18.
C. පේතෘස්ගේ පණිවුඩය : 3:19-26.
1. පේතෘස් විසින් දුන් පොරොන්දුව : 3:19-21.
a. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලයට දුන් අභියෝගය : 3:19.
b. තමන්වහන්සේ විසින් කරන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ දෙය : 3:19-21.
2. දිවැසිවරුන්ගේ අනාගතවාක්‍ය : 3:22-26.
a. මෝසෙස් හා දිවසිවරුන් පැවසූ අනාගතවාක්‍ය : 3:22-24.
b. ගිවිසුමේ පොරොන්දුව : 3:25.
c. මෙසියස්වහන්සේ පිළිබඳ සැළැස්ම : 3:26.
1V. පළමු විරුද්ධ වීම : 4:1-31.
A. අත් අඩංගුවට ගැනීම : 4:1-4.
1. විරුද්ධ වීමේ මූලාශ්‍රය : 4:1
2. විරුද්ධ වීමේ හේතුව : 4:2.
3. විරුද්ධ වූ ආකාරය : 4:3.
B. නඩු ඇසීම : 4:5-14.
1. අධිකරණය : 4:5-6.
2. අධිකරණය විසින් ඇසූ ප්‍රශ්න : 4:7.
3. පේතෘස් විසින් කළ ප්‍රකාශය : 4:8-12.

a. ඔහුගේ පිළිතුරේ මූලාශ්‍රය : 4:8.
b. ඔහුගේ පිළිතුර 4:9-10.
c, යේසුස්වහන්සේ හා ගැළවීම පිළිබඳ ඔහුගේ සාක්ෂිය : 4:10-12.
4. අධිකරණය විසින් ඔහුගේ සාක්ෂිය සැළකීම : 4:13-14.
a. සාක්ෂිකරුවන්ගේ චරිතය : 4:13.
b. සුවය ලද මනුෂ්‍යයාගේ සාක්ෂිය : 4:14.
5. තීරණය : 4:15-22.
a. තොරතුරු විමසීම : 4:15-17.
b. තීරණය : 4:17-18.
c, පේතෘස්ගේ හා යොහන්ගේ ප්‍රතිචාරය : 4:19-20.
d. නිදහස් කිරීම : 4:21-22.
6. ප්‍රතික්‍රියාව 4:21-31
a. සභාවේ යාච්ඤාව : 4:23-30.
b. සභාවේ ක්‍රියාකාරකම : 4:31.

V. පාපය පිළිබඳ පළමු විනය : 4:32-5:16.
A. සභාව සංවිධානය කිරීම : 4:32-37.
1. එහි සහභාගිත්වය : 4:32.
2. එහි සාක්ෂිය : 4:33.
3. එහි ආර්ථිකය : 4:32-37.
B. සහභාගිත්වයට බාධා කළ පළමු පාපය : 5:1-10.
1. පාපය : 5:1-2.
2. පාපය අනාවරණය වීම : 5:3-4.
3. පාපය ගැන විනය ක්‍රියාමාර්ග ගැනීම : 5:5-10.
C. විනය ක්‍රියා ගැනීමේ ප්‍රතිඵල : සහභාගිත්වයේ සඵලවත් සාක්ෂිදැරීම : 5:11-16.
1. සාමාජිකයන්ගේ ගෞරවනීය ආකල්ප : 5:11.
2. ඒකත්වය : 5:12.
3. පුදුම ලකුණු : 5:12, 15-16.
4. ප්‍රජාවේ ප්‍රතිචාරය : 5:12-14.

V1. පළමු පීඩා කිරීම : 5:17-43.
A. විරුද්ධ වීමේ මූලාශ්‍රය : 5:17.
B. විරුද්ධ වීමේ ක්‍රියාව : 5:18.
C. දෙවියන්වහන්සේ විසින් ගළවා ගැනීම : 5:19-26.
1. උන්වහන්සේගේ ක්‍රියාව : 5:19.
2. උන්වහන්සේගේ ආඥාව : 5:20.
3. උන්වහන්සේගේ ආඥාවට දැක්වූ ප්‍රතිචාරය : 5:21.
4. උන්වහන්සේගේ ක්‍රියාව සොයා ගැනීම : 5:21-23.
5. උන්වහන්සේගේ ක්‍රියාවේ ප්‍රතිඵල : 5:24-26.
D. නඩු ඇසීම : 5:27-40.
1. සෙන්හැන්ඩ්‍රින් සභාව මඟින් චෝදනා ගොනු කිරීම : 5:27-28.
2. පේතෘස් විසින් ඉදිරිපත් කරන ලද විත්තිවාචකය : 5:29-32.
3. සෙන්හැන්ඩ්‍රින් සභාව මඟින් පවත්වන ලද පරීක්ෂණ : 5:33-39.
4. සෙන්හැන්ඩ්‍රින් සභාවේ තීරණයේ අයුක්තිසහගත බව : 5:40
E. පීඩා කිරීමට ප්‍රතිචාර දැක්වීම : 5:41-42.
1. ප්‍රීතිවීම : 5:41.
2. එක්සත්කම : දිනපතා එකම හමුවීම : 5:42.
3. සාක්ෂිදැරීම : ඉගැන්වීම හා දේශනා කිරීම : 5:42.

V11. පළමු සංවිධානය : 6:1-7.
A. සංවිධානයක අවශ්‍යතාව : 6:1.
B. යෝජනා කරන ලද සංවිධානය : 6:2-4.
1. යෝජනාව ඉදිරිපත් කළ මූලාශ්‍රය : 6:2.

2. යෝජනාව සඳහා හේතුව : 6:2.
3. යෝජනාව : 6:3.
4. යෝජනාවේ වාසිය : 6:4.

C. සංවිධානය පිහිටුවීම : 6:5-6.
1. පාවිච්චි කළ ක්‍රමය : 6:5-6.
2. තෝරාගත් මනුෂ්‍යයන් : 6:5.
3. ඔවුන් පත්කිරීම : 6:6.

D. සංවිධානයේ ප්‍රතිඵල : 6:7.
1. වචනය වර්ධනය විය : 6:7.
2. ගෝලයන් ගුණනය විය : 6:7.
3. ඇදහිල්ලට කීකරුවීම : 6:7.

V111. පළමු වේදසාක්ෂිකාරයා : 6:8-8:1.

A. ස්තේපන් පිළිබඳ විස්තරය : 6:3-15.
1. හත් දෙනාගෙන් අයෙක් : 6:3,5.
2. ශුද්ධාත්මයෙන් පූර්ණ වූ අයෙක් : 6:5.
3. යහපත් පිළිගැනීමක් තිබූ මනුෂ්‍යයෙක් : 6:3.
4. ඇදහිල්ලේ මනුෂ්‍යයෙක් : 6:5.
5. ප්‍රඥාවේ මනුෂ්‍යයෙක් : 6:3,10.
6. විශේෂ බලයක් තිබූ මනුෂ්‍යයෙක් : 6:8.
7. බලපෑමක් කළ හැකි ආකාරයේ සාක්ෂිකාරයෙක් : 6:9-10.

B. ස්තේපන්ට පීඩා කිරීම : 6:11-15.

C. ස්තේපන්ගේ පණිවුඩය : 7:1-53.
1. ආබ්‍රහම් : 7:1-8.
2. ආදි පිතෘවරු : 7:9-16.
3. මෝසෙස් : 7:17-43.
   a. ඊජිප්තුවේදී : 7:17-28.
   b. පාළුකරයේදී : 7:29-43.
4. කූඩාරම : 7:44-50.
   a. මෝසෙස්ගේ : 7:44.
   b. යොෂුවාගේ : 7:45
   c, දාවිත්ගේ : 7:45-46.
   d. සාලමොන්ගේ : 7:47-50.
   e. දෙවියන්වහන්සේගේ : 7:48-50.
5. දිවැසිවරු : 7:51-53.

D. ස්තෙපන්ගේ සාක්ෂිදැරීම : 7:54-8:1.
1. මන්ත්‍රණ සභාවේ ආකල්පය : 7:54.
2. ස්තේපන් විසින් කළ නිවේදනය : 7:55-56.
3. මන්ත්‍රණ සභාවේ ක්‍රියාව : 7:57-59.
4. ස්තේපන්ගේ මරණය : 7:59- 8:1.

## තෙවන කොටස : යුදයේ හා සමාරියේ සාක්ෂිදැරීම.
ක්‍රියා 8-12.

1. වෙනස්වීම : ස්තේපන්ගේ මරණයේ ප්‍රතිඵල : 8:1-4.

A. පීඩා කිරීම : 8:1,3.

B. ස්තේපන්ව භූමිදාන කිරීම : 8:2.

C. සභාවේ සාක්ෂිදැරීම ව්‍යාප්ත වීම : 8:4.

11. පිලිප්ගේ සාක්ෂිදැරීම : 8:5-40.

A. සමාරියේ සේවය : 8:5-25.
1. පිලිප්ගේ සාක්ෂිදැරීම : 8:5-13.

a. පිලිප්ගේ කාර්යය : 8:5-7, 12.
b. සමාරිතයන්ගේ ප්‍රතිචාරය : 8:6-12.
c. මායාකාර සීමොන් : 8:9-13.

2. පේතෘස්ගේ හා යොහන්ගේ කාර්යය : 8:14-17.
a. පේතෘස්ගේ හා යොහන්ගේ පැමිණීම : 8:14.
b. ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම : 8:15-17.
c, සීමොන්ගේ ප්‍රතිචාරය : 8:18-19.
d. සීමොන්ගේ අනතුරු ඇඟවීම : 8:20-24.

B. ඉතියෝපියානු ජාතිකයාට කළ සේවය : 8:26-40.
1. සූදානම්වීම : 8:26-28.
2. සාක්ෂිදැරීම : 8:29-35.
3. ප්‍රතිචාරය : 8:36-38.

C. අසෝතයට ගෙනයනු ලැබීම : 8:39-40.

111. සාවුල්ගේ සාක්ෂිදැරීම : 9:1-31.

A. සාවුල්ගේ හැරීම : 9:1-9.
1. ඔහුගේ අරමුණ : 9:1-2.
2. ඔහුගේ දර්ශනය : 9:3-9.
3. හඬ : 9:4-7.
4. අන්ධභාවය : 9:8-9.

B. අනනියස් තුළින් සාවුල්ට කාර්ය පැවරීම : 9:10-19.
1. කැඳවීම : 9:10-16.
2. පැවරීම : 9:17-19.

C. සාවුල්ගේ මෙහෙය : 9:20-31.
1. සාවුල් දමස්කයේ සිටීම : 9:20-25.
a. ඔහුගේ සාක්ෂිය : 9:20-22.
b. ප්‍රතිචාරය : 9:21-23.
c. ඔහුගේ පළායාම : 9:23-25.
2. සාවුල් යෙරුසලමේ සිටීම : 9:26-30.
a. ඔහුව පිළිගැනීම : 9:26-28.
b. ඔහුගේ ක්‍රියාකාරකම : 9:28-29
c. ඔහුගේ වෙන්වීම : 9:29-30

D. වර්ධනය වීම : සභාවට විවේක කාලයක් : 9:31.

1V. පේතෘස්ගේ සාක්ෂිදැරීම : 9:32-12:35.

A. ලිද්දා හිදී : 9:32-35.
1. ඇදහිලිවන්තයන් 9:32.
2. රෝගී මිනිසා : 9:33.
3. රෝගී මිනිසා සුව කිරීම : 9:34.
4. ප්‍රතිචාරය : 9:35.

B. යොප්පාවේදී : 9:36-43.
1. දෝර්කස්ගේ මරණය : 9:36-37.
2. පේතෘස්ගේ කැඳවීම : 9:38-39.
3. පේතෘස්ගේ මෙහෙය : 9:40-41.
4. මෙහෙය සඳහා ප්‍රතිචාරය : 9:42-43.

C. කායිසාරියේදී : 10:1-48.
1. කොර්නේලියස්ගේ දර්ශනය : 10:1-8.
a. කොර්නේලියස් නම් මිනිසා : 10:1-2.
b. කොර්නේලියස්ගේ දර්ශනය : 10:3-6
c. කොර්නේලියස්ගේ ප්‍රතිචාරය : 10:7-8.

2. පේතෘස්ගේ දර්ශනය : 10:9-22.
   a. දර්ශනය : 10:9-12.
   b. කටහඬ : 10:13-16.
3. පණිවුඩකරුවන්ගේ පැමිණීම : 10:17-22.
4. කොර්නේලියස්ගේ නිවසට පැමිණීම : 10:23-48.
   a. ගමන : 10:23
   b. පිළිගැනීම : 10:24-27.
   c. පැහැදිලිකිරීම : 10:27-28.
   d. ප්‍රශ්නය : 10:29.
   e. පිළිතුර : 10:30-33.
   f. අවසන් නොවූ දේශනාව : 10:34-43.
      (1). දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම බලන අයෙක් නොවේ : 10:34-35.
      (2). ශුභාරංචිය ව්‍යාප්ත කිරීම : 10:36-37.
      (3). ශුභාරංචි පණිවුඩය : 10 :38-43.
   g. කොර්නේලියස්ගේ ප්‍රතිචාරය : 8:44-48.

D. යෙරුසලමේදී : 11:1-12:25.
1. අන්‍යජාතීන් හැරීම පිළිබඳ ප්‍රශ්නය : 11:1-18.
   a. ප්‍රශ්නය :11:1-3.
   b. අන්‍යජාතීන් අතර දෙවියන්වහන්සේගේ කාර්යය පිළිබඳ පැහැදිලි කිරීම : 11:4-17.
      (1). දර්ශනය :11:4-10.
      (2). අමුත්තන් :11:11
      (3). බැහැදැකීම 11:12-16.
   c. තීරණය : 4:18.

V. සිරියාවේ අන්තියෝකියෙහි සභාව : 11:19-30.
A. අන්තියෝකියෙහි ශුභාරංචිය ප්‍රකාශ කිරීම : 11:19-21.
B. බාර්ණබස්ගේ පැමණීම : 11:22-24.
C. සභාපාලකවරයා - ගුරුවරයා ලෙස සාවුල් තෝරා ගැනීම : 11:25-26.
D. අගබස් විසින් එළිදරව් කරන ලද තොරතුරු : 11:27-30.

V1. හෙරොද් විසින් මෙහෙයවන ලද පීඩාවන් 12:1-25.
A. යාකොබ් මරා දැමීම : 12:1-2.
B. පේතෘස් අත්අඩංගුවට ගැනීම : 12:3-4.
C. පේතෘස් ගළවා ගැනීම : 12:5-19.
D. හෙරොද්ගේ මරණය : 12:20-23.

V11. දේව වචනය ප්‍රකාශ කිරීම : 12:24-25.

**හතර වන කොටස : පොළොවේ සියලු සීමාවන් දක්වා සාක්ෂි දැරීම.**

ක්‍රියා 13-28.

1. පළමු ධර්මදූත ගමන : 13:1-14:28.
A. මෙහෙය සඳහා කැඳවීම : ක්‍රියා 13:1-3.
B. කුප්‍රසයේ පාපස් හි සේවය 13:4-12.
C. පිසිදියේ අන්තියෝකියේ සේවය 13:13-50.
1. පිසිදියට ගමන් කිරීම. 13:13-16.
2. පණිවුඩය 13:17-37.
   a. නික්මයාම පොතෙහි දක්වන ගළවා ගැනීම 13:17.

b. පාඵකරයේ ගමන් කිරීම 13:18
c. කානාන් දේශය අත්පත් කරගැනීම 13:19.
d. සාවුල්ගේ හා දාවිත්ගේ පාලනය : 13:20-23.
e. යොහන් බව්තීස්තගේ මෙහෙය : 13:24-25.
f. යේසුස්වහන්සේගේ කුරුසපත් කිරීම හා උත්ථානය : 13:26-37.
g. ආරාධනය :13:38-41.
3. ප්‍රතිචාරය : 13:42-50.
D. ඉකොනියෙහි සේවය : 13:51-14:5.
E. ලුස්ත්‍රාවේ සේවය : 14:6-25.
F. සිරියාවේ සේවය : 14:26-28.

11. යෙරුසලමේ පැවැත්වූ මන්ත්‍රණ සභාව : 15:1-35.
A. ප්‍රශ්නය : 15:1-3.
B. සැසිවාර :15:4-21.
1. පළමු ප්‍රසිද්ධ සැසිවාරය : 15:4-5.
2. ප්‍රේරිතයන්ගේ හා වැඩිමහල්ලන්ගේ පෞද්ගලික සැසිවාරය :15:6.
3. දෙවන ප්‍රසිද්ධ සැසිවාරය 15:7-21.
a. පේතෘස්ගේ වාර්තාව : 15:7-11.
b. පාවුල්ගේ හා බාරණබස්ගේ වාර්තාව : 15:12.
c. යාකොබ්ගේ වාර්තාව : 15:13-21.
C. තීරණය : 15:19-21.
D. ලිපි : 15:22-35.

111. දෙවන ධර්ම දූත ගමන : 15:36-18:22.
A. විවාදය :15:36-41.
B. ලුස්ත්‍රාවේ සේවය : 16:1-5.
C. ත්‍රෝවසයේ සේවය : 16:6-10.
D. පිලිප්පියේ සේවය : 16:11-40.
E. තෙසලෝනිකයේ සේවය : 17:1-9.
F. බෙරීයේ සේවය : 17:10-14.
G. ඇතැන්ස්හි සේවය :17:15-34.
H. කොරින්තියේ සේවය : 18:1-18.
I. එපීසියේ සේවය : 18:19-21.
J. යෙරුසලම සහ අන්තියෝකිය 18:22.

1V. තෙවන ධර්මදූත ගමන : 18:23-21:14
A. සුළු ආසියාව :18:23.
B. එපීසියේ සේවය :18:24-19:41.
1. අපොල්ලස් : 18:24-28.
2. යොහාන්ගේ ගෝලයෝ : 19:1-7.
3. තුරානයන්ගේ ශිල්ප ශාලාව : 19:8-12.
4. ස්කෙවාගේ පුතුන් : 19:13-17.
5. හැරුණු අය කැප කිරීම : 19:18-20.
6. තීරණය :19:21.
7. දෙමිත්‍රියස්ගේ ආරක්ෂකයෝ : 19:23-41.
C. මෙසදෝනියේ හා ග්‍රීසියේ සේවය : 20:1-5.
D. ත්‍රෝවසයේ සේවය : 20:6-12.
E. මිලේතසයේ සේවය : 20:13-38.
1. ගමන : 20:13-16.
2. එපීසියේ සිට පැමිණි වැඩිමහල්ලන් මුණගැසීම : 20:17-35.
a. ඔහුගේ සේවය යළි සළකා බැලීම : 20:17-21.
b. අනාගතයට මුහුණදීම : 20:22-24.

- c. පාවුල්ගේ හෘදසාක්ෂිය : 20:25-27.
- d. අනතුරු ඇඟවීම 20:28-31.
- e. දෙවියන්වහන්සේට භාරවීම : 20:32.
- f. සේවය කිරීමේ පාවුල්ගේ ආදර්ශය : 20:33-35.

3. සමුගැනීම : 20:36-38.

F. තීර් හි සේවය : 21:1-6.
G. තොලිමයිසියෙහි සේවය : 21:7.
H. කායිසාරියේ සේවය 21:8-14.

V. අවසන් වරට යෙරුසලමට යාම සහ රෝමයට ගිය ගමන : 21:15- 28:31.

A. යෙරුසලම : 21:15-23:32.

1. යෙරුසලමට පැමිණීම 21:15-17.
2. පාවුල්ට විරුද්ධව පතුරුවනු ලැබූ ආරංචි : 21:18-30.
   - a. ඔහු මෝසෙස්ගේ ව්‍යවස්ථාවට අපහාස කර තිබේ : 21:18-26.
   - b. ඔහු දේවමාලිගය අපවිත්‍ර කර තිබේ : 21:27-30.
3. පාවුල්ගේ ප්‍රතික්‍රියාව 21:23-26.
4. පාවුල් ගලවා ගැනීම : 21:30-32.
5. පාවුල්ගේ ප්‍රතිචාරයන් : 21:33-23:10.
   - a. යුදෙව් සෙනඟ : 22:1-23.
   - b. රෝම ශතාධිපතියා : 22:24-26.
   - c. ප්‍රධාන අධිපතියා : 22:26-30.
   - d. සෙන්හැන්ඩ්‍රින් සභාව : 23:1-10.
     - (1). සාවුල් විසින් කළ ප්‍රකාශය :23:1.
     - (2). උත්තම පූජකයා සමග සම්මුඛ වීම : 23:2-5.
     - (3). බෙදුනු අධිකරණය : 23:6-10.
6. පාවුල්ට ලැබුණු එළිදරව්කිරීම :23:11.
7. පාවුල්ගෙන් පළිගැනීම :23:12-15.
8. පාවුල් බේරා ගැනීම : 23:16-32.
   - a. කුමන්ත්‍රණය හෙළිවීම : 23:16-22.
   - b. ලිපිය : 23:25-30.
   - c. ගැලවී යාම : 23:32.

B. කායිසාරිය : 23:33-26:32.

1. පීලික්ස් ඉදිරියේ සිටීම : 23:33-24:27.
   - a. තෙර්තුලස්, විසින් වරදට පත් කිරීම : 24:1-9.
   - b. පාවුල්ගේ පිළිතුර 24:10-21.
   - c. ෆීලික්ස්ගේ ප්‍රතිචාරය : 24:22-27.
2. පෙස්තුස් ඉදිරියේ සිටීම : 25:1-12.
3. පෙස්තුස් සහ අග්‍රිපා : 25:13-27.
   - a. පාවුල් තමන් උදෙසා කතා කිරීම : 26:1-23.
   - b. ගැළවුම්කරු වෙත ආරාධනය : 26:24-29.
   - c. තීන්දුව : 26:30-32.

C. රෝමයට යන අතරමගදී : 27:17-28:31.

1. කුණාටුව : 27:1-44.
2. සර්පයා : 28:1-6.
3. සුවය ලැබීම : 28:7-10.
4. ගමන දිගටම යාම : 28:11-15.

D. රෝමය : 28:16-31.

1. යුදෙව්වන් හමුවීම : 28:16-29.
2. සේවය : 28:30-31.

# තෙවන පරිච්ඡේදය

## ගුණනය වීම පිළිබඳ උපමා කතා

### අරමුණු

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "උපමාව" යන වචනය නිර්වචනය කිරීමට
- යේසුස්වහන්සේ උපමා කතා පාවිච්චි කළේ ඇයිදැයි පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේ ඉගැන්වූ උපමා කතා තුළ ඇති ගුණනය වීම පිළිබඳ ප්‍රතිපත්ති හඳුනා ගැනීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කී සේක. (මාර්ක් 4:33)**

## හැඳින්වීම

පොළොවේ තමන්වහන්සේගේ සේවය කළ කාලය තුළ යේසුස්වහන්සේ විසින් උගන්වන ලද ගුණනය වීමේ ප්‍රතිපත්ති පිළිබඳව මෙම පාඩම තුළ අවධානය යොමු කරයි. උපමා කතාවක් යනු ආත්මික සත්‍යයක් නිරූපණය කිරීමට ස්වාභාවික ලෝකයේ උදාහරණයක් යොදා ගන්නා කතාවකි.

"උපමාව" යන පදයේ සැබෑ අර්ථය "පසෙකින් තැබීම, සංසන්දනය කිරීම" වේ. උපමාවලදී, යේසුස්වහන්සේ ආත්මික සත්‍යයන් ස්වාභාවික උදාහරණ හා සංසන්දනය කළ සේක. උපමාවක් යනු ස්වර්ගික අර්ථයක් ඇති ලෞකික කතාන්දරයකි.

## උපමා යොදාගන්නේ මන්ද?

ආත්මික සත්‍යයන් ඉගැන්වීමට උපමා යොදා ගන්නේ මන්දැයි ගෝලයෝ වරක් යේසුස්වහන්සේගෙන් ඇසූහ:

> **එවිට ගෝලයෝ ඇවිත් ඔබවහන්සේ ඔවුන්ට උපමාවලින් කතා කරන්නේ මක්නිසාදැයි ඇසුවෝය. (මතෙව් 13:10)**

යේසුස්වහන්සේ මෙසේ පිළිතුර දුන් සේක:

> **...ස්වර්ග රාජ්‍යයේ රහස් දැනගැනීම නුඹලාට දී තිබේ. නුමුත් ඔවුන්ට දීලා නැත (මතෙව් 13:11).**

ගෝලයන්ට ආත්මික මනසක් තිබූ බැවින් උපමා කතා තුළින් ඉගැන්වූ ආත්මික සත්‍යයන් වටහා ගැනීමේ හැකියාව ගෝලයන්ට දී තිබුණි. ආත්මික මනසක් නොතිබුණු අය උපමාවලට සවන් දුන් නමුත් ඒවා තේරුම් ගැනීමට අසමත් වූහ. ආත්මික සත්‍යයන් තේරුම් ගත හැක්කේ ආත්මික මනසකට පමණි.

> **නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

ආත්මික මනසක් ඇති මනුෂ්‍යයා යනු ආත්මිකව නැවත ඉපදීම ලද අයෙකි. ආත්මික මනසක් ඇති අය උපමා කතා තුළ ඇති ප්‍රතිපත්ති තේරුම් ගනිති. ලෞකික, පව්කාර මනසක් ඇති අයට තේරුම් ගත නොහැක.

## රාජ්‍යයේ ශුභාරංචිය

ශුභාරංචි පණිවුඩය ලෝකයට ගෙන යන ලෙස යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට ආඥා කරන විට, උන්වහන්සේ මෙසේ කී සේක:

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

ඔබ ලෝකයට පැතිරිය යුතු ශුභාරංචිය නම් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචියයි. එහි පණිවිඩය තුළ යේසුස්වහන්සේගේ උපත, ජීවිතය හා සේවය පිළිබඳව අන්තර්ගත වේ. එසේම සියලු මනුෂ්‍යයාගේ පාපය උදෙසා යේසුස්වහන්සේගේ මරණයත් නැවත නැගිටීමත් එහි ඇතුළත් වේ. ආත්මික නැවත උත්පාදනය තුළින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන්නේ කෙසේද යන්න ඔබ මනුෂ්‍යයන්ට පැවසිය යුතු අතර රාජ්‍යයේ නව ජීවිතය තුළ ජීවත් විය යුතු ආකාරය ඔවුන්ට ඉගැන්විය යුතුය.

## ගුණනය වීම පිළිබඳ උපමා කතා

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිළිබඳ උපමා කතා රැසක් පැවසූ සේක. දේව රාජ්‍යය ලෝකය පුරා ව්‍යාප්ත වන්නේ කෙසේද යන්න දැක්වෙන උපමා ඒවා අතර විය. රාජ්‍යයේ වර්ධනය පිළිබඳ උපමා කතා ගුණනය වීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති එළිදරව් කරයි. සෑම බයිබල් කොටසක්ම ඔබේ බයිබලයෙන් බලමින් උපමා කතාව කියවන්න. :

| | | |
|---|---|---|
| **නැති වූ බැටළුවා** | : | මතෙව් 18:12-14, ලූක් 15:4-7 |
| **නැති වූ කාසිය** | : | ලූක් 15:8-10 |
| **නැති වූ පුත්‍රයා** | : | ලූක් 15:11-32 |

විනාශ වන්නාවූ අය ගැන දෙවියන්වහන්සේ දක්වන සැලකිල්ල හා ඔවුන්ව දේව රාජ්‍යයට ගෙන ඒම සඳහා ඔබ කෙතරම් ඉක්මණින් ඔවුන් සොයා යා යුතුද යන්න මෙම උපමා තුළින් එළිදරව් කරයි. ඔවුන් නැති වී ඇත්තේ ඇයිද යන්න වැදගත් නොවේ. බැටළුවාට මඟ වැරදී ඇත. කාසිය නැතිවූයේ නොසැලකිල්ල හේතුවෙනි. පුත්‍රයා නැතිවූයේ ඔහුගේම කැරලිකාර කම නිසාය. පාපයේ නැති වී සිටින අය සොයා ගැනීමට ඔබ හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය. ඔවුන් ඔබ වෙතට පැමිණෙන තුරු නොසිට ඔවුන් සිටින ස්ථානයට ඔබ යා යුතුය. දෙවියන්වහන්සේ සැලකිලිමත් වන්නේ මිනිසුන් නැතිවූයේ කෙසේද යන්න පිළිබඳව නොවේ. උන්වහන්සේ සලකන්නේ ඔවුන් සොයා ගත යුතු බව පමණි.

"දේව රාජ්‍යයේ ජීවත් වීම" යන හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලාව තුළ මෙම විෂය සම්බන්ධව තවදුරටත් උපදෙස් දී තිබේ.

**හිස් වූ මංගල මේසය : ලූක් 14:15-23**

ශුභාරංචිය පිළිබඳ ආරාධනාවට ඇතැම් අය ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කළ පමණින් ගුණනය වීම නැවැත්විය යුතු නොවේ. ආත්මිකව කුසගින්නේ සිටින අය සොයමින් ඔවුන්ව දෙවියන්වහන්සේ විසින් සූදානම් කර ඇති මංගල්‍ය මේසය වෙත ගෙන ඒම ඔබ විසින් කළ යුතුය.

**ඵල නැති අත්තික්කා ගස : ලූක් 13:6-9**

යේසුස්වහන්සේ ඵල නැති අත්තික්කා ගසක් පිළිබඳව උපමාවක් වදාල සේක. අත්තික්කා ගස ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳව ස්වාභාවික උදාහරණයකි. ලෝකයට ඉශ්‍රායෙලය තුළින් දේව රාජ්‍යය පෙන්විය හැකිවන ලෙස දෙවියන්වහන්සේ ජාතියක් ලෙස එය නඟා සිටෙවූ සේක. සැබෑ වූ

දෙවියන්වහන්සේ පිළිඳව සත්‍යය බෙදා ගැනීමෙන් ඉශ්‍රායෙලය නමැති "ගස" අන්‍ය ජාතීන් අතර "ඵල දැරීමට" සැලැස්වීමට දෙවියන්වහන්සේ උත්සාහ කළ සේක. නමුත් ඉශ්‍රායෙලය වඳව හා ඵල නොදරමින් පැවතිය.

දැන් දෙවියන්වහන්සේ මේ අරමුණ උදෙසා සභාව නැගිටුවා තිබේ. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට කළාක් මෙන් ඇදහිලිවන්තයන් ඵල දරන පිණිස උන්වහන්සේ ඔවුන්ව හැඩ ගස්වන සේක. උන්වහන්සේගේ අරමුණ සමානය. සැබෑ වූ දෙවියන්වහන්සේ පිළිබඳව අපට ඇති දැනුම බෙදා ගනිමින් අපි අන්‍ය ජාතීන් අතර ඵලදැරිය යුතුය. ඵල නොදරන ගස් පිළිබඳව දෙවියන්වහන්සේ ප්‍රසන්න නොවේ.

| | | |
|---|---|---|
| **තලෙන්ත** | : | මතෙව් 25:14-30, ලූක් 19:11-27 |
| **දිගු ගමනක් ගිය මනුෂ්‍යයා** | : | මාර්ක් 13:34-37 |
| **දාසයන්** | : | මතෙව් 24:43-51, ලූක් 12:39-46 |
| **අවදිව සිටින දාසයන්** | : | ලූක් 12:36-38 |
| **විශ්වාසවන්ත දාසයා** | : | මතෙව් 25:14-30 |

ඇදහිලිවන්තයන්ට භාර දී ඇති දේව රාජ්‍යය පිළිබඳ පණිවුඩයේ ප්‍රඥාවන්ත ගබඩාකාරකම ගැන මෙම "දාසයන්" පිළිබඳ උපමාවන් විස්තර කරයි. ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේදී යොදා ගැනීම සඳහා සෑම ඇදහිලිවන්තයෙකුටම "තලෙන්ත" හෝ විශේෂ හැකියාවන් දී තිබේ. ඔබේ හැකියාවන් කුඩා වුවත් විශාල වුවත් දෙවියන්වහන්සේ ඔබට දී ඇති දේ ඔබ ගුණනය කළ යුතුය.

සෑම සේවකයෙකුම ගුණනය විය යුතුය. යේසුස්වහන්සේ යළි පොළොවට පැමිණෙන විට තම හැකියාවන් නිසි ලෙස පාවිච්චි කළ අයට ඒ සඳහා විපාක ලැබෙනු ඇත (ලූක් 16:10-12). ගුණනය වී නැති අය අවිශ්වාසවන්ත අය ලෙස සලකනු ඇත.:

> **මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා තමන් පියාණන්වහන්සේගේ තේජසින් යුක්තව තමන් දූතයන් සමඟ එන්නේය. එකල උන්වහන්සේ එකිනෙකාට තම තමාගේ ක්‍රියා ලෙස විපාක දෙන සේක. (මතෙව් 16:27)**

ගුණනය වීමේ ක්‍රියාවලිය තුළ ප්‍රතිශත මූලධර්මය යේසුස්වහන්සේ විසින් හඳුනා ගත් සේක.

> **නුමුත් නොදැන, පහර ලැබීමට සුදුසු දේ කළාවූ අය පහර ස්වල්පයක් ලබන්නේය. යමෙකුට බොහෝ දේ දෙන ලද්දේද ඔහුගෙන් බොහෝ දේ අය කරනු ලබන්නේය. යමෙකුට බොහෝ දේ භාර දෙන ලද්දේද ඔහුගෙන් වඩා ඉල්ලනු ලබන්නේය. (ලූක් 12:48)**

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ව්‍යාප්ත වන්නේ දෙවියන්වහන්සේ විසින් දී ඇති තලෙන්ත ප්‍රඥාවන්ත ලෙස පාවිච්චි කිරීමෙන්ය. දෙවියන්වහන්සේ ඔබට දී ඇති දේවල් ඔබ පාවිච්චි කළහොත් ඔබගේ තලෙන්ත වැඩි දියුණු වනු ඇත. ඔබ එය පාවිච්චි නොකළහොත් ඔබට එය අහිමි වනු ඇත.

**වපුරන්නාගේ උපමාව:** මතෙව් 13:3-8, මාර්ක් 4:3-8, ලූක් 8:5-8

රාජ්‍යයේ ශුභාරංචිය ව්‍යාප්ත වන්නේ දේව වචනය නමැති බීජය වැපිරීමෙනි. වචනයෙන් තොරව ගුණනය වීමක් පැවතිය නොහැකිය. ඵලය රඳා පවතින්නේ බීජය තුළ ඇති ජීවය (දේව වචනය) හා පසෙන් ලැබෙන ප්‍රතිචාරය (දේව වචනයට මිනිසා දක්වන ප්‍රතිචාරය) මතය. මෙම වචනය වැපිරීමට විවිධ ප්‍රතිචාර ලැබිය හැකිය.

ඔබේ වගකීම නම් වැපිරීමය. ඔබ දේව වචනය නමැති බීජය වපුරන විට ඇතැම් පස් සූදානමින් ඇති අතර අස්වැන්න ලබා දෙයි. තවත් පස් ප්‍රතිචාර නොදක්වන අතර අස්වැන්න ලබා දෙන්නේ ඉතා ස්වල්පයක් පමණි. යේසුස්වහන්සේට පවා පොළොවේ තම සේවය සිදු කළ කාලය තුළ ප්‍රතිචාර නොදක්වන පස් හමු විය.

> **එහිදී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුවකළා මිස වෙන කිසි බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට නොහැකි වුයේය. ඔවුන්ගේ විශ්වාසය නැති කම ගැන උන්වහන්සේ මවිත වූ සේක. (මාර්ක් 6:5-6)**

**කිරිඳි හා තිරිඟු :** මතෙව් 13:24-30

නව ඇදහිලිවන්තයන් එකතු කර ගනිමින් ඔබ දේව රාජ්‍යය ගුණනය කරන විට එම ක්‍රියාවලිය පරාජය කිරීමට සාතන් උත්සාහ කරයි. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ හොඳ බීජ අතර "කිරිඳි" ලෙස හඳුන්වා ඇති පුද්ගලයන් ඔහු විසින් වපුරනු ඇත.
ගුණනය වීමේ ක්‍රියාවලිය තුළ සභාවට පැමිණෙන ඇදහිලිවතුන් යයි කියා ගන්නා ඇතැම් පුද්ගලයන් අවංක අය නොවේ. ඔවුන් සාතන් විසින් සිටුවන ලද කිරිඳි වේ.

තිරිඟුවලින් කිරිඳි වෙන් කරමින් ඔබේ කාලය හා ශක්තිය වැය කිරීම යේසුස්වහන්සේ අපේක්ෂා නොකරන සේක. දිගින් දිගටම බීජ වැපිරීම හා ගුණනය වීම සිදු කරන්න. අස්වැන්න නෙළන දවසේදී යේසුස්වහන්සේ නැවත පැමිණෙන විට අස්වැන්නෙන් කිරිඳි වෙන් කරනු ලබනු ඇත.

**මාළු දැල :** මතෙව් 13:47-50

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය මුහුදට විසි කළ විශාල දැලකට සමාන කළ සේක. සියලු ආකාරයේ මසුන් එයට ඇතුළු වේ. නමුත් දැල ගොඩට ගත් විට හොඳ මසුන් නරක මසුන්ගෙන් වෙන් කරනු ඇත.

දේව රාජ්‍යය සියලු ජාතීන්ට අයත් මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් ආකර්ෂණය කරයි. බොහෝ අය එයට ඇතුළු වේ. ඇතැම් අය අවංක වන නමුත් ඇතැමුන් එසේ නොවේ. අවසාන විනිශ්චය දවසේදී දෙවියන්වහන්සේ දැල හකුළන විට හොඳ හා නරක "මසුන්" වෙන් කරනු ඇත. ඔබව කැඳවා ඇත්තේ වෙන් කිරීමට නොවේ. ඔබව කැඳවා ඇත්තේ මසුන් ඇල්ලීමටයි.

**අබ ඇටය :** මතෙව් 13:31-32, මාර්ක් 4:31-32, ලූක් 13:19

දේව රාජ්‍යය අබ ඇටයක් මෙන් ගුණනය වනු ඇත. අබ ඇටය ආරම්භයේදී ඉතා කුඩාය, නමුත් පරිණත වන විට එය විශාල ප්‍රමාණයෙන් වැඩේ. පොළොව තුළ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇත්තේ ඉතා කුඩා ආරම්භයකි. පොළොවේ තම සේවයෙන් පසුව යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට යන විට, ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට උන්වහන්සේ ඉතිරි කර ගියේ ඉතා කුඩා ඇදහිලිවන්තයන් පිරිසකි. එම කුඩා ඇදහිලිවන්තයන් කණ්ඩායම බොහෝ ජාතීන් තුළ සිටින අනුගාමිකයන් දහස් ගණනක් දක්වා ගුණනය වී තිබේ.

**මුහුන් :** මතෙව් 13:33, ලූක් 13:21

පිටි පිඬක් තුළ ඇති මුහුන් මෙන් ලෝකය නමැති "පිටි පිඬ" පුරා පැතිර යාමට දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගුණනය වනු ඇත. මුහුන් මෙන් දේව රාජ්‍යයේ බලය බාහිර දෙයක් නොව අභ්‍යන්තර දෙයකි.

**මිදිවැල සහ අතු :** යොහන් 15:1-16

මෙම උපමාව යේසුස්වහන්සේ සහ ඵල දැරීම අතර ඇති සම්බන්ධතාව විස්තර කරයි. උන්වහන්සේ ආත්මික මිදි වැල වන අතර අපි අතුය. ඔබට තනිව ඵල දැරිය නොහැක. ඔබට ඵල දැරිය හැක්කේ යේසුස්වහන්සේ නමැති අතුවලට ජීවය දෙන මිදි වැලට සම්බන්ධ වී සිටියහොත් පමණි. පවතින්නාවූ ආත්මික ඵල ඔබ විසින් දරන පිණිස ඔබේ ජීවිතයේ ඇති ඵල නොදරන සියල්ල ඔබේ ජීවිතයෙන් ඉවත් කිරීමට යේසුස්වහන්සේට අවශ්‍යය.

**අස්වැන්න :** මතෙව් 9:37-38, ලූක් 10:2

මෙම උපමාව තුළ, කුඹුර යනු ලෝකයයි. අස්වැන්න යනු ශුභාරංචි පණිවුඩයට ප්‍රතිචාර දැක්වීමට සූදානමින් සිටින මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් සමූහයයි. දෙවියන්වහන්සේගේ ආත්මික සේවකයින් විසින් නෙළා ගනු පිණිස මහත් අස්වැන්නක් බලා සිටී.

## ගුණනය වීම පිළිබඳ තවත් ප්‍රතිපත්ති

කෙටි ප්‍රකාශනයන් මඟින් යේසුස්වහන්සේ ගුණනය වීම පිළිබඳ තවත් ප්‍රතිපත්ති ඉගැන්වූ සේක:

**ලෝකයේ ආලෝකය :** මතෙව් 5:14-16, ලූක් 8:16

ඇදහිලිවන්තයන් සැතපුම් ගණනක් ඈත සිට දැකිය හැකි ඉහළ බිමක පිහිටි නගරයක ආලෝකයක් මෙන් වන විට දේව රාජ්‍යය ගුණනය වේ. ආත්මික අන්ධකාරයෙන් පිරුණු ලෝකයක් වෙත අප ලෝකයේ ආලෝකය (යේසුස්වහන්සේ) ගෙන ආ යුතුය. මනුෂ්‍යයන් ආලෝකය වෙත ඇදගන්නා විට දේව රාජ්‍යය ගුණනය වනු ඇත.

**පොළොවේ ලුණු :** ලූක් 14:34

බයිබලීය කාලයන්හිදී මස් නරක් වීම වළක්වනු පිණිස ඊට ලුණු ආලේප කරනු ලැබිය. ගැළවීමේ පණිවුඩය තුළින් මනුෂ්‍යයන් ආරක්ෂා කිරිම සඳහා ලෝකයාට තැවරිය යුතු “ලුණු” නම් ඇදහිලිවන්තයන්ය. මනුෂ්‍යයන් පාපයෙන් “නරක්වීමෙන්” ගලවා ගනු ලබන විට දේව රාජ්‍යය ගුණනය වනු ඇත.

**ස්වර්ගයෙහි වස්තු :** මතෙව් 6:19-21, ලූක් 12:15

ඇදහිලිවන්තයන් ලෝකයේ ඇති ගුණනය වන වස්තූන් ගැන සැලකිලිමත් විය යුතු නොවේ. ඔබව කැඳවා ඇති ගුණනය වීම නම් ආත්මික ගුණනය වීමයි. ඔබ ශුභාරංචිය බෙදා ගන්නා විට, ස්වර්ගයේ ඇති ආත්මික වස්තූන් ඔබ විසින් ගුණනය කර ගනී.

**පුළුල් දොරටුව :** මතෙව් 7:14

ගණනින් පමණක් ඔබට නිවැරදි මාර්ගය සොයා ගත නොහැක. සදාකාලික ජීවිතය උදෙසා වූ මාර්ගය සොයා ගන්නේ සුළු පිරිසක් වන අතර නිරයට ඇති මාර්ගය බොහෝ පිරිසක් විසින් ආකර්ෂණය කර ගනී.

**වැඩ බොහොමයක්:** මතෙව් 7:22

බොහෝ පුද්ගලයන් විසින් පුදුම ක්‍රියා කරනු ඇත. මතුපිටින් බැලූ විට වර්ධනය වීමක් හා ගුණනය වීමක් පෙනෙනු ඇත. නමුත් වැඩ බොහොමයක් කිරීම සහ දෙවියන්වහන්සේගේ කැමැත්ත කරමින් උන්වහන්සේගේ අරමුණ ඉටු කිරීම යන්න හැම විටම සමාන නොවේ. දෙවියන්වහන්සේගේ කාර්යයන් උන්වහන්සේගේ සෙනඟ විසින් උන්වහන්සේගේ ක්‍රමයට සිදු කළ යුතුය.

**කුඩා දෙය බොහොමයක් වේ :** මතෙව් 10:42, මතෙව් 14:15-21

යේසුස්වහන්සේගේ නාමයෙන් කරන ලද සෑම දෙයක්ම කුඩා දෙයක් ලෙස පෙනෙන දෙයක් වුවත් එය ඵලදායී වේ. අපට පූජා කිරීමට ඇති කුඩා දේවල් දෙවියන්වහන්සේ විසින් ගුණනය කරන්නේ හා පාවිච්චි කරන්නේ කෙසේද යන්න රොටී සහ මාළු පිළිබඳ උපමා කතාවෙන් නිරූපණය කරයි.

**වර්ධනය වීමට වෙනස් වීමක් අවශ්‍යය :** මාර්ක් 2:21-22, 7:13

නව වර්ධනයට වෙනස් වීම අවශ්‍යයි. අලුත් දෙය ඔබට සම්ප්‍රදායී හා පචිකාරී ජීවිත රටාවන් නමැති පැරණි භාජනවලට දැමිය නොහැක. සම්ප්‍රදායන්ට ඇලී ගැලී සිටිමින් වෙනස් වීම ප්‍රතික්ෂේප කරන මනුෂ්‍යයෝ දේව වචනයට කළ හැකි බලවත් දේවලට බාධා කරති.

**නැතිවීමෙන් සම්බවීම :** මාර්ක් 8:34-37, 10:29-30
**දීමෙන් ලැබීම :** ලූක් 6:38

ලෝකයේ ප්‍රතිපත්තීන් උගන්වන්නේ ඔබට ලැබෙන්නේ වඩ වඩා දේවල් ලබා ගැනීමෙන් බවයි. යේසුස්වහන්සේ පැවසුයේ ඔබට සියල්ල නැතිවූ විට සියල්ල ලැබෙන බවයි. ස්වාභාවික ලෝකය තුළ නැතිවී ඇති ලෙස පෙනෙන දෙය ආත්මික ලෝකය තුළ ලැබෙන්නාවූ දේවල් වේ.

**මරණය ජීවිතය ගෙන එයි :** යොහන් 12:24

යේසුස්වහන්සේගේ මරණය තුළින් බොහෝ අයට සදාකාල ජීවනය ලැබුණි. ගුණනය වීමට නම්, බීජයක් මිය යා යුතුය. මරණය තුළින් ජීවනය ලැබේ. බෝවනු ලබන ගෝලයන් වීමට නම් ඔබ ඔබගේ මාංසික ආශාවන්ට මිය යා යුතුය. ඔබ පාපයට "මියගිය" අයෙක් විය යුතුය. යේසුස්වහන්සේ අනුගමනය කිරීමට ඔබ ඔබගේ මාර්ගයන් අතහැර දැමිය යුතුය.

**පර්වතය මත ඇති සභාව :** මතෙව් 16:18

දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩ නඟා ඇත්තේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ නමැති පර්වතය මතය. උන්වහන්සේ නැතිව කිසි වර්ධනයක් නැත. "මම මාගේ සභාව ගොඩ නඟමි" යි යේසුස්වහන්සේ කී සේක. පියාණන්වහන්සේ විසින් අඬගසනු ලැබුවහොත් මිස කිසි මනුෂ්‍යයෙක් එයට ඇතුළු නොවන බව උන්වහන්සේ කී සේක. (යොහන් 6:44)

විරුද්ධ වීම් බලාපොරොත්තු විය යුතුය. නමුත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය සඳහා වූ සැලසුම් පරාජය කිරීමට "පාතාලයේ දොරටු" වලට නොහැකිය.

> **යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින් : ඒක මනුෂ්‍යයන්ට නම් නුපුළුවන: නුමුත් දෙවියන්වහන්සේට සියල්ලම පුළුවනැයි කීසේක. (මතෙව් 19:26)**
>
> **... විශ්වාස කරන්නාට සියල්ල පුළුවන. ... (මාර්ක් 9:23).**

## ගුණනය වීම පිළිබඳ විශිෂ්ටතම ප්‍රතිපත්තිය

ගුණනය වීම පිළිබඳව යේසුස්වහන්සේ ඉගැන්වූ විශිෂ්ටතම ප්‍රතිපත්තිය උන්වහන්සේ තම ගෝලයන්ට පැවසූ අවසන් වචනවල සඳහන් වේ. ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට හා දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ලබන්නන් හා ගෝලයන්ගේ ගුණනය වීම පිළිබඳ මූලික සැලැස්ම උන්වහන්සේගේ ආඥාව තුළින් එළිදරව් වේ. :

> **එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කී සේක. (මතෙව් 28:19-20)**
>
> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න. (මාර්ක් 16:15)**
>
> **මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව් කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතු යයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය. (ලූක් 24:46-48)**
>
> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

## සාරාංශය

යේසුස්වහන්සේ පහත සඳහන් දේවල් ගැන ප්‍රසන්න නොවන බව උන්වහන්සේගේ ඉගැන්වීම් තුළින් එළිදරව් වේ.

- ඇල්ලීමෙන් තොරව මාළු බෑම.
- හිස් වූ මංගල මේසය
- අස්වැන්න නෙළීමෙන් තොරව වැපිරීම.

- ඵල නොදරන ගසක්
- බැටළු රැළ වෙත නොගෙනාවු නැතිවු බැටළුවා
- සෙවු නමුත් සම්බ නොවු කාසියක්
- නැවත නොපැමිණි නැති වූ පුත්‍රයන්
- ඵලදායි නොවන සේවකයන්
- ප්‍රතිචාර නොදක්වන ආත්මික පස්
- නෙළා ගනු නොලැබූ පැසුණු අස්වැන්න

එක් මනුෂ්‍යයෙක්වත් විනාශ වනු දැකීමට අකමැති අපේ පියාණන්වහන්සේ, ආත්මික ගුණනය වීම තුළින් ලැබෙන ප්‍රතිඵල ගැන උනන්දු වේ :

**එසේම මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් විනාශවෙනවාට ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ කැමති නොවන සේක. (මතෙව් 18:14)**

**ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක. (2 පේතෘස් 3:9)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "උපමාව" යන පදය නිර්වචනය කරන්න.

3. තම අනුගාමිකයන්ට ඉගැන්වීමට යේසුස්වහන්සේ උපමා පාවිච්චි කළේ ඇයි?

4. වෙනම කඩදාසියක් ගෙන, පහත සඳහන් එක් එක් උපමාව මඟින් උගන්වනු ලැබූ ගුණනය වීම පිළිබඳ ප්‍රතිපත්ති කෙටියෙන් විස්තර කරන්න:

   හිස් වූ මංගල මේසය
   වඳ අත්තික්කා ගස
   නැති වූ බැටළුවා, කාසිය හා පුත්‍රයා
   සේවකයින් පිළිබඳ උපමා කතා
   වපුරන්නාගේ උපමාව
   කිරිඳි සහ තිරිඟු
   මාළු දැල
   අබ ඇටය
   මුහුන්
   මිදිවැල හා අතු

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. වයස අවුරුදු 12 පටන් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රසිද්ධ සේවයේ ආරම්භය දක්වා වූ කාලය තුළ උන්වහන්සේගේ ජීවිතයේ සිදුවූයේ මොනවාද යන්න පිළිබඳව බයිබලය විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් නොකරයි. මෙම කාලය තුළ සිදුවූ ආත්මික වර්ධනය පිළිබඳ ක්‍රියාවලිය විස්තර කරන්නේ එක් පදයක් පමණි.

   **ළදරුවා වැඩී, ශක්තිමත්ව, ප්‍රඥාවෙන් පූර්ණ වූ සේක. දෙවියන්වහන්සේගේ කරුණාවද උන්වහන්සේ කෙරෙහි විය. (ලූක් 2:40)**

   බලපෑමක් කිරීමට නම් සෑම විටම ප්‍රසිද්ධ සේවයට කලින් ආත්මික වර්ධනයක් සිදු විය යුතුය.

2. අවසාන කාලය පැමිණි විට සාතන් ගුණනය වීම පිළිබඳ තමන්ගේම ප්‍රතිපත්තින් පාවිච්චි කරනු ඇත. පහත බයිබල් කාටස් අධ්‍යයනය කරන්න.

   - බොහෝ බොරු දිවැසිවරු නැගී සිටිනු ඇත. මතෙව් 24:11
   - බොහෝ පුද්ගලයන් රැවටීමට ලක්වනු ඇත. මතෙව් 24:11
   - පාපය වැඩි වනු ඇත. මතෙව් 24:12
   - බොහෝ අය ශුභාරංචියේ සත්‍යයෙන් මුළාව යනු ඇත. 2 තෙසලෝනික 2:3
   - ඇදහිලිවන්තයන්ට පීඩා කිරීම වැඩි වනු ඇත. මතෙව් 24:9-10
   - අපහාස කිරීම් සහ හිස් දෙඩවිලි වැඩි වනු ඇත. 2 තිමෝති 2:16

# හතරවන පරිච්ඡේදය

## එකට එකක් එකතු කළ විට දෙකට වඩා වැඩිවේ.

### අරමුණු

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "සාක්ෂිදැරීම" යන වචනය නිර්වචනය කිරීමට
- "ගිහි බව" යන වචනය නිර්වචනය කිරීමට
- "පූජ්‍ය" යන වචනය නිර්වචනය කිරීමට
- ගිහිභාවයේ "කැඳවීම" යනු කුමක්දැයි පැහැදිලි කිරීමට
- ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ගුණනය වීම පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලැස්ම පැහැදිලි කිරීමට
- මෙම ගුණනය වීමේ ක්‍රියාවලියට උදාහරණ ලෙස යොදා ගන්නා ලද නව ගිවිසුමේ සඳහන් පුද්ගලයන් දෙදෙනෙකු නම් කිරීමට
- ආත්මික ගුණනය වීම ආරම්භ කරන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- ආත්මිකව ගුණනය වීම ආරම්භ කිරීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාර දෙන්න.** (2 තිමෝති 2:2)

### හැඳින්වීම

මනුෂ්‍ය ශරීරයේ වර්ධනය ආරම්භ වන්නේ එක් ජීවී සෛලයකිනි. මනුෂ්‍ය ශරීරයක් සකස් වන තුරු එම සෛලය නැවත නැවත ගුණනය වේ. උපතින් පසුව, දරුවා තුළ එම ක්‍රියාවලිය දිගටම සිදුවේ. මනුෂ්‍ය සෛලයන් දිගින් දිගටම ගුණනය වන අතර එවිට වර්ධනය ඇති වේ. ආත්මික ලෝකය තුළද මෙය සත්‍යයක් වේ. යේසුස්වහන්සේ තුළ නව ජීවනය අත් දුටු සෑම පුද්ගලයෙකුම මනුෂ්‍ය ශරීරයේ ඇති ජීවී සෛලයකට සමානය. සෑම ඇදහිලිවන්තයෙකුම ආත්මිකව බෝවිය යුතුය. ඇදහිලිවන්තයන් මෙලෙස දිගින් දිගටම ගුණනය වන විට ශුභාරංචිය ව්‍යාප්ත වේ.

මෙම ආත්මික ක්‍රියාවලිය තුළ ඔබගේ පෞද්ගලික වගකීම මෙම පරිච්ඡේදය තුළින් එළිදරව් කරයි. "එකට එකක් එකතු කළ විට" එය දෙකට වඩා වැඩි අගයක් බවට පත් කරන ආත්මික ගුණනය වීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔබ විසින් ඉගෙන ගනු ඇත.

### අභියෝගය

යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට දී ඇති අභියෝගය නම් මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන යාමයි (මතෙව් 28:19, ක්‍රියා 1:8). අද අප ජීවත් වන්නේ වර්ධනය වන ලෝකයකය. හැම දවසකදීම මනුෂ්‍යයන් දහස් ගණනක් උපත ලබයි. ලෝකයේ ජනගහනය වේගයෙන් වර්ධනය වේ.

යේසුස්වහන්සේ ගැන කිසිදා අසා නැති කිසිවෙකු විසින් ළඟා නොවූ මනුෂ්‍ය කණ්ඩායම් රැසක් ලෝකය තුළ සිටී. තවමත් ශුභාරංචිය අසා නැති පුද්ගලයන් මිලියන ගණනකින් මෙම කණ්ඩායම සමන්විත වේ. බොහෝ ගම්මාන හා ප්‍රජාවන්වලට සභාවන් නැත. බොහෝ රටවල්වල, තිබෙන සභාවන් සඳහා පුහුණුවලත් සභාපාලකවරු නොමැත.

මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන යාමේ යේසුස්වහන්සේගේ මෙම මහත් අභියෝගය අප අත්පත් කරගන්නේ කෙසේද?

## දෙවියන්වහන්සේගේ සැලැස්ම

ලෝකයට ශුභාරංචිය ගෙන යාමට දෙවියන්වහන්සේට විශේෂ සැලැස්මක් තිබේ. තම ගෝලයන්ට මෙසේ පවසන විට යේසුස්වහන්සේ එය සාරාංශ කර දැක්වූ සේක.

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. (ක්‍රියා 1:8)**

දෙවියන්වහන්සේගේ සැලැස්ම මෙසේය: ගුණනය වීමේ ක්‍රියාවලිය පසුපස ඇති දිව්‍යමය බලය ශුද්ධාත්මයාණන්වහන්සේය. පණිවුඩය තුළ අන්තර්ගතය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. එසේම මුළු ලෝකයම මෙම පණිවුඩය ලබා ගන්නන් බවට පත් විය යුතුය.

ගෝලයන් යනු ගුණනය වීම සම්බන්ධ නියෝජිතයන්ය. දෙවියන්වහන්සේගේ ක්‍රමය නම් සෑම ගෝලයෙකුම ශුභාරංචි පණිවුඩය පිළිබඳ “සාක්ෂි” දරා සිටීමයි. “සාක්ෂි දැරීම” යනු ඔබ දැක ඇති, අසා ඇති හෝ අත්දැක ඇති දේ ප්‍රකාශ කිරීමයි. අධිකරණයකදී, සාක්ෂිකරුවෙකු යනු යමෙකු ගැන හෝ යම් දෙයක් ගැන සාක්ෂි දෙන අයෙකි. සාක්ෂිකරුවෙකු ලෙස ඔබ යේසුස්වහන්සේ ගැන හා සියලු මනුෂ්‍ය වර්ගයාට ගැළවීම ගෙන ඒමට උන්වහන්සේට ඇති සැලැස්ම ගැන සාක්ෂි දිය යුතුය. අධිකරණයකදී සාක්ෂිකරුවන් මඟින් ඉදිරිපත් කරන සාක්ෂි වර්ග දෙකක් තිබේ. එකක් නම් අදාළ කරුණ පිළිබඳව වාචිකව ලබා දෙන සාක්ෂියයි. අනෙක නම් ඇසින් දැකිය හැක්කාවූ සාක්ෂි වේ.

වාචිකව මෙන්ම දෙවියන්වහන්සේගේ බලය නිරූපණය කරමින්ද ශුභාරංචිය ගැන සාක්ෂි දැරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට උපකාරී වේ.

## පූජ්‍ය පක්ෂය හා ගිහියන් අතර වෙනස

දෙවියන්වහන්සේගේ සැලැස්ම නම් සෑම ගෝලයෙකුම (ඇදහිලිවන්තයෙකුම) ශුභාරංචියේ සාක්ෂිකරුවෙකු වීමයි. මුල් සභාව මෙම සැලැස්ම අනුගමනය කරන විට ඔවුන් වර්ධනය විය. සෑම ඇදහිලිවන්තයෙක්ම ශුභාරංචිය බෙදා ගත් අතර ආත්මිකව බෝවීමක් විය. ඔවුන්ගේ නිවෙස් ගුණනය වීමේ මධ්‍යස්ථාන බවට පත්විය (මීළඟ පරිච්ඡේදයකදී ඔබ මේ පිළිබඳ තවත් දේවල් ඉගෙන ගනු ඇත.). තනි ඇදහිලිවන්තයන් ශුභාරංචිය පිළිබඳ සාක්ෂි දරන විට සභාව වර්ධනය වෙමින් ගුණනය විය.

සභාව වර්ධනය වන විට, සභාපාලකයන්, ශුභාරංචි ප්‍රකාශකරන්නන්, දිවැසිවරු, ගුරුවරු හා ප්‍රේරිතයන් ලෙස සම්පූර්ණකාලීනව සේවය කිරීමට දෙවියන්වහන්සේ ඇතැම් අයව කැඳවූ සේක. කාලයක් ගතවන විට ඇදහිලිවන්තයන්ගේ සභාව තුළ පැවති කොටස් දෙකෙන් එකක් බවට පත්විය. ඔවුන් “පූජ්‍ය” හෝ “ගිහි” පක්ෂයට අයත් විය.

“ගිහියන්” යන වචනය බිඳී ආවේ “දෙවියන්වහන්සේගේ තෝරා ගත් සෙනඟට අයත්” යන අර්ථය දෙන ග්‍රීක වචනයකිනි. එම වචනයේ මුලික අර්ථය නම්, “දෙවියන්වහන්සේගේ සියලු සෙනඟ” යන්නයි. සභාවේ විශේෂ පූර්ණකාලීන සේවයන්හි නිරත නොවන අය හැඳින්වීමට “ගිහියා” හෝ “ගිහි බව” යන වචන භාවිත විය.

“පූජ්‍ය” යන වචනය වර්ධනය වූයේ සභාවේ සිටින වෘත්තිමය සේවකයන් හඳුන්වා දීම සඳහාය. පූජ්‍ය යන වචනයෙන් අදහස් වනුයේ සේවය තම වෘත්තිය ලෙස සලකන හෝ සභාව මඟින් සම්පූර්ණකාලීනව සේවයේ නියුක්ත කර ඇති පුද්ගලයන් හැඳින්වීම උදෙසාය. ඔවුන් යම් නිකායක් මඟින් අභිෂේකලත් අය හෝ එසේ නොවන අය විය හැකිය.

සභා ඉතිහාසයේ කාලයක් පුරාවට, පූජකයන් හා ගිහියන් අතර වෙනස ක්‍රමානුකූලව වර්ධනය විය. බොහෝ ගිහි පුද්ගලයන් ආත්මිකව ගුණනය වීම නතර කළහ. ලෝකය වෙත ළඟා වීමේ අභියෝගය සම්පූර්ණකාලීන පූජ්‍ය පක්ෂය වෙත සීමා කිරීමට ඔවුන් පටන් ගත්හ.

මුළු මහත් සභාවම විසින් කළ යුතු බවට අණ කර ඇති දෙය කිසිදා තනි වෘත්තිමය පූජකවරයෙකුට කළ නොහැකිය. අප තවමත් මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන ගොස් නොතිබීමට මෙය එක් හේතුවකි. ඇදහිලිවන්තයන් තම පෞද්ගලික වගකීම් පූජ්‍ය පක්ෂය වෙත මාරු කර තිබේ. සභාව තුළ ශ්‍රමය බෙදා ගැනීමක් පිළිබඳව බයිබලයේ සඳහන් වන නමුත්, සෑම පුද්ගලයෙකුම ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට දායක විය යුතුය (ක්‍රියා 6:1-6 කියවන්න).

යෙරුසලමේ සභාව ගුණනය වන විට සභාවේ සියලු අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා ශ්‍රමය බෙදා ගැනීමක් අවශ්‍ය විය. නායකයන් සම්පූර්ණ කාලීනව දේව වචනය අධ්‍යයනය කිරීමෙහි හා යාච්ඤාවෙහි නිරත වූහ. වැන්දඹුවන්ට සේවය කිරීම හා වෙනත් සේවයන් සම්බන්ධ ක්‍රියාවන් ගිහියන් විසින් කරනු ලැබීය. නුමුත් ඇදහිලිවන්තයන් සභාවේ විවිධ නිලයන් දරමින් ක්‍රියා කළ නමුත් ඔවුහු සියලු දෙනාම ශුභාරංචිය ව්‍යාප්ත කිරීමෙහි නිරත වී සිටියහ.

ස්තේපන් යනු සේවය කිරීමේ කාර්යය උදෙසා (උපස්ථායකයෙකු ලෙස) තෝරා ගන්නා ලද ගිහියන්ගෙන් කෙනෙකි. නුමුත් ඔහු ශුභාරංචිය ගැන බලවත් ලෙස සාක්ෂි දැරීය (ක්‍රියා 6:8-11). පිලිප් යනු උපස්ථායකයෙකු ලෙස තෝරා ගන්නා ලද තවත් ගිහියෙකි. ඔහු සමාරිතයන් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය (ක්‍රියා 8:5-12).

යෙරුසලමේ පීඩාවන් ඇති වීම නිසා ඇදහිලිවන්තයන් වෙනත් නගරවලට පළා ගිය විට ඔවුන් දිගින් දිගටම ශුභාරංචිය පිළිබඳ සාක්ෂි දැරීය. :

**එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4).**

යේසුස්වහන්සේ සියල්ලෙහි ස්වාමියා වන බැවින්, සැබෑ ඇදහිලිවන්තයෙකුට ශුද්ධ වූ දේ හා ලෞකික දේ අතර වෙනසක් නැත.

## ගිහි භාවයේ කැඳවීම

ගිහිභාවයේ ආත්මික කැඳවීම පිළිබඳව ඔබට ඇත්තෙන්ම අධ්‍යයනය කිරීමට අවශ්‍ය නම්, ඔබ පරණ ගිවිසුමට යා යුතුය. දෙවියන්වහන්සේගේ සැලැස්ම වූයේ මුළු මහත් ඉශ්‍රායෙල් ජාතියම "පූජකයන්" හෝ සේවකයන් වීමයි.

**නුඹලා මට පූජක රාජ්‍යයක් සහ ශුද්ධ ජාතියක් වන්නහුය. (නික්මයාම 19:6)**

පූජකයන් ලෙස සෑම ඉශ්‍රායෙල් මනුෂ්‍යයෙකුම තමන් වටා සිටි නොඇදහිලිවන්තයන්ට සැබෑවූ එකම දෙවියන්වහන්සේ පිළිබඳ සාක්ෂිකරුවෙකු විය යුතු විය.

නිල වශයෙන් පූජකයන් පත් කිරීම නිසා ඉශ්‍රායෙලය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම වෙනස් නොවීය. පූජකයන් අද දවසේ "පූජ්‍ය පක්ෂය" මෙන් විශේෂ නායකත්ව භූමිකාවක් ඇති තනතුරක් විය. නමුත් මුළු ජාතියම තවදුරටත් දෙවියන්වහන්සේ පිළිබඳ පණිවුඩය අන්‍යජාතීන් වෙත ගෙන යන සේවකයන් ලෙස සේවය කළ යුතු විය.

නව ගිවිසුම තුළ ඇදහිලිවන්තයන්ට ද ඒ හා සමාන කැඳවීමක් දී තිබේ. ඔවුන් ශුභාරංචිය පිළිබඳ පූජකයන් හෝ සේවකයන් විය යුතුය :

**නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධවූ ජාතියක්ද දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය. (1 පේතෘස් 2:9).**

ඇදහිලිවන්තයන්ගේ කැඳවීම නම්, තමන්ව ආත්මික අන්ධකාරය තුළින් යේසුස්වහන්සේ නමැති "ආලෝකය" වෙත ගෙන ආ දෙවියන්වහන්සේ පිළිබඳව සාක්ෂි දැරීමය (යොහන් 9:5).

"කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස" ජීවත් වන ලෙස ඇදහිලිවන්තයන්ට පවසා තිබේ (එපීස 4:1). ඇත්තේ එක් කැඳවීමක් වන අතර එය නම් ශුභාරංචි පණිවුඩය ගැන සාක්ෂි දැරීමය. සියලු ඇදහිලිවන්තයන් විසින් ඉටු කළ යුතු කාර්යය එය වේ. සෑම පුද්ගලයෙකුම මෙම කැඳවීමට තමන් දක්වන ප්‍රතිචාරය ගැන වගකිව යුතුය.

මෙම කැඳවීම අධ්‍යාපනය හෝ ස්වාභාවික හැකියාවන් මත පදනම් වී නැත. දෙවියන්වහන්සේට පමණක් මහිමය ලැබෙනු පිණිස උන්වහන්සේ සාමාන්‍ය ගිහි පුද්ගලයන් පාවිච්චි කරන සේක :

> **මක්නිසාද සහෝදරයිනි, නුඹලාගේ කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙක්වත් බලවන්ත බොහෝදෙනෙක්වත් වංශවත් බොහෝ දෙනෙක්වත් කැඳවනු නොලැබූ බව බලන්න. නමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරා ගත් සේක: දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරා ගත් සේක. ඇත්තාවූ දේවල් නැති කරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල්ද සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ තෝරා ගත් සේක. එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාරට්ටු කර නොගන්නා පිණිසය.** (1 කොරින්ති 1:26-29)

## ගුණනය වීමේ ක්‍රියාවලිය

ඇදහිලිවන්තයන්ට තම කැඳවීම සම්පූර්ණ කිරීමේ හැකියාව ලබා දෙන විශේෂ සැලැස්මක් බයිබලය තුළ දෙවියන්වහන්සේ එළිදරව් කරයි. ගුණනය වීම යනු ස්වාභාවික ලෝකයේ සියලු වර්ධනයන්ට අදාළ වන මූලික ප්‍රතිපත්තියකි. එක් ඒකකයකට තවත් ඒකකයක් එකතු කිරීමෙන් පමණක් වර්ධනයක් ඇති නොවේ. ජීවී සෛල ගුණනය වේ. නිපදවනු ලබන සෑම නව සෛලයකටම යළි සෛලයක් නිපදවීමේ හැකියාව ඇත.

ආත්මික ලෝකයේ ගුණනය වීම පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලැස්මද ඊට සමානය. පාවුල් තිමෝති වෙත මෙම වචන ලියා යවන විට ඔහු එම සැලැස්ම සාරාංශ කොට දැක්විය :

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාර දෙන්න.** (2 තිමෝති 2:2)

විශ්වාසවන්ත මනුෂ්‍යයන් තෝරාගෙන පාවුල් විසින් තමන්ට ඉගැන්වූ දේවල් ඔවුන්ට භාර දෙන ලෙස පාවුල් තිමෝතිට පැවසීය. මෙම විශ්වාසවන්ත මනුෂ්‍යයන් හට අන් අයට ඉගැන්වීමේ හැකියාව තිබිය යුතු විය. බෝවීම උදෙසා වූ මෙම සංවිධානාත්මක සැලැස්ම තුළින්, ලෝකය පුරා ශුභාරංචිය පැතිරී යනු ඇත.

දෙවියන්වහන්සේගේ ගුණනය වීම පිළිබඳ සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය දැන ගැනීමට මිළඟට ඇති වගුව දෙස බලන්න. කෙනෙකුව ශුභාරංචිය වෙත ගෙනැවිත් බෝවීමේ හැකියාව ඇති කිතුනුවෙකු ලෙස පුහුණු කිරීමට ගතවන සාමාන්‍ය කාලය වසරක් ලෙස මෙම වගුවේ දී සලකා ඇත. යථාර්ථය නම් සම්බන්ධ වන පුද්ගලයා අනුව මෙම කාලය වැඩි හෝ අඩු විය හැකි බැවින් නිශ්චිත කාල සීමාවක් දැක්වීමට හැකියාවක් නැත. නමුත් ඇදහිලිවන්තයෙකු වසරකදී එක් පුද්ගලයෙකු වෙත ළඟාවී ඔහුව ගෝලයෙකු ලෙස පුහුණු කර සෑම වසරකදීම එම පුද්ගලයා තවත් කෙනෙකු ගෝලයකු බවට පත් කරන තත්ත්වයට පැමිණියහොත් , පහසුවෙන්ම ශුභාරංචි පණිවුඩය ලෝකය වෙත ගෙන යා හැකිය.

වගුව නිරීක්ෂණය කර බලන්න. පළමු වසරේදී ඇදහිලිවන්තයා එක් අයකු ගෝලයකු කරයි. එම වසර අවසානයේදී ඇදහිලිවන්තයා හා ඔහු විසින් ගෝලයකු කළ පුද්ගලයා යන විශ්වාසවන්ත මනුෂ්‍යයන් දෙදෙනෙකු සිටී (ගෝලයකු බවට පත් කිරීමේ මෙම ක්‍රියාවලිය ගැන මෙම පාඨමාලාවේ පසුවට ඔබ තවත් දේ ඉගෙන ගනු ඇත). ඊළඟ වර්ෂය තුළදී, ඔවුන් දෙදෙනා තවත් දෙදෙනෙකු වෙත ශුභාරංචිය ගෙන ගොස් ඔවුන් ගෝලයන් කරයි. දෙවන වසර අවසානයේදී, තවත් කෙනෙකු ගෝලයකු කළ හැකි මනුෂ්‍යයන් සතර දෙනෙකු සිටී.

| | ගෝලයන් කරන්නා(නන්) | ගෝලයා(යන්) | | එකතුව |
|---|---|---|---|---|
| 17 වන වසර | 65,536 | 65,536 | = | 131,072 |
| 16 වන වසර | 32,768 | 32,768 | = | 65,536 |
| 15 වන වසර | 16,384 | 16,384 | = | 32,768 |
| 14 වන වසර | 8,192 | 8,192 | = | 16,384 |
| 13 වන වසර | 4,096 | 4,096 | = | 8,192 |
| 12 වන වසර | 2,048 | 2,048 | = | 4,096 |
| 11 වන වසර | 1,024 | 1,024 | = | 2,048 |
| 10 වන වසර | 512 | 512 | = | 1,024 |
| 09 වන වසර | 256 | 256 | = | 512 |
| 08 වන වසර | 128 | 128 | = | 256 |
| 07 වන වසර | 64 | 64 | = | 128 |
| 06 වන වසර | 32 | 32 | = | 64 |
| 05 වන වසර | 16 | 16 | = | 32 |
| 04 වන වසර | 8 | 8 | = | 16 |
| 03 වන වසර | 4 | 4 | = | 8 |
| 02 වන වසර | 2 | 2 | = | 4 |
| 01 වන වසර | 1 | 1 | = | 2 |

## ගුණනය වීම හා පුහුණු කිරීම පිළිබඳ දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්ම

දැන්, සභාවක සාමාන්‍යයෙන් සිටින සාමාජික සංඛ්‍යාව ආසන්න වශයන් සියයක් බව සලකන්න. මෙම වගුව එක් මනුෂ්‍යයෙකු වෙත ශුභාරංචිය ගෙන ගොස් ඔවුන්ව බෝවීමට හැකි තත්ත්වයට පුහුණු කරන මනුෂ්‍යයන් සියයක් දක්වා වර්ධනය කරන්න. මුළු ලෝකයටම කොතරම් පහසුවෙන් ශුභාරංචිය ගෙන යා හැකිදැයි ඔබට පෙනෙනු ඇත. ගුණනය වීම එකතු වීමට වඩා වේගවත්ය. එකතු කිරීම නිරූපණය කරන රූපයක් පහත දැක්වේ.

| |
|---|
| එකතු කිරීම : 1+1+1+1+1 . . . එක් එක්කෙනා බැගින් දිගටම |

ගුණනය වීම නිරූපණය කරන රූප සටහනක් පහත දැක්වේ. මෙම ක්‍රියාවලිය තුළ සෑම පුද්ගලයෙකුම තමන්ව ගුණනය කරන අතර “එකට එකක් එකතු වූ විට” ප්‍රතිඵලය දෙකට වඩා වැඩිවේ. :

ගුණනය වීම : 1×1×1×1×1 . . . ඔබ දිගටම ගුණනය වේ.

× × × × ×

1 1 1 1 1 . . . ඔබ ළඟාවූ සෑම කෙනෙක්ම ගුණනය වේ.

× × × × ×

1 1 1 1 1

× × × × ×

. . . . .

. . . . .

. . . . .

c c c c c ''' ඔවුන් ළඟාවූ සෑම කෙනෙක්ම ගුණනය වේ.

o o o o o

n n n n n

t t t t t

I I I I I

n n n n n

u u u u u

e e e e e

s s s s s

## මුල් සභාවේ ක්‍රියාවලිය


යේසුස්වහන්සේගේ මුල් ගෝලයන්ගෙන් කෙනෙකු වූ ඇන්ඩෲගෙන් ආරම්භ වූ ගුණනය වීමේ මුල් අඩියර පහත රූප සටහන තුළින් නිරූපණය වේ.

ඇන්ඩෲ ➡ පේතෲස් ➡ වෙනත් අය ➡ වෙනත් අය

↘ පෙන්තකොස්ත දවස ➡ වෙනත් අය ➡ වෙනත් අය

1. ඇන්ඩෲ තම සහෝදරයා වූ පේතෲස් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය.
2. පෙන්තකොස්ත දවසේදී යෙරුසලමේදී පේතෲස් ශුභාරංචිය බෙදා ගත්තේය.
3. පේතෲස් වෙනත් අය සමඟද ශුභාරංචිය බෙදා ගත් අතර ඒ අයද තවත් අය බිහි කළෝය.
4. යෙරුසලමෙන් විසිරී ගිය දහස් ගණනක් ඇදහිලිවන්තයන් දිගින් දිගටම ශුභාරංචිය බෙදා ගත්හ.
5. ඔවුන් ළඟාවූ හැම කෙනෙක්ම තමා වැනි තවත් අය බිහි කළ අතර ක්‍රියාවලිය දිගින් දිගටම සිදුවිය. . .

අපෝස්තුළුවර පාවුල්ගෙන් ආරම්භ වූ ආත්මික ගුණනය වීමේ මුල් අදියර පෙන්වා දෙන රූප සටහනක් පහත දැක්වේ :




1. පාවුල්ව නැගිටුවීමට දෙවියන්වහන්සේ විසින් අනනියස් පාවිච්චි කරන ලදී.
2. පාවුල් තිමෝති ගෝලයෙක් කළේය.
3. පාවුල් දිගටම වෙනත් අයවද ගෝලයන් කළේය.
4. අන් අයට ඉගැන්විය හැකි “විශ්වාසවන්ත මනුෂ්‍යයන්ව” තිමෝති ගෝලයන් කළේය.
5. විශ්වාසවන්ත මනුෂ්‍යයෝ වෙනත් අය වෙතට ගියහ.
6. මෙම “වෙනත් අය” ගුණනය වීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන ගියහ.
7. ජාලය තුළ සිටි සෑම පුද්ගලයෙක්ම දිගින් දිගටම ගුණනය විය.

## සාමාන්‍ය මනුෂ්‍යයන්

ඉහත රූප සටහනෙහි සඳහන් අනනියස් නම් මනුෂ්‍යයා ගැන බයිබලය පවසන්නේ ඉතා සුළු තොරතුරු ප්‍රමාණයකි. මනුෂ්‍යයන් ඔහුව දැන සිටියේ නැත. නමුත් අපෝස්තුළුවර පාවුල් නැගිටුවීමට දෙවියන්වහන්සේ ඔහුව පාවිච්චි කළ සේක. ඇන්ඩෘ, සාමාන්‍ය නුගත් මසුන් අල්ලන්නෙක් විය. නමුත් ඔහු විසින් වගකිව යුතු වූ ආත්මික ගුණනය වීමේ දාමය දෙස බලන්න. ඔබව මනුෂ්‍යයන් හොඳින් නොහඳුනවා විය හැකිය. ඔබ ජීවත් වන ප්‍රජාව තුළ හෝ සභා නිකාය තුළ ඔබ හොඳින් දන්නා අයෙකු නොවිය හැකිය. ඔබ සාමාන්‍ය කාර්යයන් කරන සාමාන්‍ය මනුෂ්‍යයෙකු විය හැකිය. නමුත් ගෝලයන් ගුණනය කිරීමට දෙවියන්වහන්සේට ඔබව පාවිච්චි කළ හැකිය.

ක්‍රියා 4හි ඇති කොරවූ මිනිසා සුව කිරීම පිළිබඳ කතන්දරය කියවන්න. පේතෘස් හා යොහන් මන්ත්‍රණ සභාව ඉදිරියේ පෙනී සිටින විට, ඔවුන් සැබවින්ම නුගත් සාමාන්‍ය මනුෂ්‍යයන් විය.

> **එවිට ඔවුහු පේතෘස්ගේද යොහාන්ගේද නිර්භීතකම දැක, ඔවුන් අපණ්ඩිතවූ නුගත් මනුෂ්‍යයන් බව දැන මවිත වූවෝය. ඔවුන් යේසුස්වහන්සේ සමඟ සිටි බව ඔවුහු ඇඳින්නෝය. සුවකරනු ලැබූ මනුෂ්‍යයා ඔවුන් සමඟ සිටිනවා දැක, ඊට විරුද්ධව කිසිවක් කියන්ට ඔවුන්ට නොහැකි විය. (ක්‍රියා 4:13-14)**

මෙම “සාමාන්‍ය” මනුෂ්‍යයන් යේසුස්වහන්සේ තුළින් නව ජීවිතයක් ලබා තිබුණි. ඔවුන් තුළ වූ ජීවනයේ ප්‍රතිඵලය වූයේ ආත්මිකව ගුණනය වීමයි. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ වගකීම යේසුස්වහන්සේ විසින් ගිහියන්ට භාර දෙන ලදී. උන්වහන්සේ මසුන් මරන්නන් ඔවුන්ගේ බෝට්ටුවලින් ඉවතට ගෙන ඔවුන්ව මනුෂ්‍යයන් අල්ලන්නන් බවට පත් කළ සේක. ශුද්ධාත්මයාණන් විසින් බල ගන්වනු ලැබූ විට සාමාන්‍ය මනුෂ්‍යයන්ට අධි සාමාන්‍ය තත්ත්වයට පත් විය හැකි බව උන්වහන්සේ විශ්වාස කළ සේක.

ගිඩියොන් ගොවියෙකු විය. පාවුල් කූඩාරම් තනන්නෙකු විය. මෝසෙස් එඬේරෙකු විය. ලූක් වෛද්‍යවරයෙක් වූ අතර යෝසෙප් බලවත් දේශපාලනඥයෙකු විය. ඔබේ අධ්‍යාපන මට්ටම හා රැකියාව කුමක් වුවත් දෙවියන්වහන්සේට තම සැලැස්ම තුළ ඔබව පාවිච්චි කළ හැකිය.

ඔබ සිටින්නේ කොහේද යන්න හා ඔබ කවුරුන්ද යන්න වැදගත් නොවේ. වැදගත් වන්නේ දෙවියන්වහන්සේ ඔබව තබා ඇති ස්ථානයේ ඔබ කරන්නේ කුමක්ද යන්නයි. බලපෑමක් කළ හැකි ආකාරයේ ආත්මික ගුණනය වීමකට මූලික සාධකය නම් දෙවියන්වහන්සේගේ ස්ථානයේ, දෙවියන්වහන්සේගේ ක්‍රමයට, දෙවියන්වහන්සේගේ කාර්යයේ නියුතු, දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු හෝ ස්ත්‍රියක වීමයි.

## ආරම්භ කරන්නේ කෙසේද?

පවතින සමාජීය ජාලයන් තුළ ශුභාරංචිය ඉතා වේගයෙන් ව්‍යාප්ත වන බව නව ගිවිසුම එළිදරව් කරයි. මෙමඟින් අප අදහස් කරනුයේ ඔබේම මිතුරන්ගෙන්, ඥාතීන්ගෙන් හා ඔබ සමඟ සේවය කරන අයගෙන් සමන්විත සමාජ කණ්ඩායම තුළ ඔබට පහසුවෙන්ම ශුභාරංචිය ව්‍යාප්ත කළ හැකි බවයි.

උදාහරණයක් ලෙස යේසුස්වහන්සේ ඇන්ඩෘ නම් එක් මසුන් අල්ලන්නෙකු කැඳවූ සේක. ජේතෘස් නම් ඥාතියෙක් සමඟ ඇන්ඩෘ ශුභාරංචිය බෙදා ගත්තේය. ඔවුන් සමඟ සේවය කළ වෙනත් මසුන් මරන්නන් සමඟ ඔවුන් බෙදා ගත්හ. ඉක්මණින්ම මසුන් මරන්නන් කණ්ඩායමක්ම යේසුස්වහන්සේගේ අනුගාමිකයෝ වූහ.

දෛනික ජීවිතයේදී හා රැකියාවේදී ගිහියන් යනු නමස්කාරය හා සහභාගිත්වය සඳහා පමණක් එක්රැස් වන සමාජය තුළ විසිරී සිටින සභාවට අයත් කොටස් පමණක් නොවේ. ගිහියන් තම ඥාතීන්ට, මිත්‍රයන්ට හා තමන් සමඟ සේවය කරන අයට දේව රාජ්‍යයේ තානාපතිවරුය. ඔබ රැකියාව කරන ස්ථානය, පාසල, පවුල හා සමාජය ඔබ සේවය කළ යුතු ප්‍රදේශය වේ.

ලූක් 16:19-31 හි සඳහන් නිරයට ගිය පොහොසතා පිළිබඳ කතාව කියවන්න. තම පවුල සමඟ ශුභාරංචිය බෙදා ගැනීම සඳහා ආපසු ඒමට මේ මනුෂ්‍යයාට අවශ්‍ය වූ නමුත් එවිට ප්‍රමාද වැඩි විය. ඔබේම සමාජ ජාලය තුළ ජීවත් වන අය සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට ප්‍රමාද වැඩිවන තුරු නොසිටින්න.

## ආත්මික දීමනා හා ගුණනය වීම

ශුද්ධාත්මයෙන් බව්තිස්මය වීම පිළිබඳ සැබෑ සාක්ෂිය නම් ශුභාරංචියේ බලවත් සාක්ෂිකරුවෙකු වීමයි. ශුද්ධාත්මයාණන්ගේ බලය ඇදහිලිවන්තයන්ට ආත්මික ගුණනය වීමේ හැකියාව ලබා දෙයි (ක්‍රියා 1:8).

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන් බල ගන්වන එක් ආකාරයක් නම් ආත්මික දීමනාවන්ය. අන් අයට සේවය කිරීමේ කාර්යයයෙහි තමන්ව නිරත කරවීම සඳහා සෑම ඇදහිලිවන්තයෙකුටම ආත්මික දීමනා දී තිබේ. මෙම දීමනා නම්, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙනු ලබන අධි ස්වාභාවික හැකියාවන්ය.

දෙවියන්වහන්සේ ඔබට දී ඇති ආත්මික දීමනා මොනවාදැයි ඔබ නොදන්නේ නම්, *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ඇණවුම් කරන්න. මෙම පාඨමාලාව ආත්මික දීමනා නමැති විෂය සමඟ සම්බන්ධ වේ.

## නූතන උදාහරණයන්

එක් එක් ඇදහිලිවන්තයන්ගේ සාක්ෂි දැරීම තුළින් ශුභාරංචිය ගුණනය වීම සම්බන්ධව දෙවියන්වහන්සේට ඇති සැලැස්ම පරාජය කිරීමට කිසිවකටත් නොහැක. නූතන උදාහරණයක් පහත දැක්වේ:

> *චීනය තුළ වසර ගණනක මිෂනාරී සේවයෙන් අනතුරුව රජය විසින් මිෂනාරිවරු නෙරපා හරින විට එහි වූ සභාවන් ගණන මිලියනයකට වඩා සුළු ප්‍රමාණයකින් අඩු විය. සභාපාලකවරු සිර ගත කරනු ලැබීය. බයිබල් ගිනි තැබූහ. සභාවන් වසා දමනු ලැබීය. නමුත් අවුරුදු තිහකට පසු චීනය යම් තරමක විවෘත භාවයක් ලැබූ විට හා වාර්තාවන් ලබා ගත හැකි වූ විට ඇදහිලිවන්තයන් ගණන මිලියන 10 සිට 50 දක්වා බව ඇස්තමේන්තු ගත කරනු ලැබීය.*
>
> *සභාවන් වසා දමා සභාපාලකවරු සිරගත කර තිබුණද සාමාන්‍ය ඇදහිලිවන්තයන් දිගින් දිගටම ආත්මිකව ගුණනය විය. ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම නතර කිරීමට කිසිවකට නුපුළුවන.*

## දේව රාජ්‍යයේ වර්ධනය

සෑම ඇදහිලිවන්තයෙක්ම තමා වැනි තවත් අය බිහි කරන අයෙක් විය යුතුය. නුමුත් හුදු ඇදහිලිවන්තයන් ගුණනය වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඇදහිලිවන්තයන් සියලු සැබෑ ඇදහිලිවන්තයන් ඒකාබද්ධ කරන සාමූහික ශරීරය වන සභාවේ ක්‍රියාකාරී කොටසක් විය යුතුය. සභාවද ඒ ආකාරයෙන් ගුණනය විය යුතුය. සභාව අභ්‍යන්තර ආත්මික වර්ධනයක් අත් දකිමින්, පැතිරීම, ව්‍යාප්ත වීම හා වර්ධනය සම්බන්ධ කරන පාලමක් ලෙස විය යුතුය. තනිවම ගුණනය වීමට ඔබට ඇති වගකීම ඔබ ඉගෙන ගෙන තිබේ. ප්‍රාදේශීය සභාව නමැති සන්දර්භය තුළ සාමූහිකව ගුණනය වන්නේ කෙසේද යන්න මීළඟ පරිච්ඡේදවලදී ඔබ ඉගෙන ගනු ඇත.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "සාක්ෂි දැරීම" යන වචනය නිර්වචනය කරන්න.

3. "ගිහි බව" යන පදය නිර්වචනය කරන්න.

4. "පූජ්‍ය පක්ෂය" යන පදය නිර්වචනය කරන්න.

5. ගිහි භාවයේ කැඳවීම යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

6. ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ගුණනය වීම පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලැස්ම කුමක්ද?

7. ආත්මික ගුණනය වීම සඳහා උදාහරණ ලෙස ඉදිරිපත් කළ හැකි නව ගිවිසුමේ සඳහන් පුද්ගලයන් දෙදෙනාගේ නම් මොනවාද?

8. ආත්මික ගුණනය වීම ආරම්භ කිරීමට හොඳම ක්‍රමය කුමක්ද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. පසුගිය පරිච්ඡේදයෙහිදී ගුණනය වීම පිළිබඳ උපමා කතා ඔබ ඉගෙන ගත්තෙහිය. පහත උපමා යළි මතක් කර ගන්න. මෙම උපමාවලදී විශ්වාසවන්තව ගුණනය වීම පිළිබඳව එක් එක් පුද්ගලයා වගකිව යුතු විය.

   - තලෙන්ත : මතෙව් 25:14-30, ලූක් 19:11-27
   - දුර ගමනක නිරත වූ මිනිසා : මාර්ක් 13:34-37
   - දාසයන් : මතෙව් 24:43-52, ලූක් 12:39-46
   - අවදිව සිටි දාසයන් : ලූක් 12:36-38
   - විශ්වාසවන්ත සේවකයා : මතෙව් 25:14-20

2. යොහන් 21:15-22හි සඳහන් යේසුස්වහන්සේ හා පේතෘස් අතර පැවති සංවාදය කියවන්න. ක්‍රියා 10:22හි ඇති පාවුල්ගේ හැරීම සිදුවූ වේලාවේදී යේසුස්වහන්සේ ඔහුට පැවසූ වචන කියවන්න.

   ඔබ සැලකිලිමත් විය යුත්තේ අන් අය විසින් ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට ඇති වගකීම ඉටු කරනවාද නැද්ද යන්න පිළිබඳව නොවේ. "මේ මනුෂ්‍යයා කුමක් කළ යුතුද?" යනුවෙන් පේතෘස් කළාක් මෙන් ඔබ ප්‍රශ්න කළ යුතු නැත. ඔබ සැලකිලිමත් විය යුත්තේ පාවුල් මෙන්, "මා කුමක් කළ යුතුද ස්වාමිනී?" යන්න පිළිබඳවයි.

# පස්වන පරිච්ඡේදය

## සභා වර්ධනය සඳහා හැඳින්වීමක්

### අරමුණු:

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- සැබෑ සභාව හඳුනාගැනීමට,
- සභාව ආරම්භ වූයේ කෙසේදැයි පැහැදිලි කිරීමට,
- සභාව විස්තර කිරීමට බයිබලය පාවිච්චි කර ඇති උදාහරණ ලැයිස්තුගත කිරීමට,
- බයිබලයට අනුව සභාවේ පරමාර්ථයන් හඳුනාගැනීමට
- සභාව වර්ධනය වන ආකාර හතරක් හඳුනාගැනීමට,
- සභාවේ වර්ධනය හා සම්බන්ධ වන ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය සාරාංශගත කිරීමට,

ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

**මම නුඹට කියමි: නුඹ පේතෘස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි: පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. (මතෙව් 16:18)**

### හැඳින්වීම

ශුභාරංචි පණිවුඩය බෙදා ගැනීම මගින් ගුණනය වීමට එක් එක් ඇදහිලිවන්තයාට ඇති වගකීම පසුගිය පාඩමේදී ඔබ ඉගෙන ගත්තේය. මෙම ක්‍රියාවලිය තුළින් ගොඩනගන නව ඇදහිලිවන්තයන් සඳහා දෙවියන්වහන්සේට විශේෂ සැලැස්මක් තිබේ. ඔවුන් සභාව නමින් හඳුන්වන ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයේ කොටසක් විය යුතුය. ඇදහිලිවන්තයන් සභාව නැමති සන්දර්භය තුළ තමා මෙන් තවත් අය බිහි කිරීම සිදු කළ යුතුය. දේව රාජ්‍යය තුළට නව ඇදහිලිවන්තයන් නැවත උත්පාදනය ලබන විට, සභාව ගුණනය වේ.

ආත්මික ගුණනය වීමේ මධ්‍යස්ථානයක් ලෙස සභාව උදෙසා දෙවියන් වහන්සේගේ සැලැස්ම මෙම පරිච්ඡේදය තුළින් විස්තර කරයි. මීළඟ පරිච්ඡේද හතර සභාව වර්ධනය වන විශේෂ ආකාර හතර ගැන සාකච්ඡා කරයි.

### සභාව

අප සභාව ගැන කතා කරන විට අප කතා කරනුයේ මනුෂ්‍යයා විසින් නිර්මාණය කරන ලද සංවිධානයක් හෝ නිකායක් ගැන නොවේ. එය ඉතිහාසය විසින් නිර්මාණය කරන ලද්දක් හෝ මනුෂ්‍යයෙකු විසින් සිතන ලද සැලැස්මක ප්‍රතිඵලයක් නොවේ.

"සභාව" නැමති වචනයේ නියම අර්ථය "කැඳවනු ලැබූ අය" යන්නයි. අප සභාව ගැන කතා කරන විට, අප කතා කරනුයේ ලෝකයේ සිට දෙවියන්වහන්සේගේ රාජ්‍ය වෙතට කැඳවනු ලැබූ සියලු සැබෑ ඇදහිලිවන්තයන්ගේ ලෝක ව්‍යාප්ත සහභාගීත්වය පිළිබඳව වේ.

සේවයේ පරමාර්ථය උදෙසා මෙම ඇදහිලිවන්තයන්ගේ ලෝක ව්‍යාප්ත සහභාගීත්වය ප්‍රාදේශීය ඇදහිලිවන්ත කණ්ඩායම්වලට බෙදා තිබේ. මෙම ප්‍රාදේශීය කණ්ඩායම් ද සභාව ලෙස හැඳින්වේ. මෙම ප්‍රාදේශීය කණ්ඩායම්වලින් අනෙක් ඒවා ස්වාධීනව පවතී. අනෙක් ඒවා එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, බැප්ටිස්ට්, මෙතෝදිස්ත ආදී සංවිධාන ලෙස එකට එක්වී තිබේ.

සංවිධානයකට සම්බන්ධ වීම මගින් ඔබ සැබෑ සභාවේ සාමාජිකයෙකු බවට පත් නොවේ. ඔබ සැබෑ සභාවේ සාමාජිකයෙකු බවට පත්වන්නේ දෙවියන්වහන්සේගේ රාජ්‍ය තුළ නැවත ඉපදීම ලැබීමෙනි. මෙය සිදුවන්නේ පව් කියා දී පසුතැවිලි වී යේසුස්වහන්සේ ඔබේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙනි. ඔබ ඇදහිලිවන්තයකු වු පසු, ඔබ උදෙසා ඇති දෙවියන්වහන්සේගේ සැළැස්ම නම් ඔබ සැබෑ සභාවේ කොටසක් වන ප්‍රාදේශීය ඇදහිලිවන්තයන්ගේ සහභාගීත්වයක කොටසක් බවට පත් වීමයි.

## සභාව ආරම්භ වූයේ කෙසේද?

පරණ ගිවිසුමේ දෙවියන්වහන්සේ ලෝකයේ ජාතින්ට තමන්ව එළිදරව් කළ හැකි මනුෂ්‍යයන් කණ්ඩායම ලෙස ඉශ්‍රායෙල් සෙනඟ තෝරාගෙන තිබුණි. වරින් වර මෙම වගකීම ඉටුකිරීමට ඉශ්‍රායෙලය අසමත් විය.

නව ගිවිසුම් කාලයේදී යේසුස්වහන්සේ පොළොවට පැමිණි විට ඉශ්‍රායෙලය උන්වහන්සේ තම මෙසියස්වහන්සේ ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කළහ. මේ හේතුවෙන් තමන්වහන්සේ ලෝකයට එළිදරව් කිරීම සඳහා දෙවියන්වහන්සේ තවත් මනුෂ්‍යයන් කණ්ඩායමක් නැගිටවූ සේක. එම කණ්ඩායම සභාව නම් වේ.

"සභාව" නැමති වචනය මුලින්ම සඳහන් වන්නේ යේසුස්වහන්සේ සභාව ගොඩනගන ආකාරය පැහැදිලි කළ අවස්ථාවේය.

> **මම නුඹට කියමි: නුඹ පේතෘස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි; පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. (මතෙව් 16:18)**

පේතෘස් පළමු සභාවේ ආත්මික මුල්ගල්වලින් එකක් වන බව මෙම කොටසේදී යේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක. මෙහි අදහස එහි වර්ධනයේදී හා සංවර්ධනයේදී ඔහු වැදගත් වනු ඇති බවයි. පේතෘස්ගේ නමේ සැබෑ අර්ථය නම් "ගල හෝ පර්වතය" යන්නයි.

"මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගමි" යි යේසුස්වහන්සේ ඉන් පසුව තමන්වහන්සේ ගැන පැවසූ සේක. එයින් උන්වහන්සේ අදහස් කළේ සභාව උන්වහන්සේ මත පිහිටුවනු ලබන බවයි. සභාව ගොඩනගනු ලබන "පර්වතය" උන්වහන්සේය. එහි තවත් වෙනත් ගල් ද තිබිය හැකිය. (පේතෘස් වැනි මනුෂ්‍යයන්). එසේම ඇදහිලිවන්තයන්ව හඳුන්වනු ලබන්නේ සභාව නැමැති ආකෘතියේ කොටස් වන "ජීවමාන ගල්" වශයෙනි.

> **නුඹලාත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේට ප්‍රසන්නවූ ආත්මික පූජා ඔප්පුකරන පිණිස ශුද්ධ පූජක සමූහයක් වීමට ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩනගනු ලබන්නහුය. (1 පේතෘස් 2:5)**

මෙම "ජීවමාන ගල්" වල අත්තිවාරම "පර්වතය" වේ. එම පර්වතය යේසුස්වහන්සේ වන අතර එය සභාවේ සීමාවන් නිර්වචනය කරයි. සභාව ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත පිහිටුවන තුරු එය සැබෑ සභාවක් නොවේ.

සංවිධානය වීමේ හා සේවයේ අරමුණු උදෙසා වසර ගණනාවක් තිස්සේ බොහෝමයක් විවිධ සභාවන් හා නිකායන් බිහිවී තිබේ. ඒවා ක්‍රිස්තුස්වහන්සේ මත පිහිටුවනු ලැබූ සැබෑ සභාවන් නම්, ඒ සියල්ලම ලෝක ව්‍යාප්ත ඇදහිලිවන්තයන්ගේ සහභාගීත්වයේ කොටස්ය:

> **"නුඹලාගේ කැඳවීමේ එක බලාපොරොත්තුවට නුඹලා කැඳවනු ලැබූ ලෙසම, ඇත්තේ එක ශරීරයත්, එක ආත්මයාණන්වහන්සේත්, එක ස්වාමීන්වහන්සේත්, එක ඇදහිල්ලත්, එක බව්තිස්මයත්, සියල්ලන් කෙරෙහිද සියල්ලන් කරණකොටගෙනද සියල්ලන් තුළද පවතින්නාවූ, සියල්ලන්ට එකම පියවූ දෙවියන් වහන්සේත්ය" (එපීස 4:4-6).**

"පාතලයේ දොරටු" සැබෑ සභාවට එරෙහිව ජය නොගන්නා බව යේසුස්වහන්සේ පැවසූ සේක. මෙයින් පැවසෙන්නේ සභාවට සාතන්ගෙන් මහත් පීඩාවන් පැමිණෙනු ඇති බවයි, නමුත් සභාව ඉන් පරාජය නොවනු ඇත.

සභාවට පැමිණි මුල්ම විරුද්ධවාදිකම බයිබලයේ ක්‍රියා පොතෙහි වාර්ථා වේ (ක්‍රියා 8). ඉතිහාසය පුරා වර්තමානය දක්වාම, සභාවට බොහෝ විරුද්ධවාදිකම් සිදු වී ඇත. නමුත් එය තවමත් පවතින අතර ඉදිරියටත් පවතිනු ඇත. එය දෙවියන්වහන්සේගේ අරමුණු ඉටු කරනු ඇත.

## සභාව විස්තර කර ඇත්තේ කෙසේද?

සභාව විස්තර කිරීමට බයිබලයේ උදාහරණ කිහිපයක් පාවිච්චි කර ඇත. සභාවේ ආකෘතිය හා අරමුණු පිළිබඳව බොහෝ දේ මෙම උදාහරණ මගින් එළිදරව් වේ. පහත සඳහන් සෑම බයිබල් කොටසක්ම ඔබේ බයිබලයෙන් කියවන්න. සභාව මෙසේ විස්තර කර තිබේ:

නව මිනිසෙක් : එපීස 2:14-15

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය : එපීස 1:22-23; 5:30; 1 කොරින්ති 12:27

දෙවියන්වහන්සේගේ මාලිගය හෝ ගොඩනැගිල්ල : එපීස 2:21-22; 1 කොරින්ති 3:9,16; 1 තිමෝති 3:15; 1 පේතෘස් 2:5.

රාජකීය පූජක වංශයක් : 1 පේතෘස් 2:5,9; එළිදරව් 1:6; 5:10

ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය : 2 කොරින්ති 11:2; මතෙව් 25:6; එපීස 5:22-32.

දෙවියන්වහන්සේගේ පවුලේ අය : එපීස 2:19

දෙවියන්වහන්සේගේ බැටළු රැළ : යොහන් 10:1-29; 1 පේතෘස් 5:3-4; හෙබ්‍රෙව් 13:20; ක්‍රියා 20:28

ඇත්තේ එක් සභාවක් වන නමුත් බයිබලයේ එය විවිධ ආකාරවලින් දක්වා ඇත. එය පහත පරිදි හැඳින්වේ.

දෙවියන්වහන්සේගේ සභාව : ක්‍රියා 20:28; 1 කොරින්ති 1:2; 10:32; 11:22; 15:9; 1 තිමෝති 3:5; 1 තෙසලෝනික 2:14

ජීවමාන දෙවියන්වහන්සේගේ සභාව : 1 තිමෝති 3:15

ක්‍රිස්තුස්වහන්සේගේ සභාව : රෝම 16:16

කුලුඳුලාගේ සභාව :ෙ හබ්‍රෙව් 12:23

ශුද්ධාත්මයාණන්ගේ සභාව : 1 කොරින්ති 14:33

දෙවියන්වහන්සේගේ සෙනඟ : හෙබ්‍රෙව් 4:9; 1 පේතෘස් 2:9-10.

## සභාව උදෙසා බයිබලයේ සඳහන් පරමාර්ථ

අරමුණු රැසක් බයිබලය එළිදරව් කර තිබේ. එහි සාමාජිකයන් පහත ක්‍රියාවන්හි නිරත විය යුතුය.

### දෙවියන්වහන්සේ නමස්කාර කිරීම :

මනුෂ්‍යයා මවනු ලැබූ මූලිකම අරමුණ නම් දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටය. නමස්කාරය සභාවේ කේන්ද්‍රගත අරමුණකි. පහත බයිබල් පද අධ්‍යයනය කරන්න: 1 පේතෘස් 2:5,9; 1 කොරින්ති 14:26-27; යොහන් 4:23-24; එපීස 2:19-22

## ශරීරය තුළ සේවය කිරීම :

සභාවේ සාමාජිකයන් එකිනෙකාගේ අවශ්‍යතාවයන්ට උපකාර කිරීම මගින් සේවය කළ යුතුය.

- මෙම අවශ්‍යතාවයන් ද්‍රව්‍යමය අවශ්‍යතාවන් විය හැකිය : ක්‍රියා 11:27-30; 6:1-6
- සාමාජිකයන් තමා සතු දේවල් අන්‍යයන් සමඟ බෙදාගත යුතු විය : ක්‍රියා 2:44;4:32,34,37
- ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඇති ආත්මික අවශ්‍යතාවයන් ගැනද සාමාජිකයන් සැලකිලිමත් විය යුතුය. යොහන් 15:1-7;රෝම 15:1-15; 1 කොරින්ති 3:9; ගලාති 6:1; කොලොස්සි 2:16-23; 1 තෙසලෝනික 2:7-16

## සහභාගිත්වය :

- සභාවේ සහභාගිත්වය ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්සත් වීම මත රඳා පවතී : එපීස 4:4-6

- ක්‍රිස්තුස්වහන්සේ තුළ සභාව ඒකත්වයට පත් කරනු ලැබේ: එපීස 2:11-18. සෑම සාමාජිකයකුම ස්වාමින්වහන්සේ ඉදිරියේ සමානය: එපීස 2:19-20.

- වචනයෙන්, යාච්ඤාවෙන් හා ක්‍රියාවෙන් සහභාගිත්වය දරන ප්‍රජාවක් බවට සභාව පත් විය යුතුය: ක්‍රියා 2:41-47; 4:24, 32-33; එපීස 2:20-22; 1 යොහන්

- එකම අරමුණක්, මනසක්, ප්‍රාණයක් හා ආත්මයක් ලෙස ඔවුන්ගේ සහභාගිත්වය එක්සත් විය යුතුය: ක්‍රියා 1:14; 2:46; 4:24,32; 5:12; 15:25

සහභාගිත්වය තිබිය යුත්තේ තනි සභාවක් තුළ පමණක් නොව සභාවන් අතරද එය තිබිය යුතුය. මුල්කාලීන සභාවන් අතර ද තිබූ සමීප සම්බන්ධතාව නිරූපණය කරන පහත බයිබල් කොටස් අධ්‍යනය කරන්න:

- පොදු බැම්මකින් බඳිනු ලැබ ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකත්වයට පත්ව ඇති බව ඔවුහු විශ්වාස කළහ: ක්‍රියා 15:1; රෝම 15:26-27

- ඔවුන් නිරන්තරයෙන් එකිනෙකා අතර සන්නිවේදනය කළහ: රෝම 16:16; 1 කොරින්ති 16:19-20; පිලිප්පි 4:23.

- ඔවුහු එකිනෙකාට උපකාර කළහ: රෝම 15:26; 1 කොරින්ති 16:1-3

- වෙනත් ක්ෂේත්‍රයන්වලට ශ්‍රමය යෙදවීමට ඔවුහු අපොස්තුළුවරුන්ට සහයෝගය දැක්වූහ : පිලිප්පි 4:15-16.

- ඔවුහු අපොස්තුළුවරුන්ගෙන් ලද ලිපි බෙදා ගත්හ: කොලොස්සි 4:16.

- ඔවුහු එකිනෙකාට නියෝජිතයන් යැවූහ: ක්‍රියා 11:22,23,27; 15:1,2; 1 කොරින්ති 16:3,4.

- ඇදහිල්ලේ නිරූපණයන් ලෙස ඔවුහු එකිනෙකා ධෛර්යවත් කළහ: 2 කොරින්ති 1:24;9:2; 1 තෙසලෝනික 1:7-10; 2:14.

- ශුභාරංචිය ප්‍රකාශ කිරීම නැමති පොදු කාර්යය තුළ ඔවුහු සහයෝගයෙන් ක්‍රියා කළහ: 1 තෙසලෝනික 1:8.

## මිෂනාරි සේවය:

සභාවේ පවතිනුයේ නමස්කාරයේ හා සහභාගීත්වයේ රැස්වීම් උදෙසා පමණක් නොවේ. එය පවතිනුයේ මිෂනාරි සේවය උදෙසාය. පරණ ගිවිසුමේ ඉශ්‍රායෙලය හා නව ගිවිසුමේ සභාව යන දෙකෙහිම අරමුණ ලෝකයට දෙවියන්වහන්සේ එළිදරව් කිරීමය.

පරණ ගිවිසුම තුළ, ඉශ්‍රායෙලය තමන් වටා සිටි අන්‍ය ජාතීන්ට සාක්ෂියක් විය යුතු විය. දෙවියන්වහන්සේගේ උපක්‍රමය වූයේ ජාතින් පැමිණ ඉශ්‍රායෙලය තුළින් එළිදරව් වන උන්වහන්සේගේ බලය දැකීමය. නව ගිවිසුම තුළ දෙවියන්වහන්සේගේ උපක්‍රමය වෙනස්ය. උන්වහන්සේගේ සැළැස්ම වූයේ සභාව උන්වහන්සේගේ සාක්ෂිකරුවන් ලෙස ලෝකයට යාමය. සභාවේ සැබෑ සේවය එපිස පොතෙහි සාරාංශ කර ඇත:

> **"එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රායකරන ලද සදාකාග අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්නට ලැබෙන පිණිසය." (එපිස 3:10-11)**
>
> **"එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස් වහන්සේ තුළ ඒකරාශි කරන්නට, තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය." (එපිස 1:9-10)**

සභාවේ මෙහෙවර පහත පරිදි සාරාංශගත වේ :

1. සභාව ස්වාමීන්වහන්සේ හෝ ගැළවුම්කරු ලෙස යේසුස්වහන්සේ ලෝකයට ඉදිරිපත් කළ යුතුය. මනුෂ්‍යයන් පව්වලට සමාව ලබාගෙන නව ජිවිත අද්දැකීම තුළින් යේසුස්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවක් ඇති කර ගැනීමට සභාව ඔවුන්ට මඟපෙන්විය යුතුය.

2. වතුර බව්තිස්මය, ඉගැන්වීම හා දේශනාකිරීම් තුළින් සභාව විසින් ඇදහිලිවන්තයන් කිතුනු ජිවිතයේ දේව ධර්ම, ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් තුළ පිහිටුවනු ලැබිය යුතුය. දේව වචනයේ අණ කර ඇති "සියලු දේවල්" පිළිපැදීමට ඔවුන් දෙවියන්වහන්සේ වෙතට හැරුණාවූ අයට ඉගැන්විය යුතුය.

3. සභාව විසින් නව ඇදහිලිවන්තයන් ක්‍රියාකාරී ප්‍රාදේශීය සහභාගීත්වයන් ලෙස සංවිධානය කරනු ලැබිය යුතුය.

4. නව ඇදහිලිවන්තයන් දිනාගැනීමට හා නව සහභාගීත්වයන් පිහිටුවීමට මෙම පිහිටුවනු ලැබූ සභාවන් විසින් මෙම ක්‍රියාවලිය නැවත නැවත කරගෙන යා යුතුය.

   සභාවේ සේවය පිළිබඳ පහත බයිබල් කොටස්වලින් තවත් දේ අධ්‍යනය කරන්න :

   ලෝකයට ශුභාරංචිය ව්‍යාප්ත කිරීම : මතෙව් 5:13-14; 28:18-20; මාර්ක් 16:15-16; ලූක් 24:45-49; යොහන් 20:19-23; ක්‍රියා 1:8.

   ලෝකයේ ආලෝකය ලෙස හා පොළොවේ ලුණු ලෙස සේවය කිරීම : මතෙව් 5:13-16; පිලිප්පි 2:14-16; 1 යොහන් 4:1.

   අලුතින් හැරුණු අය ගෝලත්වයට ගෙන ඒම : මතෙව් 28:19-20; ක්‍රියා 20:27; එපිස 4:11-16; 1 පේතෘස් 5:1-3.

## සභාවන් වර්ධනය වන ආකාර :

සභාව දේව වචනය තුළ තමන්ගෙන් අපේක්ෂිත අරමුණු ඉටුකළහොත්, එහි ප්‍රතිඵලයක් ලෙස හතර ආකාරයක වර්ධනයක් ඇති වනු ඇත:

### අභ්‍යන්තර වර්ධනය :

අභ්‍යන්තර වර්ධනය යනු සභාව තුළ සිටින පුද්ගලයන්ගේ ආත්මික වර්ධනයයි.

### විශාල වීම තුළින් වර්ධනය :

විශාල වීම තුළින් වර්ධනය යනු සභාව ශුභාරංචිය සේවය ඉටු කරන විට සිදුවන ගණනින් වර්ධනය වීමයි. නව ඇදහිලිවන්තයන් දිනා ගනු ලබන අතර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළට ඔවුන් ඇතුල් කරනු ලැබේ.

### දුරස්ථ වර්ධනය :

සමාන සංස්කෘතීන් තුළ නව සභාවන් ආරම්භ කරන විට සභාව දුරස්ථ වර්ධනයක් වේ.

### සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම :

සංස්කෘතික සීමාව හරහා වෙනත් ජාතියක්, ජන වර්ගයක් හෝ දේශයක මිනිසුන් සමග ශුභාරංචිය බෙදාගනු ලැබූ විට සම්බන්ධ වීම තුළින් වර්ධනය සිදුවේ.

### සභාව වර්ධනය වන විවිධ ආකාරයන් දක්වන රූප සටහන් පහත දැක්වේ :

**අභ්‍යන්තර :**

⇨ ❍ ⇦

**විශාල වීම :**

⇦ ❍ ⇨

**දුරස්ථ වීම**

❍ ⇨ ❍

**සම්බන්ධ වීම**

❍ ⇨ ❑

ප්‍රාදේශීය සභාව තුළ ගුණනය වීම පිළිබඳව අවධානය යොමු කරන මීළඟ පරිච්ඡේද හතර තුළදී මෙම වර්ධනය වීමේ ආකාරයන් එක එකක් ගැන ඔබ ඉගෙන ගනු ඇත.

## ශුද්ධාත්මයාණන්වහන්සේ හා සභාව වර්ධනය වීම

සියලු ආකාර සභා වර්ධනයක් පිටුපස ඇති ආත්මික බලය ශුද්ධාත්මයාණන්වහන්සේය :

> **"නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක." (ක්‍රියා** 1:8)

මෙම පදය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ පහත දේවල්වලට උපකාර කරන ආකාරය දැක්වේ:

> **අභ්‍යන්තර වර්ධනය :** ශුද්ධාත්මයාණන්ගේ මෙම විශේෂ වැගිරීමේදී ගෝලයන් නව ආත්මික අන්දැකීමක් ලබනු ඇත. ශුභාරංචිය පිළිබඳ බලවත් සාක්ෂිකරුවන් වීමේ හැකියාව මෙමගින් ඔවුන්ට ලැබෙනු ඇත.

**විශාල වීම තුළින් වර්ධනය :** සභාව යෙරුසලම තුළ ගුණනය වනු ඇත.

**දුරස්ථ වීම තුළින් වර්ධනය :** සමාන සංස්කෘතීන් තුළ නව සභාවන් ආරම්භ කිරීම සඳහා සභාව දුරස්ථ වනු ඇත. (යුදය)

**සම්බන්ධ වීම තුළින් වර්ධනය** : සමාරිය හා "පොළොවේ සියලු සීමා" කරා ළඟා වීම සඳහා සභාව විසින් විවිධ සංස්කෘතීන් සම්බන්ධ කරනු ඇත.

ශුද්ධාත්මයාණන්වහන්සේට විවිධ සේවයන් ඇති බව බයිබලය උගන්වයි. ලෝකය මැවීමේදී උන්වහන්සේ ක්‍රියා කළ සේක. දේව වචනය ලිවීමේදී දේවානුභාවයේ බලය ශුද්ධාත්මයාණන්වහන්සේ විය. දෙවියන්වහන්සේ පොළොවේ ගත කල ජීවිතය හා සේවය තුළ ක්‍රියාත්මක විය. එසේම ඇදහිලිවන්තයන් උදෙසා බොහෝ සේවයන් ඉටු කරන සේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ශුභාරංචියේ සත්‍ය එළිදරව් කරමින් පුරුෂයන් සහ ස්ත්‍රීන් ගැළවීම කරා ආකර්ෂණය කරගන්නා සේක. ශුද්ධාත්මයාණන්වහන්සේට සාතන් හා සම්බන්ධ සේවයක්ද ඇත. සාතන්ගේ බලය සීමා කරමින් බාධා ඇති කරන ආත්මික බලය උන්වහන්සේය (යෙසායා 49:19). "ශුද්ධාත්මයාණන්ගේ සේවය" නැමති හාමස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව තුළ උන්වහන්සේගේ සෑම සේවයක්ම විස්තරාත්මකව සාකච්ඡා වේ.

සභාවේ වර්ධනයට හා සංවර්ධනයට බලපාන විශේෂිත සේවයක්ද ශුද්ධාත්මයාණන්වහන්සේට තිබේ:

## සභාව නිර්මාණය කළේ ශුද්ධාත්මයාණන්වහන්සේය

ක්‍රියා 2:1-14 හි සඳහන් පෙන්තකොස්ත දවසේදී ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව නිර්මාණය කළ සේක. සභාව යනු ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද දෙවියන්වහන්සේගේ වාසභූමිය බව බයිබලය උගන්වයි :

> **"ඒ නිසා නුඹලා තවත් විදේශිකයෝවත් ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමග එක නුවර වැසියෝව දෙවියන් වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය. නුඹලා ප්‍රේරිතයන්ගේත් ප්‍රොපේතවරුන්ගේත් අත්තිවාරම පිට ඉදිකරනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස් වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටින සේක. උන්වහන්සේ තුළ මුළු ගෙඩනැගිල්ල හොඳ හැටියට එකතුකරනලදුව, ස්වාමීන් වහන්සේ තුළ ශුද්ධවූ මාලිගාවක්ව සෑදිගන යන්නේය. උන්වහන්සේතුළ නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගන ලද්දහුය." (එපීස 2:19-22)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ නමස්කාරයට පොලඹවයි :

සභාවේ නමස්කාරය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පොලඹවනු ලැබ විය යුතුය:

> **"නුමුත් සැබෑ නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාළය පැමිණෙන්නේය, දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳුවූවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාරකළ යුතුයයි කීසේක." (යොහන් 4:23-24)**
>
> **"මක්නිසාද චර්මඡේදිතයෝ නම් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන නමස්කාරකරන්නාවූ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පාරට්ටුකරගන්නාවූ, මාංසය තුළ විශ්වාසයක් නැත්තාවූ අපිය." (පිලිප්පි 3:3)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ සේවය සම්බන්ධ ක්‍රියාවන්ට මඟපෙන්වයි :

මුල් සභාවේ සේවා ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවන් මෙයට සාක්ෂි දරයි :

**"එවිට ආත්මයාණන් වහන්සේ පිලිප්ට කථා කොට: නුඹ මේ රථය ළඟට ගෙස් එක්වෙන්නැයි කීසේක." (ක්‍රියා 8:29)**

**"ඔව්හු ආසියාවේදී වචනය කියා දෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය: ඔව්හු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහකළෝය: නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන් සේක." (ක්‍රියා 16:6,7)**

**"ඔහු දර්ශනය දුටු කළ, ඔවුන්ට ශුභාරංචිය දේශනාකරන්ට දෙවියන් වහන්සේ අඬගැසූ බව තේරුම්ගෙන, එකෙණෙහිම මකිදෝනියට යන්ට අපි උත්සාහකෙළෙමුව." (ක්‍රියා 16:10)**

**"ඔවුන් ස්වාමීන් වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන් වහන්සේ කථා කොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරන්නැයි කීසේක." (ක්‍රියා 13:2)**

**"මෙසේ ඔව්හු ශුද්ධාත්මයාණන් විසින් යවනලදුව සිලූකියට බැසගොස්, එහිදී නැව් නැගී කුප්‍රසයට ගියෝය," (ක්‍රියා 13:4)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ සේවකයන් තෝරා ගනී :

ඇතැම් නිකායන් සභාවට සේවය කිරීමට සේවකයන් ඡන්දයෙන් පත්කර ගනී. සේවකයන් ලෙස පුහුණුව ලැබීමට බොහෝ අය බයිබල් විද්‍යාල වෙත යති. නමුත් දේව වචනය තුළ දක්වා ඇති අවශ්‍යතාව නම් සේවකයන් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කැඳවා ගැනීම හා තෝරා ගැනීමයි.

**දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේට ගත් තමන්ගේ සභාව පෝෂණයකරන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ යම් රැළෙක්හි නුඹලා නායකයන් කොට නියමකළසේක්ද, ඒ මුළු රැළ ගැනත් නුඹලා ගැනත් ප්‍රවේශම්වෙන්න. (ක්‍රියා 20:28)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ දේශකයන් ආලේප කරයි :

-පාවුල් මෙසේ ලිවේය :

**මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. (1 කොරෙන්ති 2:4)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ තීරණවලට මඟපෙන්වයි :

සභාවේ විවිධ ප්‍රශ්න සාකච්ඡා කිරීමට නායකයන් පැවැත්වූ රැස්වීමක් ක්‍රියා 15 හි සඳහන් වේ. ඔවුන්ගේ අවසන් තීරණයට මඟපෙන්වනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේය.

**එනම් රූපවලට පූජාකළ දේවලින්ද ලෙයින්ද බොටුව මිරිකා මැරූ සතුන්ගෙන්ද වේශ්‍යාකමින්ද නුඹලා වලකින්නට ඕනෑවා මිස, වෙන කිසි බරක් නුඹලා පිට නොතබන්ට ශුද්ධාත්මයාණන්ටත් අපටත් යහපතැයි පෙනීගියේය. (ක්‍රියා 15:28)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව බලයෙන් බෞතිස්ම කරයි :

මෙම මහත් සිදුවීම පිළිබඳ වාර්තා ක්‍රියා පොතෙහි සඳහන් වේ.

**තවද පෙන්තකොස්ත දවස පැමිණි කල ඔවුන් සියල්ලෝ එකතැනක රැස්ව සිටියෝය. තද හුළඟක් හමන්නාක්මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන උන්නාවූ මුළු ගෙය පිරුණේය. ගිනි වැනි වූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය: එය ඔවුන් එක්එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන්**

**ඔවුන්ට කථාකරන්නට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්නට පටන්ගත්තෝය. (ක්‍රියා 2:1-4)**

ක්‍රියා පොතේ සෙසු කොටස්වල වාර්තා වන සභාවේ අභ්‍යන්තර, විශාල වීම, දුරස්ථ වීම, සම්බන්ධ වීම, තුළින් සිදු වු වර්ධනයන් පිටුපස ඇති බලවත් බලවේගය මෙම බෞතිස්මයයි.

# ස්වයං පරීක්‍ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සැබෑ සභාව සමන්විත වන්නේ කාගෙන්ද?

3. සභාව ආරම්භ වූයේ කෙසේද?

4. සභාව විස්තර කිරීමට බයිබලය තුළ යොදාගත් උදාහරණ කිහිපයකි. එයින් තුනක් හෝ ඔබට මතක තිබේද?

5. මෙම පාඩම තුළ සාකච්ජා කරන ලද සභාවේ අරමුණු හතර මොනවාද?

6. සභාව වර්ධනය වන ආකාර හතර නම් කර කෙටියෙන් නිර්වචනය කරන්න.

7. සභාවේ වර්ධනයට හා සංවර්ධනයට සම්බන්ධ ශුද්ධාත්මයාණන්වහන්සේගේ අරමුණු හතරක් මෙම පරිච්ජේදය තුළ විස්තර කරයි. එයින් කීයක් ඔබට ලැයිස්තුගත කළ හැකිද?

]

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා

1. **සැබෑ** සභාව හදුනාගත හැකි මාර්ගෝපදේශ සමහරක් පහත දැක්වේ. එය පහත ආකාරයේ සභාවකි.

   - දේව ධර්මය අනුව නිවැරදිය: සියලුම ඉගැන්වීම් දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය මත පදනම් වී තිබේ.

   - එය නව උත්පාදනයක් ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත වේ: එහි සාමාජිකයන්ගේ ජීවිත දෙවියන්වහන්සේගේ බලයෙන් වෙනස් කරනු ලැබ තිබේ.

   - නමස්කාර කරයි : සැබෑ වූ එකම පියවූ දෙවියන්වහන්සේ, පුත්‍රවූ දෙවියන්වහන්සේ හා ශුද්ධාත්ම වූ දෙවියන්වහන්සේ නමස්කාර කරයි.

   - ශුභාරංචිය ප්‍රකාශ කරයි: යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ලෝකයට ගෙනයාමේ සේවයෙහි ක්‍රියාශීලිව දායක වී සිටිති.

2. **ව්‍යාජ** සභාව හදුනාගත හැකි මාර්ගෝපදේශ සමහරක් පහත දැක්වේ. එය පහත ආකාරයේ සභාවකි.

   - දේව ධර්මය අනුව නිවැරදි නොවේ : ඔවුහු දේව වචනයේ තෝරාගත් කොටස් ඉස්මතු කර දක්වන අතර සෙසු කොටස් අතහැර දමයි. ඔවුහු දෙවියන්වහන්සේගේ වචනය තිබෙන ආකාරයෙන්ම පිළි නොගනිති. දෙවියන්වහන්සේගේ වචනයට පටහැනි මනුෂ්‍යයන්ගේ ඉගැන්වීම් ඔවුහු පිළිගනිති.

   - බෙදී තිබේ : සභාව තුළ බෙදීම් තිබිය හැකි අතර සමස්තයක් ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ බෙදීම් ඇති කිරීමට ක්‍රියා කරති. රෝම 16:17-18; ක්‍රියා 20:29-30; එපීස 4.

   - පාලනය කරයි : ව්‍යාජ සභාවක් තම සාමාජිකයන්ගේ ජීවිත හා ක්‍රියාවන් බලවත් ලෙස පාලනය කිරීමට උත්සාහ කරයි.

   - නව උත්පාදනයක් නොලත් සාමාජිකයන්ගෙන් සමන්විත වේ. මනුෂ්‍යයන් තවදුරටත් පැරණි පව්කාර ජීවන රටාව තුළම ජීවත් වෙති.

# හයවන පරිච්ඡේදය

# අභ්‍යන්තර වර්ධනය

## අරමුණු :

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සභාවේ "අභ්‍යන්තර" වර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට,
- "ආත්මික වර්ධනය" යන්න නිර්වචනය කිරීමට,
- ආත්මික වර්ධනයේ සාක්ෂි හඳුනාගැනීමට,
- සභාවේ "අභ්‍යන්තර වර්ධනය" හා සම්බන්ධ ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය පැහැදිලි කිරීමට,
- ආත්මික ලෝකයේ ප්‍රතිපත්තිවලට සමාන්තර වර්ධනය වීමේ කොන්දේසි සම්බන්ධ ස්වභාවික ලෝකයේ ප්‍රතිපත්ති හඳුනා ගැනීමට ඔබට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය :

> **මක්නිසාද උන්වහන්සේ තුළ මුළු පූර්ණකම පැවතීමටත්, උන්වහන්සේගේ කුරුසියේ ලෙයින් සමාදානය උපදවා (කොලොස්සි 1:19).**

### හැඳින්වීම

සභාවේ වර්ධනය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ වර්ධනය වන ආකාර හතරක් ඇති බව පසුගිය පරිච්ඡේදය තුළදී ඔබ ඉගෙන ගත්තේය. සභාව අභ්‍යන්තරව, ව්‍යාප්තවීම තුළින්, දුරස්ථ වීම තුළින් හා සම්බන්ධ වීම තුළින් වර්ධනය විය යුතුය. මෙම පාඩම තුළ අවධානය යොමු කරනුයේ සභාවේ අභ්‍යන්තර වර්ධනය පිළිබඳව වේ.

### අභ්‍යන්තර වර්ධනය

සභාවේ "අභ්‍යන්තර වර්ධනය" පිළිබඳව අප කතා කරන විට, අප අදහස් කරනුයේ එහි සාමාජිකයන්ගේ ආත්මික වර්ධනය හා සංවර්ධනය පිළිබඳව වේ. සභාවේ තනි සාමාජිකයන්ගේ වර්ධනයට සමානුපාතිකව සභාව ආත්මිකව වර්ධනය වේ.

ව්‍යාප්ත වීම, දුරස්ථ වීම හා සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනය තුළ සභාව ප්‍රමාණාත්මකව වර්ධනය වීම පමණක් ප්‍රමාණවත් නොවේ, එය ගුණාත්මකව ද වර්ධනය විය යුතුය. ගුණාත්මකව වර්ධනය වීම යනු අභ්‍යන්තර හෝ ආත්මික වර්ධනයයි.

ස්වාභාවික ශරීරය තුළ සිදුවන අභ්‍යන්තර වර්ධනයට සමාන කරමින් පාවුල් මේ ගැන කතා කළේය :

> **මුළු ශරීරයට පුරුක් සහ නහර කරණකොටගෙන උපකාර කොට, එය සම්බන්ධකර දෙවියන්වහන්සේගේ වර්ධනයෙන් වර්ධනය කරන්නාවූ හිසට නොබැඳී සිටින්නේය (කොලොස්සි 2:19).**

"දෙවියන්වහන්සේගේ වර්ධනය වීම" යනු ආත්මික වර්ධනයයි. සාමාජිකයන් ආත්මිකව වර්ධනය වන විට, සභාව අභ්‍යන්තර වර්ධනය අත්දකී. දෙවියන්වහන්සේගේ වැඩිවීමත් සමඟ සමස්ථ ශරීරයම පෝෂණය ලබන අතර එය වර්ධනය වීමද සිදුවේ.

ආත්මික වර්ධනය යනු ආත්මික පරිණතභාවයේ සිදු වන වර්ධනයකි. එහි ප්‍රතිඵලය නම් ඇදහිලිවන්තයන් තුළ ක්‍රිස්තුස්වහන්සේට සමාන ජීවිතයක් වර්ධනය වීමයි. එය යේසුස්වහන්සේ පිළිබඳ දැනගැන්මේ සිදුවන වර්ධනයයි :

> **එහෙත් අපගේ ස්වාමි වූ ගැළවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද උන්වහන්සේ දැනගැන්මෙහිද වර්ධනය වෙයල්ලා . . . (2 පේතෘස් 3:18).**

එය යේසුස්වහන්සේ තුළ වර්ධනය වීමයි :

> **ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය (එපීස 4:15).**

ආත්මික වර්ධනය යනු තමකම අඩු වී ඔබ තුළ ඇති ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය වැඩි වීමයි :

> **උන්වහන්සේ වර්ධනය වෙන්ටත් මා අඩුවෙන්ටත් ඕනෑය (යොහන් 3:30).**

කෙනෙකු ඇදහිලිවන්තයෙකු වී ගත වන කාලය වැඩි වීමත් සමඟ ආත්මික වර්ධනය යන්න ස්වයංක්‍රියව ඇති වන්නක් නොවේ. එය ඇදහිලිවන්තයෙකු තුළ ඇති ක්‍රිස්තුස්වහන්සේ වැනි වූ ජීවිතය වර්ධනය වීමේ ප්‍රතිඵලයකි.

ආත්මික වර්ධනය පිළිබඳ සාක්ෂිය තුළ පහත දේවල් ඇතුළත්ය :

1. ආත්මික දනුම වර්ධනය වීම.
2. එම දැනුම ජීවිතයට හා සේවයට නිසි ලෙස අදාළ කර ගැනීම.
3. ආත්මික දේවල් තුළ ගැඹුරින් සතුටු වීම.
4. දෙවියන්වහන්සේට හා අන් අයට වඩා වඩා ප්‍රේම කිරීම.
5. ක්‍රිස්තුස්වහන්සේට සමාන ආත්මික ගුණාංග (ආත්මික ඵල) වර්ධනය වීම.
6. අන් අය සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට ඇති ආශාව හා හැකියාව වැඩි වීම.
7. ආත්මික දීමනා වර්ධනය වීම හා ඒවා බලවත් ලෙස පාවිච්චි කිරීම.

වර්ධනය යනු ජීවනයේ ස්වභාවික ප්‍රතිඵලයයි. සභාව තුළ ආත්මික ජීවිතයක් තිබේ නම්, ව්‍යාප්ත වීම, දුරස්ථ වීම හා සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම මෙන්ම අභ්‍යන්තර වර්ධනයද එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වනු ඇත.

## ශුද්ධාත්මයාණන්වහන්සේ හා අභ්‍යන්තර වර්ධනය

ශුද්ධාත්මයාණන්වහන්සේ සභාවට කරන සේවය පසුගිය පරිච්ඡේදය තුළදී ඔබ ඉගෙන ගත්තේය. ශුද්ධාත්මයාණන්වහන්සේ :

- සභාව නිර්මාණය කළ සේක.
- එහි නමස්කාරය උදෙ‍්‍යාගිමත් කරන සේක.
- එහි ශුභාරංචි ක්‍රියාකාරකම්වලට මඟපෙන්වන සේක.
- එහි සේවකයන් තෝරන සේක.
- එහි දේශකයන් ආලේප කරන සේක.
- එහි තීරණයන්ට මඟපෙන්වන සේක.
- එය බලයෙන් බව්තීස්ම කරන සේක.

සභාව තුළ මෙම කාර්යයන්ට අමතරව, සභාවේ අභ්‍යන්තර වර්ධනය හා සම්බන්ධව ද ශුද්ධාත්මයාණන්වහන්සේ සතුව වැදගත් කාර්යයන් රැසක් තිබේ. ඒ තුළ පහත දේ අන්තර්ගතය :

### පාපය අඟවා දීම :

පාපය ආත්මික වර්ධනයට බාධා කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ට පාපය අඟවා දෙන සේක :

**උන්වහන්සේ ආ කල, පාපය ගැනද, ධර්මිෂ්ඨකම ගැනද, විනිශ්චය ගැනද ලෝකයාට අඟවාදෙන සේක. පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඇදහන නිසාය; ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ පියාණන්වහන්සේ ළඟට යන බැවින් තවත් නුඹලා මා නොදක්වා නිසාය. විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරනු ලැබ සිටින නිසාය (යොහන් 16:8-11).**

ශුද්ධාත්මයාණන්වහන්සේ පාපය අඟවා දුන් විට, ඉන් පසු අපට පහත ආඥාව අනුගමනය කළ හැකිය . . .

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක (1 යොහන් 1:9).**

## පුනරුත්ථානය :

"පුනරුත්ථානය" යනු වෙනස්වීමයි. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ජීවිත වෙනස් කරන සේක. එවැනි වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස අභ්‍යන්තර වර්ධනය ඇති වේ :

**අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත්කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූසේක (තීතස් 3:5).**

## පවිත්‍ර කිරීම :

පවිත්‍ර වීම යනු "දෙවියන්වහන්සේ උදෙසා වෙන් කරනු ලැබීම" වේ. මෙම වෙන්කිරීමේ ප්‍රතිඵලය ආත්මික වර්ධනයයි :

**නුමුත්, ස්වාමින්වහන්සේ විසින් ප්‍රේමකරනු ලබන සහෝදරයෙනි, ආත්මයාණන්වහන්සේගේ පිරිසිදුකිරීමද සැබෑව ඇදහීමද කරණකොටගෙන නුඹලා ගැළවෙන පිණිස දෙවියන්වහන්සේ පටන්ගැන්මේ සිට නුඹලා තෝරාගත් නිසා නුඹලා ගැන දෙවියන්වහන්සේට නිතරම ස්තුතිකරන්ට අපි බැඳී සිටිමුව (2 තෙසලෝනික 2:13).**

## වාසයකිරීම :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ ජීවිතවල වාසය කරන හෝ ජීවත් වන සේක. මෙම වාසය කිරීමේ අරමුණ නම් ගැළවීම නිසා ලද නව ස්වභාවය දිරිමත් කිරීමයි :

**නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? (1 කොරින්ති 6:19).**

**නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බවද නොදවුද? (1 කොරින්ති 3:16).**

**එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත්වී තිබේ (2 කොරින්ති 5:17).**

**නුමුත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරියල්ලා, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණකරන්නේ නැතයි කියමි. මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමතිවන දේ නොකරන ලෙස මොව්හු එකිනෙකාට විරුද්ධවෙති. නුමුත් නුඹලා ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන්නහු නම්, නුඹලා ව්‍යවස්ථාව යටතේ නොවන්නහුය (ගලාති 5:16-18).**

## ශක්තිමත් කිරීම :

ශක්තිය හා වර්ධනය යන්න එකිනෙකට සම්බන්ධ වේ. ඔබ වර්ධනය වන විට ඔබ ශක්තිමත් වේ. වර්ධනය වීමට ශක්තිය අවශ්‍යය. අභ්‍යන්තර වර්ධනය ඇති වන්නේ ශුද්ධාත්මයාණන්ගේ ශක්තිමත් කිරීම තුළින් වේ :

> **උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත් (එපීස 3:16).**

## එක්සත්බව :

එක්සත් බව සභාව තුළ අභ්‍යන්තර වර්ධනය ඇති කරයි :

> **නුමුත් ස්වාමින්වහන්සේට එක්වූ තැනැත්තේ එක ආත්මයය (1 කොරින්ති 6:17)**
>
> **මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතුවාක්මෙන්ද, ශරීරයේ අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක්ව තිබෙන්නාක්මෙන්ද, ක්‍රිස්තුස්වහන්සේ එසේව සිටිනසේක. මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වෙත්වා, දාසයෝ නොහොත් නිර්දාසයෝ වෙත්වා, අපි සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තිස්මකරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව (1 කොරින්ති 12:12-13).**

## මැදහත්කාරකම :

ශුද්ධාත්මයාණන්ගේ මැදහත්කාරකම ඇදහිලිවන්තයන්ව ආත්මිකව වර්ධනය කරයි :

> **එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරනසේක. මක්නිසාද යුතුලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව; නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගැම්වලින් අප උදෙසා මැදහත්කම් කරනසේක (රෝම 8:26).**
>
> **නුමුත් ප්‍රේමවන්තයෙනි, නුඹලා වනාහි නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාම ගොඩනඟා ගනිමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ සිට යාච්ඤා කරමින් (යුද් 20).**
>
> **සියලු යාච්ඤාවලින්ද ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤාකරපල්ලා (එපීස 6:18).**

## මඟපෙන්වීම :

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින්, ආත්මික වර්ධනය ගෙන දෙන දෙවියන්වහන්සේගේ වචනය වෙත ඇදහිලිවන්තයන්ට මඟපෙන්වන සේක :

> **එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වනසේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරනසේක" (යොහන් 16:13).**
>
> **මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය (රෝම 8:14).**

## එළිදරව්කිරීම :

ශුද්ධාත්මයාණන්වහන්සේ දේව වචනයේ සත්‍යයන් ඇදහිලිවන්තයන්ට එළිදරව් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආත්මික වර්ධනය ඇති වේ :

**නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව්කළසේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේ ගැඹුරු දේවල් විමසනසේක (1 කොරින්ති 2:10).**

## ප්‍රේමය :

ප්‍රේමයේ වාතාවරණයක් තුළ මනුෂ්‍යයන් ආත්මිකව වර්ධනය වේ :

**බලාපොරොත්තුව ලජ්ජාවට නොපමුණුවන්නේය; මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය (රෝම 5:5).**

## වෙනස් කරනු ලැබීම :

ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ව අභ්‍යන්තරයෙන් යේසුස්වහන්සේගේ ස්වභාවයට ස්ථිර කිරීමේ කාර්යයේ නිරත වේ :

**අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන් වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව (2 කොරින්ති 3:18).**

## ඉගැන්වීම :

දෙවියන්වහන්සේ පිළිබඳ දැනගැන්ම අප තුළ වර්ධනය වන විට අප අභ්‍යන්තරව වර්ධනය වේ. අප තුළ වාසය කරන ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේම වන සේක.

**නුඹලා ගැන වනාහි, නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය. යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනැකරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්නූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ පැවතියල්ලා (1 යොහන් 2:27).**

## සහතික කිරීම :

සැකය ආත්මික වර්ධනයට බාධා කරයි. ගැළවීම පිළිබඳ සහතික කිරීමක් ලබා දීම තුළින් ශුද්ධාත්මයාණන්වහන්සේ සැකය දුරු කරන සේක :

**අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂිදෙනසේක (රෝම 8:16)**

**උන්වහන්සේගේ ආඥා පවත්වන්නා උන්වහන්සේ තුළ පවතියි, උන්වහන්සේද ඔහු තුළ පවතිනසේක. උන්වහන්සේ අප තුළ සිටින බව අප දැනගන්නේ උන්වහන්සේ අපට දුන් ආත්මයෙන්ය (1 යොහන් 3:24).**

## නිදහස :

බාධාවන් වර්ධනය සීමා කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ පාපයෙන් හා මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන්ගෙන් නිදහස ලබා දෙන සේක :

**මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස්කළාය (රෝම 8:2)**

**ඉදින් ඒ ස්වාමීන්වහන්සේ ආත්මයාණන්වහන්සේය. ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඇති තැන නිදහස්කම ඇත්තේය (2 කොරින්ති 3:17)**

## සැනසීම :

කලකිරීම හා අධෛර්යට පත්වීම ආත්මික වර්ධනයට බාධා කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ සැනසීම ලබා දෙන සේක :

> **. . . ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතිව හැසිරෙමින්, ශුද්ධාත්මයාණන්ගේ පිහිට වීමෙන් . . . (ක්‍රියා 9:31).**
>
> **ඒ සැණසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය: මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය: මක්නිසාද උන්වහන්සේ නුඹලා සමඟ නැවතී සිටිනසේක, නුඹලා තුළෙහි සිටින සේක**
> **නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක (යොහන් 14:17,26).**

## ප්‍රාණවත් කිරීම :

යේසුස්වහන්සේගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ කළ සේවයන්ගෙන් එකක් නම් උන්වහන්සේ මරණින් නැඟිටුවීමයි.

> **තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසයකරනසේක් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගේන් නැගිටෙවූ තැනන්වහන්සේ නුඹලා තුළෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත් කරනසේක (රෝම 8:11).**

ඔබ ආත්මිකව පරිණත නොවුණහොත්, ආත්මිකව "මළ" අයෙක් බවට පත් වේ. එවිට වර්ධනය වීමේ ක්‍රියාවලිය නතර වේ. ඔබව නැවතත් ආත්මික ජීවිතයට ඉක්මන් කරනුයේ ශුද්ධාත්මයාණන්ගේ බලයයි.

## බලය ප්‍රදර්ශනය කිරීම :

පාවුල් මෙසේ පැවසුවේය :

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය (1 කොරින්ති 2:4-5).**

ශුද්ධාත්මයාණන් විසින් බලය ප්‍රදර්ශනය කිරීම දෙවියන්වහන්සේ ගැන ඔබට ඇති ඇදහිල්ල වැඩි කරයි.

## සාක්ෂි දැරීමට බලගැන්වීම :

සාක්ෂි දැරීමට ඇති විශේෂ බලය යනු යමෙකු ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම වූ බවට ඇති සාක්ෂියයි :

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක (ක්‍රියා 1:8).**

ආත්මිකව පරිණත වූ ඇදහිලිවන්තයන් ශුභාරංචිය පිළිබඳ තමන් මෙන්ම සාක්ෂි දැරීමේ හැකියාව ඇති අය බිහි කළ හැකි සාක්ෂිකරුවන්ය.

## බව්තිස්ම කිරීම :

ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය තුළින් සභාව අභ්‍යන්තර වර්ධනය අත්දකී.

> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය (ක්‍රියා 2:4).**

ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම වීමේ ප්‍රතිඵල ලෙස ඇදහිලිවන්තයන්ගේ ජීවිතවල ආත්මික දීමනා හා ඵල වර්ධනය වීම සිදු වේ.

## ආත්මික දීමනා ලබා දීම :

ඇදහිලිවන්තයන්ගේ "යහපත් වර්ධනයට" හේතු වන බැවින් අභ්‍යන්තර වර්ධනය සඳහා ආත්මික දීමනා වැදගත් වේ. "යහපත් වර්ධනය" යනු "ආත්මික වර්ධනය ගොඩනැඟීම හා එයට ඉඩ සැලසීමයි" (ඊළඟ පාඩමේදී ආත්මික දීමනා ගැන තවත් දේ ඔබ ඉගෙන ගනු ඇත).

## ආත්මික ඵල වර්ධනය කිරීම :

ආත්මික පල යනු ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ සිටින ආත්මයාණන්වහන්සේගේ ස්වභාවය එළිදරව් වීමයි. සියලු ඇදහිලිවන්තයන්ගේ ජීවිත තුළ තිබිය යුතු ආත්මික ගුණාංග එමඟින් අදහස් කරයි.

ආත්මික පල යනු ආත්මික වර්ධනයේ සාක්ෂියයි. ස්වාභාවික ලෝකයේ ඵල මෙන්ම, එය ජීවයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන නිෂ්පාදනයකි. ස්වභාවික ලෝකය තුළ ඵල වර්ධනය වීමට කාලයක් ගතවන්නාක් මෙන්ම, ආත්මික ඵල ද වර්ධනය වීමට කාලය ගත වේ. එය ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ සිදු වන අභ්‍යන්තර වර්ධනයේ නිෂ්පාදනයකි.

ශුද්ධාත්මයාණන්ගේ ආත්මික ඵලවල ලැයිස්තුවක් පහත දැක්වේ :

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්කම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය (ගලාති 5:22-23).**

දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබ පහත දේවල් තුළ වර්ධනය වනු දැකීමයි :

ප්‍රේමය : ගැඹුරු කරුණාව, සැලකිල්ල හා රැකබලාගැනීම.

ප්‍රීතිය : ජීවිතයේ තත්වයන් මත රඳා නොපවතින සතුට, සොම්නස හා ප්‍රීති සැමරුමයි.

සමාදානය : නිහඬ, සන්සුන්, සමාදානය: ගැටුම්, කනගාටුව හා කනස්සල්ලෙන් තොර වීම.

ඉවසිලිවන්තකම : ඉවසීම - දරාගත අපහසු තත්වයක් ප්‍රීතියෙන් දරාගැනීමට ඇති හැකියාව: දරා ගැනීම.

කරුණාවන්තකම : මෘදු ලෙස ක්‍රියාකිරීම ප්‍රබල, ප්‍රචණ්ඩ හෝ ඝෝෂාකාරී නොවේ: අන් අය වෙත පෙන්වන නිහඬ ගෞරවනීය කරුණාවන්තකම.

යහපත්කම : ශුද්ධකමේ හා ධර්මිෂ්ඨකමේ ක්‍රියාවන්

විශ්වාසකම : දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමේ ආකල්පය.

මෘදුකම : පාලනය කරගත් ශක්තිය.

පමණ දැන ක්‍රියා කිරීම : හැඟීම්, සිතුවිලි හා ක්‍රියාවන් මැදහත් ලෙස තබාගැනීම: ස්වයං - පාලනය.[2]

## වර්ධනය වීම සඳහා වූ කොන්දේසි

ස්වාභාවික ලෝකය තුළ ඵල වර්ධනය හා සංවර්ධනය වීම සඳහා අවශ්‍ය නිශ්චිත කොන්දේසි සමහරක් තිබේ. මෙම ස්වභාවික කොන්දේසි, ආත්මික පරිණතභාවය නැමති ඵලය වර්ධනය වීම සඳහා අවශ්‍ය ආත්මික කරුණුවලට සමාන්තර වේ. එවැනි සමාන්තර කරුණු කිහිපයක් පහත දැක්වේ :

### ජීවය :

ජීවය නොමැතිව වර්ධනයක් තිබිය නොහැකිය. ඵල වර්ධනය වීම ආරම්භ වන්නේ බීජයකිනි. බීජය තුළ ජීවය තිබිය යුතු අතර නොඑසේ නම් එය වර්ධනය නොවේ. වපුරන්නාගේ උපමාව තුළදී, "බීජය" යනු දෙවියන්වහන්සේගේ වචනයයි. වර්ධනය ඇති වන්නේ දේව වචනය නැමති බීජය තුළිනි.

> **ස්වාමීන්වහන්සේ යහපත් බව නුඹලා රසබලා දැනගත්තහු නම්, ආත්මිකවූ අමිශ්‍රවූ කිරිවලින්, නුඹලා ගැළවීම සඳහා වර්ධනයවන පිණිස අලුත උපන් බිළිඳුන් මෙන් එයට බොහෝ ආශාවෙයල්ලා (1 පේතෘස් 2:2,3).**

දේව වචනයේ දෘෂ්‍යමාන ප්‍රකාශ වීම උන්වහන්සේ වූ අතර, බීජය ද උන්වහන්සේ විය, එසේම උන්වහන්සේ තුළ ජීවය ද විය :

> **උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය: ඒ ජීවනය මනුෂයන්ගේ ආලෝකය වූයේය (යොහන් 1:4).**

> **මක්නිසාද, පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක්මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන්සේක (යොහන් 5:26).**

යේසුස්වහන්සේ පැමිණියේ අපගේ ආත්මික වර්ධනයට හැකියාව ලබා දෙන මෙම බීජය අප තුළ සිටුවීමට වේ :

> **සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය (යොහන් 10:10).**

### නිසි ආකාර පස :

දේව වචනය නැමති බීජයට නිසි පරිදි වර්ධනය වීම සඳහා හොඳ පසක් තිබිය යුතුය. මාර්ක් 4 හි සඳහන් වපුරන්නාගේ උපමාව කියවන්න. ආත්මික වර්ධනය ගෙන ආවේ හොඳ පසෙහි වැටුණු බීජ පමණි :

> **සරුබිමේ වපුරනලද්දෝ නම්, වචනය අසා, පිළිගෙන, තිස් ගුණයක්ද සැට ගුණයක්ද සියක් ගුණයක්ද බැගින් ඵල දරන්නෝයයි කීසේක (මාර්ක් 4:20).**

දේව වචනය නැමති බීජය පිළිගැනීම සඳහා ඔබේ හදවත හා මනස යන "භූමිය" ඔබ විසින් පිළියෙල කළ යුතුය.

---

[2] *හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්ගේ සේවය" නැමති පාඩමාලාව තුළ මෙම ආත්මික ගුණාංග එක එකක් සවිස්තරාත්මකව විස්තර කෙරේ.*

**ජලය :**

ස්වභාවික ලෝකය තුළ වර්ධනයට ජලය අවශ්‍ය වේ. දෙවියන්වහන්සේ මෙසේ පොරොන්දු වූ සේක :

> **මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරු වන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි (යෙසායා 44:3).**

මෙම ජලය වැගිරවීම යනු ජලය මඟින් සංකේතවත් කරන ශුද්ධාත්මයාණන්ගේ ආලේපයකි :

> **මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරු වන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි (යෙසායා 44:3).**

> **මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක (යොහන් 7:38).**

ශුද්ධාත්මයාණන් නැමති ජලය ආත්මිකව මියගොස් සිටින මනුෂ්‍යයන්ගේ හා ස්ත්‍රීන්ගේ හදවත්වල දේව වචනය නැමති බීජය මුල් ඇදීමට හේතු වේ :

> **මක්නිසාද ගහක් කපාදැමුවොත් ඒක දෙවනු ලියලා, ඒකේ රිකිලි හටගන්නේය යන බලාපොරොත්තුව ඇත්තේය. ඒකේ මුල බොහෝ කල් පොළොවෙහි පරණවී, ඒකේ කඳ බිමෙහි මැරුණත්, වතුරට පෙනීමෙන් ඒක දළුලා, පැළෑටියක් මෙන් අතු ලියලනවා ඇත (යෝබ් 14:7-9).**

**ආලෝකය :**

ස්වාභාවික ලෝකය තුළ වර්ධනයට හේතු වන්නේ ආලෝකයට දක්වන ප්‍රතිචාරයයි. ආත්මික වර්ධනය ඇති වන්නේ ආත්මික ආලෝකයට දක්වන ප්‍රතිචාර හේතුවෙනි. එම ආලෝකය යේසුස්වහන්සේය :

> **උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය: ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය (යොහන් 1:4).**

> **එබැවින් යේසුස්වහන්සේ නැවත ඔවුන්ට කථාකරමින්: මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේයයි කීසේක (යොහන් 8:12).**

**වාතය :**

ස්වභාවික පැළෑටි තමන් වටා ඇති වාතාශ්‍රයෙන් වාතය ඇදගනී. වර්ධනය සඳහා වාතය අවශ්‍ය වේ. බයිබලයේ ශුද්ධාත්මයාණන්වහන්සේ වාතයට හෝ සුළඟට සමාන කර තිබේ :

> **හුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනට යන්නේද කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගේ ඉපිද සිටින සියල්ලෝම එසේමයයි කීසේක (යොහන් 3:8).**

ශුද්ධාත්මයාණන්වහන්සේ දේව වචනය නැමැති බීජය තුළට ජීවය ලබා දෙන සේක. එහි ප්‍රතිඵලය ආත්මික වර්ධනය හා ඵල වර්ධනය වීමයි.

**ඉඩකඩ :**

වපුරන්නාගේ උපමාව තුළදී, ඉඩ කඩ සඳහා පැවති තරඟය ඇතැම් බීජ මිය යාමට හේතු විය :

**කටු අතරෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා, ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ රැවටිලිකාරකමෙන්ද වචනය යටවීමෙන් එල නොදරන තැනැත්තාය (මතෙව් 13:22).**

ලෝකයේ දේවල් සමඟ ඇති තරඟය දේව වචනය නැමති බීජය පොඩිකර දමන අතර ආත්මික වර්ධනය වළකාලයි.

## විවේකය :

ස්වාභාවික ලෝකයේ පැළෑටිවල වර්ධන චක්‍රයේ එක් නිශ්චිත කොටසක් විවේක ගැනීමේ කාලය (උදාසීන කාලය) ලෙස හැඳින්වේ. එය බීජවලට විවේක ගැනීමට ඇති කාලයක් වන අතර වේගවත් වර්ධනය වන වසන්ත ඍතුවට පෙර ඍතුව එයයි. එම කාලය තුළදී ශාකය මිය ගොස් ඇති ලෙස පෙනේ නමුත් එය මියගොස් නැත. ජීවයේ බීජය ඒ තුළ තවමත් ජීවමානව තිබේ.

ඇතැම් විට තනි පුද්ගලයෙකු හෝ සභාවක් ආත්මිකව වර්ධනය නොවන සේ පෙනිය හැකිය. නමුත් දේව වචනය නැමති බීජය නිසි ලෙස පැළ කර තිබේ නම්, නිසි කාලයේදී අභ්‍යන්තර වර්ධනය සිදු වනු ඇත (ගීතාවලිය 1).
ස්වාභාවික ලෝකයේදී මෙන්, වේගවත් වර්ධනයකට හා සංවර්ධනයකට පෙර ආත්මික නිහඬකාලයක් ඇති වේ. ආත්මික දීමනා ගුණනය වීමට අභ්‍යන්තර වර්ධන ක්‍රියාවලිය උදෙසා ඉවසිලිවන්තව සිටින්න :

**එබැවින්, සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේගේ ඊම දක්වා ඉවසාපල්ලා. බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසමින් ගොවියා පොළොවේ අනර්ඝ එල ගැන බලාසිටී (යාකොබ් 5:7).**

## මුල් පද්ධතිය :

ශාකය නිසි ලෙස සවි වීමට හා පෝෂණය සැපයීමට මුල් අවශ්‍ය වේ. ඔබගේ ආත්මික ජීවිතයේ මුල් පද්ධතිය සකස් කළ යුත්තේ කෙසේදැයි ගීතාවලිය 1 පරිච්ඡේදයෙන් පවසයි.

**දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමීන්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහිකරන්නාවූ, මනුෂ්‍යයා ආශීර්වාදලද්දේය. ඔහු දිය ඇළවල් ළඟ හිඳුවූ, නියම කලට එල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය: ඔහු කරන සියල්ල සඵලවෙයි (ගීතාවලිය 1:1-3).**

### මරණය :

**සැබවක් සැබවක් නුඹලාට කියමි-ගෝධුම බීජය පොළොවෙහි වැටී නොමළොත් තනිව තිබෙයි: නුමුත් මළොත් බොහෝ එල දෙයි (යොහන් 12:24).**

**අඥානය, නුඹම වපුරන දේ මළොත් මිස නැත්නම් පැළවෙන්නේ නැත (1 කොරින්ති 15:36).**

ආත්මික ජීවිතය රඳා පවතින්නේ ලෝකයේ දේවල්වලට මිය යාම මතය. පාපයට, ලෞකික ආශාවන්ට හා ආශ්වාදයන්ට මියයාම ඒ සඳහා අවශ්‍ය වේ. ලෝකයට මිය යාමේ ප්‍රතිඵලය ඔබේ ජීවිතය තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන ස්වරූපයක් වර්ධනය වීම නැමති එලය වර්ධනය වීමයි.

## මිදි වැල සම්බන්ධ වී සිටීම :

ස්වාභාවික ලෝකය තුළ එල දැරීමට නම් අත්ත ප්‍රධාන ශාකයට සම්බන්ධ වී තිබිය යුතුය. අත්ත ප්‍රධාන ලෙස ජීවය ගෙන දෙන වැලෙන් හෝ කඳෙන් වෙන් වී තිබුණහොත් එයට එල දැරිය නොහැකිය.

යේසුස්වහන්සේ මිදි වැල වන අතර අපි අතුය. ආත්මික එල දැරීමට නම් අප උන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාව නිසි ලෙස පවත්වා ගත යුතුය :

**මම සැබෑවූ මිදිවැලය, මාගේ පියාණන්වහන්සේ ගොවියාය. මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක. මා විසින් නුඹලාට කී වචනය කරණකොටගෙන නුඹලා දැන් පවිත්‍රය. මා තුළ පැවතියල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි නොපවතී නම් තනියම ඵල දරන්ට බැරුවාක්මෙන්, නුඹලා මා තුළෙහි නොපවතිවූ නම් ඵල දරන්ට නුඹලාට බැරිය. මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලා බැරිය (යොහන් 15:1-5).**

## කප්පාදු කිරීම :

ශාකයක් බෝවීමට හා ඵලදැරීමට ස්වභාවික ලෝකය තුළ කප්පාදු කිරීම අවශ්‍ය වේ. ගොවියෙකු ශාකයක් කප්පාදු කරන විට ශාකයට වඩා ඵල දැරිය හැකි වන පිණිස ඵල නොදරන අතු ඔහු විසින් කපා දමයි. ශාකයේ වර්ධනයට බාධා කරන සියලු දේ ඔහු ඉවත් කරයි.

ආත්මික ලෝකයේදී ද කප්පාදු කිරීම අවශ්‍ය වේ. ආත්මික කප්පාදු කිරීම යනු දෙවියන්වහන්සේ විසින් සිදු කරන නිවැරදි කිරීමයි. බයිබලය එය තරවටු කිරීම ලෙසද හඳුන්වයි. දෙවියන්වහන්සේ "කප්පාදු කරන විට" ඔබේ ආත්මික වර්ධනයට බාධා කරන හැම දෙයක්ම උන්වහන්සේ විසින් ඉවත් කරනු ලැබේ. ඔබ ආත්මික ඵල දැරීමට නම් මෙම ක්‍රියාවලිය අවශ්‍ය වේ :

**මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරනසේක (යොහන් 15:2).**

ඇතැම් විට ඔබව නිවැරදි කිරීම (කප්පාදු කිරීම) සඳහා දෙවියන්වහන්සේ විසින් ඔබේ ජීවිතයට ඇතැම් බාහිර තත්වයන් ගෙන එන විට ඔබ සාතන්ට දොස් තැබීම නිසා ඔබ කප්පාදු කිරීමේ වාසි නිසි පරිදි නෙළා නොගනී. දෙවියන්වහන්සේගේ නිවැරදි කිරීමේ අරමුණ හොෂෙයා 6:1 හි සඳහන් වේ :

**එන්න, අපි ස්වාමින්වහන්සේ වෙතට හැරීයමු. මක්නිසාද ඉරා දැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ අප සුවකරනවා ඇත: පහරදෙන උන්වහන්සේ අපේ තුවාල බඳිනවා ඇත (හොෂෙයා 6:1).**

කප්පාදු කිරීම නැමති තරවටු කිරීමේ ප්‍රතිඵලය දෙවියන්වහන්සේ වෙත යළි හැරීමයි. ඔබ ආත්මිකව ඔබ වැනිම වූ තවත් අය බිහි කළ හැකි තත්වයට පත් වන්නේ හා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල දැරිය හැකි වන්නේ උන්වහන්සේ වෙතට හැරීමෙන් පමණි.

## දේශගුණය :

ඵල වර්ධන වීම සඳහා දේශගුණය වැදගත් වේ. ස්වභාවික ලෝකය තුළ විශේෂයෙන් පාලනය කරන ලද පරිසරයන් තුළ විවිධ ආකාරයේ ඵල වර්ධනය වේ. "උණුසුම් නිවාස" හෙවත් "උෂ්ණාගාර" ලෙස හඳුන්වනු ලබන ගොඩනැඟිලි තුළ නිශ්චිත උෂ්ණත්වයක් යටතේ ඒවා වර්ධනය වේ. පිට ලෝකයේ ඇති සැබෑ පරිසරයෙන් ඒවා ආරක්ෂා කරගනු ලැබ තිබේ.

"උෂ්ණාගාරයක්" තුළ ඇති පැළෑටියක් ඔබ පිටතට ගතහොත්, එය පාලනය කරන ලද පරිසරයක් තුළ පමණක් ජීවත් වී ඇති නිසා එය ඉක්මනින්ම මිය යනු ඇත. සැබෑ ලෝකයේ පරිසරය තුළ එයට ජීවත් විය නොහැකිය. ආත්මිකව කතා කළහොත්, පාලනය කරන ලද තත්වයන් තුළ හොඳින් සිටින නමුත් සැබෑ ලෝකය සමඟ ගණුදෙනු කළ නොහැකි "උෂ්ණාගාර" තුළ වසන කිතුනුවන් ඔබට අවශ්‍ය නොවේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සභාවේ අභ්‍යන්තර වර්ධනය ගැන කතා කරන විට අප අදහස් කරන්නේ කුමක්ද?

3. ආත්මික වර්ධනය යනු කුමක්ද?

4. ආත්මික වර්ධන පිළිබඳ සාක්ෂි හතක් ලැයිස්තු ගත කරන්න :

5. සභාවේ අභ්‍යන්තර වර්ධනයට ශුද්ධාත්මයාණන්වහන්සේ බලපෑම් කරන ආකාරයන් රැසක් මෙම පාඩම තුළ සාකච්ඡා කරන ලදි. ඔබට මතක දේවල් ලැයිස්තුගත කරන්න :

6. ස්වභාවික ලෝකය තුළ වර්ධනයට අවශ්‍ය කොන්දේසිවලට සමාන්තර ආත්මික වර්ධනයේ කොන්දේසි මෙම පාඩම තුළ සාකච්ඡා කරන ලදි. ඔබට මතක දේවල් ලැයිස්තුගත කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ස්වභාවික ලෝකයේදී ශාකයක් මිය යන්නට ආසන්න වී ඇති විට, එය නැවත ප්‍රාණවත් කළ යුතුය. සභාවක් ආත්මිකව මියයාමට ආසන්නව තිබෙන විටද, පිබිදීමක් අවශ්‍ය වේ. පිබිදීම යනු "යළි ජීවය ලබා ගනිමින් අලුතින් සමෘද්ධිමත් වීමයි". පහත බයිබල් පද අධ්‍යයනය කරන්න.

   පිබිදීම උදෙසා ආයාචනයක් : ගීතාවලිය 85:6. පිබිදීම උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම : 2 ලේකම් 7:14.

   පරණ ගිවිසුමේ පිබිදීම පිළිබඳ පහත වාර්තා අධ්‍යයනය කරන්න. පිබිදීම ගෙන ආ කරුණු කවරේද? සෑම පිබිදීමකම ප්‍රතිඵල මොනවාද?

| | |
|---|---|
| සීනයි කන්දේදී පිබිදීම : | නික්මයාම 32:1-35 33:1:23 |
| සාමුවෙල් යටතේ වූ පිබිදීම : | 1 සාමුවෙල් 7:1-17. |
| කර්මෙල් කන්දේදී ඇති වූ පිබිදීම : | 1 රාජාවලිය 18:1-46 |
| නිනිවයෙහි වූ පිබිදීම : | යෝනා පොත |
| ආසා යටතේ වූ පිබිදීම : | 2 ලේකම් 15 |
| හෙසකියා යටතේ වූ පිබිදීම : | 2 ලේකම් 29:1-36 30:1-27 31:1-21 |
| යොෂියා යටතේ වූ පිබිදීම : | 2 ලේකම් 34:1-33 35:1-19 |
| වහල් යුගයෙන් පසුව ඇති වූ පිබිදීම : | නෙහෙමියා 8:1-8 |

2. සභාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැමති අත්තිවාරම මත ඉදි කරන ලද ආත්මික ගොඩනැඟිල්ලකට සමාන කළ හැකි බව පසුගිය පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගත්තේය. අභ්‍යන්තර ආත්මික වර්ධනය යනු එම අත්තිවාරම මත ගොඩනැඟීමේ ක්‍රියාවලියයි. පහත සටහන අධ්‍යනය කරන්න.

## ගොඩනැගීම මඟින් වර්ධනය වීම

### මූලික ප්‍රතිපත්ති :

අ. ඔබ ආත්මිකව ගොඩනඟන්නේ කුමක්ද?

1. ඔබ ගොඩනැඟිල්ලකි :

**නුඹලාත් . . . ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩනඟනු ලබන්නහුය (1 පේතෘස් 2:5).**

2. ඔබ ගොඩනඟන්නේ සදාකාලික ආකෘතියකි.

**කූඩාරමක්වූ අපේ භූමික ගෙය කඩාවැටුණත් දෙවියන්වහන්සේගෙන්වූ ගොඩනැගිල්ලක් වන අතින් නොසෑදුවාවූ සදාකාලිකවූ ගෘහයක් සවර්ගවල අපට ඇති බව දනිමුව (2 කොරින්ති 5:1).**

3. සභාව ගොඩනැඟිල්ලකි :

**නුඹලා ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත් අත්තිවාරම පිට ඉදිකරනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටිනසේක. උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතුකරනලදුව, ස්වාමීන්වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක් සෑදීගන යන්නේය. උන්වහන්සේ තුළ නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩනගනලද්දහුය (එපීස 2:20-22).**

ආ. මෙම ක්‍රියාවලියට සම්බන්ධ වන දෙදෙනෙකු සිටී:

1. දෙවියන්වහන්සේ :

**.... සියලු දේවල් පිහිටෙවූ තැනන්වහන්සේ දෙවියන්වහන්සේය (හෙබ්‍රෙව් 3:4).**

**ස්වාමින්වහන්සේ ගෙය නොසාදන සේක් නම්, සාදන්නෝ නිෂ්ඵලයේ වෙහෙසෙති . . (ගීතාවලිය 127:1).**

**. . . මාගේ සභාව ගොඩනඟන්නෙමි: පාතලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය (මතෙව් 16:18).**

2. මිනිසා : ගොඩනැඟීම සඳහා මිනිසා දෙවියන්වහන්සේ සමඟ එක්සත් විය යුතුය.

**මක්නිසාද අපි දෙවියන්වහන්සේගේ හවුල් වැඩ කරන්නෝය. නුඹලා . . . දෙවියන්වහන්සේගේ ගොඩනැඟිල්ලය (1 කොරින්ති 3:9).**

**. . . නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාම ගොඩනඟා ගනිමින් . . . (යුද් 20).**

**නුඹෙන් පැවත එන්නෝ පරණ නටබුන් තැන් ගොඩනගන්නෝය. නුඹ බොහෝ පරම්පාවල අත්තිවාරම ගොඩනගන්නෙහිය: කැඩුම් හරි ගස්සන්නාය, වාසය පිණිස මාවත් අලුත්වැඩියා කරන්නායයි නුඹට කියනු ලැබේ (යෙසායා 58:12).**

## ඔබ ගොඩනැඟීමට පටන් ගැනීමට පෙර :

ඔබ ගොඩනැඟීමට පටන් ගැනීමට පෙර ඔබ පහත දේවල් කළ යුතුය .

**1. වියදම ගණන් බලන්න :**

**මක්නිසාද කොතක් ගොඩනගන්ට කැමතිවූ නුඹලාගෙන් යමෙක් ඒක නිමකරන්ට තමාට පුළුවන්දැයි පළමුකොට හිඳ වියදම ගණන් බලන්නේ නැද්ද? එසේ නොකළොත්, අත්තිවාරමක් දමා නිමකරන්ට බැරිවූ වි ඒ දකින සියල්ලෝ: මේ මනුෂ්‍යයා ගොඩනගන්ට පටන්ගත් නුමුත් නිමකරන්ට ඔහුට බැරිවීයයි කියා ඔහුට සරදම්කරන්ට පටන්ගන්නෝය (ලූක් 14:28-30).**

**2. අධිෂ්ඨානශීලි වන්න :**

**සාලමොන් ස්වාමින්වහන්සේගේ නාමයට ගෘහයක්ද ... ගොඩනඟන්ට අදහස් කරගෙන. (2 ලේකම් 2:1).**

**3. නිසි පෙලඹවීමේ හේතුවක් ඇතිව සිටින්න :**

**මම මාගේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ නාමයට ගෘහයක් ගොඩනඟා උන්වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු කරන පිණිසත්, නිරන්තර පිදීමේ රොටි තබන පිණිසත් . . . දවන පූජා ඔප්පු කරන පිණිසත් ඒක උන්වහන්සේට කැප කරන්ට යමි . . . (2 ලේකම් 2:4).**

**4. සූදානම් වන්න :**

**එස්රා ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාව සොයන්ටත් පවත්වන්ටත් . . . උගන්වන්ටත් තමාගේ සිත යොමුකරගත්තේය (එස්රා 7:10).**

**තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගන්න සූදානම් නොකළාවූ දාසයා .. . (ලූක් 12:47).**

**ගොඩනැඟිය යුත්තේ කෙසේද?**

1. **නිවැරදි අත්තිවාරම මත ගොඩනඟන්න :**

> **එහෙයින් යමෙක් මාගේ මේ වචන අසා ඒවා පිළිපදිද්ද, ඔහු පර්වතය පිට තමාගේ ගෙය සාදාගත් නුවණ ඇති මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, හුළඟ හමා, ඒ ගෙට ගැසුවේය: එය පර්වතය පිට පිහිටා තිබුණු බැවින් නොවැටුණේය. යමෙක් මාගේ මේ වචන අසා, ඒවා පිළි නොපදිද්ද, ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදාගත් නුවණ නැති මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, හුළඟ හමා, ඒ ගෙට ගැසුවේය: ඒක වැටුණේය. එහි වැටීමද බලවත්විය (මතෙව් 7:24-27)**

නිවැරදි අත්තිවාරම යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනයයි :

> **නුඹලා ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත් අත්තිවාරම පිට ඉදිකනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස් යේසුස්වහන්සේම එහි කොණේ ප්‍රධාන ගලව සිටිනසේක (එපීස 2:20).**
>
> **නුඹලාට ඉගැන්නූ ලෙසම නුඹලාගේ ඇදහිල්ලෙහි පිහිටා, . . . උන්වහන්සේ හැසිරියල්ලා (කොලොස්සි 2:7).**

මෙම අත්තිවාරම මත ඔබ ගොඩනඟන ආකාරය ගැන ප්‍රවේසම්වන්න :

> **මට දෙනලද දෙවියන්වහන්සේගේ අනුග්‍රහ පරිද්දෙන් ප්‍රඥාවන්ත ප්‍රධාන ගෘහකාරයෙකු මෙන් මම අත්තිවාරමක් දැම්මීම්: වෙන කෙනෙක් ඒ පිට ගොඩනගයි. නුමුත් එකිනෙකා ඒ පිට ගොඩනගන්නේ කොස්දැයි බලාගනිවා. මක්නිසාද දමා තිබෙන අත්තිවාරම ඇර වෙන අත්තිවාරමක් දමන්ට කවරෙකුටවත් නුපුළුවන, ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. නුමුත් අත්තිවාරම පිට යමෙක් රන්, රිදී අනර්ඝ ගල්, ලි, තෘණ, පිදුරු ගොඩනගන්නේ නම්, එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශවන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව්වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශකරන්නේය: එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පුවන්නේය (1 කොරින්ති 3:10-13).**

**2. සැලැස්මට අනුව ගොඩනඟන්න :**

බයිබලයේ සඳහන් සෑම ගොඩනැඟිලි ව්‍යාපෘතියකදීම දෙවියන්වහන්සේ විසින් දුන් සැලැස්මක් විය. උත්පත්ති 6: නික්මයාම 25: 1 ලේකම් 22 බලන්න. මිනිසුන් දෙවියන්වහන්සේගේ සැලැස්මට කීකරු වූහ :

> **නෝවා එසේ කෙළේය: දෙවියන්වහන්සේ ඔහුට අණ කළ සියල්ල ලෙස ඔහු කෙළේය (උත්පත්ති 6:22).**

සැලැස්ම වෙනස් විය, නමුත් මෝසෙස්, දාවිත්, සලමොන්, එස්රා හා නෙහෙමියා යන සියලු දෙනාම කෙරෙහි මෙය සත්‍යයක් විය. හැම කෙනෙක්ම ස්වාමීන්වහන්සේ අණ කළ ලෙස කළහ.

> **මේ සටහනේ සියලු වැඩ තේරුම්කර දුන්නාවූ ස්වාමීන්වහන්සේගේ අතින් මා ලවා සියල්ලම ලියවා තිබේයයි දාවිත් කීවේය (1 ලේකම් 28:19).**

දේව වචනය මත ඔබේ ජීවිතය ගොඩනැඟීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔබ අනුගමනය නොකළහොත්, ඔබ සාර්ථක නොවනු ඇත.

> **ඔවුන් ස්වාමීන්ගේ ක්‍රියා හෝ උන්වහන්සේගේ හස්තකර්ම හෝ නොසලකන බැවින් උන්වහන්සේ ඔවුන් බිඳ දමනසේක, ගොඩ නොනගනසේක (ගීතාවලිය 28:5)**

**3. ඔබේ හැකියාව අනුව ගොඩනඟන්න :**

පැරණි ගිවිසුම් සමයේ ගොඩනැඟිලි ව්‍යාපෘතිවලදී, මනුෂ්‍යයන් තම හැකියාවන් අනුව දායක විය :

> **ඔව්හු තමන්ගේ පුළුවන්කමේ හැටියට . . . දුන්නෝය (එස්රා 2:69).**

**4. කැමැත්තෙන් ගොඩනඟන්න :**

ආත්මික වර්ධනය වීමට කැමැත්තෙන් සිටින්න :

> **. . . දෙවියන්වහන්සේගේ ගෘහය ස්වකීය ස්ථානයෙහි ගොඩනඟන පිණිස සිය කැමැත්තෙන් දුන් පඬුරු ඔප්පුකළෝය (එස්රා 2:68).**

**5. ස්වාමීන්වහන්සේගේ ශක්තිය තුළ ගොඩනඟන්න :**

> **මම වනාහි මා කෙරෙහි තිබුණු මාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ හස්තය නිසා බලවත්වී . . . (එස්රා 7:28).**

**6. ඒකත්වය තුළ ගොඩනඟන්න :**

> **. . . වැඩකරන්ට සෙනඟට හිත තිබුණේය (නෙහෙමියා 4:6).**

**7. ඥාණවන්තව ගොඩනඟන්න.**

> **ප්‍රඥාවෙන් ගෙයක් ගොඩනගනු ලැබ, නුවණින් එය ස්ථිරවේ (හිතෝපදේශ 24:3).**
>
> **ඥානවන්ත ස්ත්‍රී තොමෝ තම ගෙය ගොඩනගන්නීය: එහෙත් අඥාන තැනැත්ති තමාගේම අත්වලින් ඒක කඩාදමයි (හිතෝපදේශ 14:1).**
>
> **ප්‍රඥාතොමෝ ඇගේ ගෙය ගොඩනගා, ඇගේ කුළුනු සත කපා තිබේ (හිතෝපදේශ 9:1).**

දෙවියන්වහන්සේ ඔබට ප්‍රඥාව ලබා දෙනු ඇත :

> **...ප්‍රඥාවද බුද්ධියද දැනගැන්මද ...තේරුමද ලැබෙන පිණිස ඔහු දෙවියන්වහන්සේගේ ආත්මයෙන් පූර්ණ කළෙමි ... (නික්මයාම 31:3,6).**
>
> **... මක්නිසාද ස්වාමීන්වහන්සේට ගෘහයක්ද තමාගේ රාජ්‍යයට ගෘහයක්ද ගොඩනැගීමට සිහිකල්පනාවෙන් හා නුවණින් යුක්තවූ ප්‍රඥාවන්ත පුත්‍රයෙකු උන්වහන්සේ දාවිත් රජුට දුනසේක'' (2 ලේකම් 2:12).**

ප්‍රඥාවේ මූලාශ්‍රය දෙවියන්වහන්සේය :

> **නමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු නම් . . . දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා එවිට ඔහුට එය දෙනු ලැබේ (යාකොබ් 1:5).**

# හත්වන පරිච්ඡේදය

## ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වීම.

### අරමුණු

- මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- යෙරුසලමේ පළමු සභාව ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වූ ආකාරය සාරාංශ කිරීමට
- සභාවන් ව්‍යාප්ත වීම සම්බන්ධව නව ගිවිසුමේ ඇති ක්‍රමයන් සාරාංශ කිරීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**තවද දෙවියන්වහන්සේගේ වචනය පතළ වී ගියේය. ගෝලයන්ගේ ගණන යෙරුසලමේ අතිශයින්ම වැඩි විය... (ක්‍රියා 6:7).**

### හැඳින්වීම

ස්වාභාවික ශරීරය තුළ හිස මඟින් විවිධ කොටස් සම්බන්ධීකරණය කරනු ලැබේ. ශරීරයෙන් කරන සෑම ක්‍රියාවක්ම හිසෙන් දෙනු ලබන මඟපෙන්වීම්වල ප්‍රතිඵලයකි. යේසුස්වහන්සේගේ ආත්මික ශරීරය වන සභාවට මඟපෙන්වන හිස උන්වහන්සේය. "සභාව ගොඩනගන්නෙමි"යි (මතෙව් 16:18) යේසුස්වහන්සේ පැවසූ සේක. මෙම අරමුණ කරා ළඟා වීමේදී උන්වහන්සේ යොදා ගන්නා ක්‍රමයන් බයිබලය තුළින් එළිදරව් වේ.

සභාව ගුණනය වීමේ ක්‍රමයන් දේව වචනය තුළ උගන්වනු ලබන හා ඉන් නිරූපණය වන දේවල් මත පදනම් විය යුතුය. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සාමාජිකයන් ලෙස අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන හිස මඟින් ලබා දෙන මඟපෙන්වීම් අනුව ක්‍රියා කිරීමට ඇදහිලිවන්තයන් කැඳවා තිබේ. සභාව ගණනින් වර්ධනය වීම පිළිබඳව අවධානය යොමු කරන පරිච්ඡේද තුනෙන් පළමු පරිච්ඡේදය මෙයයි. මෙම පාඩම අවධානය යොමු කරන්නේ ව්‍යාප්ත වීම කෙරෙහිය.

### ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වීම

ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේ තුළට නව සාමාජිකයන් දිනා ගනිමින් ඔවුන්ව තමන්ගේම ප්‍රාදේශීය සභාවේ සහභාගීත්වය වෙත ගෙන එන විට ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වීම සිදුවේ. මෙහි ප්‍රතිඵලය ප්‍රාදේශීය සභාව ගණනින් වර්ධනය වීමයි. ව්‍යාප්ත වීම තුළින් සිදු වන වර්ධනය දේව රාජ්‍යය වර්ධනය වීම වෙත යොමු කළ යුතුය.

එක් සභාවක් තවත් සභාවක ඇදහිලිවන්තයන් හුවමාරු වීම තුළින් සාමාජිකයන් 100 දෙනෙක් එකතු කර ගනී නම් දේව රාජ්‍යය වර්ධනය වීමක් සිදු වී නැත. දෙවන සභාවේ සාමාජිකත්වය වැඩි වීමක් සිදු වී ඇති නමුත් දේව රාජ්‍යය ව්‍යාප්ත වීමක් සිදු වී නැත. දේව රාජ්‍යය වර්ධනය වීම සිදුවන්නේ නව සාමාජිකයන් දිනා ගනිමින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකීමක් දැරිය හැකි සාමාජිකයන් ලෙස ඔවුන් ගොඩනැගීමෙන් පමණි.

### නව ගිවිසුමෙහි සඳහන් වාර්තාවන්

යෙරුසලමේ පළමු සභාව ව්‍යාප්ත වීම තුළින් වර්ධනය වූ ආකාරය ක්‍රියා පොතෙහි වාර්තා වේ. එම වාර්තාවේ සාරාංශයක් පහත දැක්වේ.

**මුල්ම වර්ධනය වීමේ රටාවන්:**

> **මේ දවස්වලදී එකසිය විසි දෙනෙක් පමණ සෙනඟ රැස්ව සිටි කල පේත්‍රුස් සහෝදරයන් මැද නැගිට සිට කියනුයේ: (ක්‍රියා 1:15)**

සභාව ආරම්භ වූයේ උඩුමහල් මැදුරක 120 දෙනෙකුගෙන් යුත් කුඩා ගෝලයන් කණ්ඩායමකිනි. පෙන්තකොස්ත දවසේදී යෙරුසලමේ සභාවට 3000ක් එකතු කරනු ලැබීය.

> **එකල ඔහුගේ වචනය පිළිගත් අය බව්තීස්ම කරනු ලැබුවෝය. ඒ දවසේදී තුන්දාහක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතු කරන ලද්දෝය. (ක්‍රියා 2:41)**

පෙන්තකොස්ත දවසින් පසු ව්‍යාප්ත වීම තුළින් සිදුවන වර්ධනය දිනපතා සිදුවිය.

> **ස්වාමීන්වහන්සේ වනාහි ගැළවෙන්නාවූ අය දවස්පතා ඔවුන්ට එක් කළ සේක. (ක්‍රියා 2:47)**

යෙරුසලම් සභාවේ පුරුෂයන්ගේ ගණන පන්දහස දක්වා වැඩිවිය. සභාවේ කොටසක් වූ කාන්තාවන් හා දරුවන් මෙම ගණනට අයත් නොවේ.

> **නුමුත් වචනය ඇසූවන්ගෙන් බොහෝ දෙනෙක් අදහා ගත්තෝය. ඒ මනුෂ්‍යයන්ගේ ගණන පන්දහසක් පමණ විය. (ක්‍රියා 4:4)**

ක්‍රමානුකූලව සමූහයන් සභාවට එකතු කරනු ලැබීය.

> **අදහාගන්නන් වන පුරුෂයන්ගෙන්ද ස්ත්‍රීන්ගෙන්ද මහත් සමූහයක් වැඩි වැඩිව ස්වාමීන්වහන්සේට එක් කරන ලද්දෝය. (ක්‍රියා 5:14)**

සභාවට විරුද්ධ වූ අය පවා මෙම ව්‍යාප්තිය දැක මවිත වූහ.

> **දේවමාළිගාවේ අධිපතියාද නායක පූජකයෝද මේ වචන අසා, මෙයින් කුමක් වන්නේදෝ කියා බොහෝ වියවුල් වූහ. (ක්‍රියා 5:24)**

සභාව ව්‍යාප්ත වීම විස්තර කිරීම සඳහා මුලින්ම පාවිච්චි කළේ එකතු කරන ලදී යන වචනයයි. ඉක්මනින්ම වර්ධනය ඉතා වේගයෙන් සිදුවූ අතර එවිට ගුණනය වීම යන වචනය පාවිච්චි කරන ලදී.

> **තවද දෙවියන්වහන්සේගේ වචනය පතළ වී ගියේය. ගෝලයන්ගේ ගණන යෙරුසලමේ අතිශයින්ම වැඩි විය... (ක්‍රියා 6:7).**

මෙම ස්ථානයේ සිට යෙරුසලමේ ප්‍රාදේශීය සභාවේ සාමාජිකයන් මෙන්ම සභාවන්ද ගුණනය වීම පිළිබඳව ක්‍රියා පොත අවධානය යොමු කරයි. අවුරුදු හතළිහකටත් අඩු කාලයකදී එවකට සොයා ගෙන තිබූ ලෝකයේ සෑම අන්‍යජාතීන්ගේ මධ්‍යස්ථානයකම නව සභාවක් පිහිටුවන ලදී. උදාහරණයක් ලෙස සමාරියේ සභාව දැක්විය හැකිය.

> **නුමුත් ඔවුහු දෙවියන්වහන්සේගේ රාජ්‍යයද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද ගැන ශුභාරංචිය දේශනා කළාවූ පිලිප් විශ්වාසකොට පුරුෂයෝද ස්ත්‍රීහුද බව්තීස්ම කරනු ලැබුවෝය. (ක්‍රියා 8:12)**

යුදයේ, ගලීලයේ, සමාරියේ, ලිද්දාහි, ශාරොන්හි හා යොප්පාවේ සභාවන් ව්‍යාප්ත වීම තුළින් සිදුවන වර්ධනය අත් දුටුවේය.

> **මෙසේ මුළු යුදයෙහිද ගලීලයෙහිද සමාරියෙහිද සභාව දියුණු වී, සමාදානය ලැබ, ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතිව හැසිරෙමින්, ශුද්ධාත්මයාණන්ගේ පිහිටවීමෙන් වර්ධනය වූවාය. (ක්‍රියා 9:31)**

> **ලිද්දායෙහිද ෂාරොනෙහිද විසූ සියල්ලෝ ඔහු දැක, ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය.**

**එය යොප්පාව මුළුල්ලෙහි ප්‍රකාශ විය. බොහෝ දෙනෙක් ස්වාමින්වහන්සේ කෙරෙහි අදහා ගත්තෝය. (ක්‍රියා 9:35,42)**

යුදෙව්වෙකුව සිට හැරුණු එක් අයෙකුගේ සේවය නිසා "මහත් සමූහයක්" සභාවට එකතු කරනු ලැබීය.

**මක්නිසාද ඔහු යහපත්වූ ශුද්ධාත්මයෙන්ද ඇදහිල්ලෙන්ද පූර්ණ වූ මනුෂ්‍යයෙක්ය. මහත් සමූහයක්ද ස්වාමින්වහන්සේට එක් කරන ලද්දෝය. (ක්‍රියා 11:24)**

අන්තියෝකියේ සභාවට විශාල සෙනඟක් එකතු කරන ලද බව බයිබල් පද තුනක සඳහන් වේ.

**ස්වාමින්වහන්සේගේ හස්තය ඔවුන් සමඟ වූයේය. විශ්වාස කළාවූ විශාල ගණනක් ස්වාමින්වහන්සේ වෙතට හැරුණෝය. . . . මක්නිසාද ඔහු යහපත්වූ ශුද්ධාත්මයෙන්ද ඇදහිල්ලෙන්ද පූර්ණ වූ මනුෂ්‍යයෙක්ය. මහත් සමූහයක්ද ස්වාමින්වහන්සේට එක් කරන ලද්දෝය. . . . තවද ඔව්හු අවුරුද්දක් මුළුල්ලෙහිම සභාව සමඟ රැස්ව, මහත් සමූහයකට ඉගැන්නුවෝය. ගෝලයෝ ක්‍රිස්තියානිකාරයෝයයි පළමු කොට කියනු ලැබුවේ අන්තියෝකියේදීය. (ක්‍රියා 11:21, 24, 26)**

ස්වාමින්වහන්සේගේ වචනය දිගින් දිගටම පතළ වෙමින් දියුණු වන විට සභාවට නව ඇදහිලිවන්තයන් එකතු කරන ලදහ.

**නුමුත් දෙවියන්වහන්සේගේ වචනය පතළ වී දියුණු විය. (ක්‍රියා 12:24)**

## ගුණනය වීම දිගටම සිදුවිය.

පලස්තීනයෙන් පිටත සභාවන්ගේ වර්ධනය පහත බයිබල් පද තුළ සාරාංශගත කර තිබේ.

**අන්‍යජාතීහු ඒ අසා සන්තෝෂව, දෙවියන්වහන්සේගේ වචනයට ගෞරව කළෝය. සදාකාල ජීවනය ලැබීමට නියමකරනලද සියල්ලෝම අදහාගත්තෝය. ස්වාමින්වහන්සේගේ වචනය ඒ පළාත මුළුල්ලෙහි පතලව ගියේය. (ක්‍රියා 13:48-49)**

**එපමණ බලගතු ලෙස ස්වාමින්වහන්සේගේ වචනය වර්ධනය වී, බලවත් වුණේය. (ක්‍රියා 19:20)**

## ඉකෝනියෙහි වර්ධනය :

**තවද ඉකෝනියේදී ඔවුහු එක්ව යුදෙව්වරුන්ගේ සිනගෝගයට ඇතුල් වී, යුදෙව්වරුන්ගෙන්ද ග්‍රීක්වරුන්ගෙන්ද මහත් සමූහයක් අදහාගන්නා පරිද්දෙන් කතා කළෝය. (ක්‍රියා 14:1)**

## දර්බයෙහි වර්ධනය :

දර්බයෙහිදී පාවුල් විසින් ගෝලයන්ව ස්ථිර කර, ධෛර්යවත් කර සංවිධාන කරනු ලැබීය. (ක්‍රියා 14:20-21 බලන්න.)

## ගලාතියේ වර්ධනය :

**මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)**

## පිලිප්පියේ වර්ධනය :

**තියතිරා නුවර විසූ රත්නිල් පිළී විකුණන්නාවූ ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියෙක් අපේ වචන අසාගන සිටියාය. පාවුල් විසින් කියනලද කාරණා සලකන ලෙස ස්වාමින්වහන්සේ ඇගේ සිත විවර කළ සේක. (ක්‍රියා 16:14** මෙය පිලිප්පි සභාවේ ආරම්භය විය.)

## තෙසලෝනිකයේ වර්ධනය :

**ඔවුන්ගෙන් සමහරෙක්ද භක්තිවන්තවූ ග්‍රීක්වරුන්ගෙන් මහත් සමූහයක්ද ප්‍රධාන ස්ත්‍රීන්ගෙන් කීපදෙනෙක්ද ඇදහීමට පමුණුවනු ලැබ, පාවුල් හා සීලස් සමඟ සමාගම් වූවෝය. (ක්‍රියා 17:4)**

## බෙරියේ වර්ධනය :

**එහෙයින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ද ග්‍රීක් කුල ස්ත්‍රීන් හා පුරුෂයන්ගෙන් කීපදෙනෙක්ද අදහා ගත්තෝය. (ක්‍රියා 17:12)**

## කොරින්තියෙහි වර්ධනය :

"මට මේ නුවර බොහෝ සෙනඟ සිටිති"යි ස්වාමීන්වහන්සේ පැවසූ සේක. (ක්‍රියා 18:8-11 බලන්න.) ක්‍රියා පොත අවසන් වන්නේ ප්‍රේරිත පාවුල් විසින් රෝමයේ සිරගතව සිටියදී පවා තවදුරටත් සභාව ව්‍යාප්ත කිරීමෙනි.

**ඔහු තමා විසින් කුලියට ගත් ගෙයි දෑවුරුද්දක්ම වාසය කොට, තමා වෙත පැමිණි සියල්ලන්ම පිළිගෙන, කිසිම භයක්වත් තහනමක්වත් නැතුව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය. (ක්‍රියා 28:30-31)**

දහස් ගණනක් යුදෙව්වන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරී ප්‍රාදේශීය සභාවේ කොටසක් බවට පත් වූ බව පාවුල් වාර්තා කරයි.

**ඔවුහු ඒ අසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කළෝය. තවද ඔවුහු ඔහුට කතාකොට: සහෝදරය, අදහාගත්තවුන් අතරේ යුදෙව්වරු කොපමණ දහස් ගණන් සිටිත්ද කියා නුඹට පෙනෙන්නේය. ඔවුන් සියල්ලෝ ව්‍යවස්ථාව ගැන ජ්වලිතව සිටිති. (ක්‍රියා 21:20)**

## සභාව ව්‍යාප්ත වූ ආකාරය :

මුල් සභාව ව්‍යාප්ත වූ ක්‍රමයන් පහත දැක්වේ.

## ආත්මික දර්ශනය :

**දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාර වෙති. එහෙත් ව්‍යවස්ථාව රක්ෂාකරන්නා වාසනාවන්තයෙක්ය. (හිතෝපදේශ 29:18)**

ආත්මික දර්ශනයක් නොමැතිව මිනිසුන් ආත්මිකව මියයයි. මුල් සභාවට ආත්මික දර්ශනයක් තිබුණේය. එය යේසුස්වහන්සේ මෙසේ පවසමින් තම ගෝලයන්ට ලබා දුන් දර්ශනයයි.

**. . . නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැඩීමට පැහී තිබෙන බව බලන්න. (යොහන් 4:35)**

ආත්මික දර්ශනය අරමුණ තුළ මිනිසුන් එක්සත් කරයි. දර්ශනය උපක්‍රමයන් වර්ධනය කිරීමට මඟපෙන්වයි. එම උපක්‍රමය තුළ පරමාර්ථය වටහා ගැනීම, එම පරමාර්ථය කරා ළඟා වීමට අවශ්‍ය අරමුණු සහ එම පරමාර්ථය ඉටු වී තිබෙන බවට ගණන් දීමක් සිදු කිරීමේ ක්‍රමවේද යන දේවල් අන්තර්ගත වේ.

දර්ශනය අනුකම්පාව වෙත ගෙන යයි. යේසුස්වහන්සේ සෙනඟ දුටු විට උන්වහන්සේ ඔවුන්ට අනුකම්පා කළ සේක. එය ඔවුන්ගේ අවශ්‍යතා තුළ තිබූ දැනුම මත පදනම් වූ බරකි. දර්ශනය යනු මූලිකවම බයිබලීය දෘෂ්ටියක් වර්ධනය කිරීමයි. එනම් දෙවියන්වහන්සේ ලෝකය දකින ආකාරයට එය දැකීම හා එම දෘෂ්ටිය මත පදනම්ව ඊට ප්‍රතිචාර දැක්වීමයි.

යෙරුසලමේ පටන් යුදය, සමාරිය හා ලෝකයේ සීමාවන් දක්වා ව්‍යාප්ත කිරීමේ දර්ශනය මුල් සභාව විසින් අල්ලා ගන්නා ලදී. එය ඔවුන්ගේ නායකයා විසින් උගන්වනු ලැබූ දර්ශනයකි (ක්‍රියා 1:8). මනුෂ්‍යයන්ට ආත්මික දර්ශනයක් ඇති විට වෙහෙස වෙනුවට අපේක්ෂාව ද තරඟය වෙනුවට සහයෝගය ද ඇතිවේ.

## පිළිගැනීමට සූදානම් ප්‍රදේශ හා කාලයන් :

ඇතැම් ප්‍රදේශ අනෙකුත් ප්‍රදේශවලට වඩා පිළිගැනීමට සූදානම් වනු ඇති බව යේසුස්වහන්සේ පැවසූ සේක:

> **යේසුස්වහන්සේ මේ දොළොස්දෙනා යවමින් ඔවුන්ට මෙසේ අණ කළ සේක: කෙසේද? අන්‍ය ජාතීන්ගේ කිසි මාවතකට නොගොස්, සමාරියයන්ගේ කිසි නුවරකට ඇතුල් නොවී, ඉශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතට යන්න. . . . කවරෙක්වත් නුඹලා පිළිගන්නේවත් නුඹලාගේ වචන අසන්නේවත් නැත්නම්, ඒ ගෙදරින් හෝ නුවරින් හෝ පිටත්ව යන කල නුඹලාගේ පාදවල ධූලි ගසා දමන්න. (මතෙව් 10:5-6, 14)**

ඇතැම් නිශ්චිත කාලවලදී ඇතැම් ප්‍රදේශ හා කණ්ඩායම් අන් අයට වඩා ශුභාරංචියට විවෘත වේ. මුල් සභාව ක්‍රියා කළේ පිළිගැනීමට සූදානම් ආත්මික කෙත්වලයි. සිනගෝගයේදී පාවුල්ව ප්‍රතික්ෂේප කරනු ලැබූ විට ඔහු වෙනත් ස්ථානවල ඉගැන්නුවේය (ක්‍රියා 9:20-31). ඔහුට මුලින්ම ආසියාවට යෑමට අවශ්‍ය වූ විට, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුව නැවැත්වූ සේක (ක්‍රියා 16:6). ඔහු පසුව වඩාත් පිළිගැනීමට සූදානම් කාලයකදී එහි ගියේය.

පැසුණු අස්වැන්න ඇති කුඹුරු වෙත ඔබ උත්සාහයන් යොමු කරන විට ව්‍යාප්තිය වඩා වේගයෙන් සිදුවේ. මින් අදහස් වන්නේ ඔබව පිළිනොගන්නා අයව නොසලකා හරින බව නොවේ. ඔබ දිගටම දේව වචනය පැල කරන්න, ඉවසීමෙන් සිට ඔවුන්ව ශුභාරංචිය පිළිගන්නා අය බවට පත් කරන ලෙස දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

## “එන්න” යන ක්‍රමවේදය වෙනුවට “යන්න” යන ක්‍රමවේදය :

පැරණි ගිවිසුමේ ඉශ්‍රායෙලයේ “එන්න” යන ක්‍රමවේදය වෙනුවට මුල් සභාව යොදා ගත්තේ “යන්න” යන ක්‍රමයයි. පැරණි ගිවිසුම් සමයේදී දෙවියන්වහන්සේ ගැන එළිදරව් වීමක් ලබා ගැනීමට ජාතීන් ඉශ්‍රායෙලය වෙත පැමිණිය යුතු විය. නමුත් අලුත් ගිවිසුමේ ආඥාව වූයේ “නුඹලා ලෝකය වෙත යන්න” යන්නයි. නව ගිවිසුමේ ඇදහිලිවන්තයන් මෙම උපක්‍රමය අනුගමනය කළහ. ඔවුහු හිඳගෙන ලෝකයා ඔවුන් වෙතට එනතුරු බලා සිටියේ නැත.

## සෑම ඇදහිලිවන්තයෙක්ම තමා වැනි අය බිහි කිරීම :

නව ගෝලයන් බිහි කිරීම සඳහා මුල් සභාවේ සෑම සාමාජිකයෙකුම ගුණනය විය.

> **එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4)**

හැම ඇදහිලිවන්තයෙකුටම අන් අයට ඉගැන්වීමේ හැකියාව ඇති තවත් අයෙකුට ඉගැන්වීම තුළින් ඔවුන් කෙතරම් වේගයෙන් ගුණනය වනවාද යන්න පසුගිය පරිච්ඡේදයේ තිබුණු සටහන තුළින් නිරූපණය විය.

සභාවන් විසින් දිනපතා ජීවිතයේ සෑම ක්ෂේත්‍රයක් වෙතම පුරුෂයන් හා ස්ත්‍රීන් යැවිය යුතුය. ඔවුන් තම ඇදහිල්ල ගැන කතා කරන අය නොවී ඒ අනුව ජීවත් වන අය විය යුතු අතර ශුභාරංචියේ බලයෙන් තම ජීවිත වෙනස් කරනු ලැබූ අය විය යුතුය. බැරැක්කය තුළ රැඳී සිටීමෙන් සොල්දාදුවෙකුට සටනක් ජය ගත නොහැකිය. ගොයම් නෙළන්නෙකු ධාන්‍යාගාරය තුළ රැඳී සිටින්නේ නැත. එසේම මසුන් අල්ලන්නෙකු තනිව වෙරළේ හිඳ සිටින්නේද නැත.

## සාමාජීය ජාලයන් :

නව ගිවිසුම් කාලයේදී පවුල් හා මිතුරන් අතර පැවති සාමාජීය ජාලයන් හරහා ශුභාරංචිය වේගයෙන් ව්‍යාප්ත විය. උදාහරණයක් ලෙස, යේසුස්වහන්සේ තමන් අනුගමනය කරන ලෙස

ඇන්ඩෘ කැඳවූ සේක. ඇන්ඩෘ ක්ෂණිකවම ශුභාරංචිය බෙදා ගැනීමට පටන් ගත්තේය. ඔහු එය ආරම්භ කළේ තම පවුල වෙත ළඟා වීමෙනි. ඔහු පේතෘස්ව ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ආවේය.

ඒ වනවිටත් පැවති සාමාජීය ජාලයන් හරහා ශුභාරංචිය ව්‍යාප්ත වූ ආකාරය පෙන්වන පහත බයිබල් කොටස් අධ්‍යයනය කරන්න :

- සාකෙවුස් හා ඔහුගේ පවුල : ලූක් 19
- කපර්ණවුමේ ඇමතියාගේ පවුල : යොහන් 4:53
- කොර්නේලියස්ගේ ඥාතීන් හා මිතුරන් : ක්‍රියා 10:24, 44
- පිලිප්පියේ නිවාස දෙකක වැසියන් : ක්‍රියා 16:15 හා 27-34
- සිනගෝගයේ මූලාදෑනියාගේ පවුල : ක්‍රියා 18:8
- ස්තේපනස් හා ඔහුගේ නිවැසියන් : 1 කොරින්ති 1:16
- අරිස්තොබුලස්ගේ හා නාර්කිසස්ගේ නිවෙස්වල වැසියන් : රෝම 16:10-11
- ඔනේසිපොරස් හා පවුල : 2 තිමෝති 1:16
- පිලෙමොන් හා පවුල : පිලෙමොන් 1

## යේසුස්වහන්සේගේ ක්‍රම :

ක්‍රියා පොත පුරාවට මුල් සභාව යේසුස්වහන්සේ විසින් උගන්වනු ලැබූ හා ප්‍රදර්ශනය කරනු ලැබූ ක්‍රම පාවිච්චි කළේය. ඔවුහු ශුභාරංචිය දේශනා කළහ. වචනය ඉගැන්වූහ. නව ඇදහිලිවන්තයන් බව්තීස්ම කළ අතර නව ගෝලයන් පුහුණු කළහ (මතෙව් 28:19-20).

සභාව ව්‍යාප්ත වීමේදී යාච්ඤාව හා දේව වචනය අධ්‍යයනය කිරීම වැදගත් විය (ක්‍රියා 6:4). දේව වචනය හා බලය ප්‍රදර්ශනය කිරීම යන්න ඒකාබද්ධ වීම නිසාද සභාව ව්‍යාප්ත විය. මනුෂ්‍යයන් සුවය ලබන විට, හාස්කම් සිදුවන විට හා යක්ෂයන් පලවා හරිනු ලබන විට සමූහයා ස්වාමීන්වහන්සේ වෙතට පැමිණියහ.

(බලය ප්‍රදර්ශනය කිරීම යන්න ඉතා වැදගත් වන අතර හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය තුළ මෙම විෂය වෙනුවෙන්ම කැපවූ *"බලයේ මූලධර්ම"* නැමති වෙනම පාඨමාලාවක් තිබේ.)

## නව ගිවිසුමේ කණ්ඩායම් :

නව ගිවිසුම තුළ සිදුවූ ව්‍යාප්ත වීමේදී කණ්ඩායම් වැදගත් විය. ක්‍රියා 6:1-7 දී ප්‍රශ්නයක් මතු වූ විට, එයට පිළියමක් ලෙස විශේෂ කණ්ඩායමක් සංවිධානය කරන ලදි. දුරස්ව් පාසලකදී පාවුල් විශේෂ ගෝලයන් කණ්ඩායමකට ඉගැන්නුවේය (ක්‍රියා 19:9). තවත් අවස්ථාවලදී පාවුල් වෙන් කරන ලද යුදෙව් හා අන්‍යජාතික කණ්ඩායම්වලට ඉගැන්නුවේය (ක්‍රියා 13:42). කුඩා කණ්ඩායම් නිවෙස්වල රැස්වූහ (ක්‍රියා 12).

මුළු සභාවම සහභාගී වන විශේෂ රැස්වීම්වලදී ඉටු කරගත නොහැකි අරමුණු ඉටු කර ගැනීම සඳහා බොහෝ සභාවන් තම මුළු සාමාජිකත්වයම කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කර තිබේ. පෞද්ගලික අවශ්‍යතාවන් උදෙසා සේවය කිරීමේදී කුඩා කණ්ඩායම් වඩා කුළුපග, ජංගම හා නම්‍යශීලී වේ. සභාවකට එවැනි කණ්ඩායම් සංවිධානය කර ගත හැක්කේ කෙසේදැයි මෙම රූපසටහන පෙන්නුම් කරයි.

3 ⟵ 2 ⟵ 1 ⟶ 2 ⟶ 3

1. සභාපාලකවරයා විසින් (අංක 1) කුඩා කණ්ඩායම් භාරව සිටිය හැකි නායකයන් පුහුණු කරනු ලබයි (අංක 2 මඟින් දක්වයි). කණ්ඩායමේ ආත්මික අරමුණ හා ක්‍රියාකාරකම් පිළිබඳව ඔහු ඔවුන්ට උපදෙස් ලබා දෙයි. ඒ තුළ සහභාගීත්වය, දේව වචනය අධ්‍යයනය කිරීම, පෞද්ගලික අත්දැකීම් බෙදා ගැනීම, යාච්ඤාව, ප්‍රායෝගික ද්‍රව්‍යමය අවශ්‍යතා ගැන සැලකිලිමත් වීම හා ශුභාරංචිය ප්‍රකාශ කිරීම යන දේවල් අන්තර්ගත විය යුතු බවට

උපදෙස් දෙයි. කණ්ඩායම් කීයක් සකස් කරන්නේද යන්න මත පදනම්ව කණ්ඩායම් නායකයන් සංඛ්‍යාව සභාවෙන් සභාවට වෙනස් වේ.

2. සෑම කණ්ඩායම් නායකයෙකුම (අංක 2 නිරූපණය කරන) කුඩා කණ්ඩායමක් (අංක 3 මඟින් දක්වන) නිර්මාණය කර එයට නායකත්වය දෙයි.

## සෑම නිවසක්ම ශුභාරංචිය බෙදීමේ මධ්‍යස්ථානයක් :

ආරම්භයේ පටන් දෙවියන්වහන්සේගේ සැලැස්ම වූයේ නිවස ක්‍රිස්තියානි පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමයි :

**මා විසින් අද නුඹට අණ කරන මේ වචන නුඹේ සිතේ තිබේවා. ඒවා නුඹේ දරුවන්ට හොඳාකාරයෙන් උගන්වා, නුඹ ගෙයි හිඳින කල . . . ඒවා ගැන කතා කරපන්න. . . . ඒවා නුඹේ ගෙයි උළුවහු පිටද නුඹේ දොරවල් පිටද ලියාපන්න (ද්විතීය කතාව 6:6-9).**

පහත බයිබල් පදවලින් නිරූපණය වන ආකාරයට සෑම නිවසක්ම ශුභාරංචිය බෙදීමේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම මුල් සභාව ව්‍යාප්ත කිරීමේ ක්‍රමයේ කොටසක් විය. :

- ක්‍රියා 2 : ශුද්ධාත්මයාණන්වහන්සේ ප්‍රදානය කරන ලද්දේ නිවසක උඩුමහල් මැදුරක පැවති රැස්වීමකදීය.

- ක්‍රියා 5:42 : ඇදහිලිවන්තයන් දේව මාළිගයේ හා නිවෙස්වල නමස්කාර කළ අතර, බැහැ දැකීමට, සහභාගීත්වයට හා නමස්කාරයට ගෙයින් ගෙට ගියහ.

- ක්‍රියා 8:3 : සාවුල් සභාව පරාජය කිරීමට උත්සාහ කරන විට ඔහුගේ අවධානය යොමුවූයේ දේව මාළිගාවේ නමස්කාර කිරීමට ගත් උත්සාහයන් පිළිබඳව පමණක් නොවේ. ශුභාරංචිය ව්‍යාප්ත වීම වැළැක්වීමට උත්සාහ කරමින් ඔහු සෑම නිවසකටම ගියේය. සෑම නිවසක්ම ශුභාරංචි මධ්‍යස්ථානයක් විය.

- ක්‍රියා 9:11,17 : අනනියස් විසින් පාවුල් ගෝලයෙකු ලෙස ගොඩනැගුවේ නිවසකදීය.

- ක්‍රියා 10: අන්තර් සංස්කෘතිකමය වශයෙන් ශුභාරංචි පණිවුඩය ව්‍යාප්ත වීම පිළිබඳව මුල්ම දර්ශනය පේතෘස්ට දෙන ලද්දේ ඔහු නිවසක යාච්ඤා කරමින් සිටියදීය.

- ක්‍රියා 10: අන්‍ය ජාතීන් වෙත වූ පළමු පණිවුඩය දේශනා කරන ලද්දේ නිවසකදීය.

- ක්‍රියා 12 : නිවසක පැවති යාච්ඤා රැස්වීමක ප්‍රතිඵලයක් ලෙස පේතෘස් හිරගෙයින් මුදනු ලැබීය.

- ක්‍රියා 20:20, 28:30-31 : තම සේවය තුළදී පාවුල් ප්‍රසිද්ධියේ මෙන්ම ගෙයින් ගෙට ගොස් ඉගැන්වීමෙහිද නිරත විය.

- ක්‍රියා 20:7-12 : යුතිකස් ජනේලයකින් වැටෙන විට පාවුල් නිවසක දේශනා කරමින් සිටියේය.

- ක්‍රියා 21:8-14 : නිවෙස්වලදී අනාගතවක්තෘමය එළිදරව් වීම් ලැබුණි.
නිවෙස්වල පැවැත් වූ සභාවන් පිළිබඳව 1 කොරින්ති 16:19, රෝම 16:3-5, කොලොස්සි 4:15 හා පිලෙමොන් 1:2 හි සඳහන් වේ.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය :

පව්කාර පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට තම පාපය අඟවා දෙමින් ශුභාරංචි පණිවුඩය පිළිගැනීම වෙත ඔවුන්ට මඟ පෙන්වන බලවේගය ශුද්ධාත්මයාණන්වහන්සේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ වෙතට හැරීම තුළින් සභාව ව්‍යාප්ත වීම සිදුවේ.

**උන්වහන්සේ ආ කල, පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අඟවා දෙන සේක. පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඇදහන නිසාය. ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ පියාණන්වහන්සේ ළඟට යන බැවින් තවත් නුඹලා මා නොදක්නා නිසාය. විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරනු ලැබ සිටින නිසාය. (යොහන් 16:8-11).**

## ආත්මික දීමනා :

මනුෂ්‍යයා වර්ධනය වන විට සෛලවල ගුණනය වීමට උපකාර කරන අස්ථි ව්‍යුහයක වර්ධනයද අවශ්‍ය වේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වීමේදීද ව්‍යුහය එක ලෙස වැදගත් වේ. ගොයම පැසී තිබෙන නමුත් ගොවීහු විරල බව යේසුස්වහන්සේ පැවසූ සේක. ගොවීහු විරල නම්, අස්වැන්න නෙළීම සඳහා ඔවුහු ඵලදායි ලෙස සංවිධාන ගත විය යුතුය.

මෙම අරමුණ සඳහා, ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව තුළ ආත්මික දීමනා හා විවිධ නිලතල තබා තිබේ. මෙම දීමනා හා නිලයන් ඇත්තේ සේවයේ අරමුණු උදෙසා වේ. ආත්මික දීමනා යනු දේව සේවය තුළ ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබා දී ඇති අධි ස්වාභාවික හැකියාවන්ය. පහත බයිබල් පද තුළින් ඔබට විවිධ ආත්මික දීමනා පිළිබඳව කියවිය හැක:

- රෝම 12:1-8
- 1 කොරින්ති 12:1-31
- එපීස 4:1-16
- 1 පේතෘස් 4:7-11

සභාව තුළ සෑම ඇදහිලිවන්තයෙකුටම දෙවියන්වහන්සේ විශේෂ ස්ථානයක් දී ඇත.

**නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත ලෙස ඒ සියලු අවයවයන් වෙන වෙනම ශරීරයේ තැබූ සේක. (1 කොරින්ති 12:18)**

සෑම සාමාජිකයෙකුටම දෙවියන්වහන්සේ විසින් ඔහු උදෙසා තෝරාගත් ස්ථානයක් තිබේ. සභාව තුළ ඔහු විසින් ඉටු කළ යුතු විශේෂිත අරමුණු ඉටු කිරීම සඳහා ශුද්ධාත්මයාණන්ගේ දීමනා තුළින් ඔහුව බලගන්වා තිබේ. සෑම ඇදහිලිවන්තයෙක්ම දෙවියන්වහන්සේ ඔහු උදෙසා තෝරා ගත් ස්ථානය සම්පූර්ණ කරන විට හා ආත්මික දීමනා පාවිච්චි කරන විට, සභාව නිසි පරිදි ක්‍රියාත්මක වෙයි. සෑම සාමාජිකයෙක්ම තම කාර්යය හඳුනන හා එහි නිරත වන මනුෂ්‍ය ශරීරයට දෙවියන්වහන්සේ විසින් සභාව උපමා කර ඇත (1 කොරින්ති 12:1-31).

ස්වභාවික ශරීරයේ සෑම කොටසක්ම වැදගත් වන ආකාරයටම, සේවයේ කාර්යයන් සඳහා සෑම පුද්ගලයෙකුම වැදගත් වේ.   :

**නුඹ මට ඕනෑ නැතැයි අතට කියන්ට ඇසටවත්, නුඹලා මට ඕනෑ නැතැයි පාදවලට කියන්ට හිසටවත් නුපුළුවන. එසේය, ශරීරයේ වඩා ඕනෑ කරන්නේ වඩා දුර්වලව පෙනෙන අවයවයෝය. (1 කොරින්ති 12:21-22).**

හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* නමැති පාඨමාලාව තුළ සෑම ආත්මික දීමනාවක් පිළිබඳවම විස්තරාත්මක වාර්තාවක් සපයයි. ඒ හේතුවෙන් මෙහිදී දක්වා ඇත්තේ සංක්ෂිප්ත සාරාංශයක් පමණි.

## විශේෂ නායකත්ව දීමනා:

දෙවියන්වහන්සේ සභාවේ ඇතැම් පුද්ගලයන් කැඳවා ඇති හා පත්කර ඇති විශේෂ නායකත්ව තනතුරු තිබේ.

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

දෙවියන්වහන්සේ විසින් දී ඇති මෙම විශේෂ නායකයන්ට පහත අය ඇතුළත් වේ.

ප්‍රේරිතයන් :

ප්‍රේරිතයෙක් යනු විවිධ ස්ථානයන් හා සංස්කෘතින් තුළ නව සභාවන් බිහි කිරීමේ හැකියාව ඇති සහ පරීක්ෂකයෙකු ලෙස සභාවන් ගණනාවක් සුපරීක්ෂා කිරීමේ හැකියාව ඇති අයෙකි. ප්‍රේරිතයෙකු යනු, "කෙනෙකු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා සම්පූර්ණ බලය හා ආධිපත්‍ය පවරා දී යවනු ලැබූ අයෙක්" වේ. ඇදහිලිවන්තයන් සංවිධානය කිරීම තුළින් ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ විශේෂ ආධිපත්‍යයක් හෝ හැකියාවක් ප්‍රේරිතයෙකුට තිබේ. ප්‍රේරිතයන් පිළිබඳව සභාව විසින් නූතනයේ භාවිත කරන වචන නම් මිෂනාරිවරු හෝ සභාවන් පිහිටුවන්නන් යනුයි.

අනාගතවක්තෘවරු :

අනාගතවක්තෘමය දීමනා දෙකක් තිබේ. එකක් නම් අනාගතවක්තෘවරයෙකු වීමේ විශේෂ දීමනාවයි. අනෙක නම් අනාවැකි කතා කිරීමේ දීමනාවයි. පොදුවේ ගත් විට අනාගත වාක්‍ය කීම යනු දෙවියන්වහන්සේගේ ආනුභාවය යටතේ කතා කිරීමයි. එය දෙවියන්වහන්සේගෙන් වන ක්ෂණික පණිවුඩයක් ලබාගෙන එය උන්වහන්සේගේ සෙනඟට පැවසීමේ විශේෂ හැකියාවයි. අනාගතවක්තෘවරයෙකු වන පුද්ගලයෙකුට අනාගතවාක්‍ය කීමේ දීමනාව මෙන්ම අනාගතවක්තෘ කෙනෙකුගේ විශේෂ නායකත්ව දීමනාවද තිබේ.

ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් :

පුරුෂයන් හා ස්ත්‍රීන් විසින් පිළිගනු ලැබ ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු පුද්ගලයන් බවට පත්වන ආකාරයට, නොඇදහිලිවන්තයන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමේ හැකියාව ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් සතුය. "ශුභාරංචි ප්‍රකාශ කරන්නා" යන වචනයේ අර්ථය "යහපත් ආරංචි ගෙනෙන තැනැත්තා" යනුයි.

සභාපාලකයන් :

සභාපාලකයන් යනු ඇදහිලිවන්තයන් කණ්ඩායමක ආත්මික සුභසාධනය පිළිබඳව දීර්ඝකාලීන වගකීම දරන පුද්ගලයා වේ.

ගුරුවරු :

අන් අයට ඉගෙන ගනු ලබන දේවල් තේරුම් ගෙන අදාළ කරගත හැකිවන පරිදි දේව වචනය ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ගුරුවරු සතුය. ගුරවරයෙකු යනු ඉගැන්වීමේ දීමනාව දරන හා සභාවේ නායකත්ව තනතුරක සේවය කරන පුද්ගලයෙකි.

නායකත්වය පිළිබඳ විශේෂ දීමනාවන් පහ සභාවේ ව්‍යාප්තිය උදෙසා එකට ක්‍රියා කරයි. ප්‍රේරිතයන් විවිධ ප්‍රදේශ වෙත ශුභාරංචිය ගෙන ගොස් ඇදහිලිවන්තයන්ගේ සංවිධානාත්මක ව්‍යුහයන් ගොඩනගයි. මෙම ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේදී උපකාර පිණිස දෙවියන්වහන්සේ හාස්කම්, ලකුණු සහ පුදුම ක්‍රියා ලබා දෙන සේක. තමන් විසින් ගොඩනඟන සභාවන්ට ප්‍රේරිතයන් විසින් විශේෂ නායකත්වයක් ලබා දෙනු ලැබේ.

අනාගතවක්තෘවරුන්ද සභාවට නායකත්වය දෙන්නෝ වෙති. ඔහුගේ එක් කාර්යයක් නම් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවයෙන් දෙවියන්වහන්සේගේ පණිවුඩ ගෙන ඒමයි. මනුෂ්‍යයන් විසින් ප්‍රතිචාර දක්වා ඇදහිලිවන්තයන් බවට පත්වන ආකාරයට ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් ශුභාරංචිය සන්නිවේදනය කරති. ඔවුහු තනි පුද්ගලයන්ට හෝ විශේෂ කණ්ඩායම්වලට සේවය කළ හැකිය. නමුත් ඔවුන්ගේ සේවය හැමවිටම නව ඇදහිලිවන්තයන් බිහිකරයි.

මෙම ඇදහිලිවන්තයන් අනතුරුව ඔවුන්ගේ ආත්මික වර්ධනයට මඟ පෙන්වන සභාවේ ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරු, සභාපාලකවරු හා ගුරුවරුන්ගේ රැකවරණයට පැමිණේ. (ක්‍රියා 8 හි සඳහන් ලෙස පිලිප් පිළිබඳ උදාහරණය මෙය නිරූපණය කරයි. ඔහු සමාරිතයන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙනා අතර ඉන් අනතුරුව වැඩිදුර ඉගැන්වීම් සඳහා ඔවුන්ව ප්‍රේරිතයන් වෙත යොමු කළහ.)

ප්‍රේරිතයන් හා ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ගේ පණිවිඩය තුළින් අදහාගත් අයට සභාපාලකයන් විසින් දීර්ඝකාලීන රැකවරණය සපයයි. ඔවුන්ගේ සේවය එඬේරෙකු තම බැටළුවන් වෙත දක්වන ප්‍රේමණීය සැලකිල්ල නිරූපණය කරන චිත්‍රයකි. ගුරුවරුන් විසින් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් විසින් දුන් උපදෙස්වලට එහා ගිය උපදෙස් ලබා දෙයි. ඇදහිලිවන්තයන්ට ආත්මිකව පරිණතවීමට ඔවුහු උගන්වති. අන් අයට ඉගැන්වීමේ හැකියාව ඇති විශ්වාසවන්ත මනුෂ්‍යයන්ව ඔවුහු පුහුණු කරති.

විශේෂ නායකත්ව දීමනා සහිත අයගේ ප්‍රධාන වගකීම අන් ඇදහිලිවන්තයන්ට තම ආත්මික දීමනා හඳුනා ගැනීමට හා පාවිච්චි කිරීමට උපකාර කිරීමයි (එපිස 4:11-16). සේවයේ කාර්යයන් සඳහා සියලු සාමාජිකයන්ගේ ක්‍රියාකාරී දායකත්වය අවශ්‍ය වේ. සේවයේ මෙම ශරීර ආකාර ව්‍යුහය නිසි ලෙස ක්‍රියාත්මක නොවන විට, අක්‍රිය සාමාජිකයන් වැරදි ඉගැන්වීම් මඟින් පහසුවෙන්ම හසු කරගනු ලැබේ. (එපිස 4:11).

ඇදහිලිවන්තයන්ට දෙන අනෙකුත් ආත්මික දීමනාවල සාරාංශයක් පහත දැක්වේ:

**කතා කිරීමේ දීමනාව :**

මෙම දීමනා සියල්ල තුළ කතා කිරීම (ශබ්ද නගා) අන්තර්ගත වන බැවින් ඒවා කතා කිරීමේ දීමනා ලෙස හැඳින්වේ.

අනාගතවාක්‍ය කීම : අනාගතවාක්‍ය කීමේ දීමනාව ඇති පුද්ගලයෙකු දෙවියන්වහන්සේගේ සෙනඟට ක්ෂණික පණිවුඩයක් සන්නිවේදනය කිරීම සඳහා උන්වහන්සේගේ ආනුභාවය යටතේ කතා කරයි.

ඉගැන්වීම : අන්‍යයන් විසින් ඉගෙන ගත් දෙය තේරුම් ගෙන අදාළ කරගත හැකි වන පරිදි දේව වචනය ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ගුරුවරුන්ට ඇත.

උපදේශනය : අවශ්‍යතාවන් ඇති පුද්ගලයන්ට ළංවී, දේව වචනය භාවිත කොට ඔවුන්ට නිසි උපදෙස් දීමේ හැකියාව ඇත.

ප්‍රඥාවේ වචන : විශේෂිත අවශ්‍යතාවන් සඳහා දැනුම අදාළ කිරීමට හැකි පරිදි සූක්ෂ්ම ඥානය ලබා ගැනීමට ඇති හැකියාව.

දැනගැන්මේ වචන : අන් අය නොදන්නා හා ඔවුන්ට තේරුම් ගත නොහැකි දේවල් තේරුම් ගැනීමට හා මෙම දැනුම ඔවුන් සමඟ බෙදා ගැනීමට ඇති හැකියාව.

**සේවය කිරීමේ දීමනා :**

මෙම දීමනා ආත්මික මෙන්ම ප්‍රායෝගික ක්ෂේත්‍රවලද ව්‍යුහය, සංවිධානය හා උපකාරය ලබා දීම මඟින් සභාවට සේවය කරයි.

සේවය කිරීම : ස්වාමින්වහන්සේගේ සේවයේ ප්‍රායෝගික කාර්යයන්ට අදාළ ප්‍රායෝගික වැඩ ඉටු කිරීමට ඇති හැකියාවයි. දිනපතා කිරීමට ඇති වැදගත් හා අවශ්‍ය කාර්යයන්වලින් අන් අය නිදහස් කිරීමට ඇති හැකියාවයි.

උපකාර කිරීම : අන් අයගේ ආත්මික දීමනාවල ඵලදායීතාව වැඩි කිරීම සඳහා ස්වාමින්වහන්සේගේ කාර්යයන්හි නිරත වීමට ඔවුන්ට උපකාර කිරීමට ඇති හැකියාවයි.

නායකත්වය : දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සමගාමී වන ඉලක්ක සකස් කිරීමට හා එම ඉලක්ක අන් අය වෙත සන්නිවේදනය කිරීමට ඇති හැකියාවයි. මෙම දීමනාව ඇති පුද්ගලයන් ස්වාමින්වහන්සේගේ මහිමය උදෙසා ඉලක්ක වෙත ළඟා වීමට අන් පුද්ගලයන්ව පොලොඹවයි.

පරිපාලනය : බයිබලයේ මෙම දීමනාව හඳුන්වන්නේ "ආණ්ඩු කරන්නන්" යනුවෙනි. මෙම දීමනාව සහිත පුද්ගලයෙකුට මඟ පෙන්වීමේ, සංවිධානය කිරීමේ හා අන් අය උදෙසා තීරණ ගැනීමේ හැකියාව ඇත.

දීම : ස්වාමීන්වහන්සේගේ කාර්යයන් උදෙසා ද්‍රව්‍යමය භාණ්ඩ හා මූල්‍ය සම්පත්, කාලය, ශක්තිය හා හැකියාවන් ලබා දීමේ විශේෂ හැකියාව.

කරුණාව දැක්වීම : විශේෂ අනුකම්පාව හා දුක් විඳින අයට උපකාර කිරීමේ හැකියාව.

ආත්ම විමසීම : මනුෂ්‍යයන්, ධර්මයන් හා අවස්ථා විමසා බලා ඒවා දෙවියන්වහන්සේ වෙතින් එන දේවල්ද නැතහොත් සාතන් වෙතින් එන දේවල්ද යන්න තීරණය කිරීමේ හැකියාව.

ඇදහිල්ල : ඇදහිල්ලේ දීමනාව ඇති පුද්ගලයෙකුට අසීරු තත්ත්වයන්වලදී දෙවියන්වහන්සේ පිළිබඳව අසාමාන්‍ය විශ්වාසයක් ඇති අතර අදහා ගැනීමට විශේෂ හැකියාවක් ඔවුන් සතුය.

ආගන්තුක සත්කාරය : ආහාර හා නවාතැන් සැපයීමට හා අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතාවන්ට සේවය කිරීමට ඇති හැකියාවයි.

**ලකුණු දැක්වීමේ දීමනා :**

මේවා නම් දෙවියන්වහන්සේගේ වචනය ස්ථිර කිරීම සඳහා ඇදහිලිවන්තයන් තුළින් ක්‍රියා කරන උන්වහන්සේගේ බලයේ අධි ස්වාභාවික ලකුණුය.

අන්‍ය භාෂා : කිසිදා ඉගෙන නොගත් භාෂාවකින් දෙවියන්වහන්සේගෙන් පණිවුඩයක් ලබා ගෙන එය උන්වහන්සේගේ සෙනඟට සන්නිවේදනය කිරීමේ හැකියාවයි.

අන්‍ය භාෂා පණිවුඩය තේරුම් කර දීම : අන්‍ය භාෂාවකින් කතා කරන කෙනෙකුගේ පණිවුඩය තේරුම් ගත හැකි භාෂාවකින් ඉදිරිපත් කිරීමට ඇති හැකියාවයි.

හාස්කම් : හාස්කම් කිරීමේ දීමනාව ඇති පුද්ගලයෙක් තුළින් ස්වාභාවිකව සිදු වීමට හැකියාවක් නොමැති ක්‍රියා දෙවියන්වහන්සේ විසින් සිදු කරයි.

සුව කිරීම : මෙම දීමනාව සහිත පුද්ගලයෙකුට ස්වාභාවික ක්‍රමයක් පාවිච්චි කිරීමෙන් තොරව දෙවියන්වහන්සේගේ බලය තමා තුළින් ගලා යාමට ඉඩහැර සුවය ලබා දීමේ හැකියාව ඇත.

## බයිබලීය සංවිධානය :

බයිබලයේ සඳහන්ව ඇති එකම නායකයන් වර්ගය විශේෂ දීමනා සහිත ඇදහිලිවන්තයන් පමණක් නොවේ. උපස්ථායකයන්, වැඩිමහල්ලන් බිෂොප්[3] යන තනතුරුද බයිබලයේ සඳහන් වේ. සභාවේ වර්ධනයේදී මෙම පුද්ගලයන්ද උපකාරී වේ.

මෙම නායකත්ව තනතුරු ඔබ පෙර ඉගෙන ගත් නායකත්ව දීමනා හා සමාන නොවේ. ඒවා මුල් සභාව විසින් සභාවේ වර්ධනයේදී උපකාරී වීම සඳහා පිහිටුවා ගන්නා ලද විශේෂ තනතුරු වේ. මුල් සභාවේ පළමු සංවිධානයේ ප්‍රතිඵලයක් ලෙස සභාව වර්ධනය වූයේ කෙසේදැයි ක්‍රියා 6:1-7 දක්වා ඔබට කියවිය හැකිය.

ආකෘතියක් ලෙස අප විසින් අනුගමනය කිරීම සඳහා මුල් සභාව පිළිබඳ වාර්තාවන් දෙවියන්වහන්සේ විසින් ආරක්ෂා කර තිබේ. මෙම තනතුරු අද දවසේ සභාව තුළද ක්‍රියාත්මක විය යුතුය.

මෙම තනතුරුවල අරමුණ නම් විශේෂ නායකත්ව දීමනා ඇති අයට, එනම් : ප්‍රේරිතයන්ට, අනාගතවක්තෘවරුන්ට, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ට, සභාපාලකවරුන්ට හා ගුරුවරුන්ට උපකාර කිරීමයි.

මෙම නායකත්ව තනතුරු ගැන අධ්‍යයනය කිරීම සඳහා පහත කොටස් යොදා ගන්න. :

---

[3] ඇතැම් සභාවන් බිෂොප් තනතුර යන්න සභාපාලක යන්න හා සමාන ලෙස සලකයි. අනෙකුත් සභාවන් එය වෙනම තනතුරක් ලෙස සලකයි.

## සභාවේ තනතුරු

| තනතුර | බයිබල් කොටස් | කාර්යයන්: |
|---|---|---|
| බිෂොප් | 1 තිමෝති 3:1-7<br>පිලිප්පි 1:1<br>තිතස් 1:5-9<br>1 පේතෘස් 5:2-3 | බොහෝ අය බිෂොප් සභාපාලකයා හා සමාන බව සලකයි. ඔහු ඇදහිලිවන්තයන් කණ්ඩායමක් වෙත දීර්ඝකාලීන සැලකිල්ලක් දැක්විය යුතු බව මෙම බයිබල් පදවලින් දක්වයි. |
| උපස්ථායකයන් | 1 තිමෝති 3:8-13<br>පිලිප්පි 1:1<br>ක්‍රියා 6:1-7 | උපස්ථායකයන්ට සේවය කිරීමේ හා උපකාර කිරීමේ මෙහෙයක් ඇති බව මෙම පදවලින් දක්වයි. |
| උපස්ථායක ස්ත්‍රීන් | 1 තිමෝති 3:11<br>රෝම 16:1:2 | උපස්ථායක ස්ත්‍රීන් යන්න බයිබලයේ නිශ්චිතව දක්වා නැත. ඇතැම් සභාවන් උපස්ථායකයන්ගේ භාර්යාවන් හෝ සේවය කිරීමේ හා උපකාර කිරීමේ නිරත වෙනත් කාන්තාවන් හැඳින්වීමට මෙම පදය යොදයි. |
| වැඩිමහල්ලන් | ක්‍රියා 20:17, 28-32<br>ක්‍රියා 14: 23, 15<br>ක්‍රියා 16:4, 11:30<br>1 තිමෝති 5:17<br>1 පේතෘස් 5:1-4<br>තිතස් 1:5<br>යාකොබ් 5:14 | වැඩිමහල්ලන් විසින් සභාවේ තීරණ ගැනීමේදී නායකත්වය දිය යුතු බවත් ඇදහිලිවන්තයන්ගේ අවශ්‍යතාවන්ට සේවය කළ යුතු බවත් ඇදහිලිවන්තයන්ගේ ප්‍රාදේශීය ව්‍යුහයන්ගේ වර්ධනයට හා රැකබලා ගැනීමට උපකාර කළ යුතු බවත් මෙම පදවලින් දක්වයි. |

සටහන : “වැඩිමහල්ලන්” යන වචනය බයිබලයේ මුලින්ම පාවිච්චි කර ඇත්තේ නික්මයාම 3:16 හි ඉශ්‍රායෙල් නායකයන් සම්බන්ධයෙන් වේ. බයිබලය පුරා ඉශ්‍රායෙල් වැඩිමහල්ලන් ගැන සඳහන් වන අවස්ථා රැසක් තිබේ. මෙම වැඩිමහල්ලන් මුල් සභාව තුළ වැඩිමහල්ලන් ලෙස හැඳින්වූ නායකත්ව තනතුරින් වෙනස් වේ. අප මෙහි ලයිස්තු ගත කර ඇති සියලුම බයිබල් පදවල දැක්වෙන්නේ ඉශ්‍රායෙල් වැඩිමහල්ලන් පිළිබඳව නොව සභාවේ වැඩිමහල්ලන් පිළිබඳව වේ.

වැඩිමහල්ලන් දෙවියන්වහන්සේ සභාවේ තබා ඇති විශේෂ නායකත්ව දීමනා හා සමගාමීව ක්‍රියාත්මක වේ. වැඩිමහල්ලන් විසින් දෙවියන්වහන්සේගේ විශේෂ නායකයන් වන ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරුන්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභාපාලකයන් හා ගුරුවරුන්ගෙන් වෙන්ව ස්වාධීනව නායකත්වය දැරිය යුතු නොවේ. සභාවේ විශේෂ නායකයන් පිහිටුවා ඇත්තේ දෙවියන්වහන්සේ විසිනි. වැඩිමහල්ලන් තෝරා ගත්තේ මනුෂ්‍යයන්ය.

සභාවේ සියලුම නායකයන් සැබවින්ම නැවත උත්පාදනය ලැබූ අය විය යුතුය. නමුත් සභාවේ මෙම තනතුරු සම්පූර්ණ කරන අය වෙත තිබිය යුතු විශේෂ සුදුසුකම්ද බයිබලය තුළ දක්වා ඇත. :

**නායකයන් හා වඩිමහල්ලන්ගේ සුදුසුකම් :**

නිර්දෝෂීභාවය : යහපත් පිළිගැනීමක් තිබිය යුතු අතර දේව වචනය උල්ලංඝනය නොකළ යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:6-7.

එක භාර්යාවකට පුරුෂයා විය යුතුය : විවාහක නම් එක් භාර්යාවක් පමණක් සිටිය යුතුය. 1 තිමෝති 3:2, තිතස් 1:6.

පමණ දැන හැසිරෙන අයෙක් : සියලු දේවලදී මධ්‍යස්ථ අයෙක් විය යුතුය. තීතස් 1:8, 1 තිමෝති 3:2.

ස්වයං පාලනයක් තිබීම : ජීවිතයේ සියලු ක්ෂේත්‍ර මෙන්ම හැසිරීම තුළද ස්වයං පාලනයක් තිබෙන බව පෙන්නුම් කිරීම. තීතස් 1:8.

සන්සුන්, සුපරීක්ෂාකාරී වීම : සිහි ඇතිව සිටින, සංවේදී, බුද්ධිමත් හා ප්‍රායෝගික අයෙකු වීම. 1 තිමෝති 3:2, තීතස් 1:8.

ආගන්තුක සත්කාරයට ලැදිවීම. : නිවස අන් අයට විවෘත වීම. 1 තිමෝති 3:2, තීතස් 1:8.

ඉගැන්වීමට හැකි වීම : දේව වචනය අන් අයට සන්නිවේදනය කිරීමේ හැකියාව තිබීම. 1 තිමෝති 3:2, තීතස් 1:9.

මුද්‍රික පානයට ඇබ්බැහි නොවීම : 1 තිමෝති 3:3, තීතස් 1:7.

ඉවසිලිවන්ත වීම : ඉක්මණින් කිපීමේ විරුද්ධ ලක්ෂණය. 1 තිමෝති 3:3.

හිතුවක්කාරී නොවීම : තමන් ගැන පමණක් සිතමින් තමන්ගේම ක්‍රමයට හැසිරීමට උත්සාහ කරන අයෙකු නොවීම. තීතස් 1:7.

අලුත් ඇදහිලිවන්තයෙකු නොවීම : ඇදහිලිවන්තයෙකු ලෙස පරිණතභාවය හා අත්දැකීම්ලත් අයෙකු විය යුතුය. 1 තිමෝති 3:6.

යහපත් දෙයට ප්‍රේම කිරීම : දෙවියන්වහන්සේට හා උන්වහන්සේගේ පරමාර්ථ ඉටු කර ගැනීමට වැදගත් වන හැම දෙයකටම උපකාර කිරීම. තීතස් 1:8.

සාධාරණ : මනුෂ්‍යයන් සමඟ ක්‍රියා කිරීමේදී සාධාරණ වීම. තීතස් 1:8.

වචනය තුළ ස්ථිර වීම. : තීතස් 1:9.

ශුද්ධ වීම : තීතස් 1:8.

නින්දිත ලාභයට ගිජු නොවීම : මූල්‍යමය ලාභ සඳහා තණ්හාවක් ඇති බවට හඳුනා නොගැනීම, මුදලට ඇති ආශාවෙන් තොර වීම. තීතස් 1:7, 1 තිමෝති 3:3.

තම නිවස නිසි ලෙස හැසිරවීම : තම පවුල තුළ නායකත්වය දැරීමේ හැකියාව පෙන්විය යුතුය. 1 තිමෝති 3:4-5.

ඇදහිල්ලෙහි සිටින දරුවන් සිටීම : ස්වාමීන්වහන්සේට ප්‍රතිචාර දැක්වූ හා කැරලිකාර නොවූ දරුවන් සිටිය යුතුය. තීතස් 1:6.

පිටස්තරයන් අතර යහපත් පිළිගැනීමක් තිබීම : නොඇදහිලිවන්තයන් අතර යහපත් සාක්ෂියක් ඇතිව සිටිය යුතුය. 1 තිමෝති 3:7.

**උපස්ථායකයන් සඳහා සුදුසුකම් :**

ගරුත්වය : ගෞරවය ලැබිය යුතු අතර සන්සුන් මනසක් හා චරිතයක් ඇති බව පෙනී යා යුතුය. 1 තිමෝති 3:8.

දෙආකාර කතා නැතිවීම : එකිනෙක ගැටෙන වාර්තා නොසැපයීම. 1 තිමෝති 3:8.

බොහෝ මුද්‍රිකපානයට ඇබ්බැහි නොවීම. : 1 තිමෝති 3:8.

නින්දිත ලාභයට ගිජු නොවීම : මූල්‍යමය ලාභ උදෙසා තෘෂ්ණාවක් නොවීම. 1 තිමෝති 3:8.

ඇදහිල්ලට ඇති කැපවීම තුළ ස්ථිරව සිටීම : 1 තිමෝති 3:9.

සෝදිසි කරනු ලැබ තිබීම : ආත්මික පීඩා හා පරීක්ෂාවන් තුළින් ගෙන යනු ලැබ විශ්වාසවන්ත භාවය ඔප්පු කරනු ලැබූ අයෙකු වීම. 1 තිමෝති 3:9.

නිර්දෝෂී වීම : හැසිරීමේ ප්‍රචණ්ඩභාවය ගැන චෝදනා විරහිත වීම. 1 තිමෝති 3:10.

එක භාර්යාවකට ස්වාමියා වීම. : විවාහක නම් එක් භාර්යාවක් පමණක් සිටිය යුතුය. 1 තිමෝති 3:12.

නිවස හා දරුවන් හොඳින් හැසිරවීම. : පවුල් ජීවිතය තුළ නායකත්වය නිරූපණය කළ යුතුය. 1 තිමෝති 3:12.

**උපස්ථායක ස්ත්‍රීන්ගේ සුදුසුකම් :**

කාන්තාවන් : 1 තිමෝති 3:11.

ගරුත්වය ලැබූ : ගෞරවය ලද, සන්සුන් මනසක් හා චරිතයක් ඇති අය වීම : 1 තිමෝති 3:11.

ද්වේෂ සහගත කේලාම් නොපැවසීම : අපහාසාත්මක ලෙස අන් අය ගැන කතා නොකිරීම :1 තිමෝති 3:11.

පමණ දැන හැසිරීම : සියල්ලෙහිදී මධ්‍යස්ථ වීම : 1 තිමෝති 3:11.

සියල්ලේදී විශ්වාසවන්ත වීම : ජීවිතයේ සෑම අංශයකින්ම විශ්වාසය තැබිය හැකි හා අන් අයට රඳා පැවතිය හැකි ආකාරයේ කෙනෙකු වීම : 1 තිමෝති 3:11.

බොහෝ දෙනෙකුගේ උපකාරකාරියක් වීම : අන් අයට සේවය කළ යුතු අතර ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට උපකාර කළ යුතුය : රෝම 16:2.

පහත රූප සටහන සංවිධානාත්මක ව්‍යුහය සාරාංශ ගත කරයි :

## සභාව

විශේෂ නායකත්ව දීමනා :
ප්‍රේරිතයන්
අනාගතවක්තෘවරු
ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්
සභාපාලකවරු
ගුරුවරු
(එපිස 2:20-22)

▲

(බිෂොප්, උපස්ථායකයන්, වැඩිමහල්ලන් යන විශේෂ තනතුරුවල හා දෙවියන්වහන්සේ සභාව තුළ තමන්ව තබා ඇති ස්ථානයේ සිට තම ආත්මික දීමනා පාවිච්චි කරන සියලු සාමාජිකයන්ගේ උපකාරය ලබයි.)

▲

ප්‍රේරිතයන් සහ අනාගතවක්තෘවරුන් විසින් දමන ලද අත්තිවාරම :
එපිස 2:20

▲

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යන පර්වතය පිට ගොඩනඟන ලද
මතෙව් 16:18
1 කොරින්ති 3:11
එපිස 2:20

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සභාවක් ව්‍යාප්ත වීම තුළින් සිදුවන වර්ධනය අත්දකින විට කුමක් සිදුවේද?

3. යෙරුසෙලමේ මුල් සභාවේ ව්‍යාප්ත වීම තුළින් සිදුවූ වර්ධනය සාරාංශ ගත කරන්න.

4. නව ගිවිසුමේදී සභාවන් ව්‍යාප්ත වූ ක්‍රම ලැයිස්තුවක් පහත දැක්වේ. යෙරුසලමේදී පළමු සභාව විසින් එම එක් එක් ක්‍රමය යොදාගත් ආකාරය වෙනම කඩදාසියක සටහන් කරන්න.

   - ආත්මික දර්ශනය
   - පිළිගැනීමට සූදානම් ප්‍රදේශ හා කාලයන්
   - "එන්න" යන ක්‍රමවේදය වෙනුවට "යන්න" යන ක්‍රමවේදය
   - සැම ඇදහිලිවන්තයෙක්ම තමා වැනි අය බිහි කිරීම.
   - සාමාජීය ජාලයන්
   - යේසුස්වහන්සේගේ ක්‍රම
   - කණ්ඩායම්
   - සැම නිවසක්ම
   - ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය
   - ආත්මික දීමනා සහ තනතුරු

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. තනි ඇදහිලිවන්තයන් මිතුරන්ගෙන් හා ඥාතීන්ගෙන් සමන්විත තමන්ගේම සාමාජීය ජාලයන් තුළ සාක්ෂි දැරීමේ ප්‍රතිඵල පහත අධ්‍යයනය තුළින් පෙන්නුම් කරයි. මුල් වරට සභාවට පැමිණි

   ආකාරය තීරණය කිරීම සඳහා විවිධ සභාවන්ට පැමිණි නව ඇදහිලිවන්තයන් හාරදහසක් ආශ්‍රිතව සමීක්ෂණයක් කරන ලදී. එහි ප්‍රතිඵල පහත පරිදි විය :
   6 සිට 8% : තමන් විසින්ම පැමිණි අය
   2 සිට 3% : සභාවේ වැඩසටහනක් තුළින් පැමිණි අය
   8 සිට 12% : සභාපාලකතුමාගේ ආරාධනය තුළින් පැමිණි අය
   3 සිට 4% : තම ජීවිතයේ විශේෂ අවශ්‍යතාවන් නිසා පැමිණි අය
   1 සිට 2% : සභාවේ සාමාජිකයන් විසින් බැහැදැකීමේ ප්‍රතිඵලයක් ලෙස පැමිණි අය
   3 සිට 4% : සබත් පාසල තුළින් පැමිණි අය
   70 සිට 80% : මිතුරන් හා ඥාතීන් විසින් ආරාධනා කරන ලද අය

මිනිසුන් මුලින්ම සභාවට පැමිණියේ මන්ද යන්න තීරණය කිරීම සඳහා ඔබට ඔබේ සභාවේ නව ඇදහිලිවන්තයන් සමීක්ෂණයක් කර බැලීමට අවශ්‍ය විය හැකිය. අධ්‍යයනය තුළින් ඔබ ලබා ගන්නා තොරතුරු යාච්ඤාවට සහ වර්ධනය වීමට අවශ්‍ය තොරතුරු වනු ඇත. එක් එක් පුද්ගලයාට පහත පෝරමය පිරවීමට සලස්වන්න.

---

නම :______________________________ ලිපිනය :____________________________

කරුණාකර පහත ලැයිස්තුව තුළ ඇති ඔබට පළමුව සභාවට පැමිණීමට හේතු වූ සියලු කරුණු ලකුණු කරන්න.

- මිතුරෙකු ඒ පිළිබඳව සහතිකයක් දීම.
- මා විසින්ම පැමිණෙන ලදී.
- මම දැන්වීමක් දුටුවෙමි. (පුවරුවක්, පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය)
- සභාවේ ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් නිසා
- හිටපු සභාපාලකවරයෙකුගේ නිර්දේශය මත
- මා හට සභාවේ ලිපියක්, පත්‍රිකාවක් හෝ වෙනත් මුද්‍රිත යමක් ලැබීම
- සභාපාලකවරයා විසින් පෞද්ගලිකව බැහැ දැකීම නිසා
- පිබිදීමක් හෝ යාච්ඤා රැස්වීමක් නිසා
- මා කැමති නිකාය එය වන බැවින්
- මා (හා/හෝ මගේ පවුල) සභාව තුළින් ආත්මික උපකාර ලද නිසා
- එය මගේ නිවස ආසන්නයේ පිහිටි නිසා
- එය මිත්‍රශීලි, සැලකිල්ලක් දක්වන සභාවක් වන බැවින්
- ඥාතියෙකු මේ සභාවට අයිති නිසා

2. ගෙයින් ගෙට යාම මුල් සභාව විසින් යොදාගත් ක්‍රමයකි. ඔබේ සභාව පිහිටි ප්‍රදේශයේ අයගේ නිවෙස්වලට යාම සඳහා යෝජනා කිහිපයක් පහත දැක්වේ.

   - බැහැ දැකීමට සුදුසු ඇඳුමකින් සැරසෙන්න. ඔබගේ සංස්කෘතිය තුළ ව්‍යාපාර කටයුත්තක් සඳහා පිළිගන්නා ආකාරයට සැරසෙන්න. ඔබ එම ස්ථානයට යන්නේ දෙවියන්වහන්සේගේ ව්‍යාපාරයක් උදෙසාය.

   - බැහැ දැකීමට යාමට පෙර යාච්ඤා කරන්න.

- ඔබගේ බැහැ දැකීම මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා වෙත කේන්ද්‍රගත කරන්න. ඔවුන්ට ගැළවීම අවශ්‍යද? ඔවුන්ට ආත්මික අවශ්‍යතා සඳහා උපදේශනයන් අවශ්‍යද? ඔවුන්ට ශාරීරික සුවය හෝ ද්‍රව්‍යමය අවශ්‍යතා තිබේද?

-වැඩි වේලාවක් රැඳී නොසිටින්න. ක්‍රිස්තුස්වහන්සේ මිනිසුන් මුණගැසුණු අවස්ථා ඉතා කෙටි නමුත් පරමාර්ථයක් සහිත ඒවා විය.

- වෙනත් බැහැ දැකීමක් සඳහා සැලසුම් කරන්න. එම නිවසට යළි ඇතුළු වීමට ඔබට ඇති හේතුව කුමක්ද? වෙනත් වචනවලින් පවසන්නේ නම් ඔබට යළිත් වරක් එහි යා හැකි වනු පිණිස පවසන ලද්දේ මොනවාද? (උදාහරණයක් ලෙස, රෝගීව සිටින පුද්ගලයෙකුගේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා)

- සභාපාලකවරයාගේ පෞද්ගලික සැලකිල්ල හා අවධානය පිණිස ඔබ විසින් ඔහු වෙත යොමු කළ යුතු කිසිවක් මතු වූයේද?

3. සභාවන් ව්‍යාප්ත වන හැම අවස්ථාවකම වැදගත් වන කරුණු තුනක් තිබේ: දෙවියන්වහන්සේගේ ආත්මය, දෙවියන්වහන්සේගේ වචනය හා දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාය.

පහත සටහන උපයෝගී කරගෙන ක්‍රියා පොත යළි මතක් කර ගන්න.

**දෙවියන්වහන්සේගේ ආත්මය කෙරෙහි අවධානය යොමු කර තිබේ.** ක්‍රියා 1-11

2,8,9,10,19 යන පරිච්ඡේද තුළ ශුද්ධාත්මයෙන් බව්තිස්ම වූ අවස්ථා පහක් පිළිබඳව වාර්තා වේ.

**දෙවියන්වහන්සේගේ වචනය කෙරෙහි අවධානය යොමු කර තිබේ.** ක්‍රියා 12-20

එහි මාතෘකා විවිධ වේ. එය වචනය (16:6), දේව වචනය (17:13), ස්වාමීන්වහන්සේගේ වචනය (15:35), ශුභාරංචිය (15:7), මෙම ගැළවීමේ වචනය (13:26), උන්වහන්සේගේ අනුග්‍රහයේ වචනය (14:3, 20:32), මෙම ජීවනයේ වචනය (5:20) ලෙස හඳුන්වා තිබේ. එහි ප්‍රතිඵල නම් වචනය පතළ වීම (6:7), වර්ධනය හා ගුණනය වීම (12:24) හා වර්ධනය හා බලවත් වීම (19:20) වේ.

**දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා කෙරෙහි අවධානය යොමු කර තිබේ.** ක්‍රියා 21-28.

මෙම පරිච්ඡේද දක්වා ඇත්තේ ප්‍රේරිත වූ පාවුල් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු ලෙස උදාහරණයක් වශයෙනි.

4. අමෙරිකා එක්සත් ජනපදය තුළ වර්ධනය වන සභාවන් පිළිබඳව සමීක්ෂණ කිහිපයක් සිදු කරන ලදී. මෙම ව්‍යාප්ත වන සභාවන් තුළ වූ පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ලැයිස්තුව දක්වා ඇත්තේ වැදගත්කමේ පිළිවෙළට නොවේ. ඔබගේ සභාව මැනිය හැක්කේ කෙසේද?

- ශක්තිමත් ආත්මික නායකත්වය
- හොඳින් ක්‍රියාත්මක වන ගිහියන් හා කණ්ඩායම් සේවයන්
- ඵලදායී ශුභාරංචි ප්‍රකාශ කිරීමේ සේවය
- බයිබලයට අනුකූල ලෙස සකස්වූ ප්‍රමුඛතාවන්
- බලය ප්‍රදර්ශනය කිරීම (සුවය, භාෂාකම් වෙනත්)
- ශුද්ධාත්මයාණන්ගේ දීමනා හා ඵල ප්‍රදර්ශනය කිරීම.
- නව සභාවන් පිහිටුවීම හරහා ගුණනය වන සාමාජිකයන්
- සභාව තුළ කුඩා කණ්ඩායම් සේවය
- ආලේපලත් සාමූහික නමස්කාරය
- දෘෂ්‍යමාන බව (ප්‍රදේශයේ හොඳින් පෙනෙන ස්ථානයක පිහිටීම)
- ශක්තිමත් මූල්‍ය සම්පත්
- ගෝලයන්ව පුහුණු කිරීම සම්බන්ධ සංවිධානාත්මක වැඩසටහන්

- නිශ්චිත පරමාර්ථ හා අරමුණු
- එය පිහිටි ප්‍රදේශය සමඟ ඵලදායී සම්බන්ධතා පැවැත්වීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ කේන්ද්‍රගත වීම.
- බයිබලයට අනුකූලව පදනම් වූ (දේශනා කිරීම, නමස්කාරය, ධර්මතාවන්)
- නම්‍යශීලී (ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් වෙනස් කරනු ලැබීමට විවෘත වූ)
- ආත්මිකව වර්ධනය වන, පරිණත, කැපවූ
- යාච්ඤාවට මුල් ස්ථානයක් දීම
- ගුණනය වන සේවයන්

5. විශේෂ කණ්ඩායම් සේවයක් යනු මුල් සභාව ව්‍යාප්ත වූ එක් ක්‍රමයකි. ඔබගේ සභාව තුළ ආරම්භ කිරීම පිණිස ඔබට යාච්ඤා කළ හැකි කණ්ඩායම් සේවයන් සමහරක් පහත දැක්වේ

- නව ඇදහිලිවන්තයන් උදෙසා ගෝලත්වය
- නව හා ගර්භණී මව්වරු
- දරුවන්
- නව යොවුන් දරුවන්
- වැඩිහිටියන්
- තරුණ විවාහක යුවලවල්
- තනිකඩ පුද්ගලයන්
- විවිධ ඇබ්බැහි වීම්වලට ගොදුරු වූ අය උදෙසා සේවය, එනම්: මත්පැන්, දුම්වැටි, මත්ද්‍රව්‍ය හා වෙනත්.
- යාච්ඤාව
- බයිබල් අධ්‍යයනය
- නගරයේ විවිධ ප්‍රදේශවල අසල්වැසි කණ්ඩායම්
- අවිවාහක මව්වරු
- විශේෂ සංස්කෘතික හෝ භාෂාමය කණ්ඩායම්
- මහත්වරුන්ගේ සේවය
- කාන්තාවන්ගේ සේවය
- ශාරීරික හෝ මානසික ආබාධ සහිත අය
- අසීරුතා අත්දැක ඇති අය උදෙසා වූ විශේෂ කණ්ඩායම්, එනම් : සහකරු මරණයට පත්වූ අය, දරුවෙකුගේ මරණය, දික්කසාදය හා වෙනත්.

6. සෑම කණ්ඩායමකටම නායකයෙකු අවශ්‍ය වේ. එම නායකයා සභාවේ නායකත්වය උදෙසා බයිබලයේ දක්වා ඇති සුදුසුකම්වලට ගැළපේද යන්න පිළිබඳව සැකහැර දැනගන්න. කණ්ඩායම් නායකයෙකුගේ වගකීම් කිහිපයක් පහත දැක්වේ. :

- කණ්ඩායම වෙනුවෙන් සභාපාලකවරයාට හෝ සභාවේ නායකත්වයට වගකීමට බැඳී සිටීම.
- සභාපාලකවරයා විසින් දී ඇති උපදෙස් තුළ සිටිමින් ඉගැන්වීම්වල නිරත වීම.

- අධ්‍යයනයන්ට, සාකච්ඡාවන්ට, යාච්ඤාවන්ට, ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හා වෙනත් ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට සාමාජිකයන් ධෛර්යවත් කිරීම.

- මනුෂ්‍යයන්ට නිදහසේ තම ප්‍රශ්න බෙදාගත හැකිවන ආකාරයේ ප්‍රේමයේ හා විශ්වාසයේ වාතාවරණයක් ගොඩනැඟීම.

- කණ්ඩායමේ සාමාජිකයන්ගේ නිවෙස්වලට ගොස් ඔවුන් බැහැදැකීම හා සහභාගිත්වය දැරීම.

- කණ්ඩායමේ සාමාජිකයන්ට තම ආත්මික දීමනා හඳුනා ගැනීමට හා කණ්ඩායම තුළ, සභාව තුළ හා සමාජය තුළ ඒවා පාවිච්චි කිරීමට උපකාර කිරීම.

- කණ්ඩායමේ සාමාජිකයන්ගේ ආත්මික වර්ධනයට උපදෙස් දීම හා ධෛර්යවත් කිරීම.

- අසල්වැසි කණ්ඩායම් පිළිබඳ තත්ත්වයේදී ප්‍රදේශයේ අවශ්‍යතා හඳුනාගැනීම, අලුත් අසල්වැසියන් සමඟ සබඳතා ඇති කර ගැනීම, විශේෂ අවශ්‍යතා ඇති අය බැහැදැකීම හා ඔවුන්ට සේවය කිරීම.

- තාවකාලිකව නායකයා වෙනුවෙන් ක්‍රියා කළ හැකි හා ක්‍රමානුකූලව, අවශ්‍යතාව මත කණ්ඩායමේ නායකත්වය දැරිය හැකි සහය නායකයන් පුහුණු කිරීම.

7. සභාව ව්‍යාප්ත කිරීමේදී පහත සඳහන් උදාහරණ ලිපි පාවිච්චි කළ හැකිය :

**නගරයෙන් පිටත අමුත්තන් වෙත වූ ලිපිය**

හිතවත් (පුද්ගලයාගේ නම) :

ඔබ පසුගිය ඉරු දින පැමිණ අප හා නමස්කාර කිරීමෙන් මම මහත් ප්‍රීතියට පත් වුණෙමි. (නගරයේ නම) එහි සේවය කිරීමෙන් ලබන එක් ප්‍රීතියක් නම් විවිධ ප්‍රදේශවලින් පැමිණෙන විවිධ ප්‍රේමණීය පුද්ගලයන් හමුවීමට ඉඩ ලැබීමයි.

අපගේ දේව මෙහෙය අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රසන්න මෙන්ම ඔබටත් ඵලදායී හා ආත්මිකව වැදගත් එකක් වූයේ යැයි මම අවංකව විශ්වාස කරමි.

ඔබ යළිත් මෙම ප්‍රදේශයට පැමිණි විට කරුණාකර මෙහි පැමිණෙන්න. ආත්මික ප්‍රශ්නයක් සම්බන්ධව මා ඔබට උදව් කළ යුතු වේ නම් ඕනෑම මොහොතක මා ඇමතීමට පසුබට නොවන්න.

මෙයට,

විශ්වාසී,

ඔබගේ නම සහ තනතුර

**අදාළ ප්‍රදේශයෙන් පැමිණි වෙනත් සභාවකට සහභාගි වන අයෙකු වෙත යැවීමට ලිපියක් :**

හිතවත් (පුද්ගලයාගේ නම) :

ඔබ පසුගිය දිනක අප හා එක් වීම ප්‍රීතියකි. ඔබට දේව මෙහෙය ඵලදායී එකක් වූ බව සහ ඔබ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අභිමුඛය අත් දකින ලද බව අපි විශ්වාස කරමු.

වෙනත් ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයක් තුළ ඔබ ක්‍රියාකාරීව සිටින බව දැන ගැනීම මට සතුටකි. නමුත් කෙදිනක හෝ මට ඔබට උපකාරයක් කිරීමට හැකියාවක් තිබේනම් මා ඇමතීමට පසුබට නොවන්න.

යළිත් අප හා එක්වීමට පැමිණෙන්න.

මෙයට,
විශ්වාසී,

ඔබගේ නම සහ
ඔබගේ තනතුර

**සභාපාලකවරයාගෙන් ප්‍රදේශයට පැමිණි නව පුද්ගලයන්ට යවන ලිපියක් :**

හිතවත් (පුද්ගලයාගේ නම) :

(නගරයේ නම) වෙත සාදරයෙන් පිළිගනිමු ! ඔබ දන්නා පරිදි නව ස්ථානයකට පදිංචියට ගිය විට, නව මිත්‍රත්වයන් වැදගත් වේ. එම නිසා ඔබ විසින් මා සහ අපගේ සභාව නව මිතුරන් ලෙස සලකනු ඇති නම් මා එය සැබවින්ම භාග්‍යයක් කොට සලකමි !

ඔබට තවමත් සභාවක් නොමැති නම්, මේ සමඟ ඇති පත්‍රිකාවේ සඳහන් අපගේ දේවමෙහෙයන්ට අපි ඔබට ආරාධනා කරමු. (නොඑසේ නම් දේව මෙහෙයන් පිළිබඳ විස්තර ලිපියේම සඳහන් කරන්න.)

ඔබට හෝ ඔබගේ පවුලට ආත්මික උපකාරයක් ලබා දීමට මා හට හැකියාවක් තිබේනම් මා ඇමතීමට පසුබට නොවන්න.

මෙයට,

විශ්වාසී,

ඔබගේ නම සහ
ඔබගේ තනතුර

**සභාවේ සාමාජිකයෙකුගෙන් නගරයට පැමිණෙන නව පුද්ගලයෙකුට යවන ලිපිය :**

හිතවත් (පුද්ගලයාගේ නම) :

මගේ නම (ඔබේ නම ලියන්න). (නගරයේ නම) නගරයට සාදරයෙන් පිළිගනිමු. මෙම ප්‍රදේශයේ සාමාජිකයෙකු වීම මට මෙන්ම ඔබටත් ප්‍රීතියක් වනු ඇතැයි සිතමි.

ඇතැම් විට ඔබට තවමත් සභාවක් හමුවී නැතිවා විය හැකිය. ඉරුදින අප සමඟ (සභාවේ නම, දේව මෙහෙයයන් පවත්වන වේලාවන්, ලිපිනය) දී නමස්කාරයට එක්වන ලෙස ඔබට ආරාධනා කිරීමට කැමැත්තෙමි.

(සභාවේ නම) මෙම ප්‍රදේශය තුළ මා ගත කරන ජීවිතයේ විශේෂ කොටසක් බවට පත් වී ඇත. මිතුරෙකු හා උපදේශකයෙකු ලෙස ඕනෑම මොහොතක පෙනී සිටින දේව සේවකයෙකු හා උණුසුම්, ප්‍රියජනක සහභාගීත්වයක් මාහට හමුවී තිබේ. සමාජීයව මට සභාව තුළින් මිතුරන් රැසක් මුණගැසී ඇත.

මේ සමඟ ඇති පත්‍රිකාව අපගේ සභාව පිළිබඳව වැඩිදුර තොරතුරු සපයයි. කරුණාකර අප හා එක්වන්න. . . . ඔබගේ මිතුරන් වීමට අපි කැමැත්තෙන් සිටිමු.

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් (ඔබගේ නම හෝ ලිපිනය) මා හා සම්බන්ධ වන්න. ඔබව ඉක්මණින් මුණගැසීමට බලාපොරොත්තු වෙමි. !

මෙයට,

විශ්වාසී,

ඔබේ නම

**බැහැදැකීමක් තුළින් සම්බන්ධ කරගත් අනාගතයේදී පැමිණෙනු ඇති බවට බලාපොරොත්තු විය හැකි අයෙකුට යවන ලිපිය :**

හිතවත් (පුද්ගලයාගේ නම) :

පසුගිය දිනක ඔබව හමුවී (ඔබේ සභාවේ නම) හි සේවයට ඔබව හඳුන්වා දීමට ලැබීමේ ප්‍රීතිය අපගේ බැහැදැකීමේ කණ්ඩායමට හිමි විය. ඉතා නුදුරු අනාගතයේදීම ඔබ අප හා එක් වී නමස්කාර කරනු ඇතැයි අපි අවංකවම විශ්වාස කරමු.

(සභාවේ නම) පාලකතුමන් වන මම ඔබේ ආත්මික ජීවිතය පිළිබඳව පෞද්ගලිකව උනන්දු වීම නිසා දෙවියන්වහන්සේ හා සමඟ වඩා ඵලදායි සම්බන්ධතාවක් වර්ධනය කර ගත හැකි වන ලෙස බයිබලය අදාළ කර දීමට මම කැපවී සිටිමි.

මෙම සභාවේ සහභාගීත්වය හා සේවය අපි ඔබටත් ඔබේ පවුල වෙතටත් දිගු කර ඇත්තෙමු. එසේම මම ඔබව ඉක්මණින් හමුවීමට බලාපොරොත්තු වෙමි.
මෙයට,

විශ්වාසී,

ඔබේ නම සහ
ඔබේ තනතුර

# අටවන පරිච්ඡේදය

## දුරස්ථ සේවා තුළින් වර්ධනය වීම

**අරමුණ:**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- “දුරස්ථ සේවා තුළින් වර්ධනය වීම” යන්න නිර්වචනය කිරීමට,
- “සභාවන් පිහිටුවීම” යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට,
- නව ගිවිසුම් සභාව දුරස්ථ සේවා තුළින් වර්ධනය වූ ආකාරය සාරාංශ කිරීමට,
- දුරස්ථ සේවා වර්ධනය තුළින් සභාවන් ගුණනය වන ආකාරය පැහැදිලි කිරීමට,
- නව සභාවක් ආරම්භ කළ හැකි ආකාර හතරක් හඳුනාගැනීමට,
- දුරස්ථ සේවා සභා වර්ග තුනක් හඳුනාගැනීමට
- නව සභාවන් ආරම්භ කළ යුතු ප්‍රදේශ තෝරාගැනීමේදී බයිබලයට අනුව ප්‍රමුඛතා ලයිස්තුගත කිරීමට,
- නව සභාවන් ඇති කරන පණිවුඩය පැහැදිලි කිරීමට, ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

**මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)**

### හැඳින්වීම

යෙරුසලමේ, යුදයේ, සමාරියේ හා පොළොවේ සීමාවන් දක්වා සාක්ෂි දරන ලෙස යේසුස්වහන්සේ ගෝලයන්ට අණ කරන ලදි. (ක්‍රියා 1:8)

පසුගිය පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගත් පරිදි, යෙරුසලමේ සභාව වේගවත් ගුණනය වීමක් අත්දුටුවේය. දෙවියන්වහන්සේගේ සැලැස්මේ මීළඟ පියවර වූයේ දුරස්ථ සේවා තුළින් වන වර්ධනයයි. යෙරුසලමේ සභාව සෙසු යුදෙව් ප්‍රදේශවල නව සභාවන් ආරම්භ කළ යුතු විය.

### දුරස්ථ සේවා තුළින් වර්ධනය වීම

සභාවන් විසින් සමාන සංස්කෘතියක් තුළ තවත් සභාවක් ආරම්භ කළ විට දුරස්ථ සේවා තුළින් වර්ධනය වීම සිදු වේ. ස්වභාවික ලෝකය තුළ දරුවකු දෙමාපියන්ගේ ශාරීරික පැතිරීමක් වන ලෙසම, නව සභාව “මව්” සභාවේ දුරස්ථ සේවාවකි.

“මව්” සභාව ආත්මිකව පරිණත නම්, නව සභාව ඒ හා සමාන පරිණත තත්ත්වයකට වර්ධනය වනු ඇත. “මව්” සභාවේ ප්‍රශ්න තිබේ නම්, නව සභාව තුළ ද සමාන ප්‍රශ්න ඇති වීමේ හැකියාව තිබේ. නව සභා ආරම්භ කිරීමට පෙර සභාවක් ආත්මික පරිණතභාවයේ අභ්‍යන්තර වර්ධනය අත්දැකිය යුතු වන්නේ මේ හේතුවෙනි.

“සභා පිහිටුවීම” යනු දුරස්ථ සේවා තුළින් හා සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනයන් හැඳින්වීමට යොදන තවත් යෙදුමකි. මෙම යෙදුම යොදා ගනුයේ කෙනෙකු සභාවක් පිහිටුවීම ස්වභාවික ලෝකය තුළ ගොවියෙකු බීජයක් සිටුවීම හා වන බැවිනි. සාරවත් පසක, එම බීජය පැමිණි “මව්” ශාකයට සමාන ශාකයක් බීජය විසින් බිහිකරනු ඇත.

“පිහිටුවීම” යන යෙදුම යෝග්‍ය වන්නේ, ප්‍රාදේශීය සංස්කෘතියට නොගැළපෙන සභාවක් “සංවිධානය කිරීම” පමණක් යෝග්‍ය නොවන බැවිනි. සභාවක් “බිහිකර” එය ප්‍රශ්නවලට මුහුණ දෙමින් සිටිමට

ඉඩහැරීම ප්‍රමාණවත් නොවේ. එය "පිහිටුවිය" යුතුය. එහි අදහස නම් ආත්මික ජීවන චක්‍රය තුළ මුල් ඇදගෙන, දිගටම වර්ධනය වීමයි.

## නව ගිවිසුම තුළ දුරස්ථ සේවා සභාවන් පිහිටුවීම

මනුෂ්‍ය ශරීය තුළ වර්ධනය වීම සඳහා සෛල බෙදේ. සෛල දෙකක් බිහිවීම සඳහා එක් සෛලයක් බෙදේ. මෙම සෛල දෙක තවත් සෙලයක් බිහි කිරීමට බෙදේ. මේ ආකාරයට ක්‍රියාවලිය දිගටම සිදුවේ. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය ද ඊට සමාන වේ. ගුණනය වීම සිදු වන්නේ බෙදීමෙනි. බෙදීම යනු වර්ධනය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මේ මූලික පියවරකි.

අප ස්වකැමැත්තෙන්ම බෙදීමෙන් ගුණනය වීම තෝරා නොගතහොත්, එය සිදුවන ලෙස තත්ත්වයන් ඇති වීමට දෙවියන්වහන්සේ ඉඩහරින සේක. යෙරුසෙලමේ ඇදහිලිවන්තයන්ට එරෙහිව නැගී සිටි මහත් පීඩා කිරීමක් පිළිබඳව ක්‍රියා 8 වන පරිච්ඡේදය පැවසේ. මෙම පීඩාව නිසා යෙරුසෙලමේ සභාව බෙදුණි. යෙරුසෙලමෙන් පලා ගොස් වෙනත් නගරවල ජීවත් වීමට ඇදහිලිවන්තයන්ට බල කරනු ලැබීය.

නව ප්‍රදේශ සොයා මෙම පුද්ගලයන් යෙරුසලම හැරයන විට ඔවුහු "ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය." (ක්‍රියා 8:4). නව ඇදහිලිවන්තයන් දිනා ගත් විට, නව සභාවන් පිහිටුවනු ලැබීය. මෙම සභාවන් යෙරුසලමේ "මව්" සභාවේ දුරස්ථ සේවාවන් විය.

නව ගිවිසුම් සභාව සමාන සංස්කෘතීන් තුළ සභාවන් බිහි කිරීම සඳහා පැතිරුණා පමණක් නොව, විවිධ ජන සමාජයක් තුළ සභාවන් ආරම්භ කිරීම සඳහා විවිධ සංස්කෘතීන් සම්බන්ධ කිරීමද ඒ හරහා සිදු විය. මෙම "සම්බන්ධ වීම තුළින් වන වර්ධනය" පිළිබඳව ඊළඟ පරිච්ඡේදයේදී ඔබ විසින් ඉගෙන ගනු ඇත (මෙම පරිච්ඡේදය හා ඊළඟ පරිච්ඡේදය යන දෙකම නව සභාවක් පිහිටුවීම පිළිබඳව සළකා බලන බැවින් ඒ දෙකම එකට සැලකීම යෝග්‍ය වේ).

යෙරුසලමේ සභාවන් යුදයේ, ගලීලයේ, ලිදියේ, ෂාරෝන් හි හා යොප්පාවේ දුරස්ථ සේවා සභාවන් ආරම්භ කරන ලද බව ක්‍රියා පොතෙහි වන වාර්තාවක් එළිදරව් කරයි. මේ සියල්ලක්ම සමාන යුදෙව් සංස්කෘතීන් විය.

පසුගිය පරිච්ඡේදය තුළ ඔබ ඉගෙන ගත් ආකාරයටම, මෙම සෑම සභාවකම දුරස්ථ සේවා වර්ධනයක්ද විය. යෙරුසෙලමේ සභාව හා වර්ධනය නිසා එසේ බිහිවූ සහභාගීත්වයන් සියල්ලද....

> **....ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)**

තනි ඇදහිලිවන්තයන් ආත්මිකව තමන් වැනි අය බිහිකෙරුවා පමණක් නොව, යෙරුසලමේ සභාව ප්‍රදේශය පුරා සාක්ෂි දැරීම ව්‍යාප්ත කිරීමේදී සභාවන් ගණන ද වැඩි විය.

## දුරස්ථ සභාවන් ආරම්භවූ ආකාරය

නව සභාවක් ආරම්භ කරන ආකාර හතරක් තිබේ:

1. එක් සභාවක් තවත් සභාවක් ආරම්භ කිරීම.
2. තවත් සභාවක් ආරම්භ කිරීම සඳහා සභාවන් කිහිපයක් සහයෝගයෙන් ක්‍රියා කරයි.
3. වෙන සභාවන් දෙකක් හෝ කිහිපයක් බිහි කිරීමට විශාල සභාවක් බෙදීම.
4. සභාවක් ආරම්භ කිරීම සඳහා ඇදහිලිවන්තයෙකු යම් ප්‍රදේශයක් වෙත මග පෙන්වනු ලැබීම. ප්‍රේරිතයෙකුගේ ආත්මික දීමනාව ඇති අයෙක් සාමානයෙන් මේ ආකාරයට පාවිච්චි කරනු ලැබේ. මෙම පුද්ගලයා ඇතැම් අවස්ථාවලදී "සභාවන් පිහිටුවන්නා" ලෙස හඳුන්වනු ලැබේ.

මෙම සෑම අවස්ථාවකදීම ගුණනය වීම සිදු වන්නේ ශුභාරංචි පණිවිඩය ව්‍යාප්ත කිරීම තුළින් නව ඇදහිලිවන්තයන් පිරිසක් බිහි කිරීමෙන් වේ.

## දුරස්ථ සේවා සභා වර්ග

නව සභාවන් විවිධ ආකාරයේ දුරස්ථ සේවා සහ වර්ග විය හැකිය:

### 1. විශේෂ ප්‍රජාවකට සේවය කරන සභාවන්:

මේවා විශේෂිත ප්‍රජාවකට, ගම්මානයකට හෝ නගරයකට හෝ යම් ප්‍රදේශයකට සේවය කිරීම සඳහා පිහිටුවා ඇති සභාවන් වේ. මේවා ඇතැම් නිශ්චිත ප්‍රදේශයක් තුළ නව ඇදහිලිවන්තයන් කණ්ඩායමක් බිහිකළ ශුභාරංචි සේවයක ප්‍රතිඵලයක් විය හැකිය. මේවා ශුභාරංචිය ආසා නොමැති හෝ ප්‍රතිචාර දැක්වීමට සූදානම් ප්‍රදේශවල සේවය කිරීම සඳහා පිහිටුවනු ලද සභාවන් විය හැකිය.

### 2. විශේෂිත ජන කණ්ඩායමකට සේවය කරන සභාවන්:

මෙම සහභාගිත්වයන් එකම සංස්කෘතිය, පෙළපත හා භාෂාවන් භුක්තිවිදින විශේෂිත ජන කණ්ඩායමකට සේවය කරන සභාවන් විය හැකිය. උදාහරණයක් ලෙස, ඉංග්‍රීසි භාෂාව කතා කරන "මව්" සභාවේ දේව මෙහෙයන් තේරුම් ගත නොහැකි ස්පාඤ්ඤ භාෂාව කතා කරන පුද්ගලයන් උදෙසා සභාවක් ආරම්භ කළ හැකිය. සරණාගත කඳවුරක සිටින ආසියානුවන් හෝ ඇමරිකාව තුළ සිටින ඉන්දියානුවන් උදෙසා වූ සභාවන් උදාහරණ ලෙස දැක්විය හැකිය.

### 3. විශේෂ පරමාර්ථ සහිත සභාවන්:

විශේෂ පරමාර්ථයක් උදෙසා සභාවන් පිහිටුවිය හැකිය: උදාහරණයක් ලෙස, විශේෂයෙන්ම ශිෂ්‍යයන්ට සේවය කිරීම සඳහා විද්‍යාලයක් සමීපයේ සභාවක් පිහිටුවිය හැකිය.

## දුරස්ථ සේවා සභාවන් බිහි කිරීමේදී ප්‍රමුඛතාවය දිය යුතු කරුණු

ශුභාරංචිය ව්‍යාප්ත කරමින් නව සභාවක් බිහි කිරීමේදී ප්‍රමුඛතාවය දිය යුතු කරුණු කිහිපයක් බයිබලය තුළ දක්වයි.

ඒවා පහත පරිදි වේ.

## ශුභාරංචිය අසා නොමැති පුද්ගලයන් :

මුල්ම ස්ථානය දිය යුත්තේ ශුභාරංචිය අසා නොමැති පුද්ගලයන්ට වේ. පාවුල් මෙසේ ලිවේය.

> **මක්නිසාද: ස්වාමින්වහන්සේගේ නාමයට යාච්ඤාකරන කවුරු නමුත් ගළවනු ලබන්නේය. එසේ නම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යච්ඤාකරන්නේ කොහොමද? තමුන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනාකරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද? (රෝම 10:13-14)**

ශුභාරංචිය පිළිබඳ සාක්ෂි දරන්නෙකු නොමැති ප්‍රදේශ වෙත මුල්ම ස්ථානය දිය යුතුය. ලූක් 15:3-7 හි සඳහන් බැටළුවන් පිළිබඳ උපමාව කියවන්න. ප්‍රමුඛතාවය හිමි වූයේ නැති වූ බැටළුවාටය, දැනටමත් ගාලේ සිටි බැටළුවන්ට නොවේ.

## ප්‍රතිචාර දක්වන්නන්:

ප්‍රතිචාර දක්වන ආත්මික කෙත්වල වැඩ කිරීමේ වැදගත්කම පසුගිය පාඩමේදී ඔබ ඉගෙන ගත්තේය. යේසුස්වහන්සේ එය ඉගැන්වූ අතර (මතෙව් 10:13-15, ලූක් 8:5-15) පාවුල් එය දේශනා කළේය (ක්‍රියා 13:42-51). යේසුස්වහන්සේ හා පාවුල් ප්‍රතිචාර නොදැක්වූ කෙත් ප්‍රතික්ෂේප කළේ නැත. ඔවුහු ඔවුන්ට දිගින් දිගටම ශුභාරංචිය ප්‍රකාශ කළ අතර දෙවියන්වහන්සේගේ විනිශ්චය පිළිබඳව අනතුරු ඇඟවූවෝය. නමුත් ඔවුන් ප්‍රමුඛතාවය දුන්නේ ප්‍රතිචාර දැක්වූ පුද්ගලයන්ටය.

## පළමුව නගර, පසුව ගම්බද ප්‍රදේශ:

මෙය පාවුල් විසින් යොදාගත් උපක්‍රමයක් වන අතර ඊළඟ පරිච්ඡේදයේදී ඔබ මේ පිළිබඳව තවදුරටත් ඉගෙන ගනු ඇත. විශාල ජනගහනයක් සිටින්නේ නගරවලය. ව්‍යාපාර කටයුතු හා

විනෝදය උදෙසා බොහෝ පුද්ගලයන් නගරවලට පැමිණෙති. නගරවල සිටින මහත් සමූහයා වෙත ඔබ ශුභාරංචිය ගෙන ගිය විට, ඔවුහු යළි ගම්බද පළාත් වෙත ගොස් ශුභාරංචිය දේශනා කර නව සභාවන් පිහිටුවනු ඇත.

සම්ප්‍රදායන්, විලාසිතා හෝ නීතින් පිළිබඳ වෙනස්කම් වුවද, එවැනි වෙනස්කම් සාමාන්‍යයෙන් නගරවලින් ආරම්භ කර ඉන් අනතුරුව ගම්බද ප්‍රදේශ වෙත පැතිරී යයි. ඔබ නගරයකට ශුභාරංචිය ගෙන ගිය විට, එය මෙම සමාජයේ පවතින ස්වාභාවික රටාවන් ඔස්සේ ගම්බද ප්‍රදේශ වෙත පැතිර යනු ඇත.

## පණිවුඩය

සභාවන් පිහිටුවන්නෙකුගේ පණිවුඩය පහත ආකාර විය යුතුය:

### බයිබලය මත පදනම් වු පණිවුඩය:

නව සභාවන් බිහිවීම සිදු වන්නේ ගැළවීම නොලත් අය ශුභාරංචිය ඇසීමෙන් හා යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. දේශනා කිරීම බයිබලය මත පදනම් වු විට, ඒ සමඟ දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය ද ගෙන යයි. සවන් දෙන්නන් විසින් දේව වචනයේ බලය හඳුනාගෙන එයට ප්‍රතිචාර දක්වනු ලැබේ.

### ක්‍රිස්තුස්වහන්සේ කේන්ද්‍ර කරගත් පණිවුඩය:

සභාවන් ගුණනය කරන පණිවුඩයේ කේන්ද්‍රය යේසුස්වහන්සේය. මනුෂ්‍යයන් විසින් උන්වහන්සේ කවුරුන්ද. උන්වහන්සේ මෙලොව කළ සේවයේ වැදගත්කම, උන්වහන්සේගේ මරණය හා උත්ථානය පිළිබඳව දැනගත යුතුය. ශුභාරංචියට ප්‍රතිචාර දක්වා ගැළවීම හා සදාකාල ජීවනය ලබා ගන්නා ආකාරය ඔවුන්ට ඉගැන්විය යුතුය.

### අවශ්‍යතා කේන්ද්‍ර කරගත් පණිවුඩය:

පණිවුඩය තම පෞද්ගලික අවශ්‍යතාවයන්ට සරිලන විට පුද්ගලයන් එයට ප්‍රතිචාර දක්වයි. මෙම ක්‍රමය සඳහා හොඳ උදාහරණයක් නම් යේසුස්වහන්සේ හා ළිඳ අසල සිටි කාන්තාවයි (යොහන් 4). උන්වහන්සේගේ පණිවුඩය ස්වාභාවික ජලය උදෙසා වු ඇයගේ අවශ්‍යතාවය කේන්ද්‍ර කරගනු ලැබීය.

### නව සභාවක් බිහි කරන ආකාරය:

හාවස්ට්ටයිම් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පාඨමාලාවන් කිහිපයක් මඟින් සැබවින්ම නව සභාවක් පිහිටුවිය යුතු ආකාරය විස්තරාත්මකව පෙන්නුම් කරයි. ඔබ හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් ඔවුන් විසින් යෝජනා කර ඇති පිළිවෙළට අධ්‍යයනය කරයි නම්, ඔබ දැන් අධ්‍යයනය කරන පාඨමාලාව ගුණනය වීම පිළිබඳ බයිබලීය ප්‍රතිපත්ති පාඨමාලාවට එකතුවන එක් කොටසකි.

මෙම පාඨමාලාවන් තුළ *"බයිබලීය දැක්මක් වර්ධනය කිරීම"*, *"ඉගෙනීමේ උපක්‍රම"*, *"බලය පිළිබඳ මූලධර්ම"* යන පාඨමාලාවන් හා *"ගුණනය වීම පිළිබඳ ක්‍රමවේද"* නැමති මෙම පාඨමාලාව ද ඇතුළත්ය. සෑම පාඨමාලාවක්ම ගුණනය වීම පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලැස්මේ විවිධ කොටස් පැහැදිලි කරයි. ඊට අමතරව පහත සඳහන් පාඨමාලාවන් සභාවක් පිහිටුවීමේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරයි.

සභාව උදෙසා නායකයන් තෝරා ගැනීමේදි හා වර්ධනය කිරීමේදි ***බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති*** ඔබට මඟ පෙන්වනු ඇත.

ශුභාරංචියට ප්‍රතිචාර දක්වන හා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හා සභාවක් පිහිටුවීමට සූදානම් ප්‍රදේශ තිරණය කිරීම සඳහා *පරිසරය පිළිබඳ විශ්ලේෂණය* ඔබට උපකාරී වනු ඇත.

*<u>අරමුණු මඟින් කළමනාකරණය කිරීම</u>* යන පාඨමාලාව ප්‍රදේශීය සහභාගිත්වයේ පරමාර්ථ හඳුනාගන්නා ආකාරය, සැළසුම් සකස් කිරීම හා සභාව සංවිධානය කිරීම පිළිබඳව ඔබට උගන්වනු ඇත.

*<u>සන්නද්ධ කිරීමේ ක්‍රමවේද</u>* යන පාඨමාලාව සාමාජිකයන් පුහුණු කිරීමේදී ඔබට උපකාරී වනු ඇත.

ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ සේවයේ අවසාන ඉලක්කය සභාවක් පිහිටුවීම බව *<u>මුහුන් වැනි ශුභාරංචි සේවය</u>* යන පාඨමාලාව ඉදිරිපත් කරයි.

නිසි පරිදි සභාවක් පිහිටුවීමට හා සංවිධානය කිරීමට ඔබ මෙම පාඨමාලාවන් හැදෑරිය යුතුය. ඒ අතරම, ඔබ වර්ධනය විය යුතු යැයි දෙවියන්වහන්සේ විසින් සිතනු ලබන ස්ථානය කුමක්ද යන්න පිළිබඳව උන්වහන්සේගේ උපදෙස් ඉල්ලා යාච්ඤා කරන්න. ඔබ සභාවක සභා පාලකවරයෙකු නම්, ඔබ ගුණනය විය යුතුදැයි සිත සිතා සිටිය යුතු නැත. ගුණනය වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන බව ඔබ දැනටමත් ඉගෙන ගෙන තිබේ.

ආත්මික අස්වැන්න සම්බන්ධ වේලාව හා ස්ථානය යන්න වැදගත් කරුණු වන බැවින් ඔබ නව සභාව ආරම්භ කළ යුතු ස්ථානය හා වේලාව පිළිබඳව ඔබේ යාච්ඤාවේදී අවධානය යොමු කළ යුතුය. ඔබ නිවැරදි ස්ථානයේ නිවැරදි වේලාවේදී ගුණනය විය යුතුය.

## නව සභාවන් පරිණත විය යුතුය.

ස්වභාවික ලෝකයේ දරුවකු ලෙසම, නව සභාවද තම වර්ධනයේ මුල් අවදියේදී "මව්" සභාව මත රඳා පැවතිය හැකිය. නමුත් නව සභාව පරිණත වන විට, එය ඇදහිලිවන්තයන් සමූහයකින් යුත් වෙන් වූ ක්‍රියාකාරී ව්‍යුහයක් බවට පත් විය යුතු අතර, ආත්මිකව තමන් වැනි අය බිහි කිරීම තුළින් ගුණනය වීමේ හැකියාව ද එයට තිබිය යුතුය. ප්‍රේරිත පාවුල් විසින් බිහි කළ සභාවන්ගේ ආකෘතිය මෙයයි.

බිහිවූ දුරස්ථ සභාව "ව්‍යාප්ත වීම තුළින් සිදු වන වර්ධනය" නැමැති පරිච්ඡේදය තුළ බෙදාගත් ආත්මික ප්‍රතිපත්ති මත පදනම්ව ව්‍යාප්ත විය යුතුය. නිසි පරිදි පරිණත වීමට නම්, සෑම නව සභාවක්ම පහත දේවල් කළ යුතුය:

### 1. එහි පරමාර්ථ හා අරමුණු තේරුම්ගැනීම:

සභාව තුළ ආරම්භ කරන ලද සෑම වැඩසටහනක්ම හෝ සෑම කණ්ඩායමක්ම සභාවේ පරමාර්ථ හා අරමුණුවලට එකඟ විය යුතුය. *"අරමුණු මඟින් කළමනාකරණය කිරීම"* නැමති හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව මෙය විස්තරාත්මකව පැහැදිලි කරයි.

### 2. සංවිධානය වීම පිළිබඳ බයිබලීය ප්‍රතිපත්ති තේරුම්ගැනීම:

ආත්මික දීමනා හා තලෙන්තද නව ඇදහිලිවන්තයන්ව තම දීමනා පාවිච්චි කිරීමේ හැකියාව ඇති ආත්මික නායකයන් ලෙස පුහුණු කිරීම යන දේවල් මේ තුළ අන්තර්ගතය. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති"* සහ *"අරමුණු මඟින් කළමනාකරණය කිරීම"* යන පාඨමාලාවන් මෙහිදී ඔබට උපකාරී වනු ඇත.

### 3. නායකයන් උදෙසා වූ බයිබලීය සුදුසුකම් තේරුම්ගැනීම:

හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති"* නැමති පාඨමාලාව මෙය විස්තරාත්මකව විස්තර කරයි.

### 4. ඇදහිල්ල පිළිබඳව අත්තිවාරම් උගන්වනු ලැබූ වීම:

හාවස්ට්ටයිම් ආයතනයේ *"නියෝජිතයන් වීම්*' යන මොඩියුලය මෙම ඉලක්කය වෙත ළඟා වීම සඳහා ඔබට උපකාරී වනු ඇත.

## 5. ප්‍රායෝගික ප්‍රශ්න විසඳා ගැනීම:

මේ තුළ පහත අංග ඇතුළත් වේ:

- දේව ධර්ම ප්‍රකාශයක් නිර්මාණය කිරීම, එවිට පිටින් පැමිණෙන අයට සභාවේ බයිබලීය විශ්වාසයන් ගැන දැන ගත හැකි වනු ඇත.
- සභාවක් සඳහා ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති නෛතික අවශ්‍යතා.
- සභාව සංවිධානය කිරීම තුළ නායකයන්, නිළධාරීන් හා සභාවේ මූල්‍ය කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය අන්තර්ගත වේ.
- සභාව පිහිටි ස්ථානය හා එහි අයිතිය.
- නව සභාව "මව්" සභාව සමග ඇති සම්බන්ධතාවය.

### ගුණනය වීම දිගටම සිදු වේ

දුරස්ථ වර්ධනය හරහා බිහි වූ සෑම නව සභාවක්ම ගුණනය වීමේ චක්‍රය දිගින් දිගටම කරගෙන යාම දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ. නව සභාව ආත්මික පරිණතභාවය තුළ අභ්‍යන්තර වර්ධනය අත්දැකිය යුතුය. එය සංඛ්‍යාත්මකව ව්‍යාප්ත විය යුතු අතර ඉන්පසු නව සභාවක් ආරම්භ කිරීම සඳහා පැතිරී යා යුතුය.

මෙම බයිබලීය ක්‍රමවේදය තුළින්, සභාව වර්ධනය වීම දිගටම සිදුවනු ඇති අතර එය "ලෝකයේ සීමාවන් වෙත"(ක්‍රියා 1:8) ළඟා වනු ඇත. මෙම ක්‍රියාවලිය නිරූපණය කරන රූප සටහනක් පහත දැක්වේ:

D🡐C🡐B🡐A🡒B🡒C🡒D

A. "මව්" සභාව ("මව්" සභාව A ලෙස දැක්වෙන) නව සභාවන් බිහිකරයි.
B. නව සභාවන් (මෙම රූප සටහන තුළ "B" ලෙස දැක්වෙන) තව දුරස්ථ සභාවන් බිහිකරයි.
C. මෙම දුරස්ථ සභාවන් (මෙම රූප සටහන තුළ "C" ලෙස දැක්වෙන) තවත් දුරස්ථ සභාවන් බිහිකරයි.
D. ක්‍රියාවලිය දිගටම සිදු වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. " දුරස්ථ වර්ධනය වීම" යනු කුමක්ද?

3. "සභා පිහිටුවීම" යන පදයෙන් අදහස් වන්නේ කුමක්ද?

4. යෙරුසලමේ මුල් සභාව දුරස්ථ වර්ධනය සාරාංශ කරන්න.

5. නව සභාවක් ආරම්භ කළ හැකි ආකාර හතරක් හදුනාගන්න.

6. දුරස්ථ සභා වර්ග තුන හදුනාගන්න.

7. නව සභාවක් ආරම්භ කිරීමට ප්‍රදේශයක් තෝරා ගැනීමේදී බයිබලයට අනුව ප්‍රමුඛතාවය දිය යුත්තේ මොනවාට ද?

8. නව සභාවන් බිහි කරන පණිවුඩය කවරාකාරද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා.

නව සභාවක් ආරම්භ කළ යුතු ආකාරය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පහත පාඨමාලාවන් හදාරන්න:

*"බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති"* යන පාඨමාලාව සභාව උදෙසා නායකයන් තෝරා ගැනීමේදී හා වර්ධනය කිරීමේදී ඔබට මග පෙන්වනු ඇත.

*"පරිසරය පිළිබඳ විශ්ලේෂණය"* යන පාඨමාලාව ශුභාරංචියට ප්‍රතිචාර දක්වන හා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හා සභාවන් පිහිටුවීමට සූදානම් ප්‍රදේශ තීරණය කිරීම සඳහා ඔබට උපකාරී වනු ඇත.

*"අරමුණු මගින් කළමනාකරණය කිරීම"* යන පාඨමාලාව ප්‍රාදේශීය සහභාගිත්වයේ පරමාර්ථ හඳුනාගන්නා ආකාරය, සැලසුම් සකස් කිරීම හා සභාවන් සංවිධානය කිරීම පිළිබඳව ඔබට උගන්වනු ඇත.

*"පුහුණු කිරීමේ ක්‍රමවේද"* යන පාඨමාලාව සභාවේ සාමාජිකත්වය ශුභාරංචිය සඳහා පුහුණු කිරීමේදී ඔබට උපකාරී වනු ඇත.

*"මුහුන් වැනි ශුභාරංචිය"* යන පාඨමාලාව සභාවට නව ඇදහිලිවන්තයන් ගොඩනඟනු ඇත.

# නවවන පරිච්ඡේදය

## සම්බන්ධවීම තුළින් වර්ධනය වීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්
- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සභාව "සම්බන්ධවීම තුළින් වර්ධනය වීම" යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- සභාව "සම්බන්ධවීම තුළින් වර්ධනය" වීම සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම පැහැදිලි කරන බයිබල් පද ඉදිරිපත් කිරීමට,
- "සම්බන්ධවීම තුළින් වර්ධනයවීම" සම්බන්ධව නව ගිවිසුමේ සිටින ප්‍රධාන නායකයා හඳුනාගැනීමට
- වෙනත් සංස්කෘතීන් වෙත ශුභාරංචිය ගෙනයාම සඳහා පාවුල් භාවිත කළ ක්‍රමයන් සාරාංශ කිරීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

**...මා කෙරෙහි ඇදහීමෙන් ඔවුන් පව්-කමාව ද පිරිසිදු කරනු ලැබූ අයවලුන් අතරෙහි උරුමයක්ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්නට... (ක්‍රියා 26:17,18)**

### හැඳින්වීම

සභාවක් විසින් සමාන සංස්කෘතියක් තුළ නව සභාවක් පිහිටෙවූ විට දුරස්ථ වර්ධනය සිදුවන ආකාරය පිළිබඳව පසුගිය පරිච්ඡේදයේ අවධානය යොමුවිය. එම පරිච්ඡේදය සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනය පිළිබඳව සාකච්ඡා කරන මෙම පරිච්ඡේදය සමග එක්ව සලකා බැලිය යුතුය.

දුරස්ථ වර්ධනය සඳහා යොදාගන්නා ප්‍රතිපත්තීන් සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනයට ද සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනයේ ප්‍රතිපත්තීන් දුරස්ථ වර්ධනයටද අදාළ වේ. මෙයින් අදහස් වන්නේ පසුගිය පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද සියලුම දේවල් සම්බන්ධ වීම තුළින් සිදු වන වර්ධනයට අදාළ වන බවයි. නමුත් සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනය සඳහා ඇතැම් විශේෂ ක්‍රමයන් ද අවශ්‍ය වන අතර ඒවා මෙම පරිච්ඡේදයට විෂය වේ.

### සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනය

වෙනස් සංස්කෘතියක් තුළ නව සභාවක් පිහිටුවීම සඳහා සභාවක් ජාතික භාෂාමය හෝ ජනවාර්ගික වෙනස්කම් අබිබවා ව්‍යාප්ත වන විට සම්බන්ධ වීම තුළින් ඇති වන වර්ධනය හට ගනී. මෙහිදී "සම්බන්ධවීම" යන වචනය යොදා ගනුයේ මෙම ක්‍රියාවලිය සිදුවන විට එක් සංස්කෘතියක සිට තවත් සංස්කෘතියක් වෙත ශුභාරංචිය ගෙන යාම සඳහා පාලමක් වැනි සම්බන්ධතාවක් ගොඩනැගෙන බැවිනි. නූතන ගමනාගමනය හා සන්නිවේදන ක්‍රමවේදයන්ගේ දියුණුවීමත් සමගම සම්බන්ධවීම තුළින් සිදු වන වර්ධනය සඳහා සභාවකට ඇති හැකියාව වැඩි කර ඇති අතරම ඉතා දුෂ්කර පළාත් වෙත පවා සම්බන්ධවීමට හැකියාව ලැබී ඇත.

### නව ගිවිසුම තුළ සම්බන්ධවීම තුළින් සිදුවූ වර්ධනය

සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනය ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පැවති සැලැස්මේ කොටසක් විය. ගෝලයන් විසින් යෙරුසලමේ වූ තමන්ගේම සංස්කෘතිය තුළ සාක්ෂි දැරීමට පටන් ගෙන ඉන් අනතුරුව සමාන සංස්කෘතියක් ඇති වෙනත් ප්‍රදේශවල සභාවන් පිහිටුවීමට ව්‍යාප්ත විය යුතු විය.

ඉන් අනතුරුව ගෝලයන් විසින් තම සංස්කෘතියට වඩා වෙනස් සංස්කෘතියක් ඇති සමාරිය හා "පොළොවේ සීමාවන් දක්වා" වූ පළාත් වැනි සංස්කෘතීන් වෙත ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ජාතික භාෂාමය හා වාර්ගික සීමාවන් හරහා සම්බන්ධ විය යුතු විය (ක්‍රියා 1:8). තම සංස්කෘතිය තුළ ගුණනය වීම සඳහා වූ ආඥාව ගෝලයන් විසින් ක්ෂණිකව සම්පූර්ණ කරන ලදී (ක්‍රියා 2).

සමාන සංස්කෘතීන් සහිත වෙනත් ප්‍රදේශ වෙත ව්‍යාප්ත වීම සිදුවූයේ පීඩා කිරීමේ ප්‍රතිඵලයක් ලෙසය :

**එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථාන වල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4)**

ක්‍රියා 8 හි සඳහන් සමාරියෙහි සිදුවූ පිබිදීමේදී පිලිප් මුලින්ම සංස්කෘතීන් අතර සබඳතා ඇති කළේය. පේතෘස් හා යොහන් එම ප්‍රදේශයේ සේවය දිගින් දිගටම කරගෙන ගියේය.

අන්තර් සංස්කෘතිකමය වශයෙන් ක්‍රියා කිරීමට දී තිබූ පැවරීම පිළිගැනීමේදී ප්‍රේරිත පේතෘස් වෙත යම් යම් අපහසුතා තිබුණි. ඔහු භක්තිවන්ත යුදෙව්වෙක් වූ අතර අන්‍යජාතීන් (යුදෙව් නොවන ජාතීන්) සමග ඔහුට තිබුණේ සීමිත සම්බන්ධතා ප්‍රමාණයකි. ක්‍රියා 10 හි සඳහන් දර්ශනයකින් දෙවියන්වහන්සේ පේතෘස්ට කතා කළ අතර ඉන් අනතුරුව පේතෘස් කායිසාරියේ සිටි අන්‍යජාතීන් වෙත ශුභාරංචිය ගෙන ගියේය.

නව ගිවිසුමෙහි සම්බන්ධ වීම තුළින් සිදුවූ වර්ධනය හොඳින්ම නිරූපණය වන්නේ ප්‍රේරිත පාවුල්ගේ සේවය තුළිනි. දෙවියන්වහන්සේ පාවුල් මෙම සේවය උදෙසා විශේෂයෙන් කැඳවූ සේක. පාවුල් යුදෙව්වෙක් විය, නමුත් දෙවියන්වහන්සේ ඔහුට කතා කර ඔහු,

> **...මාගේ නාමය අන්‍යජාතීන්ද රජුන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ද ඉදිරියට ගෙනයන්ට මා විසින් තෝරාගන්නා ලද භාජනයක්ය, (ක්‍රියා 9:15)** යි පැවසූ සේක.

අන්තර් සංස්කෘතිකමය සේවය සඳහා දෙවියන්වහන්සේ විසින් පාවුල් කැඳවා තිබූ බැවින් සම්බන්ධ වීම තුළින් සභාවේ සිදුවන වර්ධනය තේරුම් ගැනීමේදී ඔහුගේ ක්‍රමයන් වැදගත් වේ. ක්‍රියා 9 හි සඳහන්ව ඇති පාවුල්ගේ හැරීම පිළිබඳ කතාන්දරය කියවන්න. ලෝකයේ ජාතීන් වෙත ඔහු කළ ශුභාරංචි ප්‍රකාශ කිරීම හා සම්බන්ධ ක්‍රියාවලින් ක්‍රියා පොතෙහි ඉතිරි කොටස පිරී තිබේ. නව ගිවිසුමෙහි ඇති පොත්වලින් බොහොමයක් ඔහු විසින් විවිධ ප්‍රදේශවල (රෝම- හෙබ්‍රෙව්) පිහිටෙවූ සභාවන් ගොඩනැගීම පිණිස ඔහු විසින් ලියන ලද ලිපි වේ.

## ප්‍රේරිත පාවුල්ගේ ක්‍රමයන්

ආකෘතියක් හෝ උදාහරණයක් වශයෙන් දෙවියන්වහන්සේ විසින් පාවුල් තෝරා ගන්නා ලදී.

> **එසේ වී නුමුත් මට කරුණාව ලැබුණේ මේ නිසාය. එනම්, සදාකාල ජීවනය ලැබීම සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට සිටින අයට ආදර්ශයක් කොට උන්වහන්සේ විසින් ප්‍රධාන පව්කාරයාවූ මා කෙරෙහි තමන්වහන්සේගේ මුළු ඉවසිලිවන්තකම දැක්වීම පිණිසය. (1 තිමෝති 1:16)**

සම්බන්ධවීම තුළින් සභාව වර්ධනය වීමේදී පාවුල්ගේ ක්‍රමයන් උදාහරණ ලෙස යොදා ගත හැක්කේ මේ හේතුවෙනි. පාවුල්ගේ සේවය තුළින් එළිදරව් වූ සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනයට අදාළ ප්‍රතිපත්ති කිහිපයක් පහත දැක්වේ.

### නිසි පෙලඹවීමේ හේතූන්:

ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව අන්‍යජාතීන් පත්ව සිටි තත්වය නිසා පාවුල්ව පොලඹවනු ලැබීය ("අන්‍යජාතීන්" යනු ඉශ්‍රායෙල් හැර සෙසු සියලු ජාතීන්ය)

> **එහෙයින් පෙර කාලයේදී මාංසයෙන් අන්‍යජාතිකයන්ව සිටියාවූ, අතින් මාංසයෙහි කරන ලද චර්මඡේදනය ඇත්තන් විසින් අචර්මඡේදිතයෝයයි කියනලද්දාවූ නුඹලා, ඒ කාලයෙහි ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව, ඉශ්‍රායෙල්ගේ නාගරිකත්වයට අන්‍යයන්ව, පොරොන්දුවේ ගිවිසුම්වලට විදේශීන්ව, ලෝකයෙහි බලාපොරොත්තුවක් නැතුව, දෙවියන්වහන්සෙත් නැතුව සිටිය බව සිහිකරපල්ලා. (එපීස 2:11-12)**

ඔහුට බැඳීමක් ඇති බවට වූ හැඟීමකින් ඔහුව පොලොඹවනු ලැබීය:

**මම ග්‍රීක්වරුන් හා මෙල්ච්ජයන්ටත් ඥානවන්තයන් හා අඥානයන්ටත් ණයකාරයෙක්ව සිටිමි. එසේ රෝමයෙහි සිටින්නාවූ නුඹලාටත් මට පුළුවන් ප්‍රමාණයට ශුභාරංචිය දේශනාකරන්ට මම සැදී සිටිමි. (රෝම 1:14-15)**

දෙවියන්වහන්සේ විසින් දෙනු ලැබූ ස්වර්ගික දර්ශනයට කීකරු වීමට වූ ආශාව මගින් පාවුල්ව පොලොඹවනු ලැබීය.

**...මම ස්වර්ගීය දර්ශනයට අකීකරු නොවී, (ක්‍රියා 26:19).**

දෙවියන්වහන්සේ උදෙසා වූ බලවත් උනන්දුව හා බර මගින් ඔහුව පොලොඹවනු ලැබීය.

**පාවුල් අතීනසයේදී ඔවුන්ගේ පම බලා සිටි කල නුවර දේවරූපවලින් පිරී තිබෙන බව දැක ඔහුගේ ආත්මය ඔහු තුළ චංචලවුයේය. (ක්‍රියා 17:16)**

පවිත්‍රවූ ප්‍රේමය නිසා ඔහුව පොලොඹවනු ලැබීය.

**... අවංක ප්‍රේමයෙන්ද... මේ සියල්ලෝ අපි දෙවියන්වහන්සේගේ සේවකයන් මෙන් අපම පිළිගන්වමුව. (2 කොරින්ති 6:4,6)**

## නිසි ප්‍රමුඛතාවන්:

පාවුල්ගේ ප්‍රමුඛතාවන් නිසි පරිදි විය. ඔහුට ලාභව තිබූ දේවල්... අධ්‍යපනය, ද්‍රව්‍යමය ධනය, තත්වය ආදි දේ... ආත්මික ලෝකය තුළ ඔහු පාඩුවක් ලෙස සැළකිය. ක්‍රිස්තුස්වහන්සේගේ කාර්යයට හේතුවන දේවල් පමණක් වටිනා ලෙස සළකනු ලැබීය.

**එසේවී නමුත් මට ලාභව තිබුණු යම් යම් දේම ක්‍රිස්තුස්වහන්සේ නිසා අලාභයයි සිතීමට පැමිණියෙමි. එසේය, මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඇඳිනගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභයයි සලකමි. උන්වහන්සේ නිසා සියලු දේ මට නැතිවී ගියා පමණක් නොව: ඒවා කුණුයයි සලකමි. එසේ කරන්නේ මම ක්‍රිස්තුස්වහන්සේ ලබාගන්නා පිණිසත්, .. (පිලිප්පි 3:7-8)**

ඔබගේ ප්‍රමුඛතාවන් සැම විටම පහත පරිදි විය යුතුය.

1. දෙවියන්වහන්සේට ඔබේ ඇති සම්බන්ධතාවය
2. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට ඔබේ ඇති සම්බන්ධතාවය (ශරීරයේ කොටසක් වන ඔබේ පවුලද ඇතුළත් වේ)
3. දෙවියන්වහන්සේ උදෙසා ඔබේ සේවය.

සම්බන්ධතාවයන් සේවයට පෙර තබා ඇත්තේ හේතු දෙකක් නිසාවෙනි:

1. දෙවියන්වහන්සේ සමග ඔබේ සම්බන්ධතාවය නිවැරදි නොවන විට ඔබට සේවය කළ නොහැකිය.
2. අන් අය සමග ඔබේ සම්බන්ධතාවය නිවැරදි නොවන විට ඔබට සේවය කළ නොහැකිය. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සාමාජිකයන් (ඔබේ පවුල ද ඇතුළත්ව) සමග ඔබේ සම්බන්ධතාවය නිවැරදි නොවන විට ඔවුන් ඔබේ සේවය ද භාර නොගනු ඇත.

## දේව වචනය:

පාවුල්ගේ සේවය දේව වචනය මත පදනම්ව තිබුණි. දේව වචනය වෙනත් සංස්කෘතීන් වෙත ව්‍යාප්ත කරනු ලැබූ විට සභාවන් පිහිටුවනු ලැබීය.

**නුමුත් දෙවියන්වහන්සේගේ වචනය පතළවී දියුණුවිය. (ක්‍රියා 12:24)**

**එපමණ බලගතු ලෙස ස්වාමින්වහන්සේගේ වචනය වර්ධනයවී, බලවත්වුණේය. (ක්‍රියා 19:20)**

**මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)**

## ශුභාරංචි පණිවුඩය:

පාවුල්ගේ පණිවුඩය දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචියයි. ශුභාරංචිය දේශනා කිරීමේ බලය වෙනුවට ඔහු අවශ්‍යතාවන් සහිත ජාතීන් උදෙසා වූ පුණ්‍ය සේවයක් කළේ නැත. සමූහයා ආකර්ෂණය කරගැනීමට ඔහු අවධානය දිනා ගන්නා ක්‍රම පාවිච්චි කළේ නැත. මනුෂ්‍යයන් ඇදගනු ලැබුයේ ශුභාරංචියේ බලය තුළිනි.

**මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන් වහන්සේගේ බලයව තිබෙන නිසාය. (රෝම 1:16)**

## යාච්ඤාව:

අන් සංස්කෘතීන් වෙත ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේදී පාවුල් දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ඉල්ලා යාච්ඤා කළේය.

**ඔවුන් ස්වාමින්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි කීසේක. (ක්‍රියා 13:2-3)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ:

පාවුල්ගේ මිෂනාරි ක්‍රියාකාරකම්වල මඟපෙන්වන්නා වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. උදාහරණයක් ලෙස එක් අවස්ථාවකදී...

**ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ... (ක්‍රියා 16:6)**

සිටියෝය.

## දේශනා කිරීම, ඉගැන්වීම, සාක්ෂි දැරීම:

ශුභාරංචිය දේශනා කිරීම, ඉගැන්වීම හා ඒ පිළිබඳ සාක්ෂිදැරීම උදෙසා වූ මහා ආඥාවේ උපදෙස් පාවුල් අනුගමනය කළේය.

**සතියේ පළමුවෙනිදා අපි රොටි කඩන්නට රැස්වූ කල, පාවුල්... ඔවුන්ට අනුශාසනා කළේය... (ක්‍රියා 20:7)**

**ප්‍රයෝජනවත්වූ කිසි දෙයක් ප්‍රකාශ කිරීමෙන් නොවැළකී, ප්‍රසිද්ධයෙන්ද ගෙයින් ගෙට ද නුඹලාට උගන්වමින්, දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ගැන යුදෙව්වරුන්ට හා ග්‍රීක්වරුන්ට සාක්ෂිදුනිමි. (ක්‍රියා 20:20-21)**

ශුභාරංචිය ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. අසන්නන් විසින් තේරුම් ගනු ලබන ආකාරයකට පණිවුය ප්‍රකාශ කළ යුතුය. ශුභාරංචිය තේරුම්ගනු ලැබීම සඳහා දේශනා කරන්නාගේ පද මාලාව, භාෂාව හා විලාසය සකස් විය යුතුය. පාවුල් මෙය හඳුනාගෙන ක්‍රියාවට නැංවිය (ක්‍රියා 21:37-40 හා 22:2 බලන්න). වෙනත් සංස්කෘතින්ට අයත් පුද්ගලයන්ට ශුභාරංචිය පැවසීමේදී යොදාගත හැකි ක්‍රම වේදයක් ක්‍රියා 26:18 හි දක්වයි.

> **...මා කෙරෙහි ඇදහීමෙන් ඔවුන් පව්-කමාව ද පිරිසිදු කරනු ලැබූ අයවලුන් අතරෙහි උරුමයක්ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්නට... (ක්‍රියා 26:17,18)**

දෙවියන්වහන්සේ පාවුල්ව යැවූ සේක.

පහත කරුණු ඉටුවන ආකාරයට ශුභාරංචිය ඉදිරිපත් කළ යුතුය.

1. මනුෂ්‍යයාගේ ඇස් අරින ලෙස
2. ඔවුන් ආත්මික අන්ධකාරයෙන් ආලෝකය වෙත හැරෙන ලෙස
3. ඔවුන් සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙත හැරෙන ලෙස
4. ගැළවීම තුළින් ඔවුන් පව් කමාව ලබන ලෙස
5. ඇදහිල්ල තුළින් පවිත්‍රකරනු ලැබීමෙන් ඔවුන් ආත්මික උරුමයක් ලබා ගන්නා ලෙස

මනුෂ්‍යයෙකු ගොඩනැගෙන සංස්කෘතිය විසින් ඔහු පිළිබඳ කරුණු පහක් තීරණය කරනු ලබයි:

ඔහුගේ භාෂාව: ඔහු පණිවුඩ හා අදහස් ඉදිරිපත් කරන හා ලබාගන්නා ආකාරය
ඔහු ලෝකය දෙස බලන දෘෂ්ටිය: ඔහු ලෝකය දෙස බලන හා එය තේරුම් ගන්නා ආකාරය
ඔහුගේ විශ්වාසයන්: ආගම, අධිස්වභාවික දේවල් කෙරෙහි ඇති විශ්වාසයන්, සිතන ආකාරය, සිතුවිලි ක්‍රියාවලියන්
ඔහුගේ අගයන්: සදාචාරමය, ද්‍රව්‍යමය හා සමාජීය අගයන්, පොලොඹවනු ලබන දේවල්, තීරණ ගන්නා ආකාරයන්
ඔහුගේ හැසිරීම : ඔහු ක්‍රියා කරන, හැසිරෙන ආකාරය, සාමාජිය වශයෙන් හා සංස්කෘතිකමය වශයෙන් පිළිගත හැකි හැසිරීම.

ක්‍රියා 26:18 මේ එක එකක් පිළිබඳව සාකච්ඡා කරයි.

| | |
|---|---|
| ඔවුන්ගේ ඇස් විවර කරයි ⟶ (1-2 පද) | භාෂාව: ඵලදායි ලෙස සන්නිවේදනය කරන ලද පණිවුඩය තේරුම් ගනු හා ග්‍රහණය කරගන්නා ලදී. ලෝකය දෙස බලන දෘෂ්ටිය: බයිබලයට අනුව ලෝකය දෙස බලන ආකාරය කියා දෙනු ලැබීය. |
| | විශ්වාසයන්: ඇදහිල්ලේ පණිවුඩය, දේවරාජ්‍යයේ ශුභාරංචිය, ඔවුන්ගේ විශ්වාසයයන් වෙනස් කළේය. |
| | ඔවුන්ගේ වටිනාකම් වෙනස් විය. |
| ඔව්හු හැරී ලබාගනු ඇත. ⟶ (4-5 පද) | හැසිරීමේ ඇතිවූ වෙනස්කම් |

## බලය ප්‍රදර්ශනය කිරීම:

පාවුල් ශුභාරංචිය ප්‍රකාශ කළා පමණක් නොව දෙවියන්වහන්සේගේ බලය තුළින් ඔහු එය ප්‍රදර්ශනය ද කළේය.

> **ක්‍රිස්තුස්වහන්සේ විසින් මා කරණකොටගෙන කරවන ලද කාරණා ගැන මිස, අන් කිසිවක් ගැන කථාකරන්ට සිතටවත් නොගතිමි. එසේම යෙරුසලම පටන් ඉල්ලූරිකය දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනාකෙළෙමි. (රෝම 15:19)**

## සභාවන් රෝපණය කිරීම:

පාවුල් හුදෙක් ශුභාරංචිය දේශනා කර නව ඇදහිලිවන්තයන් අතහැර දැමුවේ නැත. නව ඇදහිලිවන්තයන්ට සම්බන්ධ විය හැකි ඇදහිලිවන්තයන් කණ්ඩායමක් ඔහු විසින් නිර්මාණය කරන ලදී. ඔහු ප්‍රාදේශීය සභාවන් ආරම්භ කළේය.

ප්‍රාදේශීය වශයෙන් ඇදහිලිවන්තයන් එකතු නොකරමින් ශුභාරංචිය දේශනා කිරීම, දරුවන් ලෝකයට බිහිකර ඉන් අනතුරුව ඔවුන් රැකබලා ගැනීමේ වගකීමෙන් බැහැර වීම හා සමානය. පාවුල් විසින් ශුභාරංචිය රෝපණය කළ සෑම නගරයකදීම ඔහු විසින් අනුගමනය කළ චක්‍රය පහත දැක්වේ.

1. සේවකයන්ට කාර්යය පැවරීම: ක්‍රියා 13:1-4; 15:39-40

නිශ්චිත ප්‍රදේශයක් වෙත ළඟා වීමට සේවකයන් පුහුණු කර ඔවුන්ට ඒ කාර්යය පවරන ලදී. මව් සභාවේ ඇදහිලිවන්තයන් විසින් දෙවියන්වහන්සේ මෙම කාර්යයට වෙන් කරන ලද අයට සූදානම් වීමට උපකාර කිරීම, ඔවුන් පිටත් කර හැරීම, සහයෝගය දැක්වීම හා ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සිදු කරන ලදී.

2. පුද්ගලයන් සම්බන්ධ කරගැනීම : ක්‍රියා 13:14-16; 14:1; 16:13-15

බොහෝ ප්‍රදේශවලදී ඒ වන විටත් තිබුණු සිනගෝගවල නායකයන් සමග පාවුල් ආචාරශීලී සම්බන්ධතාවක් ඇති කර ගත්තේය. හැකිතාක් ප්‍රාදේශීය නායකයන් විසින් තේරුම්ගනු ලැබීමට හා ඔවුන්ගේ සහයෝගය ලබාගැනීමට ඔහු උත්සාහ කළේය. කණ්ඩායම් හා තනි පුද්ගලයන් සමග සම්බන්ධතා පැවැත්වීම පසුපස වූයේ ශුභාරංචි පණිවුඩය ඇසීම සඳහා හැකිතාක් විශාල පිරිසක් ඇතිකර ගැනීමේ අරමුණයි.

3. ශුභාරංචිය ප්‍රකාශ කිරීම: ක්‍රියා 13:17; 16:31

දේශනා කිරීම, ඉගැන්වීම, සාක්ෂි දැරීම හා බලය ප්‍රදර්ශනය කිරීම තුළින් ශුභාරංචි පණිවුඩය ප්‍රකාශ කරන ලදී. ඵලදායි ලෙස ශුභාරංචිය දේශනා කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි විවිධ ක්‍රම යොදා ගන්නා ලදී. ඇතැම් නගරවලදී යොදාගත් ක්‍රමය වූයේ සිනගෝගවලදී ශුභාරංචිය දේශනා කිරීමයි (ක්‍රියා 14:1). වෙනත් නගරවලදී ශුභාරංචිය පිළිගැනීමට සූදානම් පුද්ගලයන් විශේෂ කණ්ඩායම්වලට වෙන් කරන ලදී (ක්‍රියා 19:9). ඇතැම් ප්‍රදේශවලදී තනි පුද්ගල කණ්ඩායම්වලට විශේෂයෙන් සේවය කරන ලදී (ක්‍රියා 13:42) එසේම ශුභාරංචි පණිවුඩය නිසි පරිදි සන්නිවේදනය වන බව තහවුරු කිරීම සඳහා ක්‍රමයන් මෙන්ම භාෂාව ද සුදුසු ලෙස සකසා ගන්නා ලදී (ක්‍රියා 22:2).

4. අසන්නන් ඇදහිල්ලට හැරීම: ක්‍රියා 13:48; 16:14-15

ඵලදායි ලෙස ශුභාරංචිය දේශනාකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මනුෂ්‍යයන් ගැළවීමේ පණිවුඩය පිළිගෙන පව් ගැන පසුතැවිලි වී හැරීම සිදු විය.

5. ඇදහිලිවන්තයන් රැස්කිරීම : ක්‍රියා 13:43

ශුභාරංචිය ප්‍රකාශ කිරීමෙන් හා මිනිසුන් දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් පමණක් පාවුල් නතර වූයේ නැත. ඔහු ඇදහිලිවන්තයන්ව ප්‍රාදේශීය සභාවක් ලෙස එක්රැස් කළේය. නව ඇදහිලිවන්තයන්ව ක්ෂණිකව එම සහභාගිත්වයට හා ප්‍රාදේශීය සභාවේ වත් පිළිවෙත්වලට හඳුන්වා දෙනු ලැබීය. නව සභාවට එකට රැස්වීමට වේලාවන් හා ස්ථානයන් පිළියෙල කරන ලදී.

6. ඇදහිල්ල ස්ථිර කරන ලදී: ක්‍රියා 14:21,22; 15:41

මහා ආඥාව (මතෙව් 28:19-20) තුළින් දක්වා ඇති ආකාරයට ඇදහිල්ලට හැරුණු අයට ඉන් අනතුරුව ඉගැන්වීම් කරන ලදී. ප්‍රාදේශීය සභාව නැමති සන්දර්භය තුළ සිදු කරන ලද මෙම ඉගැන්වීම් හරහා නව ඇදහිලිවන්තයන් කිතුනු ඇදහිල්ලේ මූලික ප්‍රතිපත්ති හා දෙවියන්වහන්සේගේ රාජ්‍ය තුළ ජීවත් විය යුතු ආකාරය ඉගෙන ගැනීමත් සමග ඔවුන්ව ස්ථිර

කිරීමක් සිදුවිය. “ඇදහිල්ල ස්ථිර කිරීම” හරහා ඇදහිලිවන්තයන්ට තම ආත්මික දිමනා සොයා ගැනීමට හා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ක්‍රියාකාරී සාමාජිකයන් වීමට උපකාර කිරීම නිසා එය ආත්මික පරිණත භාවයට ඉඩ සැලසීමක් විය.

7. නායකයන් කැපකරන ලදී: ක්‍රියා 14:23

ඇදහිලිවන්තයන් පරිණත වන විට සභාවේ නායකත්වය දැරීමට සුදුසුකම් ලත් ප්‍රාදේශීය නායකයන් දෙවියන්වහන්සේ විසින් නැගිටුවන ලදී. වැඩිහිටියන් (නායකයන්) ප්‍රාදේශීය සෙනඟ තුළින්ම තෝරා ගනු ලැබූ අතර වෙනත් සභාවන්ගෙන් හා රටවල්වලින් ගෙන්වා ගනු නොලැබීය. සෑම සභාවක්ම බයිබලීය, ක්‍රියාශීලී හා ඵලදායි සංවිධානයක් ගොඩනැගිය.

8. සභාව භාර දෙන ලදී: ක්‍රියා 14:23;16:40

නායකයන් තෝරා ගනු ලැබ, ඔවුන් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන විට සභාව “පිහිටෙවූ අය” මත යැපීම අවසන් වේ. සභාව බිහි කළ පුද්ගලයාගෙන් නව ප්‍රාදේශීය නායකයන් වෙත ක්‍රමවත් හුවමාරුවක් සිදු වේ. සභාව ක්‍රියාකාරී ප්‍රාදේශීය ඇදහිලිවන්තයන් සමූහයක් ලෙස ස්වාමින්වහන්සේට භාර දෙන ලදී.

9. සම්බන්ධතාවන් දිගටම පවත්වන ලදී: ක්‍රියා 15:36;18:23

නව සහභාගිත්වය හා සභාව පිහිටෙවූ තැනැත්තා (පාවුල්) හා මව් සභාව (යෙරුසලම) අතර වූ සම්බන්ධතාවන් දිගටම පවත්වන ලදී. තවදුරටත් ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා නව සභාව හා කලාපයේ සෙසු සභාවන් අතර ද සම්බන්ධතා ඇතිකර ගන්නා ලදී.

## ලෝකය පුරා විහිදුනු දර්ශනය

පාවුල්ට ලෝකය සඳහා නිශ්චිත උපක්‍රමයක් වීම. එම කාලයේ පැවති සියලු කලාප වන ආසියාව, ගලාතිය, මකිදෝනිය, අකාය හා ස්පාඤ්ඤය යන ප්‍රදේශ කෙරෙහි ඔහු තුළ වූ සැලකිල්ල බයිබල් වාර්තා තුළින් එළිදරව් වේ.

පාවුල් සභාවන් පිහිටෙවූ ස්ථාන රෝම පරිපාලනයේ ග්‍රීක ශිෂ්ඨාචාරයේ, යුදෙව් බලපෑමට යටත් හෝ වාණිජ වැදගත්කමක් සහිත මධ්‍යස්ථාන විය.

පාවුල් විසින් සභාවන් රෝපණය කළ පහත ස්ථාන අධ්‍යයනය කරන්න.

පිලිප්පිය : (ක්‍රියා 16) මෙය මකිදෝනියේ ප්‍රධාන නගරය විය.

තෙසලෝනිකය : (ක්‍රියා 17:1-10) මෙය විශාල බලපෑමක් කළ හැකි ආකාරයේ වාණිජ නගරයක් විය.

කොරින්තිය: (ක්‍රියා 18:1-11) ග්‍රීසියේ වාණිජ අග නගරයක් විය.

එපීසිය: (ක්‍රියා 19:1-10) රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන මහ මාර්ග රෝමයේ සිට පෙර දිගට විහිදුනු ස්ථානයයි. උපක්‍රමශීලී ලෙස වැදගත් වරායක් හා වෙළඳ මධ්‍යස්ථානයකි.

ජනාකීර්ණ නගරවලදී තමන්ට විශාල ජනකායක් හමුවිය හැකි බව පාවුල් දැන සිටියේය. වෙනසක් සිදුවන විට එය සාමාන්‍යයෙන් නගරයෙන් පටන් ගෙන ඉන් අනතුරුව දුෂ්කර පළාත් වෙත ව්‍යාප්ත වන බවද ඔහු දැන සිටියේය.

ව්‍යාපාර කටයුතු සඳහා විනෝදය සඳහා බොහෝ රටවලින් පැමිණි ජනතාව මෙම ප්‍රසිද්ධ වෙළඳ හා සංචාරක මධ්‍යස්ථානවල සිටියහ. මෙම නගර මිනිසුන් විසින් සාමාන්‍යයෙන් පසුකරගෙන යන ගමන් මාර්ගවල පිහිටා තිබුණි. මෙම අමුත්තන් වෙත ශුභාරංචි පණිවුඩය ගෙනගිය විට ඔවුන් නිවස් බලා යන විට එම පණිවුඩයද ඔවුන් සමග ගෙන යනු ඇත.

මෙලෙස පිහිටුවන ලද මධ්‍යස්ථානවලින් පාවුල් තම සේවය පුළුල් කළේය. පාවුල් යෙරුසලම හැරගිය විට ඔහු පළමුව තාර්සස් හා අන්තියෝකියේ ද (ක්‍රියා 11:25-30; 13:1-3) සේවය කරමින්

සුළු ආසියාව වෙතට ද ඉන් අනතුරුව එපිසිය තම මධ්‍යස්ථානය කර ගනිමින් (ක්‍රියා 19:1-20:16:8) බටහිර සුළු ආසියාව වෙතට ද තම අවධානය යොමු කළේය. ඉන් පසුව පාවුල් රෝමය මධ්‍යස්ථානය කරගනිමින් හා දුරස්ථම ස්ථානය ලෙස ස්පාඤ්ඤය වෙත ළඟා වෙමින් බටහිරට ගමන් කළේය (ක්‍රියා 19:21; 23:11; 28:14-31; රෝම 1:9-15; 15:24,28).

## පිළිගැනීමට සූදානම් ප්‍රදේශ:

සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම උදෙසා වූ පාවුල්ගේ උපක්‍රමයට මනුෂ්‍යයන් විසින් ශුභාරංචිය පිළිගැනීම බලපෑවේය. මතෙව් 10 දී සමාරිතයන් හෝ අන්‍යජාතීන් වෙත නොගොස් ඉශ්‍රායෙලය වෙත යන ලෙස යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූ සේක. එම කාලය ඉශ්‍රායෙලය සඳහා නිවැරදි කාලය විය. අනෙකුත් කණ්ඩායම් පසුව ශුභාරංචිය පිළිගනු ඇත.

යුදෙව්වන් අතර පවා ගෝලයන් සේවය කළ යුතු වූයේ පිළිගන්නා අයටයි. යහපත් ප්‍රතිචාර ලැබුණු ස්ථානවල නැවති ශුභාරංචිය බෙදා ගැනීම ඔවුන් විසින් කළ යුතු වූ අතර පිළිනොගන්නා පුද්ගලයන් හමුවූ විට ඔවුන් අතහැර යා යුතු විය. ප්‍රබල ලෙස පිළිගන්නා ප්‍රදේශ වෙත ඔවුන් තම පරිශ්‍රමය යොමු කළ යුතු විය.

පාවුල් ද මෙම උපක්‍රමය අනුගමනය කළේය. යුදෙව්වන් ශුභාරංචිය ප්‍රතික්ෂේප කළවිට පාවුල් අන්‍යජාතීන් වෙතට හැරුණේය (ක්‍රියා 13:42-51). ඇතැන්ස් නගරය සූදානම් නැති විට පාවුල් කොරින්තියට ගියේය. කොරින්තියේදී පාවුල් යුදෙව්වන් වෙතින් අන්‍යජාතීන් වෙතට හැරුණේය. ශුභාරංචිය පිළිගැනීමට සූදානම් ග්‍රීකයන් ප්‍රීති වුණු අතර බොහෝ දෙනා අදහාගනු ලැබ හා බෞතිස්ම කරනු ලැබිය (ක්‍රියා 18:5-11). කොරින්තිය තුළ රැඳී සිටිමින් නොබියව ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ප්‍රකාශ කරන ලෙස වූ දර්ශනයකින් ස්වාමින්වහන්සේ පාවුල්ගේ ක්‍රියාවන් අනුමත කළ සේක (ක්‍රියා 18:5-11). සිනගෝගය තුළ සිටි සෙනඟ ඔහුව ප්‍රතික්ෂේප කළ විට පිළිගැනීමට කැමති අයගෙන් සමන්විත සමූහයක් පාවුල් විසින් සකස් කර ගත්තේය. පීඩා කිරීම් නිසා ඔහුව පිටතට ඇද දමනු ලැබූ විට ඔහු වෙනත් නගරයකට ගියේය.

### ඔහුගේම සෙනඟ:

තමන්ගේම සෙනඟ වෙත ශුභාරංචිය ගෙනයාම කෙරෙහි පාවුල් සැලකිලිමත් වූයේය.

> **සහෝදරයෙනි, ඔවුන් උදෙසා මාගේ සිතේ ආශාවත් දෙවියන්වහන්සේට කරන කන්නලව්වත් නම් ඔවුන් ගැළවෙන පිණිසය. (රෝම 10:1)**

### ශුභාරංචිය නොඇසූ සෙනඟ:

ක්‍රිස්තුස්වහන්සේ ගැන ඒ වන තුරුත් දේශනා කර නොතිබූ ප්‍රදේශ වෙත පාවුල් අවධානය යොමු කළේය.

> **එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩනොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන් කරනු ලැබූ තැන්වල නොව: උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය. උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම්ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනා කරන්නට අභිප්‍රාය කෙළෙමි. (රෝම 15:20-21)**

### ජන කණ්ඩායම්:

නගරයක් හෝ කලාපයක් තුළ සිටි විවිධ “ජන කණ්ඩායම්” සමග පාවුල් වැඩ කළේය. උදාහරණයක් ලෙස අන්තියෝකියේදී ඔහු ග්‍රීකයන් හා යුදෙව්වන් යන ජන කණ්ඩායම් දෙකටම සේවය කළේය (ක්‍රියා 13:42). ජන කණ්ඩායමක් යනු ගෝත්‍රයක්, කුලයක් හෝ සමාන සංස්කෘතික, භාෂාමය හා ජනවාර්ගික පසුබිමක් සහිත ඕනෑම කණ්ඩායමකි. නගරයක් හෝ කලාපයක් දෙස එවැනි කණ්ඩායම් ආකාරයෙන් බලා ඒ අනුව සම්බන්ධ වීම තුළින් සිදුවන වර්ධනය පිළිබඳ සැළසුම් ඇති කිරීම වැදගත් වේ.

උදාහරණයක් ලෙස එක්සත් ජනපදයේ එක් නගරයක් තුළ ස්පාඤ්ඤ භාෂාව කතා කරන, ඉංග්‍රීසි භාෂාව කතා කරන හා චීන මැන්ඩරින් භාෂාව කතා කරන ජන සමූහයන් විශාල සංඛ්‍යාවක් සිටී.

මෙම නගරවල සභාවන් රෝපණය කරමින් සම්බන්ධ වීම තුළින් වර්ධනය වීමේදී මෙම විශේෂිත ජන කණ්ඩායම් ඉලක්ක කළ යුතු වේ. මෙම නගරය තුළ ටැගලොග් භාෂාව කතා කරන සභාවක් රෝපණය කිරීමෙන් වාසියක් අත් නොවේ. නගරය තුළ ටැගලොග් භාෂාව කතා කරන පුද්ගලයන් නැත. වෙනත් සංස්කෘතීන් හා සම්බන්ධ වීම හරහා වර්ධනය වීමේදී සමස්ථයක් ලෙස නගරය පිළිබඳව පමණක් නොව නිශ්චිත ප්‍රදේශයක් තුළ සිටින ජන කණ්ඩායම් කෙරෙහි හැමවිටම අවධානය යොමු කළ යුත්තේ මේ හේතුවෙනි.

නිශ්චිත ජන කණ්ඩායම් තුළ සභාවන් පිහිටුවීම ශුභාරංචිය වඩාත් වේගයෙන්ම ව්‍යාප්ත වීමට හේතුවේ. ජන කණ්ඩායමක සාමාජිකයන් සියලු දෙනා එකම භාෂාව කතා කරන අතර එකම සිරිත් විරිත් ඇත. ශුභාරංචියේ ව්‍යාප්තියට බාධා කිරීමට භාෂාමය හෝ සංස්කෘතිකමය බාධාවන් කිසිවක් නොමැත. සමාජයේ පවතින සම්බන්ධතාවන් හරහා එනම් එකිනෙකාට සම්බන්ධ පුද්ගලයන්, එකම භාෂාව කතාකරන හා එකම සිරිත් විරිත් පිළිපදින පුද්ගලයන් හරහා ශුභාරංචිය ඉතාම වේගයෙන් ව්‍යාප්ත වන බව, පසුගිය පරිච්ඡේදයකදී ඔබ ඉගෙන ගත්තේය.

“අප වැනි” පුද්ගලයන් පවා ශුභාරංචියේ අරමුණු උදෙසා කුඩා ඒකකවලට බෙදිය හැකිය. උදාහරණයක් ලෙස වයස් මට්ටම් අනුව ඔබ ඉරුදින පාසලේ පංති සකස් කරන විට මෙය සිදුකරයි. විවිධ පුද්ගල කණ්ඩායම් වෙත ළඟා වීම ඔබ සැළසුම් කරන විට ඔබ මෙම සංකල්පයම තවදුරටත් දීර්ඝ කරයි.

සේවය ආරම්භ කිරීමට පෙර ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීමේදී ඔබට උපකාරී වීමට හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය විසින් *“පරිසර විශ්ලේෂණය ”* නමින් පාඨමාලාවක් ඉදිරිපත් කරයි. සභාවන් රෝපණය කිරීමේදී උපකාරයක් වනු පිණිස මෙම පාඨමාලාව හදාරන ලෙස අපි ඔබට යෝජනා කරමු.

පහත සඳහන් ආකාරයේ අංශ කෙරෙහි පාඨමාලාව ඔබට උපකාර වනු ඇත.

1. ළඟා විය යුතු පුද්ගලයන් හඳුනාගැනීමට. නගරය හෝ කලාපය සමන්විත වන්නේ කවර වෙනස් ජන කණ්ඩායම්වලින්ද? ඔබ ළඟා වීමට සැළසුම් කරන්නේ කා වෙතද? ඔවුන්ගේ ආගමික, සංස්කෘතික, ජනවාර්ගික හා භාෂාමය පසුබිම කුමක්ද?

2. ඔවුන්ගේ ආත්මික අවශ්‍යතා හඳුනාගැනීමට උපකාරී වේ. උදාහරණයක් ලෙස නිශ්චිත නගරයක ස්පාඤ්ඤ භාෂාව කතා කරන අය අතර සභාවක අවශ්‍යතාව තිබේද? ඇතැම් විට ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටු වී තිබිය හැකි නමුත් එම ප්‍රදේශයේ සිටින ප්‍රංශ භාෂාව කතා කරන පුද්ගලයන්ගේ ආත්මික අවශ්‍යතා නොසලකා හැර තිබිය හැකිය.

3. ශුභාරංචිය පිළිගැනීමට ඇති සූදානම නිර්ණය කිරීමට.

4. මෙම පුද්ගලයන් වෙත ළඟාවීමට ඔබ පාවිච්චි කරන ක්‍රම නිර්ණය කිරීමට. ඔවුන්ට ළඟාවිය හැකි හොඳම ආකාරය කුමක්ද? තේරුම්ගනු ලැබිය හැකි හා සංස්කෘතිකමය වශයෙන් පිළිගනු ලැබිය හැකි ආකාරයකින් ඔබ මිනිසුන් වෙත ළඟා විය යුතුය. උදාහරණයක් ලෙස යම් නිශ්චිත කණ්ඩායමකට කියවීමේ හැකියාව නැතිනම් ඔවුන් වෙත ළඟා වීමේදී ලිඛිත මාධ්‍යයෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම සුදුසු ක්‍රමයක් නොවේ.

## වෙනත් සංස්කෘතීන් අනුව හැඩගැසීමට ඇති කැමැත්ත:

විවිධ සංස්කෘතීන්ට හා සමාජයේ විවිධ මට්ටම්වලට අයත් පුද්ගලයන්ට අනුව හැඩගැසීමට පාවුල් කැමැත්තෙන් සිටියේය (1 කොරින්ති 9:16-23).

තමන් හැදුණු වැඩුණු සංස්කෘතිය පුද්ගලයන් මත විශාල බලපෑමක් ඇති කරයි. A සංස්කෘතිය තුළ සිටින පුද්ගලයන් B සංස්කෘතිය තුළ සිටින පුද්ගලයන්ගෙන් වෙනස් වේ.

| A සංස්කෘතිය | B සංස්කෘතිය |
|---|---|
| මව් සංස්කෘතිය | නව සංස්කෘතිය |

ශුභාරංචිය සමග ඔබ ඔබේ සංස්කෘතිය අතහැර වෙනත් සංස්කෘතියකට ඇතුළු වූ විට ඔබ වෙනස්ය. ඔබ එයට සරිලන අයෙක් නොවිය හැකිය.

ඔබ

නමුත් ඔබට ඒ සඳහා හැඩගැසිය හැකිය. පාවුල් මෙන් ස්වාමින්වහන්සේගේ උපකාරය ඇතිව එයට සරිලන අයෙකු වීමට ඔබට ඉගෙන ගත හැකිය. තෝරාගැනීම ඔබ අතේය. ශුභාරංචිය උදෙසා ඔබ ඔබේ සංස්කෘතික රටාවන් වෙනස්කර ගන්නවාද?

?

## සංස්කෘතික වෙනස්කම් :

පාවුල් අනෙකුත් සංස්කෘතීන්ට අනුව හැඩගැසීමට කැමැත්තෙන් සිටියා පමණක් නොව සංස්කෘතික වෙනස්කම්වලට ශුභාරංචියට බාධා කිරීමට ද ඔහු ඉඩ නොදුන්නේය.

බටහිර රටවලදී ඇදහිල්ලට හැරීම නිසා නව ඇදහිලිවන්තයෙකුට තමන්ගේම පවුල අතහැර දැමීමට සිදුවුවහොත් ඔහු සභාවේ සිටින තමන් වැනිම අයත් සමග එකතු වේ. ඔවුන් එකම භාෂාව කතා කරන අතර එකම සංස්කෘතියක් ඔවුන්ට තිබේ. නමුත් ක්‍රිස්තුධර්මය යනු කෙනෙකුගේ වංශය අතහැර වෙනත් කණ්ඩායමකට එකතු වීමක් ලෙස දකින වෙනත් ජාතීන්වල ශුභාරංචිය ව්‍යාප්ත වන්නේ සෙමිනි. ඇතැම් සංස්කෘතීන් ස්වභාවය අතින් බටහිර රටවලට වඩා අන්තර් සබඳතා සහිත ප්‍රජාවන් වේ. ගෝත්‍රය, කුලය, වංශය හා කණ්ඩායම ඉතා වැදගත් වේ.

නව ගිවිසුම් කාලයේදී මනුෂ්‍යයෙකු කිතුනුවෙකු වූ විට ඔහු යුදෙව් සිරිත්වලින් ඈත් විය යුතු යැයි ඉන් අදහස් නොවීය. එසේම අන්‍යජාතිකයෙකු යුදෙව් සිරිත්වලට අනුගත වීමද සිදුවිය යුතු නොවීය (චර්මඡේදනය වැනි). මුල්කාලයේදී ඇදහිල්ලට හැරුණු අන්‍යජාතීන් වෙත සංස්කෘතික අවශ්‍යතා පැනවීමට අවශ්‍යවීම යුදෙව්වන්ට ප්‍රශ්නයක් විය. නමුත් එවැනි දේවල් අනවශ්‍ය වියගහක් බව පාවුල් පැවසුවේය. යෙරුසලමේ පැවැත්වූ මන්ත්‍රණ සභාව විසින් මේ සම්බන්ධව පවත්වන ලද සාකච්ඡාව හා ඔවුන් ගත් තීරණය ක්‍රියා 15 දී ඔබට කියැවිය හැකිය.

(සටහන: සංස්කෘතිය පිළිබඳව කතා කිරීමේදී අප අදහස් කරනුයේ කණ්ඩායමින් කණ්ඩායමට වෙනස් වන, දේව වචනයේ සදාචාරාත්මක නීතීන්ට පටහැනි නොවන හැසිරීම් පිළිබඳව වේ. පාපිෂ්ඨ ක්‍රියාවන් කිසිවිටකත් පිළිගත නොහැකිය).

## කාලය නිශ්චය කිරීම.

අවශ්‍යතාවය අනුව විවිධ සංස්කෘතීන් තුළ ගත කළ යුතු කාලය පාවුල් සකස් කර ගත්තේය. ඇතැම් ස්ථානවල ඔහු නැවතී සිටියේ දින කිහිපයක් පමණි (ක්‍රියා 21:4). වෙනත් ස්ථානවල ඔහු “බොහෝ කලක්” සේවය කළේය (ක්‍රියා 14:28). ඔහු තැනින් තැන යමින් සේවය කළ අතර ඔහුගේ න්‍යාය පත්‍රය මෙහෙයවන ලද්දේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසිනි.

## ජන සන්නිවේදනය:

ජන සමූහයකට සන්නිවේදනය කිරීම තුළින් පාවුල් ශුභාරංචිය ප්‍රකාශ කළේය. විශාල ජන සමූහයක් ඇමතීමේ අවස්ථාව ඔහු උදාකර ගත්තේය:

> **තවද ඉකෝනියේදී ඔව්හු එක්ව යුදෙව්වරුන්ගේ සිනගෝගයට ඇතුල්වී, යුදෙව්වරුන්ගෙන්ද ග්‍රීක්වරුන්ගෙන්ද මහත් සමූහයක් අදහාගන්නා පරිද්දෙන් කථාකළෝය. (ක්‍රියා 14:1)**

## ගෝලත්වය:

පාවුල් සමූහයන්ට දේශනා කළ නමුත් අන් අයටත් ඉගැන්වීමේ හැකියාව ඇති ප්‍රධාන පුද්ගලයන් කිහිපදෙනෙකු වෙනුවෙන් තම ජීවිතය ආයෝජනය කිරීමේ වැදගත්කමද ඔහු දැන සිටියේය. තිමෝති මෙම පුද්ගලයන් අතරින් අයෙක් වූ අතර තීතස් හා වරක් ගෝලයෙකු ලෙස පුහුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කළ යොහන් මාර්ක් ද ඒ අතර විය (ක්‍රියා 15:36-40). සෑම ඇදහිලිවන්තයෙකුම ආත්මිකව තමන් වැනි අය බිහි කිරීම හරහා ගුණනය වීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම ශුද්ධාත්මයාණන් විසින් එළිදරව් කරනු ලැබුවේ පාවුල් තුළින් වේ (2 තිමෝති 2:2).

තමන් විසින් පුහුණු කළ ගෝලයන් සමග මෙන්ම බාර්ණබස් හා සිලස් වැනි වෙනත් ඇදහිලිවන්තයන් සමග ද වැඩ කිරීම නිසා ප්‍රේරිත පාවුල්ගේ සේවය මහත් ලෙස ගුණනය විය. ඔහුගේ දෙවන හා තෙවන ධර්මදූත ගමන්වලදී තමන් සේවය කිරීමට සැළසුම් කරන ප්‍රදේශයේ වාසය කරන හවුල් වැඩ කරන්නන්ගේ ලේඛනයක් පාවුල් විසින් දක්වයි.

මෙය ප්‍රධාන මූලධර්මයකි. අප්‍රිකානුවන් වෙත හොඳින්ම ළඟා විය හැක්කේ අප්‍රිකානුවන්ටය. ඉන්දියානුවන්ට තමන්ගේම සෙනඟ වෙත හොඳින්ම ළඟා විය හැකිය. ආසියානුවන්ට තම මහාද්වීපය හරහා හොඳින්ම ශුභාරංචිය ගෙන යා හැකිය. ඔවුන් එම භාෂාව කතාකරයි. සිරිත් විරිත් තේරුම් ගනියි. එසේම තම ජීවන රටාව දැනටමත් හැඩගස්වාගෙන තිබේ.

## ස්වාධීන සභාවන්:

පාවුල් ස්වාධීන සභාවන් රෝපණය කළේය. සහභාගිත්වය හා නායකත්වය අතින් ඔවුන් මව් සභාව සමග සම්බන්ධතා පැවැත්වුවද ඔවුන් ප්‍රධාන සභාව මත රඳා පැවතුනේ නැත. පාවුල් ඔහු රෝපණය කළ සභාවන්ගෙන් උපකාර ලබා නොගත්තේය. එසේම වෙනත් සංස්කෘතීන් තුළ ඇති කළ නව සභාවන්ට උපකාර කළ බවට ද වාර්තා වී නැත. බාහිර මූල්‍යමය උපකාරයන් මත රඳා පැවතීමෙන් තොරව ශුභාරංචි සේවය ඉදිරියට ගෙන යාමේ හැකියාව ඇති ස්වයං-පෝෂිත සභාවන් ඔහු විසින් ගොඩනගන ලදී.

දීර්ඝ කාලීනව ක්‍රියාත්මක වන නව සභාවක් උදෙසා වූ සියලුම මූල්‍යමය පිළිවෙත් සභාවේ පුද්ගලයන්ටම පාලනය කිරීමේ හැකියාව ලබා දෙන ආකාරයේ ඒවා විය යුතුය. සභාවක් වෙනත් සභාවකින්, නිකායකින් වෙනත් රටක සිටින ඇදහිලිවන්තයන්ගෙන් උපකාර ලබා ගන්නේ නම් එය ඔවුන් මත යැපේ. අනුග්‍රාහකත්වය දක්වන සභාව හෝ නිකාය ඇද වැටුණහොත් නව සභාව ද ඇද වැටේ. එම රටවල් අතර පවතින සබඳතා පළුදු වුවහොත් එම රටින් ලැබෙන උපකාරයන් නොලැබී යාම නිසා සභාවට අසීරුතාවයන් අත්දැකීමට සිදු වනු ඇත.

ජලය මිදියුස බවට හැරවූ හා කුඩා රොටි හා මාළු ප්‍රමාණයකින් සමූහයකට ආහාර සපයා දුන් ස්වාමීන්වහන්සේටම ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා දීමේ හැකියාව ඇත.

නව සභාව තුළින්ම නැඟිටුවන ලද නායකත්වය සමග ආත්මික දීමනා පාවිච්චි කිරීමේ ආධිපත්‍යය ද නව සභාවට එකවරම ලබා දිය යුතුය. පාවුල් නායකයන් තෝරාගත් විට ඔවුන් ජනතාව අතරින්ම තෝරාගනු ලැබූ අය වූ අතර වෙනත් ප්‍රදේශවලින් ගෙන්වාගත් අය නොවීය:

> **මා එන විට නුඹ ක්‍රීතෙහි නැවැත්වූ කාරණය නම්, අඩුව තිබුණු දේවල් නුඹ විසින් පිළිවෙළට යොදන පිණිසත් මා නුඹට ආඥා කළ ලෙස නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය: (තීතස් 1:5)**

යාච්ඤාව, දීම හා හවුල් සේවකයන් ලෙස ව්‍යාප්ත වීම, පැතිරීම හා සම්බන්ධ වීම තුළින් සභාව වර්ධනය කිරීමට දායක වීමට අවශ්‍ය සියලු අංගවල ක්‍රියා කිරීමට පාවුල් නව සභාවන් යොමු කළේය (ක්‍රියා 20:4: එපීස 6:19: පිලිප්පි 1:5,7: 4:14-16 බලන්න).

පාවුල් රෝපණය කළ හැම සභාවක්ම ආත්මික ගුණනය වීම උදෙසා වූ නව මධ්‍යස්ථානයක් විය.

> **මක්නිසාද නුඹලා වෙතින් ස්වාමීන්වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත් අකායෙහිත් පැතිර ගියා පමණක් නොව අප විසින් කිසිවක් කියන්ට ඕනෑ නොකරන හැටියට දෙවියන්වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ ඇදහිල්ල සෑම තැනම ප්‍රකාශවිය. (1 තෙසලෝනික 1:8)**


පාවුල් නව සභාවන් පිහිටවූයේ දේව වචනය හා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ නැමති පර්වතය මතය. ඔහු සංවිධානයක්, නිකායක් හෝ තමන්ගේම පෞරුෂත්වය මත ඒවා පිහිටවූයේ නැත. යැපීම මත නිර්මාණය කරන යමක් ස්වාධීනව සිටීමට පුහුණු නොවේ.

## සභාවන් වර්ධනය වන ආකාරයන් පිළිබඳ සාරාංශයක්


අභ්‍යන්තර වර්ධනය, ව්‍යාප්තිය, දුරස්ථ හා සම්බන්ධවීම් තුළින් සිදු වන වර්ධනය හරහා සභාව ගුණනය වන්නේ කෙසේදැයි පසුගිය පරිච්ඡේදවලදී ඔබ ඉගෙන ගත්තේය.

පහත රූප සටහන් අධ්‍යයනය කරන්න. මෙම රූප සටහන් මේ ආකාරයෙන් සභාවේ සිදුවන වර්ධනය සාරාංශගත කරයි. වෘත්තයෙන් සංකේතවත් වන්නේ ඔබේ සංස්කෘතිය තුළ පිහිටි සභාවකි. සමචතුරස්‍රයෙන් සංකේතවන්නේ වෙනස් සංස්කෘතියක් තුළ පිහිටි සභාවකි.


**අභ්‍යන්තර වර්ධනය:**
**සභාව තුළ සිදු වන ආත්මික වර්ධනය**




**ව්‍යාප්තිය තුළින් වර්ධනය වීම.**
**සංඛ්‍යාත්මකව සිදු වන වර්ධනය**



**දුරස්ථව**
**සමාන සංස්කෘතියක් තුළ නව සභාවක් රෝපණය කිරීම.**



**සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම:**
**වෙනස් සංස්කෘතියක් තුළ නව සභාවක් රෝපණය කිරීම.**



## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සභාව "සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

3. සභාව "සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම" පිණිස වූ ක්‍රිස්තුස්වහන්සේගේ සැලැස්ම තහවුරු කරන බයිබල් පදයක් ලියන්න.

4. අන්‍ය ජාතීන් අතර සභාව "සම්බන්ධ වීම තුළින් වර්ධනය වීම" සඳහා නව ගිවිසුම තුළ ප්‍රධාන වශයෙන් නායකත්වය දුන් පුද්ගලයා කවුද?

5. වෙනත් සංස්කෘතීන් වෙත ශුභාරංචිය ගෙනයාමේදී පාවුල් පාවිච්චි කළ ක්‍රමයන් සාරාංශ ගත කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. අන්තියෝකියේ සභාව යෙරුසලමේ සභාව විසින් රෝපණය කරන ලදී. ස්තේපන්ගේ මරණයෙන් පසු බොහෝ ඇදහිලිවන්තයන් යෙරුසලම අතහැර ගියෝය. ඇතැම් අය රෝම අධිරාජ්‍යයේ තෙවන විශාලතම නගරය වූ සිරියාවේ අන්තියෝකියට පැමිණියහ. එහි ඔවුහු සභාවක් පිහිටුවූවෝය (ක්‍රියා 11:19-21).

   ගෝලයන්ව මුලින්ම හඳුන්වනු ලැබුවේ අන්තියෝකියේ කිතුනුවන් ලෙසය. "යුදෙව්-නොවන" අය සහභාගිත්වය සඳහා එක් කරගත් පළමු සභාව මෙයයි. ග්‍රීකයන් (අන්‍යජාතීන්) සභාවේ ප්‍රධාන සෙනඟ ලෙස පෙනෙන්නට තිබුණි. අන්තියෝකිය ඉක්මනින්ම නව ගිවිසුම් සභාවන්ගේ නව මධ්‍යස්ථානය බවට පත්විය. අපට දැන් ලැබී ඇති සේවය තුළ ඇත්තේ යුදෙව් සංස්කෘතිය වෙත පමණක් ළඟා වීමේ පටු සංකල්පයන්ගෙන් යුත් යෙරුසලමේ සභාවේ ලකුණු නොව අන්තියෝකියේ ලකුණයි.

2. පාවුල් විසින් අනෙකුත් සංස්කෘතීන් වෙත ශුභාරංචිය ව්‍යාප්ත කිරීම බොහෝ අවස්ථාවලදී ධර්මදූත ගමන් තුනක් ආකාරයෙන් සාරාංශ කරයි.

   පළමු ගමන: ක්‍රියා 13:1-14:28
   දෙවන ගමන: ක්‍රියා 15:36-18:22
   තෙවන ගමන: ක්‍රියා 18:23-21:14

3. ක්‍රියා 22 හි සඳහන් පාවුල්ගේ පෞද්ගලික සාක්ෂිය කියවන්න:

   ක්‍රිස්තුස්වහන්සේ වෙත හැරීමට පෙර: ක්‍රියා 22:3-5
   ක්‍රිස්තුස්වහන්සේ වෙත හැරීම : ක්‍රියා 22:6-11
   ඔහුගේ පොදු සේවය: ක්‍රියා 22:12-16
   ඔහුගේ විශේෂිත මෙහෙය: ක්‍රියා 22:17-21

4. එපිසයේ සිදුවූ සිදුවීම් යළි සලකා බලමින් සෑම නගරයකදීම පාවුල් අනුගමනය කළ පොදු චක්‍රය පිළිබඳ තවත් අධ්‍යයනය කරන්න.

   පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම: ක්‍රියා 18:19; 19:1,8,9
   ශුභාරංචිය ප්‍රකාශ කිරීම: ක්‍රියා 19:4,9,10
   අසන්නන් ඇදහිල්ලට හැරීම: ක්‍රියා 19:5,18
   ඇදහිලිවන්තයන් රැස් කිරීම: ක්‍රියා 19:9-10
   ඇදහිල්ල ස්ථිර කිරීම: ක්‍රියා 20:20,27
   නායකයන් කැපවීම: ක්‍රියා 20:17,28; 1 තිමෝති 1:3,4
   සභාව භාර දීම: ක්‍රියා 20:17; එපීස 1:1-3,15,16

5. නව ගිවිසුම් සභාව සම්බන්ධ වීම තුළින් සිදුවූ වර්ධනය ඵලදායකද? වාර්තාව පරීක්ෂා කර බලන්න.

   ඒ නුවර මහත් ප්‍රීතියක් වුයේය. (සමාරිය) : ක්‍රියා 8:8

   ලිද්දායෙහිද ෂාරොනෙහිද විසූ සියල්ලෝ ඔහු දැක, ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය. (ක්‍රියා 9:35)

   නුමුත් දෙවියන්වහන්සේගේ වචනය පතළවී දියුණු විය. (ක්‍රියා 12:24)

   ස්වාමීන්වහන්සේගේ වචනය ඒ පළාත මුළුල්ලෙහි පතළව ගියේය. (ක්‍රියා 13:49)

   මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)

   ... ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරුද ස්වාමීන්වහන්සේගේ වචනය ඇසූහ: (ක්‍රියා 19:10)

එපමණ බලගතු ලෙස ස්වාමීන්වහන්සේගේ වචනය වර්ධනයවී, බලවත්වුණේය. (ක්‍රියා 19:20)

... යෙරුසලමේ පටන් ඉල්ලුරිකය දක්වා අවට රටවලට ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනා කළෙමි. (රෝම 15:19)

6. ක්‍රියා පොතෙහි සඳහන් ඇදහිල්ලට හැරුණු පුද්ගලයන් අයත්වූ විවිධ සාමාජීය හා භූගෝලීය ස්ථරයන් තුළින් නව ගිවිසුමේ සභාව ශුභාරංචිය සමග සාමාජීය, සංස්කෘතික හා ජාතික වශයෙන් තිබූ සීමාවන් සම්බන්ධ කළ ආකාරය එළිදරව් වේ. ඉන් කොටසක් ලැයිස්තුගත කළහොත් ඒ තුළ පහත ආකාරයේ පුද්ගලයන් අන්තර්ගත වේ.

- බාර්ණබස්, කුප්‍රස් දේශිකයෙකු වූ ධනවත් ලෙවියෙකි. (4:36-37)
- ස්තේපන්, හෙලනිකයෙක් වූ අතර උගත් මනුෂ්‍යයෙකි. (6:5፧8-10፧7:1-53)
- මහත් අධිපත්‍ය සහිත නපුංසකයෙක් වූ ඉතියෝපියානුවා (8:27).
- සාවුල්, පරිසියෙක් හා උගතෙකි. (9:1)
- කොර්නේලියස්, කායිසාරියේ රෝම ශතාධිපතියෙකි. (10:1-48)
- අන්තියෝකියේ සිමියොන්, ලූකියස් හා මානායින් (13:1)
- සර්ගියස් පාවුලස්, පාපස්හි රෝම බුද්ධිමතෙකි. (13:6-12)
- ලිදියා, තියාතිරා නුවර ව්‍යාපාරික කාන්තාවකි. (16:14-15)
- පිලිප්පියේ සිරගෙදර මුලාදෑනියා (16:27-34)
- තෙසලෝනිකයේ ප්‍රධාන ස්ත්‍රීන් (17:4)
- ඇතැන්ස්හි දියොනියස් (17:34)
- පන්තස්හි අකිලා හා ප්‍රිස්කිලා (18:3)
- අලෙක්සන්ද්‍රියෙක්වූ ආධිපත්‍ය සහිත යුදෙව්වා (18:24-28)
- පබ්ලියස්, මෝල්ටාවේ ප්‍රධානියා (28:7-10)
- (1 කොරින්ති 1:16 හි සඳහන් ස්තේපනස් හා පිලෙමොන් 1-2 හි සඳහන් කොලොස්සියේ පිලෙමොන්ද බලන්න)

# දහවන පරිච්ඡේදය

## තිරණද ගෝලයන්ද?

**අරමුණ:**
මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- "දෙවියන්වහන්සේ වෙතට හැරීම" යන්න නිර්වචනය කිරීමට,
- "ගෝලයා" යන්න නිර්වචනය කිරීමට,
- ගෝලත්වය උදෙසා වූ කැදවීමේ වැදගත් අංශ තුනක් හඳුනාගැනීමට,
- යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් පිළිබඳ අධ්‍යයනයකින් එළිදරව් වන ගෝලත්වය පිළිබඳ ප්‍රතිපත්ති නවයක් හඳුනාගැනීමට,
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ගෝලයකුගේ චරිත ලක්ෂණ නවයක් ලැයිස්තුගත කිරීමට,
- ගෝලත්වය පිළිබඳ සැබෑ පරීක්ෂණය පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

### හැඳින්වීම

යේසුස්වහන්සේගේ "මහා ආඥාව" ගැන ඔබට නිතර අසන්නට ලැබේ, නමුත් යේසුස්වහන්සේ තම අනුගාමිකයන් වෙත පැවරූ මෙහෙය ඔබට සැබවින්ම වැටහී තිබේද? ආඥාව ඇත්තේ නව ඇදහිලිවන්තන් දිනා ගැනීමට පමණද? උන්වහන්සේගේ අභියෝගය වූයේ නගරවල රැස්වීම් පවත්වා විශාල සභා ගොඩනැගිලි ඉදිකරන ලෙසද? ප්‍රමුඛත්වය දිය යුත්තේ දිළිඳුන්ට ආහාර හා ඇඳුම් ලබා දීම උදෙසා බව උන්වහන්සේ ඔවුන්ට පැවසූ සේක්ද?

අපි උන්වහන්සේගේ උපදෙස් යළි කියවා බලමු:

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:19-20)**

ප්‍රමුඛත්වය දී ඇති පිළිවෙළ නම්, සියලු ජාතීන් වෙත යාම, ඔවුන්ට ශුභාරංචිය ඉගැන්වීම, ඔවුන්ව බව්තීස්ම කිරීම හා ඉන් අනතුරුව යේසුස්වහන්සේ අණ කළ සියල්ල ගැන තවදුරටත් ඉගැන්වීම වේ.

ප්‍රමුඛත්වය වූයේ ඉහත කරුණය. තවදුරටත් එය එසේම විය යුතුය. ඔබට විවිධ ආකාරයන්ට ඔබගේ ජීවිතය ගත කළ හැකිය. ඔබට දිළිඳුන්ට උපකාර කිරීම වැනි යහපත් වැඩ කළ හැකිය. ඔබට විශාල සභා ගොඩනැගිලි ගොඩනැගිය හැකිය. ඔබට මහත් ආගමික රැස්වීම් මෙහෙය විය හැකිය.

නමුත් යේසුස්වහන්සේ විසින් පැවරූ මෙහෙය ඉටු කිරීමට නම් ඔබ එක් දෙයක් කළ යුතුය. සියලු ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යාමට ඔබ සහභාගී විය යුතුය. දිළිඳුන්ට සේවය කිරීම, සභාවන් ඉදිකිරීම ආදී අනෙකුත් සියලුම ක්‍රියා වලංගු වන්නේ මෙම ප්‍රමුඛත්වයට දායක වන්නේ නම් පමණි.

නමුත් මෙම සියලු ජාතීන් වෙත ළඟා වීම යනු මනුෂ්‍යන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා තීරණයක් ගැනීම දක්වා ගෙන ඒමට වඩා දෙයකි. මහා ආඥාව ඉටු කිරීම සඳහා ඔබ තීරණ ගැනීම අබිබවා ගෝලත්වය දක්වා මනුෂ්‍යන් ගෙන ආ යුතුය.

## තීරණ ද ගෝලයන් ද ?

යේසුස්වහන්සේගේ ආඥාව තුළ දෙයාකාරයක ඉගැන්වීම් අන්තර්ගත වේ :

### පළමුව : පුරුෂයන් හා ස්ත්‍රීන් ගැළවීම වෙත ගෙන එන ඉගැන්වීම් :

ශුභාරංචියට ප්‍රතිචාර දක්වා, පාපය ගැන පසුතැවී, නැවත ඉපදීම ලැබීමට නම් පුද්ගලයන් ශුභාරංචිය ඇසිය යුතුය. ඒ ආකාරයේ ඉගැන්වීම "ශුභාරංචිය ප්‍රකාශ කිරීම" නම් වේ :

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න. (මතෙව් 28:19)**

නව ඇදහිලිවන්තයන් ඇතැම් විට "දෙවියන්වහන්සේ වෙතට හැරුණු අය" ලෙස හඳුන්වයි. හැරුණු අයෙක් යනු ඇදහිල්ලෙන් නැවත උත්පාදනය ලබා දේව රාජ්‍යයේ සමාජිකයෙක් බවට පත් වූ යේසුස්වහන්සේ කෙරෙහි අදහන පුද්ගලයෙකි (ශුභාරංචිය ප්‍රකාශ කරමින් නව ඇදහිලිවන්තයන් බිහි කරන ආකාරය පිළිබඳ පුහුණුවක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"මුහුන් වලට සමාන වූ ධර්මදූත ප්‍රචාරණය"* නම් පාඩමාලාව තුළින් ලබා දෙයි).

### දෙවනුව : දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් පසුව සිදු කරන ඉගැන්වීම් :

ඔබට ශුභාරංචිය උගන්වනු ලැබ යේසුස්වහන්සේ වෙතට පැමිණි පසුව, උන්වහන්සේ **පසුපස** යන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගත යුතුය.

> **මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:20)**

දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් හා බව්තීස්ම වීමෙන් පසුව තවදුරටත් ඉගැන්වීම් කළ යුතු බව යේසුස්වහන්සේගේ ආඥාව එළිදරව් කරයි. යේසුස්වහන්සේ ඉගැන්වූ සියල්ල ගැන නව ඇදහිලිවන්තයන්ට උපදෙස් දිය යුතුය. මෙම ක්‍රියාවලිය ඇතැම් විට නව ඇදහිලිවන්තයන් උදෙසා වූ "වැඩිදුර ඉගැන්වීම්" හෝ "රැකබලා ගැනීම" ලෙස හැඳින්වේ. එසේම එය "ගෝලත්වය" ලෙසද හැඳින්වේ.

## ගෝලත්වය පිළිබඳ නිර්වචනය

යේසුස්වහන්සේගේ සැළැස්ම නම් ඔබ නව ඇදහිලිවන්තයන්ව ගෝලයන් වීම දක්වා මඟපෙන්වීමයි. ගෝලයකු යනු, කිතුනු ඇදහිල්ලේ මූලිකාංග මත පිහිටා සිටිමින් නව ඇදහිලිවන්තයන් බිහිකිරීමේ හා ඔවුන්ව ගෝලයන් ලෙස වර්ධනය කිරීමේ හැකියාව ඇති ඇදහිලිවන්තයෙකි. "ගෝලයා" යන වචනයේ අර්ථය ඉගෙන ගන්නා තැනැත්තා, ශිෂ්‍යයා, අනුගමනය කිරීම තුළින් ඉගෙන ගන්නා තැනැත්තා යනුයි. එය දැනුමට වඩා වැඩි යමකි. එය කෙනෙකුගේ ජීවන රටාව වෙනස් කරන ආකාරයේ ඉගෙන ගැනීමකි.

## තීරණ ගැනීම/ගෝලත්වය පිළිබඳ චක්‍රය

තීරණය යනු සැබෑ ගෝලත්වයේ පළමු පියවර පමණි. නව ඇදහිලිවන්තයන් තවත් නව ඇදහිලිවන්තයන් බිහි කිරීමේ හැකියාව ඇති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු සාමාජිකයන් බවට පත්වීම සඳහා තීරණයෙන් ඔබ්බට වර්ධනය විය යුතුය. නව ඇදහිලිවන්තයන් දිනා ගැනීම වැදගත් වේ. නමුත් යේසුස්වහන්සේව අනුගමනය කිරීමට හා ආත්මිකව තමන් වැනිම වූ අය බිහි කිරීමට පුරුෂයන් හා ස්ත්‍රීන් පුහුණු කිරීම ද ඒ හා සමානවම වැදගත් වේ. ඔබ පුහුණු කරන හැම කෙනෙකුම, අන් අය හරවා ගනිමින්, ඔවුන්ව ගෝලයන් කර තවත් අය වෙත යාමට ඔවුන් පුරුදු කරනු ඇත.

ගෝලත්වයට මිනිසුන් ගෙන ඒමට යේසුස්වහන්සේ විසින් පෙන්නුම් කරන ලද බයිබලිය සැළසුම මෙය වේ. උන්වහන්සේ මනුෂ්‍යයන් දොළොස් දෙනෙකු තෝරා ගෙන, ඔවුන්ව ගෝලයන් කර, අන් අය වෙත ළඟා වීමට ඔවුන් පුහුණු කළ සේක. මෙම පාඨමාලාවේ හතරවන පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගත් පරිදි, මෙම "එක් අයෙක් තව කෙනෙක්ට ඉගැන්වීම" යන සැළසුමේ ප්‍රතිඵලයක් ලෙස ඇදහිලිවන්තයන්, සභාවන් හා නිකායන් ගුණනය වීම සිදු වේ.

නමුත් හැම විටම අරමුණ පැහැදිලිව තබා ගන්න. ඔබ ගෝලයන් ඇති කරන්නේ ඔබේම සේවය හෝ නිකාය ගොඩනැඟීමට නොවේ. ගෝලයන් බිහි කිරීමේ අරමුණ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු ජාතීන් වෙත ළඟා වීමයි.

මහා ආඥාව ඉටු කිරීම බොහෝ දුරට රඳා පවතිනුයේ, වඩා හොඳ ක්‍රමවේද හා වඩා දියුණු තාක්ෂණය මත නොව, කැපවීමෙන් යුත් ගෝලයන්ගේ වර්ධනය මත වේ. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ හා ගෝලයන් බිහි කිරීමේ නොනවතින චක්‍රය පහත රූප සටහන තුළින් දැක්වේ:

**ශුභාරංචිය ප්‍රකාශ කිරීම → නව ඇදහිලිවන්තයන් → ගෝලත්වය → ගෝලයන් → ශුභාරංචිය ප්‍රකාශ කිරීම → නව ඇදහිලිවන්තයන් → ගෝලත්වය → ගෝලයන් → ශුභාරංචිය ප්‍රකාශ කිරීම →නව ඇදහිලිවන්තයන් → ගෝලත්වය → ගෝලයන්................→**

ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලය නව ඇදහිලිවන්තයන්ය. ගෝලත්වයේ ප්‍රතිඵලයක් ලෙස ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හා නව ඇදහිලිවන්තයන් බිහි කිරීමට හැකි හා ඔවුන්ව ගෝලයන් කිරීමේ හැකියාව ඇති ගෝලයන් බිහි වේ. මෙම චක්‍රය ඉන් අනතුරුව එකම රටාවට නැවත නැවත සිදු වේ.

## ගෝලත්වය සඳහා වු කැඳවීම

ඔබගේ බයිබලයේ ලූක් 9:57-62 කියවන්න. මෙම කොටස තුළදී ගෝලයකු වීමේ ආශාව ඇතිව මනුෂ්‍යයන් තිදෙනෙකු යේසුස්වහන්සේ වෙතට පැමිණියහ. එක් එක් පුද්ගලයන්ට ගෝලත්වය උදෙසා වු කැඳවීමක වෙනස් පැතිකඩයන් යේසුස්වහන්සේ එළිදරව් කළ සේක :

**1. මිළයක් ගෙවීමට තිබේ : (ලූක් 9:57-58)**

පළමු මිනිසා කැඳවන තුරු නොසිට යේසුස්වහන්සේ අනුගමනය කිරීමට කැමති විය. ස්ව උත්සාහය තුළින් ගෝලයකු වීමට ඔහු උත්සාහ කළේය. ඔහු ගෝලත්වයේ අර්ථය වටහාගෙන නොමැති බවට යේසුස්වහන්සේ ඔහුට අනතුරු ඇඟවූ සේක. ගෝලත්වය යනු මනුෂ්‍යයා දෙවියන්වහන්සේ වෙත ඉදිරිපත් කරන ඉල්ලීමක් නොවේ. එය දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දෙන කැඳවීමකි.

"ඔබ මා අනුව ආවෙත්, ඔබට මේ දේවල්වලට මුහුණ දීමට සිදු වේ" යනුවෙන් යේසුස්වහන්සේ පැවසූ සේක. සැබෑ ගෝලත්වය සඳහා මිළයක් ගෙවිය යුතු බව උන්වහන්සේ පැහැදිලි කළ සේක. එය ස්ව උත්සාහයෙන් ලබා ගත හැකි දෙයක් නොවේ.

**2. නිසි ප්‍රමුඛතාවන් : (ලූක් 9:59-60)**

දෙවන මනුෂ්‍යයාට තමන් "අනුව එන ලෙස" යේසුස්වහන්සේ කැඳවීමක් දුන් සේක. "අනුව යාම" යනු ඉදිරියෙන් ගමන් කරන පුද්ගලයාට පසුව ගමන් කිරීමයි. උදාහරණයක් අනුකරණය කිරීමයි. විශ්වාස කිරීම හා කීකරු වීම යන දෙකම ඒ තුළ ඇතුළත් වේ. යේසුස්වහන්සේ තම ගෝලයන් දොළොස්දෙනා කැඳවන විට උන්වහන්සේ ඔවුන්ට පැවසුවේ, උන්වහන්සේ අනුව එන ලෙසයි. ඔවුන් කළ යුතු සේවය පිළිබඳ රාමුවක් උන්වහන්සේ ඉදිරිපත් කළේ නැත. ජීවිතය උදෙසා වු වැඩසටහනක් පිළිබඳ සැළැස්මක් උන්වහන්සේ ඔවුන්ට දුන්නේ නැත.

කැඳවීම නිසාම ගෝලයා විසින් තම පැරණි ජීවිතය අතහැර දැමිය යුතුය. මේ සඳහා කවර තීරණ ගැනීමට සිදු වේද, කෙතරම් දේවල් අතහැර දැමීමට හා කැපකිරීමට සිදු වේද යන්න නොදනී. ලෝකයේ ඇස්වලින් බලන විට අනුගමනය කරන්නා අනාරක්ෂිත ජීවිතයක් උදෙසා

ආරක්ෂිත ජීවිතයක් අතහැර දමයි. කැපකිරීම කරනුයේ වැඩසටහනක් උදෙසා නොව, පුද්ගලයකු උදෙසාය. එම පුද්ගලයා නම් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

ලූක් පොතේ ඉහත බයිබල් කොටසේ , අනුගමනය කිරීම උදෙසා වූ කැඳවීමට මෙම මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය වූයේ "ස්වාමිනි පළමුකොට ගොස්........" යනුවෙනි. ඔහුට යේසුස්වහන්සේ අනුගමනය කිරීමට අවශ්‍ය විය, නමුත් ඔහු එයට ප්‍රමුඛතාව නොදිය. තමන් අනුගමනය කරන්නෙකු තම දෙමව්පියන්ගේ අවශ්‍යතා නොසලකා හැරිය යුතු බව යේසුස්වහන්සේ කිසිවිටෙකත් පැවසුවේ නැත (යොහන් 19:25-27 බලන්න). මෙම කතන්දරය තුළ අවධාරණය කරන්නේ ප්‍රමුඛතාව පිළිබඳ ප්‍රශ්නයකි. මෙම මනුෂ්‍යයාට පළමුකොට තම පියා භූමදාන කිරීමට අවශ්‍ය විය. යේසුස්වහන්සේ තමන්ව අනුගමනය කරන ලෙස මනුෂ්‍යයෙකුට පවසන ඉතා වැදගත් මොහොතේදී, එම කැඳවීමට දක්වන ප්‍රතිචාරයට ඉදිරියෙන් කිසිවක් නොතැබිය යුතුය.

තවත් කොටසක, "අනුගමනය කිරීම" තුළ අන්තර්ගත වන්නේ මොනවාදැයි යේසුස්වහන්සේ වඩා විස්තරාත්මකව පැහැදිලි කළ සේක :

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

ඔබට කුරුසිය දැරීමට හැකිවීමට පෙර තමකමට නැසිය යුතුය. පැරණි ආත්මාර්ථකාමී හා පව්කාර ස්වභාවය අතහැර දැමිය යුතුය (රෝම 7-8 දක්වා ඇති මෙම අංගය පිළිබඳ පාවුල්ගේ පොරබැදීම කියවන්න). ඉන්පසු ඔබ කුරුසිය දරා ගත යුතුය. කුරුසිය සංකේතවත් කරනුයේ දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමේදී මුහුණ දීමට සිදු වන කැපකිරීම්, වේදනාවන්, ප්‍රතික්ෂේපකිරීම්, අපහාසකිරීම්, හා අසීරුතාවන්ය. කුරුසිය යනු ශුභාරංචිය වෙනුවෙන් වේදසාක්ෂිකාරයෙකු ලෙස මිය යාම උදෙසා වූ කැඳවීමක් ද විය හැකිය.

"කුරුසිය දැරීම" යනු ජීවිතයේ විඳීමට සිදු වන අසීරුතාවන් නොවේ. මේවා සියලූ මනුෂ්‍යයන්ට පොදුය. ඒවා නම් පාපිෂ්ඨ ලෝකයක ජීවත්වීම නිසා ඇති වන පීඩාවන්, පරීක්ෂාවන්, අපේක්ෂා භංගත්වයන් හා කළකිරීමය. ජීවිතයේ එවැනි අසීරුතාවන්ගෙන් ඇදහිලිවන්තයා නිදහස් වී නොමැත. ඔහු පාපය විසින් වසාගත් ලෝකයක ජීවත් වන බැවින් ලෙඩරෝග, හදිසි අනතුරු, ගිනි ගැනීම් හා ස්වාභාවික විපත් ආදිය අද්දැකීමට සිදු වේ. නමුත් "කුරුසිය දැරීම" යනු මෙම අසීරුතාවන් නොවේ. කුරුසිය දැරීම යනු ස්වේච්ඡාවෙන් සිදු වන දෙයක් වන අතර, ජීවිතයේ අසීරුතාවන් නිසා බලහත්කාරයෙන් යමෙක් පිටට පටවනු ලැබූවක් නොවේ. එය නම් දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම උදෙසා තමන්ගේ ආශාවන් යටපත් කිරීමට දිගින් දිගටම (දෛනිකව) කරනු ලබන තෝරා ගැනීමකි.

කුරුසිය දැරීම යන්න ගෝලත්වය සඳහා අවශ්‍ය දෙයකි. "තමාගේ කුරුසිය රැගෙන මා අනුව නොඑන්නාට මාගේ ගෝලයකු වීමට නොහැක" යයි යේසුස්වහන්සේ පැවසූ සේක. කුරුසිය දැරීම තුළ තමකම නැසීම යන්න අන්තර්ගත වන බැවින් එය ප්‍රීතිමත් දෙයක් නොවේ. නමුත් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයකු වීම සඳහා එය උන්වහන්සේ උදෙසා ස්වේච්ඡාවෙන් කළ යුතුය.

කුරුසිය දරා ගැනීමට නම්, ලෝකයේ දේවල්වලින් ඔබ ඔබේ දෑත් හිස්කර ගත යුතුය. ඔබේ හදවත ඇත්තේ මුදල් හා ද්‍රව්‍යමය දේවල් වෙත නම්, කුරුසිය දැරිය නොහැකි ලෙස ඔබේ දෑත් පිරී තිබේ. ඔබ කාලය යොදවන්නේ සතුට හා මාංශික තෘප්තිය ගෙන එන දේවල් වෙත නම්, කුරුසිය දැරිය නොහැකි ලෙස ඔබේ දෑත් පිරී තිබේ. තම කම නසා, කුරුසිය දරාගත් පසු ඊළඟ පියවර නම් අනුගමනය කිරීමයි. පැරණි ජීවන රටාව හා පැරණි පාපිෂ්ඨ සබඳතා ඔබ විසින් අතහැර දැමිය යුතුය.

එක් ස්ථානයක හිඳගෙන ගෝලත්වය සිදු වන තුරු බලා සිටීමෙන් ඔබට කිසිදිනක ගෝලත්වයට ඇතුළත් විය නොහැකිය. පළමු පියවර **ඔබ** විසින් ගත යුතුය: තමකම නසා, ඔබේ කුරුසිය රැගෙන, උන්වහන්සේ අනුව යන්න. මතෙව්ට බදු මේසය ළඟ හා පේතෘස්ට තම දැළ ළඟ රැඳී සිටිය හැකි විය. ඔවුන් දෙදෙනාටම තම ව්‍යාපාරික කටයුතුවල අවංකව නිරත වෙමින් "ආත්මික" අත්දැකීම් අත්දැකීමට ද හැකි විය. නමුත් සැබෑ ගෝලත්වය තුළ උන්වහන්සේ අනුව යාමට ඔවුන්ට අවශ්‍ය වූයේ නම්, ඔවුන් පැරණි තත්වය අතහැර නව තත්වයට ඇතුළු විය යුතු විය. මතෙව් බදු මේසය ද පේතෘස් තම දැළ ද අතහැරිය යුතු විය.

මෙහි අදහස සැම ගෝලයකුම තම රැකියාව හා නිවස අතහැර දැමිය යුතු බව නොවේ. එයින් අදහස් වන එකම දෙය නම් ඒ සඳහා ජීවන රටාවේ වෙනසක් අවශ්‍ය වන බවයි. ඇතැම් අවස්ථාවලදී එහි අදහස ශුභාරංචිය උදෙසා නිවස, රැකියාව හා තමන් ප්‍රේම කරන අය අතහැර දැමීම ද විය හැකිය. යේසුස්වහන්සේ ඔබව ගෙන යන ඕනෑම ස්ථානයකට ඔබ උන්වහන්සේ අනුව යා යුතුය. ගෝලත්වයට ප්‍රමුඛතාව දිය යුතුය.

**3. නියත ඉලක්කයන් : (ලූක් 9:61-62)**

ලූක් 9:57-62 හි සඳහන් තෙවන මනුෂ්‍යයාට අනුගමනය කිරීමට අවශ්‍ය විය, නමුත් ඔහුට එය කිරීමට අවශ්‍ය වුයේ තමන්ගේම කොන්දේසි අනුවය. තම පවුලෙන් අවසර ගැනීම සාමාන්‍ය දෙයකි. නමුත් යේසුස්වහන්සේ තමන්වහන්සේව අනුගමනය කරන ලෙස ඔහුව කැඳවා තිබුණි. ඔහුගේ ජීවිතයේ සැබෑ ඉලක්කය වුයේ කුමක්ද? ගෝලත්වය ද නොඑසේ නම් තමන්ගේම දේවල් කිරීමද? මෙම මනුෂ්‍යයාගේ ජීවිතයේ ඉලක්ක නිසි ලෙස සකස් වී තිබුණේ නැත. ඔහු තම පැරණි ජීවිතය හා යේසුස්වහන්සේ විසින් කැඳවා තිබූ අලුත් ජීවිතය අතර හිරවී සිටියේය.

## ගෝලයන්ගේ ක්‍රමය හා පණිවුඩය

ගෝලත්වය උදෙසා වු කැඳවීම තුළ සියලු ජාතීන්ට උගන්වන ලෙස වු ආඥාවක් අන්තර්ගතය. ගෝලයන්ගේ ක්‍රමය වුයේ සාක්ෂි දැරීමය. "නුඹලා මාගේ සාක්ෂිකාරයෝ විය යුතුය" යි යේසුස්වහන්සේ පැවසූ සේක (ක්‍රියා 1:8). මෙහිදී අවධාරනය කෙරුනේ ඔවුන් කවරාකාර දේවල් කරනවාද යන්න මත නොව ඔවුන් කවරාකාර පුද්ගලයන් වන්නේද යන්න මත වේ. ඔවුන් කළ දේවල් පැමිණියේ ඔවුන් කවරාකාර පුද්ගලයන්ද යන කාරණාව තුළිනි.

අවසානය දක්වා, යේසුස්වහන්සේ අනුගාමිකයන් තමන් සාක්ෂිකාරයන් ලෙස සැළකූහ. තම ජීවිතයේ අවසානයට ළඟා වී සිටියදී, පාවුල් මෙසේ පැවසිය:

> **එසේ වී නුමුත් දෙවියන්වහන්සේගෙන් වන පිහිට ලැබ, ලොකු කුඩා අයට සාක්ෂි දෙමින්, ක්‍රිස්තුස් වහන්සේගෙන් දුක්විඳින්ට ඕනෑ බව යන පළමුකොට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන උන්වහස්සේ සෙනඟට ද අන්‍යජාතීන්ට ද එළිය ප්‍රකාශ කරන සේකැයි යන... කාරණා ගැන මිස වෙන කිසිවක් නොකියා අද දක්වා සිටිමි. (ක්‍රියා 26:22-23)**

ගෝලයන් සාක්ෂි දැරීම යනු දේශනා කිරීම, ඉගැන්වීම, බව්තිස්ම කිරීම, හාස්කම් හා සුවකිරීම් තුළින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම විය. ඔවුන්ගේ සාක්ෂි දැරීමේ පණිවුඩය නම් දේව රාජ්‍යයේ ශුභාරංචියයි.

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය: එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

ශුභාරංචියේ මූලිකාංග පාවුල් මෙසේ සාරාංශ කරයි:

> **ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත් ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිද උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්, (1 කොරින්ති 15:3,4)**

"ශුභාරංචියේ සත්‍යතාව" (ගලාති 2:5) ලෙස පාවුල් හඳුන්වන්නේ මෙයයි. වෙනත් ඕනෑම ආකාරයක පණිවුඩයක් පිළිගත හැකි නොවීය (ගලාති 1:8)

## යේසුස්වහන්සේ හා ගෝලත්වය

දෙවියන්වහන්සේ විසින් තමන්වහන්සේ එවන ලද කාර්යය ඉටු කිරීම සඳහා යේසුස්වහන්සේට ලැබුණු සේවා කාලය වසර 3 1/2 ක් පමණි. මෙය අතිවිශාල කාර්යයක් විය. මෙම කෙටිකාලය තුළදී උන්වහන්සේට යා හැකි වුයේ ස්ථාන කිහිපයකට පමණක් වු අතර ළඟා විය හැකිවුයේ සීමිත පුද්ගලයන් සංඛ්‍යාවක් වෙත පමණි.

තම කාර්යය සම්පූර්ණ වන බවට සහතිකයක් ලබා ගැනීමට, යේසුස්වහන්සේ ගෝලත්වයට ප්‍රමුඛතාව දුන් සේක. තමන්වහන්සේට කිසිදාක ළඟා වීමට අවස්ථාව නොලැබුණු ගම්මාන රාශියක් වෙත තම ගෝලයන් හා ඔවුන්ගේ ගෝලයන් ළඟා වනු ඇති බව උන්වහන්සේ දැනසිටි සේක.

දිළිඳුන්ට ආහාර හා ඇඳුම් ලබා දෙමින් යේසුස්වහන්සේට තම මුළු කාලයම ගත කළ හැකි විය. උන්වහන්සේට යෙරුසලමේ විශාල සභා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට හැකි විය. උන්වහන්සේට පාවිච්චි කළ හැකි ක්‍රම රැසක් විය. නමුත් යේසුස්වහන්සේ තෝරා ගන්නේ ආත්මික ගුණනය වීමට හේතුවන ප්‍රධාන කරුණයි. විශ්වාසවන්ත මනුෂ්‍යයන් කිහිපදෙනෙකු වෙනුවෙන් තම ජීවිතය ආයෝජනය කිරීමෙන් කිසිදාක අවසන් නොවන ගුණනය වීමේ ක්‍රියාවලියක් ආරම්භ වන බව උන්වහන්සේ දැන සිටි සේක. උන්වහන්සේගේ අවධානය යොමුවුයේ සැළසුම් භාවිතයෙන් සමූහයන් වෙත ළඟා වීම නොව, සමූහයන්ට ළඟා වීමේ හැකියාව ඇති මනුෂ්‍යයන් ඇති කිරීමය.

ඔබ කුමන රටක ජීවත් වුවත්, ඔබ විශාල නගරයක හෝ දුෂ්කර ගම්මානයක ජීවත් වුවත්, ඔබ ශුභාරංචියට සවන් දුන්නේ යේසුස්වහන්සේගේ ගෝලයන්ගේ විශ්වාසවන්තභාවය නිසා වේ. ඔබ දක්වා ශුභාරංචිය පැමිණි ආකාරය අප ඉතිහාසය තුළින් විමසා බැලුවහොත්, එම මාර්ගය යේසුස්වහන්සේගේ මුල් ගෝලයන්ගෙන් කෙනෙක් වෙත ගමන් කරනු ඇත.

ගෝලත්වය පිළිබඳ ආදර්ශය යේසුස්වහන්සේය. ඔබ උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළහොත්, තමන් වැනිම අය බිහි කිරීමේ හැකියාව ඇති ගෝලයන් කෙටි සම්මන්ත්‍රණයකින් බිහි කළ නොහැකි බව ඔබ තේරුම් ගනු ඇත. යේසුස්වහන්සේ ප්‍රමුඛ කාලයක් ලබා දුන්නේ ගෝලත්වය වෙතටය.

යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් අතර වු සම්බන්ධතාව අධ්‍යයනය කිරීමේදී ගෝලත්වය පිළිබඳ මූලධර්ම කිහිපයක් එළිදරව් වේ. ගෝලත්වය හා සම්බන්ධ ක්‍රියාවලියේදී මේවා වැදගත් වේ:

## 1. තෝරාගැනීම :

ගෝලයන් 12 තෝරාගැනීම මතෙව් 5:1; 10:2-4; මාර්ක් 3:13-19 හා ලූක් 6:12-16 හි සඳහන් වේ. 70 දෙනා තෝරාගැනීම ලූක් 10:1-16 හි සඳහන් වේ. ගෝලත්වය හා සම්බන්ධ ක්‍රියාවලියේ පළමු පියවර තෝරාගැනීමයි. යේසුස්වහන්සේ ගෝලයන් තෝරාගන්නා විට, උන්වහන්සේ කැඳවූයේ සාමාන්‍ය මනුෂ්‍යයන්ය. ඇතැම් අය නූගත් අය වූ අතර ඔවුන් සියලු දෙනා අත වැරදි හා අසමර්ථතා විය.

මුල් ගෝලයන් 12 දෙනා වර්තමාන සභාවක මිෂනාරී කණ්ඩායමක් විසින් සළකා බැලුවහොත්, ඔවුන් මිෂනාරී සේවයට සුදුසු නොවන බව තීරණය කරනු ඇතැයි කියමනක් තිබේ. නමුත් යේසුස්වහන්සේ ක්‍රියාත්මක වුයේ කෙනෙකුට වීමට ඇති හැකියාව මත පදනම්ව මිස ඇති ප්‍රශ්න මත නොවේ. උන්වහන්සේ පුරුෂයන් හා ස්ත්‍රීන් තෝරාගන්නේ ඔවුන්ගේ වර්තමාන තත්වය සළකා නොවේ ඔවුන්ට විය හැකි වන්නේ කවුද මත සලකා බැලීමෙනි. උන්වහන්සේ ප්‍රශ්නවලින් ඔබ්බට ඔවුන්ගේ හැකියාවන් දෙස බැලූ සේක.

සෑම නව ඇදහිලිවන්තයෙකුම කවරෙකු හෝ විසින් ගෝලත්වයට ගෙන එනු ලැබිය යුතු වේ. එහෙත් ඔබට සෑම කෙනෙකුම ගෝලයෙකු කළ නොහැකිය. ඔබ එක් තනි පුද්ගලයෙකු පමණක් වන අතර ඔබට එක් වරකදී ගෝලයන් ලෙස පුහුණු කළ හැක්කේ සීමිත පිරිසක් පමණි. ප්‍රාදේශීය සභාව නැමති සංදර්භය තුළ ගෝලත්වය යන්න සිදු කළ යුත්තේ මේ හේතුවෙනි. සෑම නව ඇදහිලිවන්තයෙකුම පරිණත ඇදහිලිවන්තයෙකු මඟින් නිසි ලෙස ගෝලයකු ලෙස පුහුණු කරන බවට සභාපාලකවරයාට සහතික විය හැකිය.

ගෝලයකු ලෙස තෝරාගත යුත්තේ කවුදැයි යේසුස්වහන්සේ තීරණය කළේ කෙසේද?

**පළමුව,** දෙවියන්වහන්සේ මත රඳා සිටීමෙන් :

> **මම තනියම කිසිවක් කරන්ට නුපුළුවන... මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත සොයමි. (යොහන් 5:30)**

**දෙවනුව,** උන්වහන්සේ එය යාච්ඤාව සඳහා හේතුවක් කරගත් සේක. තමන් ගෝලයන් ලෙස පුහුණු කරන මනුෂ්‍යයන් තෝරාගැනීමට පෙර යේසුස්වහන්සේ සම්පූර්ණ රාත්‍රියක්ම යාච්ඤාවෙන් ගත කළ බව ලූක් 6:12-13 හි වාර්තා වේ.

**තෙවනුව,** තම ගෝලයන් කැඳවීමේදී යේසුස්වහන්සේ මූලිකත්වය ගත් සේක. යේසුස්වහන්සේගේ ගෝලයන් වනු පිණිස මනුෂ්‍යයන් ඔබ වටා රොක් වන්නේ නැත. ඔවුන්ව කැඳවීමට ඔබ මූලිකත්වය ගත යුතු වේ. දෙවියන්වහන්සේගේ බලය කරණකොටගෙන ඔබ ගෝලයන් "සෑදිය" යුතුය.

**සිව්වනුව,** ගෝලත්වය තුළ අන්තර්ගත වන්නේ මොනවාදැයි යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. ඔබ ඉගෙන ගත් පරිදි, ගෝලත්වය සඳහා මිළයක් ගෙවිය යුතුය. නිසි දෙයට ප්‍රමුඛත්වය දිය යුතුය. එසේම ඔවුන්ගේ ජීවිතයේ එකම පරමාර්ථය ගෝලත්වය විය යුතුය.

ගෝලත්වය තුළ විශ්වාසවන්තභාවය හා අන් අයට ඉගැන්වීමේ හැකියාව ද අන්තර්ගත වේ. විශ්වාසවන්ත මනුෂ්‍යයන් තෝරාගෙන තමන් විසින් ඉගැන්වූ දේවල් ඔවුන්ට භාර දෙන්න යැයි පාවුල් තිමෝතිට පැවසුවේය. මෙම විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට අන් අයට ඉගැන්වීමේ හැකියාව තිබිය යුතු විය. ගුණනය වීමේ ක්‍රියාවලිය සඳහා මෙම ගුණාංග දෙක අත්‍යවශ්‍ය වේ. මනුෂ්‍යයෙකු විශ්වාසවන්ත නොවේ නම්, ආත්මිකව ගුණනය වීම උදෙසා වූ ඔහුගේ වගකීම ඔහු විසින් සම්පූර්ණ නොකරනු ඇත. ඔහු විශ්වාසවන්ත වුවත්, අන් අයට ඉගැන්විය යුත්තේ කෙසේදැයි නොදනී නම්, එවිට ද ඔහු අසාර්ථක වනු ඇත.

අන් අයට ඉගැන්වීමේ හැකියාව ලබාගත යුතු වූ නමුත් තවමත් එසේ කිරීමට තරම් පරිණත නොවූ ඇදහිලිවන්තයන් පිළිබඳව ද පාවුල් කතා කළේය. මෙම පුද්ගලයන් සැබෑ ගෝලත්වය උදෙසා තවමත් සූදානම් වී නැත. ඇදහිල්ලේ මූලිකාංග පිළිබඳව ද ඔවුන්ට තවදුරටත් උපදෙස් දිය යුතුය. ගෝලත්වය උදෙසා කැඳවනු ලබන්නේ "අන් අයටත් ඉගැන්වීමේ හැකියාව ඇති විශ්වාසවන්ත මනුෂ්‍යයන්" වේ.

විශ්වාසවන්ත මනුෂ්‍යයන් අනිවාර්යයෙන්ම දෝෂ රහිත මනුෂ්‍යයන් විය යුතු නොවේ. ගෝලත්වය හා සම්පූර්ණත්වය පටලවා නොගනින්න. අනාගතයේ ගෝලයන් බවට පත් වීමට සිටින පුද්ගලයන්ගේ ජීවිතවල තිබෙන ප්‍රශ්න දෙස අවධානය යොමු නොකරන්න. ඔවුන්ට විය හැකිවන පුද්ගලයා දෙස බලන්න. ගෝලත්වය යනු එපීස 4 හි විස්තර කරන "ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම" වෙත ගෙන යන ක්‍රියාවලියයි. මුල් ගෝලයන් තුළ වුවාසේම විශ්වාසවන්ත මනුෂ්‍යයන් තුළ ද ජයගත යුතු ප්‍රශ්න හා දුර්වලතා තිබේ.

ලෝකය දක්ෂ පුද්ගලයන් තෝරාගෙන ඔවුන්ට චරිතයක් ලබා දීමට උත්සහ කරයි. ඔවුන් අවධානය යොමු කරන්නේ වෘත්තිකයන් නිර්මාණය කිරීම වෙතය. දෙවියන්වහන්සේ පැවසුවේ චරිතයෙන් විශ්වාසවන්ත මනුෂ්‍යයන් තෝරා ගන්න එවිට උන්වහන්සේ, ආත්මික තලෙන්ත හා හැකියාවන් තුළින් ඔවුන්ව බලගන්වන බවයි. විශ්වාසවන්ත මනුෂ්‍යයන් දෙවියන්වහන්සේගේ අරමුණ ඉටු කිරීමට සූදානමින් සිටියි. යේසුස්වහන්සේ සීමොන්ටත් ඇන්ඩෘටත් කතා කළ විට ඔවුහු "එකෙණෙහිම" තම දැල් අතහැර ගියෝය. "එකෙණෙහිම" යන වචනය ඔවුන් තුළ සූදානම එළිදරව් කරයි.

ඔබ ගෝලත්වය සඳහා පුරුෂයන් හා කාන්තාවන් තෝරාගන්නා විට, ඔවුන් එයට සූදානමින් සිටිය යුතුය. ගෝලත්වයට ඔවුන්ගේ ජීවිතයේ ප්‍රමුඛස්ථානය දීමට ඔවුන් කැමැත්තෙන් සිටිය යුතුය. විශ්වාසවන්ත මනුෂ්‍යයන් ආත්මික දර්ශනය විසින් පොලොඹවනු ලබයි. යේසුස්වහන්සේ පේතෘස්ටත් ඇන්ඩෘටත් මනුෂ්‍යයන් ඇල්ලීමේ දර්ශනය ලබා දුන් විට, තම දැල් අතහැර දැමීමට එය ඔවුන්ව පෙලඹවූහ. ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන්ට තිබූ ලෙසටම, විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට දේව වචනය උදෙසා ආශාවක් තිබේ. උන්වහන්සේ දේව වචනය බෙදා ගන්නා විට "ඔවුන්ගේ සිත් දැවී ගියහ" (ලූක් 24:32,45). ඔවුන් ඉගෙන ගැනීමට කැමැත්තෙන් හා මහත් ඕනෑකමකින් සිටියහ.

**2. ඇසුරු කිරීම:**

යේසුස්වහන්සේ තම ගෝලයන් කැඳවූ විට, උන්වහන්සේ ඔවුන් කැඳවූයේ "උන්වහන්සේ සමඟ සිටීමටය." උන්වහන්සේ තම ගෝලයන් සමඟ ඉතා කුළුපග ලෙස තම ජීවිතය බෙදාගත් සේක. විධිමත් ලෙස සේවය කළ අවස්ථාවලදි හා අවිධිමත් තත්වයන්වලදි උන්වහන්සේ ඔවුන් සමඟ කාලය ගත කළ සේක. කමිටු රැස්වීම් හා ඉරුදින නමස්කාර මෙහෙයන් තුළින් පමණක් ගෝලයන්

බිහි නොවේ. ඔබ ගෝලයන් බවට පත් කරන අය සමඟ සමීප ඇසුරක් පැවතිය යුතුය. ඔබ ඔබගේ ජීවිතය ඔවුන් සමඟ බෙදා ගත යුතුය.

### 3. කැපවීම:

යේසුස්වහන්සේ සමඟ ඇසුරුකිරීම තුළින්, පූජාවීම වර්ධනය විය. යේසුස්වහන්සේ තම ගෝලයන් කැඳවූයේ පුද්ගලයෙකු උදෙසා කැපවීමට මිස නිකායක් හෝ සංවිධානයක් උදෙසා කැපවීමට නොවේ.

දෙවියන්වහන්සේ වෙත වූ එවැනි කැපවීමකට උන්වහන්සේගේ වචනයට හා අරමුණුවලට මුළුමනින්ම කීකරු වීම අවශ්‍ය වේ. (යොහන් 4:34:5:30:15:10:17:4 හා ලූක් 22:42)

### 4. දර්ශනය:

තම අනුගාමිකයන්ට ආත්මික දර්ශනයක් ලබා දීමෙන් යේසුස්වහන්සේ ඔවුන්ව පෙලඹවූ සේක. සෑම දිනකම ජීවත්වීම උදෙසා වූ ජීවනෝපායට වඩා විශාල කාර්යයක් සඳහා උන්වහන්සේ ඔවුන් කැඳවූ සේක. උන්වහන්සේ තම අනුගාමිකයන් කැඳවූයේ මනුෂ්‍යයන් අල්ලන්නන් වීමටය (මතෙව් 4:19). ලෝකය පුරා විහිදුනු ආත්මික අස්වැන්නක් පිළිබඳ දර්ශනයක් උන්වහන්සේ ඔවුන්ට දුන් සේක (යොහන් 4:35). දේව රාජ්‍යය පිළිබඳ එළිදරව් කිරීමෙන් උන්වහන්සේ ඔවුන්ට අභියෝග කළ සේක (මතෙව් 13).

දර්ශනයක් නොමැති වූ විට, මනුෂ්‍යයන් විනාශ වේ (හිතෝපදේශ 29:18). ඔවුන්ට මඟපෙන්වීමක් හා පෙලඹවීමේ හේතුවක් නොමැත. සේවය සඳහා පෙලඹවීමට අවශ්‍ය ආත්මික දර්ශනය සන්නිවේදනය කිරීම ගෝලත්වය තුළ අන්තර්ගත විය යුතුය. දර්ශනය නම් දේව රාජ්‍යයේ ශුභාරංචිය තුළින් ලෝකය ජය ගැනීමයි. ඊට වඩා අඩු හේතුවක් නිසා කිසිදාක බාධාවන්නට ඉඩ නොදෙන්න.

### 5. උපදෙස් දීම:

යේසුස්වහන්සේ තම කාලයෙන් බොහෝ වේලාවක් ගත කළේ තම ගෝලයන්ට උපදෙස් දෙමිනි. උන්වහන්සේගේ උපදෙස් හැම විටම උන්වහන්සේ ඔවුන්ට දුන් ආත්මික දර්ශනයට සම්බන්ධ විය. යේසුස්වහන්සේගේ ක්‍රම අනුගමනය කරමින් ඔබ ගෝලයන් පුහුණු කරන්නේ නම්, ඔබ යේසුස්වහන්සේ ඉගැන්වූ දේවල් ඉගැන්විය යුතුය. මෙය මහා ආඥාවේ කොටසකි (මතෙව් 28:20). යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලට හා මුල් සභාව විසින් එම ඉගැන්වීම් ක්‍රියාවට නංවන විට එළිදරව් වූ දේවල්වලට මූලික අවධානය දිය යුතුය.

හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ විෂයන් තුළ ගෝලත්වය පිළිබඳ එවැනි පුහුණුවක් අන්තර්ගත වේ. මෙම පාඩමාලාවන් ඉගැන්වීම සඳහා තවත් දුරස්ථ මධ්‍යස්ථාන පිහිටුවීම හරහා ගුණනය වන්නේ කෙසේදැයි අවසාන පරිච්ඡේදයේදී ඔබ විසින් ඉගෙන ගනු ඇත. යේසුස්වහන්සේගේ ක්‍රම උපයෝගී කර ගනිමින් උගන්වන ආකාරය ඔබට පුහුණු කරන *“ඉගැන්වීමේ උපක්‍රම”* නැමති පාඩමාලාවක් ද හාවස්ට්ටයිම් ආයතනය ඉදිරිපත් කර තිබේ.

යේසුස්වහන්සේ ඉගැන්වූ දේවල් ඔබ උගන්වන විට, ඔබ විසින් දේව වචනයේ සම්පූර්ණ එළිදරව් වීම උගන්වනු ලබයි. මන්ද උන්වහන්සේගේ ඉගැන්වීම් පරණ ගිවිසුම මත පදනම් විය. යේසුස්වහන්සේ මෙසේ කී සේක :

> **... මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියන ලද සියල්ල සම්පූර්ණ විය යුතුයැයි මා නුඹලා සමඟ සිටියදීම නුඹලාට කී වචන මේය...**
> **... මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිද මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ටත් පසුතැවිල්ල හා පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයැයි ලියා තිබේ. (ලූක් 24:44,46-47)**

**6. ආදර්ශයෙන් පෙන්වීම:**

යේසුස්වහන්සේ වාචික අවවාද තුළින් ඉගැන්වුවා පමණක් නොවේ. උන්වහන්සේ ඉගැන්වූ දෙය උන්වහන්සේ ආදර්ශයෙන් දැක්වූ සේක. උන්වහන්සේ සුවකිරීම ගැන ඉගැන්වූ අතර රෝගීන් සුවකිරීමේන් එය ආදර්ශයෙන් දැක්වූ සේක. සාතන්ට එරෙහිව ඇදහිලිවන්තයෙකුට ඇති ආධිපත්‍ය ගැන උන්වහන්සේ ඉගැන්වූ අතර යක්ෂයන් දුරු කිරීමෙන් එය ආදර්ශයෙන් පෙන්වූ සේක. උන්වහන්සේ දිළිඳුන් ගැන සැළකිම පිළිබඳව ඉගැන්වූ අතර සමූහයාට කන්න දිමෙන් එය ආදර්ශයෙන් දැක්වූ සේක.

ගෝලයන් ශිෂ්‍යයන් පමණක් නොව, දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය වන ආකාරය ඇසින් දුටු සාක්ෂිකරුවන් ද විය. ඔවුන් විසින් උගන්වනුයේ, "ඇසින් දුටු සාක්ෂිකරුවන්" ලෙස "අප විසින් අසා තිබෙන්නාවූ, අපේ ඇස්වලින් දැක තිබෙන්නාවූ," දේවල් බව ඔවුහු පසුව පැවසූහ. (1 යොහන් 1:1)

යේසුස්වහන්සේ උදාහරණ තුළින් ඉගැන්වූ සේක. උන්වහන්සේ ජිවත් වූ හා සේවය කළ ආකාරය තුළින් උන්වහන්සේ ඉගැන්වූ දේවල් ආදර්ශයෙන් දැක්වූ සේක. උන්වහන්සේ මෙසේ කී සේක :

> **මක්නිසාද මා නුඹලාට කළ ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි. (යොහාන් 13:15)**

දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම මනුෂ්‍යයන් ඔබේ පණිවුඩයට සවන් දිමට සළස්වයි:

> **සමූහයෝ ඇහුම්කන්දි, පිලිප් කළ ආශ්වර්යයන් දුටු කළ, ඔහු කී කරුණු එක්සිත්ව සැලකූවෝය. (ක්‍රියා 8:6)**

පාවුල් ශුභාරංචියේ සත්‍යතාවය ගැන පමණක් නොව (ගලාති 2:5) ශුභාරංචියේ බලය ගැන ද කතා කළේය (රෝම 1:16). ඔහු ශුභාරංචිය ප්‍රකාශ කළා පමණක් නොව එය ප්‍රදර්ශනය කිරීමද සිදු කළේය (1 කොරින්ති 2:1,4).

ගුණනය වීමේ ක්‍රියාවලිය තුළ බලය ප්‍රදර්ශනය කිරීමේ වැදගත්කම හේතුවෙන්, මෙම විෂය උදෙසා වෙන්වූ *"බලය පිළිබඳ මූලධර්ම"* නැමැති පාඨමාලාවක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සතුව ඇත.

**7. සහභාගිවීම:**

හුදු දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. බලපෑමක් ඇති කිරීමට නම් දැනුම අදාළ කර ගත යුතුය. ක්‍රියා කිරීම සඳහා කාලයක් පැමිණේ. ගෝලයන් යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලට සවන් දෙමින් බලය ප්‍රකාශ කළ ආකාරය නිරීක්ෂණය කරමින් සිටියා පමණක් නොව, ඔවුන් ද එයට සහභාගි විය.

විෂයක් ඉගැන්වීමේදී එය ඉගෙන ගත් බව පමණක් සහතිකව දැනගැනීම ප්‍රමාණවත් නොවේ. ඉගැන්වීම පමණක් සිදු කිරීම පොතක් කියවීමෙන් මොළයේ සැත්කමක් කිරීමට උත්සාහ කිරීම හා සමානය.

තමන් ඉගෙන ගන්නා දේවල් සම්බන්ධව ගෝලයන්ට සැබෑ අද්දැකීමක් ලැබිය යුතුය. ශුභාරංචිය බෙදා ගන්නා ආකාරය, රෝගීන්ට යාච්ඤා කරන ආකාරය, යක්ෂයන් පළවා හරින ආකාරය හා වෙනත් දේ පිළිබඳව ඔවුන්ට අත්දැකීම් ලැබිය යුතුය. යේසුස්වහන්සේ තම ගෝලයන්ට එබඳු අවස්ථාවන් ලබා දුන් සේක. මාර්ක් 6:7-13 හා ලූක් 9:1-6 කියවන්න. උගන්වනු ලැබූ දේවල් පිළිබඳ අත්දැකීම් ලැබීමට යේසුස්වහන්සේ තම ගෝලයන් පිටත් කර හැරිය සේක. ඔබේ ගෝලයන් වචනය අසන්නන් පමණක් නොවී එය ක්‍රියාත්මක කරන්නන් වන බවට සහතික වන්න.

**8. අධීක්ෂණය:**

යේසුස්වහන්සේගේ ගෝලයන් තම සේවය පිළිබඳ ගමන් නිම කර පැමිණි විට යේසුස්වහන්සේ ඔවුන් ගත් උත්සාහයන් තක්සේරු කර බැලූ සේක (ලූක් 9:10). සමස්ථ පුහුණු කිරීමේ ක්‍රියාවලිය තුළදී යේසුස්වහන්සේ තම ගෝලයන්ව අධීක්ෂණය කළ සේක. ඔවුන්ගේ පොර බැදීම්වලදී ඔවුන්

තනිවී නොසිටියහ. ඔවුන්ව නිවැරදි කිරීමට, තරවටු කිරීමට හා ධෛර්වත් කිරීමට උන්වහන්සේ ඔවුන් සමග සිටිසේක.

සේවය කිරීමට කැමැත්තෙන් සිටින පුද්ගලයෙකුට එය කළ යුතු ආකාරය ඔබ විසින් උගන්වා ඇති බැවින් හා දිදුළන බලාපොරොත්තු සහිතව ඔහු පිටත් කර ඇති බැවින් පමණක්ම එම කාර්යය ඉටුවන ඇතැයි ඔබට උපකල්පනය කළ නොහැකිය. ඔබ අධීක්ෂණය කළ යුතුය. ගෝලයන් ව්‍යාකූලතාවන්ට හා බාධාවන්ට මුහුණ දෙන විට, මෙම අභියෝගවලට මුහුණ දිය යුතු ආකාරය ඔබ ඔවුන්ට ඉගැන්විය යුතුය.

අධීක්ෂණය ඇතම් විට "වැඩිදුර ඉගැන්වීම්" ලෙස හැඳින්වේ. තම ගෝලත්වය "වැඩිදුර ඉගැන්වීම්" සඳහා පාවුල් ඔවුන්ව අධීක්ෂණය කළේය.

> **ඔහු එහි කලක් පසුකොට පිටත්ව පිළිවෙළින් ගලාතියේ සහ පිරිගියේ පළාත මැදින් ගොස් සියලු ගෝලයන් ස්ථිර කළේය. (ක්‍රියා 18:23)**

> **අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යට බෝහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනැයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:22)**

**9. පවරා දීම:**

ගෝලත්වයේ අවසාන අදියරය වූයේ යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට ගෝලයන් බිහිකරන්නන් වීමට බලය පවරා දීමයි. ලෝකයේ ජාතීන් පුරා ආත්මිකව ගුණනය වීමේ කාර්යය උන්වහන්සේ ඔවුන්ට දුන් සේක.

## සැබෑ ගෝලයෙකුගේ චරිත ලක්ෂණ

ශුද්ධාත්මයාණන්ගේ ඵල තම ජිවිතය තුළින් ප්‍රකාශ වීමෙන් හා තම සේවයන් තුළ ආත්මික දීමනා ක්‍රියාත්මක වීමෙන් යේසුස්වහන්සේගේ ගෝලයන් පරිණත අදහිලිවන්තයන් බවට පත්විය යුතුය.

දෙවියන්වහන්සේගේ වචනය තුළින් එළිදරව් වන සියලුම දේවල් සළකා බැලූවිට යේසුස්වහන්සේගේ සැබෑ ගෝලයෙකුගේ චරිත ලක්ෂණ බොහොමයක් තිබේ, නමුත් යේසුස්වහන්සේ විශේෂිත චරිත ලක්ෂණ නවයක් ඉස්මතු කර දැක්වූ සේක. ගෝලයෙකු විසින් :

### 1. සියල්ල අතහැර දමයි:

යේසුස්වහන්සේ අනුගමනය කිරීමට ඔහු සියලුම දේවල් අතහැර දමයි.

> **එසේම නුඹලා අතරෙහි තමා සන්තක සියල්ලම අත්නාරින කවරෙකුටවත් මාගේ ගෝලයා වන්ට බැරිය. (ලූක් 14:33)**

### 2. තමකම නසයි:

ගෝලත්වය නැමති කුරුසිය ස්වෙච්ඡාවෙන් දැරීමෙන් සැබෑ ගෝලයෙකු තමකම නැසිය යුතුය:

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

> **තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලූක් 14:27)**

### 3. යේසුස්වහන්සේ අනුගමනය කරයි :

> **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

## 4. දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ප්‍රමුඛතාවය ලබා දෙයි :

**එහෙයින් කුමක් කමුද කුමක් බොමුද කුමක් අඳිමුද කියමින් කනස්සලු නොවන්න (මතෙව් 6:31).**

**නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න: මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33).**

## 5. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රදර්ශනය කරයි :

**මා නුඹලාට ප්‍රේමකළාක් මෙන් නුඹලා එකිනෙකාට ප්‍රේමකරන ලෙස, එකිනෙකාට ප්‍රේමකරන්නය කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි නුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම්, නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලත් දැනගන්නවා ඇතැයි කීසේක. (යොහන් 13:34-35)**

## 6. වචනය තුළ පවති :

**... නුඹලා මාගේ වචනයෙහි පවතිනවා නම්, සැබැවටම නුඹලා මාගේ ගෝලයෝය. (යොහන් 8:31)**

"පැවතිම" යන වචනයේ අර්ථය රැඳී සිටීම හෝ දිගටම රැඳීමයි. ගෝලයකු දේව වචනයේ සත්‍යතාවන් ඉගෙන ගැනීමේ හා අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේ දිගටම නිරත වෙමින් සිටී.

## 7. කීකරු වේ :

වචනය තුළ පැවතිම ඉගෙන ගැනීමට වඩා වැඩි දෙයකි. එය නම් ඉගෙන ගත් දෙය මත ක්‍රියා කිරීමය. එය කීකරුකමයි. වචනය කියවා, අධ්‍යයනය කර කට පාඩම් කිරීම ප්‍රමාණවත් නොවේ. එය ජීවන රටාවක් බවට පරිවර්ථනය කරගත යුතුය. පැවතිම තුළ කීකරු වීම ද අන්තර්ගත වේ.

## 8. සේවකයෙකු වේ :

**ගෝලයෙක් තමාගේ ගුරුවරයාටවත් දාසයෙක් තමාගේ ස්වාමියාට වත් උතුම් නැත. (මතෙව් 10:24)**

**නුඹලා අතරේ එසේ නොවන්නේය. නුඹලා අතරේ යමෙක් උතුම්වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ යමෙක් ප්‍රධානියා වෙන්ට කැමති නම් ඔහු නුඹලාගේ දාසයා වන්නේය. එසේම මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලයක් කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආවේ යැයි කීසේක." (මතෙව් 20:26-28)**

## 9. ඵලදැරීම තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි :

ගෝලයකු ඵල දැරීම තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත් කළ යුතුය:

**මාගේ පියාණන්වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දැරීමෙන්ය: මෙසේ නුඹලා මාගේ ගෝලයෝ වන්නෝය. (යොහන් 15:8)**

ඔබ ආත්මික ඵල දරන විට, ඔබ ඔබේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්ගේ බලය වර්ධනය කරයි (ගලාති 5:20-23). ආත්මිකව තමන් වැනි අය බිහිකිරීම තුළින් ද ඔබ ඵල දරයි (යොහන් 15:1-16).

## ගෝලත්වය පිළිබඳ සැබෑ පරීක්ෂණය

ගෝලත්වය පිළිබඳ සැබෑ පරීක්ෂණය නම් ඔබ ගෝලයන් ලෙස පුහුණු කළ අය සමඟ ඔබ නොසිටින විට සිදු වන දේය. ඔවුන් තවදුරටත් ඔබ ඔවුන්ට ඉගැන්වූ දේවල්වලට විශ්වාසවන්තව සිටීද? ගුණනය වීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමේ හැකියාව ඇති අයට ඔවුන් උගන්වන වාද? එය එසේ නම්, ඔබේ ගෝලත්ව ක්‍රියාවලිය සාර්ථකය :

> **ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නුමුත් සම්පූර්ණත්වයට පැමිණි සැමදෙනම තමුන්ගේ ගුරුවරයා මෙන් වන්නෝය. (ලූක් 6:40)**

ඔබ අන් අයව පුහුණු කරන විට, යේසුස්වහන්සේ මුහුණ දුන් ආකාරයේ ප්‍රශ්න බලාපොරොත්තු වන්න...

- එක් අවස්ථාවකදී, ප්‍රතිචාර නොදක්වන සමාරිය ගම්මානයක් විනාශ කර දැමීමට අහසින් ගිනි බැස්සවිය යුතු බව පවසමින් පේතෘස්, යාකොබ් හා යොහන් වෛරය මුසු වූ ආකල්පයක් පෙන්නුම් කළහ (ලූක් 9:51-55).

- පේතෘස් තුන්වතාවක් ස්වාමින්වහන්සේ පාවා දුන්නේය. (ලූක් 22:54-62)

- යාච්ඤා කරන ලෙස පැවසූ විට ගෙත්සෙමනේ උයනේදී තිදෙනාම නිදා ගෙන සිටියෝය (ලූක් 22:45-46).

නමුත් මේ මනුෂ්‍යයන් අතලොස්ස යේසුස්වහන්සේගේ කාලය හා සේවය ඔවුන් වෙනුවෙන් ආයෝජනය කරනු ලැබීමට වටිය. ඔවුන්ගේ දොස් හා අසමර්තවීම් මාධ්‍යයේ විශ්වාසවන්ත මනුෂ්‍යයන් බව ඔප්පු කළහ. යේසුස්වහන්සේගේ ඔවුන් සමඟ තවදුරටත් නොසිටියදී ලෝකයේ ජාතීන් වෙත ගුණනය වීමේ ක්‍රියාවලිය ඔවුන් දිගටම කරගෙන ගියහ. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක:

> **එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කථාකොට: ගොයම නම් බොහෝය, නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. (මතෙව් 9:37)**

ගොවීන් ...... ආත්මික අස්වැන්න නෙලීමේ හැකියාව ඇති පුරුෂයන් හා ස්ත්‍රීන්... තවමත් විරලය. එම සුළු පිරිසෙන් කොටසක් වීමට ඔබේ ජීවිතය දීමට ඔබ කැමතිද?

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "දෙවියන්වහන්සේ වෙතට හැරීම" යන වචනයේ අර්ථය කුමක්ද?

3. "ගෝලයා" යන්න නිර්වචනය කරන්න.

4. ගෝලත්වය උදෙසා වූ කැඳවීමේ වැදගත් අංශ තුනක් සාරාංශ කරන්න.

5. යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් පිළිබඳ අධ්‍යනයේදි ගෝලත්වය පිළිබඳ සාකච්ඡා වූ වැදගත් මූලධර්ම නවයක් ලැයිස්තු ගත කරන්න.

6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ගෝලයකුගේ චරිත ලක්ෂණ නවයක් ලැයිස්තු ගත කරන්න.

7. ගෝලත්වය පිළිබඳ සැබෑ පරීක්ෂණය කුමක්ද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා

1. "ගෝලත්වය" යන්න "රැකබලාගැනීම" ලෙසද හඳුන්වයි. එම පදය පැමිණ ඇත්තේ එඬේරෙකු තම බැටළුවන් රැකබලා ගන්නා ආකාරය පිළිබඳ බයිබලිය උදාහරණයෙනි.

   - දෙවියන්වහන්සේ එඬේරෙකුට උපමා කර තිබේ: හෙබ්‍රෙව් 13:20; ගීතාවලිය 80:1-2; එසකියෙල් 34:11.

   - යේසුස්වහන්සේ එඬේරෙකුට උපමා කර තිබේ: යොහන් 10:11-18.

   එඬේරෙකු යනු බැටළුවන් මඟපෙන්වන්නා, රැකබලා ගන්නා හා ආරක්ෂා කරන්නාය. ඔහු ඔවුන්ව අනතුරුවලින් මුඳාගෙන, ඔවුන්ගේ තුවාළ බැඳ, ඔවුන්ට ප්‍රේම කර, ඔවුන්ව පෝෂණය කරයි. එඬේරෙකුගේ මෙම යුතුකම් පිළිබඳව හා ඔබ ගෝලයන් ලෙස පුහුණු කරන අය ගැන සැළකිම සම්බන්ධයෙන් ඒවා අදාළ වන ආකාරය පිළිබඳව සිතා බලන්න. පහත බයිබල් පද කියවන්න: මතෙව් 9:36-38; මාර්ක් 3:14-15; යොහන් 21:15-17; ක්‍රියා 20:28.

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත නැවත දුන් කැඳවීම අනුගමනය කිරීම උදෙසා වු කැඳවීමක් විය. "පසු පස එන්න." "මා අනුව එන්න" "මා පසුපස එන්න" යන වචන යේසුස්වහන්සේ විසින් 20 වතාවකට වඩා පාවිච්චි කර තිබේ. පහත පුද්ගලයන්ට එසේ පවසා ඇත.

   සිමොන් සහ ඇන්ඩෘ : මතෙව් 4:19; මාර්ක් 1:17
   යාකොබ් හා යොහන් : මතෙව් 4:21; මාර්ක් 1:20
   මතෙව් : මතෙව් 9:9; මාර්ක් 2:14; ලුක් 5:27
   පිලිප් : යොහන් 1:43
   පේතෘස් : යොහන් 21:19, 22
   ධනවත් තරුණයා : මතෙව් 19:21; මාර්ක් 10:21; ලුක් 18:22
   උන්වහන්සේගේ තවත් ගෝලයකු : මතෙව් 8:22
   ඕනෑම මනුෂ්‍යයෙකු : මතෙව් 16:24; මාර්ක් 8:34; ලුක් 9:23; යොහන් 12:26

   පාවුල් තමන් යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු බව පවසමින් කොරින්තියේ වැසියන්ට තමන්ව අනුගමනය කරන ලෙස පවසය (1 කොරින්ති 11:1). එපීස වැසියන්ට (එපීස 5:1); පිලිප්පියේ වැසියන්ට (පිලිප්පි 3:17) හා තෙසලෝනිකයේ වැසියන්ට (1 තෙසලෝනික 1:6) ඒ සමාන උපදෙස් ලැබෙයි.

3. "ගෝලයා" යන වචනය පරණ ගිවිසුම තුළ භාවිත නොවිය, නමුත් ගෝලත්වය පිළිබද මුලධර්මය ඒ තුළ පෙනෙන්නට තිබේ:

   යොෂුවා මෝසෙස්ගේ ගෝලයෙකු විය: ද්විතීය කථාව 3:28
   එලිෂා එලියාගේ ගෝලයෙකු විය: 2 රාජාවලිය 2
   ප්‍රෝපේතවරුන්ගේ ගුරුකුලයක් ගෝලයන් පුහුණු කළහ: 2 රාජාවලිය 2:4

4. ප්‍රේරිත පාවුල් තම ගෝලයන්ට තවදුරටත් ඉගැන්වු අයුරු සළකා බලන්න:

   ලිපි මගින් : 1 තෙසලෝනික 1:1
   යාච්ඥාවෙන් : 1 තෙසලෝනික 1:2, 3:10
   නියෝජිතයන් යැවීම මගින් : 1 තෙසලෝනික 3:1-5
   පෞද්ගලික සම්බන්ධතා මගින් : 1 තෙසලෝනික 2:18

5. ප්‍රේරිත පාවුල් විශ්වාසවන්ත පුරුෂයන් හා ස්ත්‍රීන් පුහුණු කිරීමෙහි තම ජිවිතය ආයෝජනය කළේය. පාවුල්ගේ සේවය හා සම්බන්ධ නම් 125 ක් බයිබලය තුළ වාර්තා වේ. ඔහුගේ අනුගාමිකයන් වෙත අවධානය යොමු කරන පහත බයිබල් පද අධ්‍යනය කිරීමෙන් ගෝලත්වය ගැන තවත් දේවල් ඉගෙන ගන්න:

අපෝල්ලොස් : ක්‍රියා 18:24-28; 19:1; 1 කෙරින්ති 1:12; 3:4-6,22; 4:6; 16:12; තීතස් 3:13

අකිලා සහ ප්‍රිස්කිලා : ක්‍රියා 18:1-3,18-19,26; රෝම 16:3-5; 1 කොරින්ති 16:19; 2 තිමෝති 4:19

බාර්ණබස් : ක්‍රියා 4:36-37; 11:22-30; 13:1-14:28; 15:1-40; 1 කොරින්ති 9:6; ගලාති 2:1,9,13; කොලොස්සි 4:10

ලූක් : ලූක් 1:1-4; ක්‍රියා 1:1; 16:10-18; 20:5-21; 18; 27:1-28:16; කොලොස්සි 4:14; පිලමොන් 24; 2 තිමෝති 4:11

මාර්ක් : ක්‍රියා 12:12, 25; 13:5, 13: 15:36-39; කොලොස්සි 4:10; 2 තිමෝති 4:11; පිලමොන් 24; 1 පේතෘස් 5:13

සිලස් : ක්‍රියා 15:22,27,32-34,40-41; 18:5, 17:15; 2 කොරින්ති 1:19; 1 තෙසලෝනික 1:1; 2 තෙසලෝනික 1:1; 1 පේතෘස් 5:12

පිලෙමොන් : පිලෙමොන් 1-25

පේබී : රෝම 16:1-2

ස්තේපනස් : 1 කොරින්ති 1:16; 16:15-18

ත්‍රොපිමස් : ක්‍රියා 20:4; 21:29; 2 තිමෝති 4:20

තුඛිකස් : ක්‍රියා 20:4; කොලොස්සි 4:7-8; 2 තිමෝති 4:12; එපීස 6:21-22; තීතස් 3:12

ඔනේසිමස් : කොලොස්සි 4:9; පිලමොන් 10-21

ලිදියා : ක්‍රියා 16:13-15, 40

ගායස් : ක්‍රියා 19:29; 20:4; රෝම 16:23; 1 කොරින්ති 1:14

එවෝදියා සහ සින්තකි : පිලිප්පි 4:2-3

එරස්තස් :ක්‍රියා 19:22; රෝම 16:23; 2 තිමෝති 4:20

එපප්‍රොදිතස් : පිලිප්පි 2:25-30; 4:18

එපප්‍රස් : කොලොස්සි 1:7-8; 4:12-13; පිලෙමොන් 23

දේමස් : කොලොස්සි 4:14; පිලෙමොන් 23-24; 2 තිමෝති 4:10

අරිස්තාර්කස් : ක්‍රියා 19:29; 20:4; 27:2; කොලොස්සි 4:10; පිලෙමොන් 24

අන්ද්‍රෝනිකස් හා යුනියස් :රෝම 16:7

අනනියස් : ක්‍රියා 9:10-19; 22:12-16

තීතස් : 2 කොරින්ති 2:12-13; 7:6-7; 13-14; 8:6; 16-17;23; 12:17-18; ගලාති 2:1-3; තීතස් 1:5; 2 තිමෝති 4:10

තිමෝති : ක්‍රියා 16:1-3; 17:14-15; 18:5; 19:22; 20:4; රෝම 16:21; 1 කොරින්ති 4:17; 16:10-11; 2 කොරින්ති 1:1; 19; පිලිප්පි 1:1; 2:19-23; කොලොස්සි 1:1; 1 තෙසලෝනික 1:1; 3:2; 6; 2 තෙසලෝනික 1:1; 1 තිමෝති 1:2; 18; 6:20; 2 තිමෝති 1:2; 4:9; 21; පිලමොන් 1; හෙබ්‍රෙව් 13:23

6. ගෝලයන්ට පාවුල් තම අනුගාමිකයන් හැඳින්වීමට යොදා ගත් වචන ගෝලත්වයේ ඇතැම් යුතුකම් එළිදරව් කරයි :

| | |
|---|---|
| වැඩකරන්නන් : | පිලිප්පි 4:3; පිලමොන් 24; 1 තෙසලෝනික 3:2 |
| උදව්කරුවන් : | 2 කොරින්ති 8:23 |
| වැඩකාරයන් : | රෝම 16:3; 9; 21; පිලිප්පි 2:25; කොලොස්සි 4:11 |
| භේවායා : | පිලිප්පි 2:25 |
| දාසයා/සේවකයා : | කොලොස්සි 1:7; 4:7 |
| හිරකාරයා : | රෝම 16:17; පිලමොන් 23; කොලොස්සි 4:10 |
| පුත්‍රයා : | 1 කොරින්ති 4:17; 1 පේතෘස් 5:13 |
| සේවකයා/ දාසයා : | පිලිප්පි 1:1 |
| සහෝදරයා : | 2 කොරින්ති 1:1 |

7. ගෝලත්වය සඳහා ඇතැම්විට ඉහළ මිළයක් ගෙවිය යුතුය. ශුභාරංචිය උදෙසා මිස ගිය ඇතැම් මුල් ගෝලයන්ගේ මරණය සළකා බලන්න.

මතෙව් ඉතියෝපියාවේදි කඩුවෙන් ජිවිත පරිත්‍යාග කළේය.

නගරයේ වීථි හරහා ඇදගෙන යනු ලැබීමෙන් පසුව මාර්ක් ඇලැක්සැන්ඩ්‍රියාවේදි මිය ගියේය.

ලූක්ව ග්‍රිසියේ ඔලිව් ගසක එල්ලනු ලැබීය.

යොහන්ව උතුරන තෙල් කටාරමකට දමනු ලැබූ නමුත් ඔහු එයින් දිවි ගලවාගනු ලදුව පැත්මොස් දිවයිනට පිටුවහල් කරන ලදි.

හිස පහතට සිටින ලෙස පේතෘස්ව රෝමයේදි කුරුසපත් කරන ලදි.

යාකොබ්ව යෙරුසලමේදි හිසගසා දමනු ලැබීය.

යාකොබ්ව දේවමාලිගයේ මුදුනේ සිට පහළට දමනු ලැබ පහළ සිටි මිනිසුන් විසින් මිය යන තුරු පහර දෙන ලදි.

පිලිප්ව පර්ගියාවේදි එල්ලා මරන ලදි.

බර්තොලමෙවුස්ට මිය යන තුරු පහර දෙන ලදි.

අන්ඩෘව කුරුසියකට තබා බදිනු ලැබූ අතර එහිදි ඔහු තම මරණය දක්වා තමන්ව මැරූ පුද්ගලයන්ට දේශනා කළහ.

තෝමස්ට ඉන්දියාවේදි කඩුවෙන් අනිනු ලැබීය.

ජුද්ව ඊතලවලින් ඇන මරා දමනු ලැබීය.

මත්තියස්ට මුලින් ගල් ගසා පසුව හිසගසා දමන ලදි.

සැලෝනිකයේ යුදෙව්වන් විසින් බාර්ණබස්ට මිය යන තුරු ගල් ගසන ලදි.

පාවුල්ව රෝමයේදි නිරෝ විසින් හිසගසා දමන ලදි.

8. ගෝලත්වය පිළිබඳව තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා පහත සටහන පාවිච්චි කරන්න.

## ශුභාරංචි පොත් තුළ දක්වන ගෝලත්වය

ගෝලත්වයට ප්‍රමුඛතාව දිය යුතුය : ලූක් 9:57-62

යේසුස්වහන්සේ ගිය ඕනෑම ස්ථානයකදී ගෝලයෝ උන්වහන්සේ අනුව ගියෝය: මතෙව් 8:23; 9:19; මාර්ක් 6:1; 8:10; 10:46; ලූක් 22:39; යොහන් 1:37; 3:22; 6:3; 11:7, 54; යොහන් 18:1-2.
යේසුස්වහන්සේ තම ගෝලයන්ට සාතන්ට එරෙහිව ආධිපත්‍ය දුන් සේක: මතෙව් 10:1; ලූක් 9:1.

ගෝලයෝ සේවකයෝ විය යුතු විය: මතෙව් 10:24; ලූක් 6:40; යොහන් 13:5-17.

යේසුස්වහන්සේ ගෝලයන්ව සම්පූර්ණ කැපවීමකට කැඳවූ සේක : මතෙව් 16:24; මාර්ක් 8:34; ලූක් 14:26-33; යොහන් 1:20-23.

ගෝලයෝ යේසුස්වහන්සේට පවුලක් වැනි විය: මතෙව් 12:49; යොහන් 2:12; 19:26-27.

යේසුස්වහන්සේ හා ගෝලයන් සාමාජිය සහභාගිත්ව කාලයක් එකට භුක්තිවින්දහ : යොහන් 2:2

යේසුස්වහන්සේ ඔවුන් සමඟ ආහාර බෙදා ගත් සේක : මාර්ක් 2:15; යොහන් 4:31-33

ගෝලයෝ යේසුස්වහන්සේ තමන්ට අණ කළ දේ කළහ : මතෙව් 14:19,22; 15:36; 21:1; 6; 24:3; 26:19; මාර්ක් 6:41,45; 11:1; යොහන් 6:12

ගෝලයෝ තම ගැටලු හා ප්‍රශ්න රැගෙන යේසුස්වහන්සේ වෙතට පැමිණියහ : මතෙව් 14:15; 15:12,33; 17:19; මාර්ක් 5:31, 8:4; 9:28; යොහන් 9:2

ගෝලයෝ වැරදි දේ කරන විට යේසුස්වහන්සේ ඔවුන්ව නිවැරදි කළ සේක : මතෙව් 19:13-15; 26:8-13; මාර්ක් 8:23; 10:13-16; ලූක් 9:40-42; 9:54; යොහන් 6:61

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ බලය ගෝලයන්ට ප්‍රදර්ශනය කළ සේක : ලූක් 19:37; යොහන් 2: 11; 20:30

ගෝලත්වය සඳහා දේව වචනයට කිකරුකම අවශ්‍ය වේ : යොහන් 8:31

ගෝලත්වය සඳහා ප්‍රේමය අවශ්‍ය වේ : යොහන් 13:35

ගෝලත්වය සඳහා ඵල දැරීම අවශ්‍ය වේ : යොහන් 15:8

යේසුස්වහන්සේ තම උත්ථානය පිළිබඳ විශේෂ වචනය තම ගෝලයන්ට යැවූ අතර උන්වහන්සේ ඔවුන්ට දර්ශනය වූ සේක : මතෙව් 28:7-8; මාර්ක් 16:7; යොහන් 20-21

යේසුස්වහන්සේගේ ජීවිතයේ අසීරු අවස්ථාවේදී ගෝලයන් උන්වහන්සේ අතහැර ගියෝය: මතෙව් 26:36-45; මාර්ක් 14:32-42; ලූක් 22:45; යොහන් 18: 17,25.

පසුව, ඔවුන් විශ්වාසවන්ත මනුෂ්‍යයන් බව ඔප්පු කළහ : මතෙව් 28:16

උපදෙස් දීම, එළිදරව් කිරීම, යාච්ඤාව හා විවේක ගැනීම වැනි විශේෂ කාලයක් සඳහා යේසුස්වහන්සේ තම ගෝලයන්ව වෙන්ව ගෙන ගිය සේක : මාර්ක් 3:7; 4:34; 7:17; 10:10;

12:43; මතෙව් 11:1; 13:30,36; 16:13,21; මාර්ක් 4:34; 7:17; 9:31; 10:23-24; ලූක් 6:20-49; 9:18; 10:23; 11:1; 16:1; 17:1,22; 20:45; යොහන් 2:22; 16:29.

## ක්‍රියා පොතෙහි සඳහන් ගෝලත්වය

ගෝලයන්ට උපදෙස් දි තිබූ පරිදි ඔවුහු ගුණනය වූහ : ක්‍රියා 6:1,7.
ගෝලයන්ට වෙනස් වගකීම් විය. ඇතැම් අය මෙහෙකිරීමේ සේවයන්හි නිරත විය. අන් අය (නායකයන්) දේව වචනය අධ්‍යනයට හා යාච්ඤාවට කාලය යෙදවිය. සියලු දෙනාම ආත්මිකව තමන් වැනි අය බිහි කළහ: ක්‍රියා 6.

ගෝලයෝ පීඩාවන් අත්දුටුවහුය : ක්‍රියා 9:1.

පුරුෂයන් මෙන්ම කාන්තාවන්ද ගෝලයෝ විය : ක්‍රියා 9:36.

ගෝලයෝ එකිනෙකා සමඟ ද්‍රව්‍යමය දේවල් බෙදා ගත්හ : ක්‍රියා 4:11; 29

ගෝලයෝ ශුද්ධාත්මයෙන් පූර්ණ වූ, ප්‍රීතිමත් සෙනඟක් විය : ක්‍රියා 13:52

ගෝලයන්ව ශක්තිමත් කරමින් ස්ථිර කිරීමට පාවුල් ප්‍රමුඛතාව දුන්නේය : ක්‍රියා 14:22; 18:23.

විශේෂ පුහුණුවක් ලැබීමට පාවුල් ගෝලයන්ව සමූහයන්ගෙන් වෙන් කළේය : ක්‍රියා 19:9

ගෝලයෝ එකිනෙකාට තම ප්‍රේමය දැක්වූහ : ක්‍රියා 20:1

අන් අය විසින් යේසුස්වහන්සේ වෙත වූ සැබෑ ගෝලත්වයෙන් ඔවුන්ව ඉවතට ගත හැකි බවට ගෝලයන්ට අනතුරු ඇඟවනු ලැබීය : ක්‍රියා 20:30

ක්‍රියා පොතෙහි ගෝලත්වය පිළිබඳ ඇති විවිධ සඳහන් කිරීම් අතරට : ක්‍රියා 9:10,19,25-26,38; 14:20,28; 15:10; 16:1; 18:27; 19:1,30; 21:4,16; ඇතුළත් වේ.

# එකළොස්වන පරිච්ඡේදය

## ඇන හිටින ලද වර්ධනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය කිරීම තුළින් ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- "ඇන සිටින ලද" වර්ධනය යන්න නිර්වචනය කිරීමට,
- ආත්මික වර්ධනයට හා ගුණනය වීමට බාධා කරන කරුණු හඳුනා ගැනීමට,
- එවැනි ප්‍රශ්න නිවැරදි කර ගැනීමට බයිබලීය ප්‍රතිකර්ම සැපයීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදයන් :**

> **දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ උන්වහන්සේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහිකරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය. ඔහු දිය ඇළවල් ළඟ හිඳවූ නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය. ඔහු කරන සියල්ල සඵලවෙයි. (ගීතාවලිය 1:1-3)**

### හැඳින්වීම

මනුෂ්‍ය ශරීරයේ සාමාන්‍ය වර්ධනයට හා සංවර්ධනයට බලපාන කරුණු රැසක් තිබේ. නිසි ආහාර නොලැබීම භෞතික වර්ධනය ප්‍රමාද කරයි. විවිධ ලෙඩ රෝග ද වර්ධනයට බලපෑම් ඇති කරයි. මනුෂ්‍ය ශරීරය තුළ වර්ධනය මඳ බවක් පෙනෙන විට එම ප්‍රශ්නය නිවැරදි කිරීමට ප්‍රතිකර්මයක් සොයාගත යුතුය. නොඑසේ නම් වර්ධනය ඇන සිටිනු ඇත. වර්ධනය ඇන සිටිය විට ශරීරය නිසි පරිදි සංවර්ධනය නොවේ.

ඔබ ඉගෙන ගෙන ඇති ආකාරයට බයිබලය තුළ සභාව භෞතික ශරීරයකට උපමා කර ඇත. භෞතික ශරීරය තුළ මෙන්ම එහි වර්ධනයට හා සංවර්ධනයට ද විවිධ කරුණුවලින් බලපෑම් ඇති වේ. ඇතැම් විට සභාව තුළ ප්‍රශ්න ඇතිවේ. මෙම ප්‍රශ්නවලට ආත්මික වර්ධනය නතර කළ හැකිය. ආත්මික වර්ධනය නතර වූ විට සභාව නිසි ලෙස ගුණනය නොවේ. තම ඇදහිලිවන්තයන්ගේ හා ගෝලයන්ගේ ප්‍රමාණය අඩු වන අතර ආත්මික පරිණතභාවය නැති වේ.

" මම සභාව ගොඩනගම්" යි යේසුස්වහන්සේ පැවසූ සේක. අපට අපගේම ශක්තියෙන් ගුණනය වීම ඇති කළ නොහැක. නමුත් වර්ධනයට වළක්වාලන තත්වයන් අපට ඉවත් කළ හැකිය. අප එසේ කරන විට වර්ධනය සිදු විය හැකි සුදුසු ආත්මික වාතාවරණයන් අප විසින් සකස් කෙරේ. ගුණනය වීම වළක්වන පොදු ප්‍රශ්න මෙම පරිච්ඡේදය තුළ ලැයිස්තුගත කෙරේ. සෑම ප්‍රශ්නයකටම බයිබලීය ප්‍රතිකර්මයක් සපයා තිබේ.

### ඇන සිටින ලද වර්ධනය

**ප්‍රශ්නය : ආත්මික ආහාර මඳ වීම**

මනුෂ්‍ය ශරීරයකට ස්වභාවික ආහාර හා ජලය අවශ්‍ය වේ. නොඑසේ නම් මරණයට පත් විය හැකිය. ආත්මික ශරීරයට ආත්මික ආහාර හා ජලය ලැබිය යුතුය. නොඑසේ නම් එය මිය යනු ඇත. ඇතැම් සභාවන් තුළ කිසි ආකාරයකින් දේව වචනය උගන්වන්නේ නැත. ඔවුන් උගන්වන්නේ මනුෂ්‍යයන්ගේ ධර්මයන් වේ. ඔවුන් පවසනුයේ මනුෂ්‍යයන්ට ඇසීමට ආසා කරන දේවල්ය (2 තිමෝති 4:3). ආත්මික මන්දපෝෂණය දේව වචනය නොමැති වීම නැමැති සාගතයේ ප්‍රතිඵලයකි (ආමොස් 8:11-12). අනෙක් සභාවන් දේව වචනයේ "කිරි" වැනි කොටස් පමණක් උගන්වන අතර මනුෂ්‍යයන් කිසිදාක ආත්මිකව පරිණත නොවේ. ඇදහිලිවන්තයන් බයිබල් අධ්‍යයනයන් නොසලකා හරිනු හෝ කිසිකලෙක මූලික සත්‍යයන්ගෙන් ඔබ්බට ගොස් දේව වචනයේ "මස්" වැනි කොටස්

වෙත නොයනු ඇත. ස්වභාවික ශරීරය ආහාර නොමැතිව මියයන්නේ යම් සේද ආත්මික ශරීරයත් එසේම වන්නේය.

**ප්‍රතිකර්මය:**

දේව වචනය වෙත අවධානය අලුත් කරගන්න (රෝම:10:17). දේව වචනයේ කිරි හා මස් යන කොටස් දෙකම උගන්වන්න (1 කොරින්ති 3:1, 1 පේතෘස් 2:22, හෙබ්‍රෙව් 5:12:14). කුඩා දරුවකුට සදාකාලිකවම කිරිවලින් පමණක් ජීවත් විය නොහැකිය. වර්ධනය වන දරුවකු ඝන ආහාර ගැනීම අවශ්‍ය වේ. වර්ධනය වන ආත්මික ශරීරයටත් දේව වචනයේ කිරිවලින් පමණක් ජීවත් විය නොහැකිය. වර්ධනය වන ආත්මික ශරීරයත් "මස්" වැනි කොටස් අනුභව කිරීමට ඉගෙන ගත යුතුය. දේව වචනය අපගේ ආත්මික ආහාරය වේ. පහසුවෙන් තේරුම්ගත හැකි මූලික සත්‍යතාවන් දේව වචයේ කිරි ලෙස හැඳින්වේ. බයිබලයේ ඇති වඩා ගැඹුරු ඉගැන්වීම් දේව වචනයේ මස් ලෙස හැඳින්වේ.

## ප්‍රශ්නය : දර්ශනයක් නොමැතිවීම:

"දර්ශනයක් නොමැති විට, සෙනඟ හිතුවක්කාරි වෙති" (හිතෝපදේශ 29:18) යි බයිබලයේ පවසයි. ඇතැම් පුද්ගලයන්ගේ ආත්මික දර්ශන තමන්ගේම පවුලට හා ප්‍රජාවට සීමා වී ඇත. තවත් අය තම සභාවේ දොරෙන් එළියේ සිටින මිනිසුන් ක්‍රිස්තුස්වහන්සේ නොමැතිව මිය යද්දී අමුතු නම් ඇති ඉතා දුර බැහැර ප්‍රදේශ පිළිබඳව සිත යොමු කරති.

**ප්‍රතිකර්මය:**

ප්‍රාදේශිය හා ලෝකය පුරා විහිදුනු ආත්මික දර්ශනය අතර සමබරතාවක් ඇති කරගත යුතුය. තමන්ගේම සමාජයට අයත් පුද්ගලයන් නොසලකා හැරීමෙන් තොරව සභාවන් විසින් ලෝකය පුරා විහිදුනු දර්ශනයක් ගොඩනගාගත යුතුය. යේසුස්වහන්සේ විසින් තම ගෝලයන්ට දුන් දර්ශනය වුයේ නෙලීමට සුදානම් ආත්මික අස්වැන්න වේ. කෙත නම් ලෝකයයි. ඔබේ ඇස් ඔසවා බලන්න. යේසුස්වහන්සේ විසින් තම ගෝලයන් සමඟ බෙදාගත් ඔවුන්ගේ ජීවිතයේ පරමාර්ථ හා ඉරණම වෙනස් කළ දර්ශනය මෙයයි (යොහන් 4).

## ප්‍රශ්නය : නොගැඹුරු වර්ධනය:

මාර්ක් 4:1-20 හි සඳහන් වපුරන්නාගේ උපමාව කියවන්න. දෙවියන්වහන්සේගේ වචනය ඔබේ ජීවිතයේ ගැඹුරට මුල් ඇද නොගත් විට එහි ප්‍රතිඵලය වන්නේ නොගැඹුරු ආත්මික වර්ධනයයි. පීඩාවන් හා අසීරු කාලයන් පැමිණි විට ඔබ ආත්මිකව මරණයට පත්වේ (මාර්ක් 4:17).

**ප්‍රතිකර්මයන්:**

දේව වචනය කියැවීම, එයට සවන් දීම හා ඉගැන්වීම පමණක් ප්‍රමාණවත් නොවන බව මනුෂ්‍යයන්ට උගන්වන්න. ඔවුන් වචනය ක්‍රියාවට නංවන්නන් විය යුතුය. එය ඔවුන්ගේ ජීවිත වෙනස් කළ යුතුය (යාකොබ් 1:22-25). වෙනස ඇති වන්නේ දේව වචනය හදවත තුළට ඇතුළු වු විටය (ගීතාවලිය 119:130).

## ප්‍රශ්නය : කප්පාදු නොකිරීම:

සභාවන් තුළ බොහෝ විට ඵල නොදරන ක්‍රම සහ වැඩසටහන් තිබේ. එවැනි ක්‍රියාකාරකම් කප්පාදු නොකළ විට ඵල දැරීම නවති. කප්පාදු නොකළ විට හෙමින් නමුත් නිසැකවම මරණයේ ක්‍රියාවලියෙන් ජීවය විනාශ කර දමයි. ස්වභාවික ලෝකය තුළ ශාකයන් කප්පාදු නොකළ විට එයට තවදුරටත් නැගී සිටිය හැකිය. නමුත් එය මිය ගොස් තිබේ. එහි ඵල දැරීමක්, වර්ධනයක් හෝ ගුණනය වීමක් නොමැත. ආකෘතිය එම ස්ථානයේ තිබේ. නමුත් ජීවය නැති වී තිබේ. ආත්මික ලෝකය තුළද මේ සියල්ල සත්‍ය වේ.

**ප්‍රතිකර්මය:**

ස්වභාවික ලෝකය තුළ ශාකයන් වඩා ඵල දැරීමට නම් ඵල නොදරන අතු කප්පාදු කළ යුතුය. ආත්මික ලෝකය තුළ අප විසින් අපගේ ජීවිත තුළ හා සභාව තුළ ඇති ඵල නොදරන ක්‍රියාකාරකම් කප්පාදු කර දැමිය යුතුය. ශුභාරංචිය ප්‍රකාශ කිරීමත් ගෝලයන් බිහි කිරීමත් සිදු නොවන ක්‍රම සහ වැඩසටහන් කප්පාදු කළ යුතුය.

සභාවේ සෑම රැස්වීමක්ම වැඩසටහනක්ම හා ක්‍රියාකාරකමක්ම තක්සේරු කර බැලිය යුතුය. ඵල නොදරන කාර්යයන් ඵල නොදරන්නේ ඇයි දැයි සොයා ගැනීමට ඒවා විශ්ලේෂණය කර බලන්න. මතක තබාගන්න. කප්පාදු කිරීම යනු ඵල නොදරන අතු ඉවත් කර දැමීමක් නොවේ. එහි අරමුණ වඩා ඵලදායි වර්ධනයක් හා ආත්මික ඵල ඇති විය හැකි ආකාර සෙවීමය (යොහන් 15 බලන්න).

## ප්‍රශ්නය : ප්‍රතිචාර දක්වන ප්‍රදේශ හඳුනාගැනීමට අසමත් වීම

මාර්ක් 4:1-20 සඳහන් වපුරන්නාගේ උපමාවේදී ප්‍රතිචාර දක්වන හා ප්‍රතිචාර නොදක්වන පස් වර්ග විය. ප්‍රතිචාර නොදක්වන ප්‍රදේශවල ඇති වූයේ සුළු වර්ධනයක් පමණි.

**ප්‍රතිකර්මය:**

ගුණනය වීම සඳහා ඉතා සීමිත අවස්ථාවන් පමණක් ඇති ප්‍රතිචාර නොදක්වන ප්‍රදේශ ලෝකයේ තිබේ. එසේම ශුභාරංචිය ව්‍යාප්ත වීමට මහත් අවස්ථාවන් ලබා දෙන ආත්මික අස්වැන්න සඳහා සූදානම් ප්‍රදේශ ද තිබේ. ප්‍රතිචාර දක්වන පුද්ගලයන් හඳුනාගත යුතු අතර සියලු ප්‍රයත්නයන්වලදී මෙම ප්‍රදේශ සැළකිය යුතුය. අන්තියෝකියේදී ශුද්ධාත්මයාණන් විසින් අන්‍යජාතීන් ගෝලත්වයට ගෙනෙන බව පාවුල් ඇසූ විට ඔහු වහාම කාර්යයන් අතහැර අන්තියෝකියට ගියේය. ආසියාව සඳහා නිසි කාලය එළඹ නැති විට දෙවියන්වහන්සේ ආසියාව වෙත දොරටුව විවර කරන තුරු පාවුල් ප්‍රතිචාර දක්වන ප්‍රදේශ වෙත අවධානය යොමු කළේය. ප්‍රයත්නයන් හිදී ප්‍රතිචාර දක්වන ප්‍රදේශ වෙත අවධානය යොමු කරන්න. දිගටම වපුරමින් අස්වැන්න තවමත් පැසී නැති කුඹුරුවල නිසි කාලය එන තුරු බලා සිටින්න.

## ප්‍රශ්නය : වැරදි ප්‍රමුඛතාවයන්:

යාච්ඤාව හා දේව වචනය අධ්‍යයනය කරනවාට වඩා සභාවේ කටයුතු පිළිබඳව වඩා සැලකිලිමත් වූ විට ආත්මික නායකයන්ගේ ප්‍රමුඛතාවන් වැරදි වේ. එමෙන්ම යහපත් ක්‍රියා, ගොඩනැගිලි ව්‍යාපෘති වැනි ද්විතිය ව්‍යපෘතීන්ට ප්‍රමුඛතාව ලබා දීමද වැරදි වේ. එවිට සේවය කිරීමට වඩා නඩත්තු කටයුතු කරගෙන යාම වැදගත් ලෙස පෙනේ.

**ප්‍රතිකර්මය:**

විශාල ගොඩනැගිලි ඉදිකිරීම කිතුනු යාච්ඤා මධ්‍යස්ථාන හා වෙනත් එවැනි ව්‍යාපෘති පිළිබඳව යේසුස්වහන්සේ කිසිවක් පැවසුවේ නැත. මේවායේ කිසිදු වරදක් නොමැති නමුත් ශුභාරංචිය ප්‍රකාශ කිරීම හා ගෝලයන් බිහි කිරීමට වඩා වැඩි අවධානයක් මේවා කෙරෙහි යොමු කළ විට ගුණනය වීමට බාධා ඇති වේ. ප්‍රමුඛතා පිළිබඳ ප්‍රශ්නයක් හා ඊට පිළියම ක්‍රියා 6:1-6 හි වාර්තා වේ. ආත්මික නායකයන් යාච්ඤාවට හා දේවවචනයේ සේවයට තම කාලය යෙදවූ විට එහි ප්‍රතිඵලයක් ලෙස ගුණනය වීම සිදුවිය (ක්‍රියා 6:7).

## ප්‍රශ්නය : මිනිසුන් සමග සම්බන්ධ නොවූ සේවය:

ඇතැම් සභාවන් වර්ධනය වී නැත්තේ සේවය මිනිසුන් සමග සම්බන්ධ වී නැති නිසාය. ඇතැම් විට සේවය කරන්නා එම මනුෂ්‍යයන් අතරින් අයෙක් නොවිය හැකිය. ඔහු වෙනත් සංස්කෘතියකට අයත් නිසා සංස්කෘතිය හා භාෂාව වැනි දේවලින් සෙනඟ සමග නිසි ලෙස සම්බන්ධ වීමට නොහැකි වුවා විය හැකිය.

**ප්‍රතිකර්මය:**

සභාවක් රෝපණය කළ පසු හැකි ඉක්මනින් ඒ තුළින් නායකයන් නගා සිටුවිය යුතුය (තිතස් 1:5). එම සංස්කෘතිය හා භාෂාව දන්නා ප්‍රාදේශිය නායකයන්ට සාමාන්‍යයෙන් වඩාත් බලපෑමක් ඇතිවන ලෙස ශුභාරංචිය ප්‍රකාශ කළ හැකිය.

## ප්‍රශ්නය : "ගොස් පවසන්න" වෙනුවට "පැමිණ බලන්න" යන්න

යේසුස්වහන්සේ විසින් අණ කළ "යන්න" යන ක්‍රමය වෙනුවට බොහෝ සභාවන් "එන්න" යන උපක්‍රමය යොදාගනී. මෙම සභාවන් දේව මෙහෙයන් හා වැඩසටහන් සංවිධානය කර නොඇදහිලිවන්තයන් සභාවට "කැඳවා" ගැනීමට උත්සාහ කරයි. ඔවුන් කිසිදාක මනුෂ්‍යයන් වෙත ශුභාරංචිය ගෙන ගොස් ඔවුන් කැඳවාගෙන එනු පිණිස ලෝකයට "යන්නේ" නැත. ඔවුන් තම දොරටු විවර කර මනුෂ්‍යයන් එනතුරු බලාසිටී. නමුත් කිසිවෙකු නොපැමිණේ. එවැනි සභාවක සාමාජිකයන් සතියේ සෑම රාත්‍රියකම පවත්වන රැස්වීම් නිසා කාර්ය බහුල විය හැකිය. ශුභාරංචිය ප්‍රකාශ කිරීම් වෙනුවට සමුළු සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වේ.

**ප්‍රතිකර්මය:**

සභාව දෙවියන්වහන්සේ ලෝකය තුළ සිදු කරන මෙහෙයුමේ මුලස්ථානය විය යුතුය. නමුත් සභාව ලෝකය වෙත ගොස් සේවය කර ගුණනය වීම සඳහා ගෝලයන් පිටත් කර හරින මුලස්ථානය වනවා වෙනුවට එම සේවය ලබන ස්ථාන බවට පත්වී ඇත. සභාව තමන්ටම ශුභාරංචිය ප්‍රකාශ කිරීම නතර කර ලෝකයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පටන් ගත යුතුය. පව්කාරයන් සිටින ලෝකය වෙතට ගොස් ක්‍රිස්තුස්වහන්සේ වෙත ඔවුන් දිනා ගැනීමට ඇදහිලිවතුන් පුහුණු කරන හා සන්නද්ධ කරන ස්ථානය බවට සභාව පත්විය යුතුය. යේසුස්වහන්සේගේ යන්න යන උපක්‍රමය ඉස්මතු විය යුතුය. (මතෙව් 28:19 ක්‍රියා 1:8)

## ප්‍රශ්නය : පසුතැවිලි නොවු පාපය

සභාවේ සාමාජිකයන්ගේ ජිවිතවල ඇති පසුතැවිලි නොවු පාපය ආත්මික වර්ධනයට බාධා කරයි.

**ප්‍රතිකර්මය:**

සාමාජිකයන්ගේ පසුතැවිලි නොවු පාපය ගැන ක්‍රියා කිරීම පිළිබඳව පාවුල් කොරින්තියේ සභාවට දුන් උපදෙස් අධ්‍යයනය කරන්න (1 කොරින්ති 5:11-13 බලන්න). පව් කරන ලද සාමාජිකයා පසුතැවිලි වනවා නම් ඔහුව යළිත් සහභාගීත්වය තුළට පිළිගත යුතුය (2 කොරින්ති 2:4-8 බලන්න).

## ප්‍රශ්නය : නොවිසඳන ලද පෞද්ගලික ප්‍රශ්න

සභාවේ සාමාජිකයන් අතර නොවිසඳන ලද පෞද්ගලික ප්‍රශ්න ඇති වු විට ගැටුම්කාරි අවස්ථා උද්ගත වේ. මෙම ගැටුම්කාරි අවස්ථා නිසි ලෙස නොවිසිඳුනහොත් එහි ප්‍රතිඵලයක් ලෙස බෙදීම් ඇතිවේ. නොවිසඳුනු ප්‍රශ්න ගුණනය වීමේ ක්‍රියාවලියට බාධා කරයි.

**ප්‍රතිකර්මය:**

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සාමාජිකයන් අතර ඇතිවන ප්‍රශ්න විසදා ගැනීම පිළිබඳ නිශ්චිත උපදෙස් මතෙව් 18:15-17 හි සඳහන් වේ. ක්‍රියා 15:36-41 හි සඳහන් පාවුල් හා බර්ණබස් පිළිබඳ උදාහරණය ද අධ්‍යයනය කරන්න. ප්‍රශ්න නිසි පරිදි හසුරුවා ගතහොත් බෙදියාමකින් වුවද දේව රාජ්‍යයට වාසිදායක වන ගුණනය වීමත් සිදුවිය හැකිය.

## ප්‍රශ්නය : සුදුසුකම නොලත් ආත්මික නායකත්වය

නායකයන් බයිබලයේ සඳහන් ආත්මික සුදුසුකම් සම්පුර්ණ නොකරන විට එය සභාවේ වර්ධනයට බලපෑම් ඇති කරයි. සභාවේ නායකයන් ගැන දෙවියන්වහන්සේ විසින් නියම කර ඇති තත්වයන්

ආත්මික සුදුසුකම් වේ. මනුෂ්‍යයාගේ සැබෑ ආත්මික තත්වය ගැන සළකන තරම් උන්වහන්සේ අධ්‍යාපනය හා අනෙකුත් හැකියාවන් ගැන නොසලකන සේක (1 සාමුවෙල් 16:7).

**ප්‍රතිකර්මය:**

තම නිවස (තම පෞද්ගලික ආත්මික ජීවිතය හා පවුල) නිසි පිළිවෙළට සකස් කරගන්නා තුරු නායකයෙකු තම තනතුරින් ඉල්ලා අස්විය යුතුය. නායකයන් විසින් 1 තිමෝති 3 හා තිතස් 1:5-9 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය.

## ප්‍රශ්නය : වෙනස් වීමට විරුද්ධ වීම

වෙනස් වීමට විරෝධය පෑමේ ස්වභාවයක් මිනිසුන් තුළ තිබේ. බොහෝ අය පසුගිය වසර 40 පුරාම දේවල් පැවති ආකාරයටම පවතිනවා දැකීමට සතුටු වෙති. ඔවුන් නව ක්‍රමයක් ඉතා ඉක්මනින් පිළිගන්නේ නැත.

**ප්‍රතිකර්මය:**

සභාවේ පරමාර්ථය වන ශුභාරංචිය ප්‍රකාශ කිරීම හා ගුණනය වීම කිසිදා වෙනස් නොවන බව මතක තබාගන්න. මෙම පරමාර්ථය ළඟා කර ගැනීමේ ක්‍රම වෙනස් වේ. මුල් සභාව භාවිත කළ බයිබලීය ක්‍රම අප විසින් පාවිච්චි කළ යුතු බව සැබෑය. නමුත් ඒ කාලයේ සිට මේ වන විට ලෝකය වෙනස් වී තිබේ. බයිබලය ලියූ කාලයේදී පාවිච්චි නොකළ පමණින් අපට නව ක්‍රම ප්‍රතික්ෂේප කළ නොහැකිය.

උදාහරණයක් ලෙස පාවුල් විසින් පාවිච්චි නොකළ පමණින් මුද්‍රණාල, පරිගණක හා පටිගත කිරීමේ යන්ත්‍ර වැනි දේවල් ශුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා භාවිත නොකළ යුතු යැයි ඔබට ප්‍රතික්ෂේප කළ නොහැකිය. ඒ කාලයේදී මෙම ක්‍රම පැවතියේ නැත. සම්ප්‍රදායන් දෙවියන්වහන්සේගේ සැලැස්මට බාධාවක් විය හැකි බව හඳුනාගන්න (මාර්ක් 7:13). දෙවියන්වහන්සේ වෙතින් අලුත් දේවල් පිළිගන්නා ආකාරය මනුෂ්‍යයන්ට උගන්වන්න (යෙසායා 43:19).

## ප්‍රශ්නය : සන්නිවේදන ප්‍රශ්න

ශුභාරංචිය සන්නිවේදනය කරන ආකාරයෙන් ගුණනය වීමට බාධා ඇතිවේ. බරපතල වචන හා දේවධර්මය පිළිබඳ තම දැනුම තුළින් තම සෙනඟ තුළ හොඳ ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට සේවකයන් උත්සාහ කරයි. ඔවුන් මනුෂ්‍ය අවශ්‍යතා සහ මට්ටමේ සිට සන්නිවේදනය නොකරයි. ඔවුන්ගේ ක්‍රියාවන් හා වචන එකිනෙක හා නොගැළපේ.

**ප්‍රතිකර්මය:**

ශුභාරංචිය සන්නිවේදනය කළ යුත්තේ අසන්නන් විසින් තේරුම් ගනු ලබන පරිදි වේ. දේශකයන් ගුරුවරු හා ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් විසින් බරපතල වචන පාවිච්චි කර දේව ධර්මානුකූල දැනුම ප්‍රදර්ශනය කර යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීමට උත්සාහ කරනවා වෙනුවට තම අසන්නන්ගේ මට්ටමේ සිට පණිවුඩය ඉදිරිපත් කළ යුතුය. යේසුස්වහන්සේ ඉගැන් වූ විට සාමාන්‍ය මනුෂ්‍යයන් එයට සවන් දී එය තේරුම් ගත්හ (මාර්ක් 12:37).

පණිවුඩය ලබා දෙන විට එය සියලුම සාමාජීය හා අධ්‍යපන මට්ටම්වලට තේරුම්ගත හැකි වන අන්දමට සකස් කළ යුතුය (රෝම 1:14). වාචිකව කියනු ලබන දේවල් ජීවන රටාව සමඟ ගැළපිය යුතුය. අප දේව වචනය සන්නිවේදනය කරන්නන් මෙන්ම එය ක්‍රියාවට නංවන්නන් ද විය යුතුය. අපගේ ඇදහිල්ල අප විසින් සන්නිවේදනය කරන විට එය අන් අය වෙත බලපෑමක් කළ හැකි වන්නේ ඒවා අපගේ ජීවිතවලින් පෙනෙන්නට තිබේ නම් පමණි (පිලෙමොන් 6).

## ප්‍රශ්නය : සංස්කෘතිමය භූගෝලීය හා නිකායන් වශයෙන් ඇති බෙදීම්

ඇතැම් සභාවන් ඔවුන් අප වැනි අය නොවේ යැයි පවසමින් තම සමාජයේ සිටින මිනිසුන් වෙත ළඟා නොවේ. සංස්කෘතිකමය වශයෙන් වෙනස් ජාතීන් වශයෙන් වෙනස් හෝ වෙනත් භාෂාවක් කතා කරන මිනිසුන්ට ඔවුහු සේවය නොකරති. ඇතැම් සභාවන් භූගොලීය සීමාවන් ඉක්මවා යාම

ප්‍රතික්ෂේප කරති. නගරයේ වෙනත් ප්‍රදේශවල හෝ වෙනස් පළාත්වල සිටින මිනිසුන් තම සභාවට පැමිණෙනවාට ඔවුන් කැමති නොවේ. ඇතැම් පුද්ගලයන් වෙනත් නිකායන්වල පුද්ගලයන් සමග සහභාගීත්වය දැරීම ප්‍රතික්ෂේප කරති. තවත් සමහරක් ලෝකයෙන් වෙන් වී නොඇදහිලිවන්තයන් සමග සම්බන්ධතා නොපවත්වන බැවින් ඔවුන්ට තවදුරටත් ගුණනය වීමට නොහැකිව සිටී.

**ප්‍රතිකර්මය:**

එපීස 2:14 බලන්න. ක්‍රිස්තුස්වහන්සේ තුළ බෙදීම් ඇති කරන පවුරු නැත. සභාව විසින් පවුරු ගොඩනගා ඇති අතර ඒවා කඩා බිඳ දමනු ලැබිය යුතුය. මනුෂ්‍යයන් සිටින ස්ථාන වෙත ගොස් ඔවුන්ට ළඟා වීම සඳහා අප සංස්කෘතිමය, භාෂාමය, භූගෝලීය හා නිකායන් වශයෙන් ඇති සීමාවන් ඉක්මවා යා යුතුය.

අප මෙම බර හා පව් පසෙක තබා ලෝකයට ශුභාරංචිය ගෙන යනු පිණිස ඇති කාර්යය වෙත අවධානය යොමු කළ යුතුය (හෙබ්‍රෙව් 12:1-2). අප අපව ලෝකයෙන් හුදෙකලා කරගත යුතු නොවේ. අප ලෝකය තුළ සිටිය යුතුය. නමුත් එහි පව්කාර ක්‍රියාවන්ට සහභාගී නොවිය යුතුය (යොහන් 17: 15). ලෝකයෙන් වෙන්ව සිටීම යනුවෙන් අදහස් වන්නේ හුදෙකලා වීම හෝ තනිව සිටීම නොවේ.

## ප්‍රශ්නය : සහභාගිවන්නන් වෙනුවට නරඹන්නන්

නරඹන්නන් යනු දෙවියන්වහන්සේගේ සැලැස්ම දෙස බලා සිටින නමුත් එයට සහභාගී නොවන පුද්ගලයන්ය. ඔවුහු ආත්මිකව තමන් වැනි අය බිහි නොකරති. ඔවුන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම හා ගෝලයන් බිහි කිරීම පූර්ණ කාලීන සේවකයන්ට භාර දී සිටිති. නරඹන්නන්ගෙන් පිරුණු සභාවන් වර්ධනය නොවේ.

**ප්‍රතිකර්මය:**

මහා ආඥාව සඳහා තම පෞද්ගලික වගකීම සෑම සාමාජිකයෙකු විසින්ම හඳුනාගත යුතුය (මතෙව් 28:19-20). සභාවට නිසි පරිදි ක්‍රියාත්මක විය හැකි වන පරිදි තම ආත්මික දීමනා සොයා ගෙන පාවිච්චි කිරීමට සාමාජිකයන්ව යොමු කළ යුතුය (2 තිමෝති 1:6).

සේවයේ කාර්යයන් සඳහා සේවකයන් විසින් සාමාජිකයන් සන්නද්ධ කළ යුතුය (එපීස 4:12). සෑම පුද්ගලයෙකුම තමන් වැනි අය බිහි කළ යුතු අතර සෑම නිවසක්ම ශුභාරංචි මධ්‍යස්ථානයක් විය යුතුය (2 තිමෝති 2:2).

## ප්‍රශ්නය : ඇදහිලිවන්තයන් ගෝලයන් බවට පත් නොවේ.

තම ඇදහිලිවන්තයන් ගෝලයන් ලෙස වර්ධනය නොවේ. ඔවුන් තම පැරණි පාපයේ ජීවිතයට හැරී යාම හෝ තමන් වැනි අය බිහි කළ නොහැකි ළදරුවන් ලෙස පැවතීම සිදු වේ.

**ප්‍රතිකර්මය:**

ගුණනය වීමේ ක්‍රියාවලිය දිගටම සිදු වීමට අවශ්‍ය නම් ඇදහිලිවන්තයන් ගෝලයන් ලෙස වර්ධනය වීම හා සේවය උදෙසා සන්නද්ධ කරනු ලැබීම සිදු විය යුතුය. ඇදහිලිවන්තයෙකු ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාකාරී ගෝලයෙකු බවට පත්වන තුරු ශුභාරංචිය ප්‍රකාශ කිරීම සම්පූර්ණ නොවේ. ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පෙර මෙන්ම ඉන් අනතුරුවද ඉගැන්වීම් සිදු කළ යුතුය (මතෙව් 28:19-20).

## ප්‍රශ්නය : භය

අසාර්ථක වේ යැයි ඇති භය ගුණනය වීමට සිටින පරම සතුරාය. මතෙව් 25:14-30 හි ඇති තලෙන්ත පිළිබඳ උපමාව කියවන්න. බිය වූ සේවකයා ලාභයක් නොලැබීය. ඔහු ආත්මිකව ගුණනය නොවීය.

**ප්‍රතිකර්මය**

බිය වෙනුවට ප්‍රේමය මත පදනම් වූ සම්බන්ධතාවක් දෙවියන්වහන්සේ සමඟ ගොඩනගා ගන්න (1 යොහන් 4:18).

## ප්‍රශ්නය : නමස්කාරය වෙනුවට වැඩ ගැන අවධානය යොමු කිරීම

සැබෑ නමස්කාරයේ ස්ථානය සැළසුම්වලට වැඩසටහන්වලට සහ සභාවේ කටයුතුවලට ලබාගත හැකිය. දේව මෙහෙයක් නිවේදන, අරමුදල් රැස්කිරීම, විශේෂ ඉදිරිපත් කිරීම් හා සැළසුම් කළ වැඩසටහන්වලින් පිරී තිබිය හැකිය.

**ප්‍රතිකර්මය**

සභාව තුළ නිසි ලෙස ප්‍රමුඛතාවන් සකස් කරන්න. දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට හා නමස්කාරයට මුල් තැන දිය යුතුය. අන් අයට ප්‍රේම කිරීමට හා නමස්කාරයට මුල් තැන දිය යුතුය. අන් අයට ප්‍රේම කිරීමට හා සේවය කිරීමට ඊළඟ ස්ථානය දිය යුතුය. අනෙකුත් සියලුම වැඩසටහන් මෙම ප්‍රධාන වගකීම් දෙකට පසුව පැමිණේ (මතෙව් 12:29-31).

## ප්‍රශ්නය : ආත්ම ගලවා ගන්නවා වෙනුවට සමාජය ගලවා ගැනීම

අද දවසේ ලෝකයේ සාමාජීය අවශ්‍යතා රැසක් තිබේ. ආහාර ඇඳුම් හා නිවාස අවශ්‍ය දිළිඳු පුද්ගලයන් බොහෝ සිටී. වෛද්‍ය පහසුකම් හා රැකියා අවශ්‍ය පුද්ගලයින් සිටී. නිවැරදි විය යුතු අධ්‍යාපනික හා දේශපාලනමය ප්‍රශ්න තිබේ. මේවා යේසුස්වහන්සේගේ නාමයෙන් සභාවට සේවය කළ හැකි සැබෑ අවශ්‍යතාවයන්ය. නමුත් බොහෝ විට සේවයේ වැඩි අවධානය ආත්මයන් ගලවා ගැනම වෙනුවට සමාජය ගලවා ගැනීම වෙත මාරු වේ.

**ප්‍රතිකර්මය:**

ළිඳ ළඟ සිටි කාන්තාවට ජලය උදෙසා භෞතික අවශ්‍යතාවක් වූ නමුත් යේසුස්වහන්සේ ප්‍රමුඛතාව දුන්නේ ආත්මික අවශ්‍යතාවටයි (යොහන් 4 බලන්න). සභාවට ඇති මූලික කැඳවීම සමාජය ගලවා ගැනීම උදෙසා නොව ආත්මිකව අසරණ වී සිටින පුරුෂයන් හා ස්ත්‍රීන්ගේ ආත්මයන් ගලවා ගැනීම උදෙසාය. සාමාජීය කරුණුවලට දායක වීම තුළින් හා බුද්ධිමය ව්‍යාපාරයන් තුළින් ජීවනයේ ආහාරය සොයන කුසගිනි වූ මිනිසුන් තෘප්තියට පත් නොවේ.

## ප්‍රශ්නය : අවිශ්වාසය

දෙවියන්වහන්සේ විසින් දෙන බවට පොරොන්දු වූ දේශයේ මායිමට පැමිණ සිටි ඉශ්‍රායෙල් සෙනඟගේ කතාව කියවන්න (ගණන් කතාව 13). අවිශ්වාසය නිසා ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුළු නොවිය. ඔවුන් නැවත පාළුකරයේ ඇවිදීමට හැරී ගිය අතර ඊළඟ අවුරුදු 40 ඇතුළත එම මුළු පරම්පරාවම මිය ගියේය.

සෑම ඇදහිලිවන්තයෙකම මෙන්ම සෑම සභාවන්ම තම ආත්මික අත්දැකීමේ එක්තරා අවස්ථාවක ආත්මිකව කාදේශ් වැනි ස්ථානයකට පැමිණේ. ඔවුන් දෙවියන්වහන්සේගේ පොරොන්දුව අත්පත් කරගැනීමට ඉදිරියට යාම හෝ යළිත් අවිශ්වාසයට හැරී ගොස් ආත්මිකව මියැදීම සිදු වේ.

**ප්‍රතිකර්මය:**

අවිශ්වාසය ආත්මික වර්ධනයට හා ගුණනය වීමට බාධා කරයි. ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හා ගෝලත්වයට තමන්ට ඇති අරමුණ ළඟා කරගත හැක්කේ ඇදහිල්ල තුළින් බව සභාව විශ්වාස කළ යුතුය (මාර්ක් 6:15). අවිශ්වාසය වෙනුවට ඇදහිල්ල ඇති කරගත යුතුය. දෙවියන්වහන්සේගේ වචනය වෙත යොමු කරන අවධානය අලුත් කිරීමෙන් ඇදහිල්ල වර්ධනය වේ. මනුෂ්‍යයන් ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට පටන් ගත යුතුය. බලපෑමක් ඇති කිරීමට නම් ඇදහිල්ල ක්‍රියාවන් සමග ඒකාබද්ධ කළ යුතු වේ (යාකොබ් 2:26).

## ප්‍රශ්නය : ගුණාත්මක භාවයට වඩා ප්‍රමාණය කෙරෙහි අවධානය

ගුණාත්මක භාවයට වඩා ප්‍රමාණය ගැන අවධානය යොමු කිරීමෙන් ආත්මිකව පරිණත නොවූ ඇදහිලිවන්තයන් බිහි වේ. විශාල සංඛ්‍යාවක් සිටින නමුත් ගෝලයන් හා පරිණත ඇදහිලිවන්තයන් ඇති කිරීමට අසමත් වේ.

**ප්‍රතිකර්මය:**

මෙම පාඨමාලාවේ හයවන පරිච්ඡේදය යළි කියවා බලන්න. මෙම පාඩමේදී උගන්වනු ලැබූ ආත්මික වර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති අදාළ කරගන්න.

## ප්‍රශ්නය : සමූහයා තුළ තනි පුද්ගලයන් අතරමං වේ.

සභාවන් වර්ධනය වන විට සමූහයා තුළ තනි පුද්ගලයන් අතරමං විය හැකිය. ඔවුන් තවත් එක් අයෙක් පමණක් යැයි ඔවුන්ට සිතෙන්නට පටන් ගැනේ. කිසිදු පෞද්ගලික සම්බන්ධතාවක්, රැක බලාගැනීමක් හෝ සැලකිල්ලක් නොමැත. තනි පුද්ගලයන්ට ශුභාරංචිය දේශනා කරනු වෙනුවට සමූහයන්ට ශුභාරංචිය දේශනා කිරීම අවධාරණය කෙරේ.

**ප්‍රතිකර්මය:**

එක ආත්මයක් මුළු ලෝකයටම වඩා වටී (මතෙව් 16:26). ලෝකයම ගැන සැළකීම කළ යුතු දෙයක් වුවද අප සමූහයක් තුළ තනි පුද්ගලයන් අතහැර දැමිය යුතු නොවේ. මනුෂ්‍යයන් වරකට එක් අය බැගින් ආත්මිකව උපත ලබන අතර තනි තනිව මං මුළා වේ.

සමූහයක් දෙවියන්වහන්සේ වෙතට හැරීම කියා දෙයක් නැත. ශුභාරංචිය ප්‍රකාශ කිරීම සම්බන්ධ ආයාචනයකට විශාල පිරිසක් ප්‍රතිචාර දැක්වුවද හැම පුද්ගලයෙකුම නැවත උත්පාදනය ලබන්නේ තනි තනිව වේ. අප තනි පුද්ගලයන්ගේ අවශ්‍යතා නොසළකා හරින තරමට සමූහයන් ගැන සැළකීම යුතු නොවේ. තනි පුද්ගලයන්ට සේවය කිරීම සඳහා යේසුස්වහන්සේ ඔවුන්ව සමූහයෙන් පිටතට කැඳ වූ සේක. කුඩා කණ්ඩායම් සේවය වර්ධනය කිරීම විශාල ලෙස වේගයෙන් වර්ධනය වන සේවයක තනි පුද්ගලයන් අරක්ෂා කරගත හැකි එක් ක්‍රමයකි.

## ප්‍රශ්නය : සභාව තුළ ඇතිවන කල්ලි ගැසීම්

ඇතැම් විට සභාවන් තුළ කල්ලි බිහි වේ. කල්ලියක් යනු වෙනම කණ්ඩායමක් ලෙස එකතු වී අන් අයව තම සහභාගිත්වයට ඇතුලු කරගැනීම ප්‍රතික්ෂේප කරන පුද්ගල කණ්ඩායමකි. එම කණ්ඩායම ඇතැම් පුද්ගලයන්ට වෙනස් ආකාරයකට සලකන අතර සමහරක් කල්ලිය තුළට පිළිගන්නා අතර අන් අයව ප්‍රතික්ෂේප කරනු ලබයි.

**ප්‍රතිකර්මය:**

පුද්ගලයන්ට ඒ ආකාරයෙන් සැළකීම වැරදි බව බයිබලය පවසයි. යාකොබ් 2:1-10 කියවන්න. එවැනි හැසිරීම් පාපයක් වන බැවින් ඒ සඳහා පසුතැවිලි විය යුතු බව පැවසේ.

## ප්‍රශ්නය : සංවිධානය ජීවත්ව සිටී නමුත් ජීවය මියැදෙමින් සිටී.

සංවිධානය වැදගත් වේ. නමුත් දෙවියන්වහන්සේගෙන් ගලා එන ජීවනයට වඩා වැඩි අවධානයක් සංවිධානයට ලබා දුන් විට ආත්මික වර්ධනය ට බාධා ඇති වේ. සැබෑ ආත්මිකත්වය වෙනුවට සම්ප්‍රදාය, නිත්‍යානුකූලභාවය හා වත් පිළිවෙත් වැදගත් ස්ථානයක් ගනී (මාර්ක් 7:13). සභාවේ සංවිධානය ජීවමානව හා හොඳින් පවතිනවා විය හැකිය. නමුත් ආත්මික ජීවිතයක් නොමැති වුවහොත් ජීවය වන සැබෑ ආත්මික ශරීරය මියයනු ඇත.

එවැනි සභාවන් හොඳින් සංවාධානය වී ඇති අතර ඔවුන් නමට ජීවත් වේ. නමුත් ආත්මිකව ඔවුන් මියගොස් ඇත (එළිදරව් 3:1). ආත්මිකව මියගොස් ඇති විට වර්ධනයක් සිදු නොවේ. ඔවුන්ට ශුද්ධ බවේ ස්වරූපයක් ඇත. නමුත් ඔවුන් දෙවියන්වහන්සේගේ බලය අතහැර දමයි (2 තිමෝති 3:5).

**ප්‍රතිකර්මය:**

සභාව ශරීරයකට උපමා කෙරේ. ශරීරයක් යනු විවිධ කොටස් එක් වු සංවිධානයක් පමණක් නොව එය ජීවය ඇති වස්තුවක් වේ. සංවිධානයකට ජීවනය දිය නොහැකිය. එහෙත් ජීවය දිය හැකි වන්නේ ජීවි වස්තුවකට වේ. සභාව තුළ ශරීරයක් වැනි වු ජීවිතය ගැන ඉගැන්විය යුතු අතර ශරීරයක් වැනි වු සේවය ඉස්මතු කළ යුතුය (1 කොරින්ති 12).

## ප්‍රශ්නය : ප්‍රේමය නොමැතිවීම

සභාව තුළ ආත්මික වශයෙන් යහපත් ක්‍රියාකාරකම් රැසක් තිබිය හැකි නමුත් ප්‍රේමය නැති විය හැකිය. මනුෂ්‍යයන් මිත්‍රශිලි නොවේ. ඔවුන් එකිනෙකාට ප්‍රේම නොකරති. ඔවන් එකිනෙකා ගැන තික්තකම, වෛරය හා නොසැළකිලිමත්භාවයේ ආකල්ප තිබේ.

**ප්‍රතිකර්මය**

ප්‍රේමය නොමැති නම් සෑම සේවයක්ම සෑම දිමනාවක්ම තනි පුද්ගලයෙකුගේ හෝ සභාවේ සෑම ක්‍රියාවක්ම ඵල විරහිතය. 1 කොරින්ති 13 අධ්‍යයනය කර අදාළ කර ගන්න.

## ප්‍රශ්නය : සම්පත් හිගකම

මනුෂ්‍යයන් හා මුදල් ගුණනය වීම සඳහා අත්‍යවශ්‍ය සම්පත් දෙකකි. දර්ශනය උදෙසා කැපවු පුරුෂයන් හා ස්ත්‍රීන් හිඟ වු විට වර්ධනය නතර විය හැකිය. අරමුදල් හිඟවීමේදී සභාවේ වර්ධනය හා සංවර්ධනයට බලපෑම් කළ හැකිය.

**ප්‍රතිකර්මය:**

පෞද්ගලික සේවයක් ගොඩනගනු වෙනුවට දේව රාජ්‍යය ගොඩනැගිම කෙරෙහි අවධානය යොමු කරන්න. අප එසේ කරන විට අපට අවශ්‍ය සියලුම දේවල් දෙනු ලබන බව යේසුස්වහන්සේ පැවසු සේක (මතෙව් 6:33). ආත්මික කෙතෙහි අස්වැන්න නෙලිමේ හැකියාව ඇති පුරුෂයෙක් හා ස්ත්‍රීන් යන මානව සම්පත් උදෙසා යාච්ඤා කරන්න (මතෙව් 9:37-38).

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ඇන සිටින ලද වර්ධනය යන්න නිර්වචනය කරන්න.

3. සභාවන් තුළ සාමාන්‍යයෙන් ඇති වන අවස්ථා පිළිබඳ පහත උදාහරණ කියවන්න. ප්‍රශ්නය හඳුනාගෙන බයිබලීය විසඳුමක් ලබා දීමට ඔබේ බයිබලය පාවිච්චි කරන්න.

   අ) **උදාහරණය A**: සභාවේ කාන්තාවන් දෙදෙනෙක් එකිනෙකා සමග කතා නොකරති. A සහෝදරියව වරදට පත්කරන යමක් B සහෝදරිය පැවසුවාය. ප්‍රතිකර්මය කුමක්ද?

   ආ) **උදාහරණය B**: සෑම රාත්‍රියක්ම සභාවේ ක්‍රියාකාරකම්වලින් පිරී තිබේ. නමුත් ස්වාමින්වහන්සේ වෙතට දිනාගනු ලබන්නේ ඉතා සුළු පිරිසකි. ප්‍රශ්නය කුමක් විය හැකිද? ප්‍රතිකර්මය කුමක්ද?

   ඇ) **උදාහරණය C:** ඇතැම් නව ඇදහිලිවන්යන් ටික කලක් සභාවට පැමිණේ. ඉන් පසුව නැවත තම පව්කාර ජීවන රටාවට හැරී යයි. තවත් අය සභාවේ රැදී සිටී. නමුත් තවමත් ආත්මික ළදරුවන්ය. ප්‍රශ්නය කුමක් විය හැකිද? ප්‍රතිකර්මය කුමක්ද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. මෙම පරිච්ඡේදය තුළ හඳුනාගන්නා ලද ආත්මික වර්ධනය පිළිබඳ ප්‍රශ්න යළි සළකා බලන්න. ඔබගේම සභාව තුළ වර්ධනයට හා ගුණනය වීමට බාධා කරන දේවල්වල ලැයිස්තුවක් සකස් කරන්න. මෙම ප්‍රශ්න නිවැරදි කළ හැක්කේ කෙසේද?

2. නැවත වරක් පාඩම කියවා ඔබගේ පෞද්ගලික වර්ධනයට හා සංවර්ධනයට බාධා කරන දේවල් හඳුනා ගන්න. ඔබට මෙම ප්‍රශ්න නිවැරදි කරගත හැක්කේ කෙසේද?

3. ඔබගේ සභාව හා ඔබගේ පෞද්ගලික ආත්මික ජීවිතය විශ්ලේෂණය කරන්න. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කළ දේවල්වලට අමතරව ආත්මික වර්ධනයට බාධා කරන දේවල් තිබේද? එසේ නම් මෙම ප්‍රශ්නවල ලැයිස්තුවක් සකස් කර ඒවා එකිනෙකට බයිබලීය විසඳුම් සොයන්න.

4. එළිදරව් 2-3 පරිච්ඡේදවල ඇති සභා සතට ලියූ ලිපි කියවන්න. මෙම සභාවන් තුළ පැවති ප්‍රශ්නවල හා ශුද්ධාත්මයාණන් විසින් දෙනු ලැබූ ප්‍රතිකර්මවල ලැයිස්තුවක් සකස් කරන්න.

# දොළොස්වන පරිච්ඡේදය
## දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය

**අරමුණු:**
මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- එපීසියේ ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට පාවුල් යොදාගත් ක්‍රම හඳුනා ගැනීමට
- එපීසියේ තිබූ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය විස්තර කිරීමට
- දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක අරමුණු පැහැදිලි කිරීමට
- දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම උදෙසා වූ උපදෙස් සාරාංශ කිරීමට
- දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **නුමුත් සමහරු මුරණ්ඩුව, අකීකරුව, සමූහයා ඉදිරියෙහි ඒ ලබ්ධි මාර්ගය ගැන දොස් කී කල්හි ඔහු ඔවුන් ළඟින් අහක්ව, ගෝලයන් වෙන්කරගෙන, තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දවස්පතා තර්ක කරමින් සිටියේය. මෙය දෑවුරුද්දක් කෙරීගෙන ගියේය. මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරුද ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19:9-10)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමට පෙර ක්‍රියා 19:1-20 කියවන්න. ප්‍රේරිත පාවුල් එපීස නගරයේදී කළ සේවය මෙම පරිච්ඡේදය තුළ වාර්තා වේ. එපීසයේදී ආත්මිකව ගුණනය වීමට සඳහා පාවුල් විශේෂ ක්‍රමයක් පාවිච්චි කළේය. ඔහු දුරස්ථ පුහුණු කිරීමේ පාසලක් පිහිටුවේය. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක සේවය හරහා ගුණනය වන ආකාරය මේ පරිච්ඡේදයේ දී ඔබ ඉගෙන ගනු ඇත.

### එපීසයේ ක්‍රමය

පාවුල් පළමුවර එපීසයට පැමිණි විට, එහි ජීවත් වන ගෝලයන් ඔහු සොයාගත්තේය. මෙම මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් ඒ වනවිටත් ශුභාරංචිය පිළිගෙන යේසුස්වහන්සේගේ අනුගාමිකයෝව සිටියහ (ක්‍රියා 19:1).

තම නගරය තුළ ඵලදායි ලෙස සේවය කිරීම සඳහා මෙම නව ඇදහිලිවන්තයන්ට තවදුරටත් පුහුණුව අවශ්‍ය විය. පාවුල් පළමුව අවධානය යොමු කළේ මෙම ගෝලයන්ට දේව රාජ්‍යය ගැන තවත් දේවල් ඉගැන්වීම කෙරෙහිය.

පාවුල් අත්දැකීම් තුළින් ඉගැන්වූයේය. ඔහු කළ පළමු දෙය නම් ඔවුන්ට ශුද්ධාත්මයෙන් බව්තීස්ම වීම යන නව ආත්මික අත්දැකීම වෙත මඟපෙන්වීමයි (ක්‍රියා 19:2-8 බලන්න). තමන්ගේම ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරමින් පාවුල් ආදර්ශයෙන් ඔවුන්ට ඉගැන්වූයේය. ස්වාමින්වහන්සේගේ නාමයෙන් කරන ලද මහත් හාස්කම් රැසක් ඔවුන් ඇස්වලින් දුටුවහුය (ක්‍රියා 19:11-12). යේසුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයන් නොවන අයව එළිදරව් කරනු ලැබූ අතර ඔවුහු පසුතැවිලි වූහ (ක්‍රියා 19:13-17). ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට නව ඇදහිලිවන්තයන් දිනාගනු ලැබීය (ක්‍රියා 19:17-20).

සම්ප්‍රදායික නායකයන්ගෙන් ශුභාරංචියට විරෝධතා පැමිණි විට, පාවුල් එපීසයේ ගෝලයන් උදෙසා පුහුණු වීමේ මධ්‍යස්ථානයන් පිහිටුවූයේය.

> **නුමුත් සමහරු මුරණ්ඩුව, අකීකරුව, සමූහයා ඉදිරියෙහි ඒ ලබ්ධි මාර්ගය ගැන දොස් කී කල්හි ඔහු ඔවුන් ළඟින් අහක්ව, ගෝලයන් වෙන්කරගෙන, තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දවස්පතා තර්ක කරමින් සිටියේය. (ක්‍රියා 19:9)**

පාවුල් ඇති කළ මධ්‍යස්ථානය තුළ ගෝලයන්ට වසර දෙකක පුහුණු පාඨමාලාවක් ලබා දෙන ලදී. පාසලේ අරමුණ වූයේ ශුභාරංචි පණිවුඩය ව්‍යාප්ත කරන ගෝලයන් ගුණනය කිරීමයි :

> **නුමුත් සමහරු මුරණ්ඩුව, අකීකරුව, සමූහයා ඉදිරියෙහි ඒ ලබ්ධි මාර්ගය ගැන දොස් කී කල්හි ඔහු ඔවුන් ළඟින් අහක්ව, ගෝලයන් වෙන්කරගෙන, තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දවස්පතා තර්ක කරමින් සිටියේය. මෙය දෑවුරුද්දක් කෙරීගෙන ගියේය. මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරුද ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19:9-10)**

පුහුණු මධ්‍යස්ථානය තුළ සංස්කෘතික සීමාවන් නොවීය. ශිෂ්‍යයෝ යුදෙව්වන් හා අන්‍යජාතීන් (ලෝකය තුළ සිටින යුදෙව් නොව ජාතීන්) යන දෙපිරිසටම සේවය කළෝය. පාසලට භූගෝලීය සීමාවන් නොවීය. ශිෂ්‍යයෝ තම නගරය වූ එපීසය තුළ සේවය කළා පමණක් නොව, ඔවුහු මුළු මහත් ආසියා මහද්වීපය වෙතම ළඟා විය. පාවුල් බිහි කළ පුහුණු මධ්‍යස්ථානය එහි අරමුණ ඉටු කළේය.

> **. . . මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරු ද ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19:10)**
>
> **එපමණ බලගතු ලෙස ස්වාමින්වහන්සේගේ වචනය වර්ධනයවී, බලවත්වුණේය. (ක්‍රියා 19:20)**

එපීසයේ තිබූ පුහුණු මධ්‍යස්ථානය විසින් ශුභාරංචියේ බලවත් සේවකයන් වීමට ඇදහිලිවන්තයන්ව පුහුණු කළෝය. මුළු ආසියාවටම දේව වචනය ගෙනයාම සඳහා මෙම ගෝලයෝ ආත්මිකව ගුණනය වූහ. එවැනි මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් පාවුල් තමන්ගේ සේවය ගුණනය කළේය.

## දිගින් දිගටම සිදුවූ ක්‍රියාවලියක්

ක්‍රියා 19:23-41 හා 20:1 කියවන්න. මන්ත්‍ර ගුරුකම් කරන භාණ්ඩ, පොත්පත් ආදිය විකිණීම එපීසයේ විශාල ව්‍යාපාරයක් විය. මිනිසුන් පාපය ගැන පසුතැවිලි වී ශුභාරංචියේ මාර්ගය අනුගමනය කළ විට, ව්‍යජ දෙවිවරුන්ට නමස්කාර කිරීමට පාවිච්චි කළ මෙම ද්‍රව්‍ය ඔවුහු තවත් මිලදී නොගත්හ. ඔවුහු පෙර මිළදී ගෙන තිබූ එවැනි ද්‍රව්‍ය ගිනි තැබූහ.

එවැනි ද්‍රව්‍ය විකිණීමෙන් තම වෙළඳාම කරගෙන ගිය වෙළඳුන් ඉතා කෝප වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස කෝලාහලයක් ඇතිවූ අතර අවසානයේදී පාවුල්ට නගරය අතහැර යාමට සිදුවිය. එහෙත් පාවුල් වෙන්ව යන විට, ඔහු ඉතා වැදගත් යමක් එපීසියේ තබා ගියේය. ශුභාරංචියේ කාර්යය ඉදිරියට ගෙන යාමට පුහුණුව ලත් ගෝලයන් පිරිසක් ඔහු එහි තබා ගියේය. නව ඇදහිලිවන්තයන්ට ගෝලත්වය වෙත මගපෙන්වීමට පිහිටෙවූ මධ්‍යස්ථානයක් ඔහු එහි තබා ගියේය. පාවුල්ට තවදුරටත් නගරය තුළ රැඳී සිටිය නොහැකි වූ විට ඔහු පිහිටෙවූ මධ්‍යස්ථානය විසින් ගුණනය වීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයන ලදී.

## අද දවසේ අවශ්‍යතාව

අද දවසෙත් එවැනි පුහුණු මධ්‍යස්ථානවල අවශ්‍යතාව තිබේ. ඇදහිලිවන්තයන් ගුණනය වන විට, ඔවුහු ගෝලයන් ලෙස පුහුණු කරනු ලැබීම වැදගත් වේ. ලෝකයට ශුභාරංචිය ගෙන යාමට ගෝලයන්ට ඇති වගකීම ගැන ඔවුන්ට අභියෝග කළ යුතුය.

රටවල් තුළ දේශපාලනික වෙනස්වීම් සිදු වන විට තමන් සේවය කරමින් සිටි රටවල් අතහැර යාමට බොහෝ මිෂනාරිවරුන්ට බලකරනු ලබනවා ඇත. ඔවුන් නැති විටද ගුණනය වීමේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදුවීමට නම්, එපීසයේ තිබූ ආකාරයේ පුහුණු මධ්‍යස්ථාන ඔවුන් විසින් පිහිටුවනු ලැබ තිබිය යුතුය.

මෙම පරිච්ඡේදයේ ඉතිරි කොටස එවැනි මධ්‍යස්ථානයක් පිහිටුවීමට අවශ්‍ය උපදෙස් සපයයි. ගුණනය වීමේ මෙම ක්‍රමය පිළිබඳ දර්ශනය තදින් අල්ලාගනු ලැබූ සභාවන් සමූහයක් විසින් හෝ පාවුල් වැනි තනි පුද්ගලයෙකු විසින් එය ආරම්භ කරනු ලැබිය හැකිය.

# දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවන ආකාරය

දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට:

## 1. දෙවියන්වහන්සේගේ සැලැස්ම සොයන්න.

පාවුල් සේවය කළ හැම ස්ථානයකදීම ඔහු ගෝලයන් පුහුණු කළද එම සෑම ස්ථානයකම ඔහු පුහුණු මධ්‍යස්ථානයන් පිහිටවූයේ නැත. මෙම පාඨමාලාව තුළදී ආත්මිකව ගුණනය වීමේ විවිධ ක්‍රම ඔබ ඉගෙන ගන්නේය. ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ගෝලයන් ගුණනය කිරීමේ දෙවියන්වහන්සේගේ අරමුණ නොවෙනස්ව තිබේ. එම අරමුණ ඉටු කර ගන්නා ක්‍රම වෙනස් වේ.

දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමේ පළමු පියවර දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීමයි. දෙවියන්වහන්සේ තමන්ගේ කැමැත්ත මනුෂ්‍යයන්ට එළිදරව් කරන ආකාරය තේරුම් ගැනීමට ඔබට උපකාර කරන *"දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීම"* නම් පාඨමාලාවක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය විසින් ඉදිරිපත් කරයි. විවිධ ප්‍රදේශ සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම වෙනස් වන නිසා හා සංස්කෘතීන් වෙනස් වන නිසා, දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල අවශ්‍යතාව හා ඒවා සංවිධානය කරන ආකාරය වෙනස් වනු ඇත.

## 2. අරමුණ තේරුම්ගන්න :

එපිසයේ තිබූ ආකාරයේ පුහුණු මධ්‍යස්ථානයක අරමුණ පිළිබඳව ඔබට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. එවැනි පාසලක අරමුණ ව්‍යාපාර, කර්මාන්ත, කෘෂි කර්මාන්ත ආදී රැකියා සඳහා පුරුෂයන් හා ස්ත්‍රීන් පුහුණු කිරීම නොවේ. විද්‍යාල හා වෘත්තීය පුහුණු පාසල් මෙම අරමුණ ඉටු කිරීම උදෙසා වේ.

එපිසයේ වූ පාසල ගෝලයන් පුහුණු කළ අතර සේවයේ කාර්යය උදෙසා ඔවුන්ව සන්නද්ධ කළේය. අරමුණ වූයේ භූගෝලීයව (මුළු ආසියාව පුරා) හා සංස්කෘතිකව (යුදෙව්වන්ට හා අන්‍යජාතීන්ට යන දෙපාර්ශවයටම) ශුභාරංචිය ව්‍යාප්ත කිරීමයි. ඉන් අනතුරුව දිගින් දිගටම සිදු කරනු ලැබූ ගුණනය වීමේ ක්‍රියාවලියක් තුළින් නව ඇදහිලිවන්තයන්ව ගෝලයන් ලෙස පුහුණු කරනු ලැබීය.

මෙම ගෝලයන්ගෙන් ඇතැමෙක් ව්‍යාපාරිකයන් හෝ ගොවීන්ව සිටියා විය හැකිය. නමුත් එපිසයේ පාසල ඔවුන්ව මෙම වෘත්තීන් තුළ පුහුණු කිරීමක් සිදු නොකළේය. වෙළඳ සැලක රැකියාව කළ ද ශුභාරංචිය උදෙසා සම්පූර්ණ කාලීන සේවයේ නිරත වුවද, තමන් වැනිම අය බිහි කරන ගෝලයන් වීමට එය ඇදහිලිවන්තයන් පුහුණු කළේය.

පුහුණු කිරීමේ මධ්‍යස්ථානය සභාවේ ස්ථානය ගත්තේ නැත. මුල් සභාව රැස්වූ එක් ස්ථානයක් වූ සිනගෝගය තුළදී ඇදහිලිවන්තයන් දිගටම රැස්විය. එසේම තම නිවෙස්වල පැවැත්වූ සභාවන් තුළදී ද ඇදහිලිවන්තයන් දිගින් දිගටම රැස්විය.

එපිසයේ පැවති පාසල දුරස්ථ පුහුණු කිරීමේ සභාවක් නොවීය. පාසල සභාවේ කාර්යයන් ඉටු කළේ නැත. නමුත් එය තවදුරටත් ව්‍යාප්ත කළේය. මෙවැනි පුහුණු වැඩසටහනක අරමුණ වන්නේ දැනටමත් ක්‍රියාකාරීව ශුභාරංචිය ව්‍යාප්ත කරන ආයතනයක් මගින් කෙරෙන වැඩය ප්‍රතිස්ථාපනය කිරීම නොවේ.

පාසලේ අරමුණ ලියා තැබීම යෝග්‍ය වේ. මෙය "අරමුණු ප්‍රකාශනය" ලෙස හැඳින්වේ. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ අරමුණට සැබෑ ලෙස කැපවීමට එය ඔබට උපකාර කරනු ඇත (හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණු මගින් කළමණාකරණය කිරීම"* යන පාඨමාලාව එවැනි ප්‍රකාශනයක් ලියන ආකාරය පැහැදිලි කරයි).

## 3. අයවැය ලේඛණයක් සකසන්න :

අයවැය ලේඛණයක් යනු යමකට වැයවන මුදල පිළිබඳ තක්සේරුවකි. ඔබ පාසල උදෙසා පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන පහසුකම්, ඔබ එයට ප්‍රචාරය ලබා දෙන ආකාරය හා ඔබ

තෝරාගන්නා ඉගැන්වීම් විෂයමාලාව ආදිය ඔබට වියදම් කිරීමට ඇති මුදල් ප්‍රමාණය මත රඳා පැවතිමට සිදු විය හැකිය.

පාසලක් ආරම්භ කිරීමට අවශ්‍ය අරමුදල් ඔබ සතුව ඇති නම්, මෙම මුදල් සඳහා අයවැය ලේඛණයක් සෑදිය යුතු වේ. එසේ නම් ඔබ පහසුකම්, ප්‍රචාරක කටයුතු හා විෂයමාලාව වැනි දේ සඳහා වියදම් කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය පැහැදිලිව ලියා ගන්න.

මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අවශ්‍ය අරමුදල් ඔබ සතුව නොමැති නම්, මූල්‍ය අවශ්‍යතා සම්පූර්ණ කරන ලෙස දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න. මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා සභාවන් සමූහයක් සාමූහිකව ක්‍රියා කරන්නේ නම්, ඇතැම්විට සෑම සභාවකටම ව්‍යාපෘතියට දායක විය හැකිය. ඇතැම්විට පාසලේ ශිෂ්‍යයන්ටද දීමනා දිය හැකිය.

මුදල් හිඟකම දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ කාර්යයන් ඔබව වළක්වාලිය යුතු නොවේ. භාවස්ථිටයිම් ආයතනයේ ඉගැන්වීම් පාවිච්චි කර නිවසක හෝ ඒ හා සමාන කුලී ගෙවීමක් අවශ්‍ය නොවන ස්ථානයක පාසල ආරම්භ කරන්න. ගුරුවරුන්ට හා සේවක මණ්ඩලයට ශිෂ්‍යයන් පුහුණු කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය හැකිය.

## 4. ස්ථානයක් තෝරාගන්න:

තම ගෝලයන් උදෙසා වූ පාසල සඳහා පාවුල් විසින් තෝරාගත් එපීසය යන නගරය කාර්යබහුල වෙළඳ වරායක් විය. එය සංචාරය මධ්‍යස්ථානයක් මෙන්ම ඩයනා (අර්තේමියස්) නම් බොරු දේවතාවිගේ යන්ත්‍ර මන්ත්‍රවල මූලස්ථානයක් ද විය.

මෙම සියලු කරුණුවල ප්‍රතිඵලයක් ලෙස බොහෝ දෙනෙක් එපීසයේ වාසය කළ අතර බොහෝ දෙනෙක් ඒ නගරයට පැමිණියහ. එපීසයේ සිටි විශාල ජනගහනය වෙත ශුභාරංචි පණිවුඩයෙන් ළඟා වීම ශිෂ්‍යයන් පුහුණු කිරීමට මහත් අවස්ථාවක් ලබා දුන්නේය. නගරයේ වාසය කළ මහත් ජනගහනය වෙත ශුභාරංචිය දේශනා කළ හැකි වුවා පමණක් නොව, සංචාරකයන් ලෙස හෝ ව්‍යාපාර සඳහා නගරයට පැමිණි දහස් ගණනක් වෙත ළඟා වීමේ අවස්ථාව ද විය. ශුභාරංචිය පිළිගත් මෙම පිටින් පැමිණි පුද්ගලයන් යළි නිවෙස් බලා ගිය විට, ඔවුහු ඔවුන් සමග පණිවුඩයද රැගෙන ගියෝය. ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ඔවුහු සියගණනක් වූ නගර හා ගම්මාන වෙත ගියහ.

එපීසය ඩයනා නැමැති දෙවගන උදෙසා වූ දේවතා පිදෙව්ලිවල මධ්‍යස්ථානයක් වූ බැවින්, යක්ෂාවේශ වුවන් හා යන්ත්‍ර මන්ත්‍ර කටයුතු සමග ගනුදෙනු කළ යුතු ආකාරය පුහුණ කිරීමේ අවස්ථාව එහිදී හිමි විය. මෙම නපුරු නගරය තුළ ක්‍රියාත්මක වෙමින් තිබූ, යක්ෂ බල වේග සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයන්ට හැකි වුයේ නම්, ඔවුන්ට නිසැකවම යක්ෂයාගේ ඊට වඩා අඩු මට්ටමින් බලපෑමට ලක්වූ නගරවලද සේවය කළ හැකිවේ.

පුහුණුව ලබා ගැනීම සඳහා පාවුල් ශිෂ්‍යයන්ව ඔවුන්ගේ හුරුපුරුදු පරිසරයෙන් ඉවත් කළේ නැත. ඔවුන්ට ස්වභාවික වූ පරිසරයක සිට පාවුල් ඔවුන්ව පුහුණු කළේය. ඔවුහු තමුන්ගේම ජන සමාජය තුළ සිටිමින් තමන්ගේම භාෂාවෙන් ඉගෙන ගත්හ. ගෝලයන් උදෙසා වූ පුහුණු පාසල සඳහා පාවුල් උපක්‍රමශිලි ස්ථානයක් තෝරා ගත්තේය. ඔබගේ පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානය පිළිබඳව ඔබට මගපෙන්වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

මධ්‍යස්ථානය සඳහා ඔබ ස්ථානයක් පිළිබඳව සලකා බලන විට, මෙම ප්‍රශ්න අසන්න:

**පළමුව:-** මේ ස්ථානය පුහුණුව ලැබීමට සිටින පුද්ගලයන්ට පැමිණිය හැකි ස්ථානයක් ද?

පුහුණුව ලබා ගැනීම සඳහා පුද්ගලයන්ට පාසල වෙත පැමිණිය හැකි විය යුතුය. ඔබ ගම්මානයක ජීවත් වන්නේ නම්, පුහුණුව ලබන පුද්ගලයන්ට පයින් ඇවිද යා හැකි දුරක ආයතනය පිහිටා තිබිය යුතුය. නගරයක නම්, පොදු ගමනාගමන පහසුකම් මගින් පහසුවෙන් ළඟා විය හැකි විය යුතුය. ඔබ පුහුණු කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයන්ගෙන් බහුතරයකට පහසුවෙන්ම ළඟා විය හැකි මධ්‍යස්ථ ස්ථානයක් සොයා ගන්න.

**දෙවනුව:-** එය උපක්‍රමශීලි ස්ථානයක් ද?

එපිසය ස්වභාවික වෙළෙඳ මාර්ගයේ පිහිටි මුහුදු වරායක් හේතුවෙන් එය උපක්‍රමශීලි නගරයක් විය. හැකියාවක් තිබේ නම් එවැනි ස්ථානයක ආයතනය පිහිටුවන්න. මිනිසුන් ස්වභාවිකවම එක් රැස්වන, යන එන හෝ විශාල ජනගහනයක් සහිත ස්ථානයක් තෝරා ගන්න.

සාතන්ගේ බලකොටුවක් තුළ පුහුණු මධ්‍යස්ථානය ස්ථානගත කිරීමට බිය නොවන්න. තමන්ට උගන්වනු ලබන දෙය අත්දැකීමට එමගින් ශිෂ්‍යන්ට මහත් අවස්ථාවක් ලබා දෙයි. ඩයනා සම්බන්ධ ඇදහිලිවල ප්‍රබල බලපෑම නිසා එපිසය එවැනි නගරයක් විය.

**තෙවනුව :** පාවිච්චි කළ යුත්තේ කවර පහසුකම්ද?

පුහුණු මධ්‍යස්ථානය උදෙසා විශේෂ ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවශ්‍ය නොවේ. තුරානස් නම් මනුෂ්‍යයෙකුට අයත් ස්ථානයක් පාවුල් පාවිච්චි කළේය. දැනටම පවතින සභාවක්, පාසල් ගොඩනැගිල්ලක්, නිවසක්, හෝ පොදු රැස්වීම් ශාලාවක් තුළ ඔබට දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ආරම්භ කළ හැකිය.

හැකියාවක් තිබේ නම්, මධ්‍යස්ථ ස්ථානයක එනම්, විශේෂිත සභා නිකායකට අයිති නොවන ගොඩනැගිල්ලක පාසල ස්ථාන ගතකිරීම වඩාත් යෝග්‍යවේ. වෙනත් නිකායකට අයත් ස්ථානයක් පාවිච්චි කිරීම යන හේතුව මත ඇතැම් පුද්ගලයන් මඟහැරීමකින් තොරව බොහෝ සභාවන්ගෙන් පැමිණෙන පුද්ගලයන්ට මෙමඟින් අවස්ථාව ලබා දෙයි.

තම සෙනඟ වෙනත් සභාවකට ගියහොත් තමන්ට ඔවුන් අහිමි වෙතැයි ඇතැම් සභා පාලකවරු බිය වෙති. ඇතැම් නිකායන් තම සාමාජිකයන්ට වෙනත් සභාවන්ට ඇතුලු වීමට අවසර නොදෙයි. එවැනි ආකල්ප නිවැරදි නොවන නමුත් ඒවා පවති. මධ්‍යස්ථ ස්ථානයක් තෝරා ගැනීමෙන් මෙවැනි ප්‍රශ්න රැසක් වැළකේ. ඔබට රජයේ හෝ නගරයට අයිති පහසුකමක් පාවිච්චි කළ හැකිය. ඇතැම් විට ඔබට නිවසක් පොදු රැස්වීම් ශාලාවක් කඳවුරු භූමියක් හෝ සාමාන්‍ය පාසල් ගොඩනැගිල්ලක් පාවිච්චි කළ හැකිය.

ඔබ පුහුණු කිරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයන් සංඛ්‍යාවට සරිලන ස්ථානයක් තෝරා ගැනීමට උත්සහ කරන්න. ඔබ ළඟා වීමට බලාපොරොත්තු පුද්ගලයන්ගේ සමාජ තලයට සරිලන ස්ථානයක් තෝරා ගන්න. උදාහරණයක් ලෙස ඔබට නගරයේ සිටින දිළිඳු පිරිසක් පුහුණු කිරීමට අවශ්‍ය නම් පුහුණුව ලබා ගැනීම සඳහා පළමු පංතියේ හෝටලයක රැස්වීම් ශාලාවක් වෙත පැමිණීම ඔවුන්ට සුවපහසු හැඟීමක් ඇති නොකරනු ඇත.

## 5. සුදුසු ඉගැන්වීම් විෂය මාලාවක් තෝරාගන්න

විෂය මාලාවක් යනු සංවිධානය කරන ලද අධ්‍යයන පාඨමාලාවක්ය. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ අරමුණ වන ගෝලයන් පුහුණු කිරීම හා සන්නද්ධ කිරීම වෙත ළඟා විය හැකි ඉගැන්වීම් විෂය මාලාවක් තෝරා ගැනීමට වගබලා ගන්න. උදාහරණයක් ලෙස පාසලේ අරමුණ වෙත ළඟාවීමේදී ඔබේ නිකායේ ඉතිහාසය පිළිබඳව වන පාඨමාලාවකට වඩා දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීම පිළිබඳ පාඨමාලාවක් වැදගත් වේ.

සාමන්‍ය ගිහි පුද්ගලයන් තෝරාගෙන ලෝකය පුරා ශුභාරංචිය ගෙන යන ගෝලයන් බවට ඔවුන් වෙනස් කළ යේසුස්වහන්සේ විසින් ඉගැන්වූ දේවල් පිළිබඳව දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ ඉගැන්වීම් විෂය මාලාවේ අවධානය යොමු විය යුතුය. එය බයිබලය මත පදනම් වූ විෂය මාලාවක් විය යුතුය. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සතුව එවැනි ඉගැන්වීම් විෂය මාලාවක් තිබේ. අප විසින් ඉදිරිපත් කරන ඉගැන්වීම් විෂය මාලාවක් පිළිබඳව වැඩිපුර විස්තර ඇතුළත් *“හැඩගැස්ම හා පරිපාලනය පිළිබඳ මාර්ගෝපදේශය”* ලබා ගැනීම සඳහා හාවස්ට්ටයිම් වෙත ලිපියක් එවන්න.

ඉගැන්වීම් විෂය මාලාව තෝරා ගැනීමේදී ඔබ පුහුණු කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. ඔවුන්ට කියවීමේ හා ලිවීමේ හැකියාව තිබේද? ඔවුන්ට ලිවීමට හා කියවීමට හැක්කේ කවර භාෂාවද? ප්‍රාදේශිය භාෂාවන් කිහිපයක් තිබේ නම්, පාසල තුළ භාවිත කළ හැකි පොදු භාෂාවක් තිබේද? පරිවර්තකයෙකු භාවිත කරමින් භාෂා දෙකකින් ඉගැන්වීමේ අවශ්‍යතාවක් තිබේද?

## 6. ගුරුවරු හා කාර්ය මණ්ඩලය තෝරාගන්න

දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය සඳහා ගුරුවරු තෝරා ගැනීමේදී ඔබට මගපෙන්වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. පාසලේ අරමුණ හා උගන්වනු ලබන ඉගැන්වීම් විෂය මාලාව සමග ඔවුන් එකඟ වන බව සහතික කොට දැනගන්න. ගුරුවරුන්ගේ අධ්‍යාපන මට්ටම සලකා බැලිය යුතුය. පුහුණුව ලැබිය යුතු ශිෂ්‍යයන්ගේ මට්ටමට සරිලන පරිදි ඉගැන්වීමේ හැකියාව ඔවුන්ට තිබිය යුතුය. නමුත් ඔවුන්ගේ අධ්‍යාපනයට වඩා වැදගත් වන්නේ ඔවුන්ගේ ආත්මික අත්දැකීම් හා ආත්මික දීමනාවන්ය.

තමන් ඉගෙන ගන්නා දෙය අත්දැකීමට ශිෂ්‍යයන් මෙහෙයවිය හැකි ගුරුවරු තෝරාගන්න. තමන්ගේ ජීවිතය හා සේවය තුළ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීම තුළින් නිසි ආදර්ශයක් ලබා දිය හැකි ගුරුවරු තෝරාගන්න. එපිසයේදී ශිෂ්‍යයන් ඉගෙන ගන්නේ පන්ති කාමරය තුළ පැවැත්වූ සැසිවාරයන් තුළින් පමණක් නොවන බව මතක තබාගන්න. ඔවුන් අත්දැකීම් තුළින් හා ඔවුන්ගේ ගුරුවරයා වූ පාවුල්ගේ ආදර්ශය තුළින් ඉගෙන ගන්න.

ඉගැන්වීමේ ආත්මික දීමනාව ඇති ඇදහිලිවන්තයන් තෝරාගන්න. ඔවුන්ගේ දීමනාව වර්ධනය කරගැනීමට උපකාරී වන වැඩිදුර පුහුණුව ඔවුන්ට ලබා දෙන්න. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය සඳහා ගුරුවරු පුහුණු කිරීමේදී හාවස්ට්ටයිම් ආයතනයේ *"ඉගැන්වීමේ උපක්‍රම"* යන පාඨමාලාව ඔබට උපකාරී වනු ඇත.

ගුරුවරුන්ට අමතරව ඔබට කාර්ය මණ්ඩල සාමාජිකයන්ද අවශ්‍ය විය හැකිය. පන්ති කාමර පිරිසිදු කර සූදානම් කිරීමට හෝ ඉගැන්වීම් විෂය මාලාව ලබාගැනීමට ඔබට යමෙකු අවශ්‍ය විය හැකිය. පාසල පිළිබඳ ප්‍රචාරණය කිරීමේදී එහි වගකීම දැරීමට කෙනෙකු අවශ්‍ය විය හැකිය. පාසල පිළිබඳව විස්තරාත්මකව සිතා බලන්න. පාසල පවත්වාගෙන යාම සඳහා කවර කාර්යයන් කළ යුතු වේද? අවශ්‍ය කාර්යයන් කිරීමට හැකියාව ඇති කාර්ය මණ්ඩල සාමාජිකයන් තෝරාගන්න.

## 7. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ප්‍රසිද්ධියට පත් කරන්න

පාසල පවතින බව මනුෂ්‍යයන් නොදනී නම් පුහුණුව ලබාගැනීම සඳහා එයට පැමිණීමට ඔවුන්ට නොහැකිය. ඔබ සේවය කිරීමට බලාපොරොත්තු වන ගම හෝ නගරය පුරා මධ්‍යස්ථානය පිළිබඳ ප්‍රවෘත්තිය ඔබ විසින් ව්‍යාප්ත කළ යුතුය.

ඔබ පාසල පිළිබඳව ප්‍රචාරණය කරන ආකාරය ඔබගේ පාසල පිහිටි ස්ථානය හා ප්‍රචාරණය සඳහා වැය කිරීමට ඔබට ඇති මුදල් ප්‍රමාණය අනුව වෙනස් වේ. පුහුණු මධ්‍යස්ථානය පිහිටියේ කුඩා ගම්මානයක නම්, ගෙයින් ගෙට යාමෙන් හා ගම්මානයේ ඇති සෑම සභාවක් වෙතටම යාමෙන් ඔබට ඒ පිළිබඳව ප්‍රචාරයක් ලබා දිය හැකිය. කට වචනයෙන් ප්‍රවෘත්තිය ව්‍යාප්ත කළ හැකිය. වැඩසටහන පිළිබඳව ඔබට සභාපාලකවරුන්ට තනි තනිව කතා කළ හැකිය. පුහුණුව ලැබීමේ ආශාව ඇති ඇදහිලිවන්තයන්ට ඔබට පෞද්ගලිකව කතා කළ හැකිය. මූල්‍ය පිරිවැයකින් තොරව සමස්ත ගම්මානයම වෙත පහසුවෙන් ළඟා විය හැකිය. නගරයක් තුළ විශාල ජනගහනයක් සිටින බැවින් එතරම් පහසුවෙන් ප්‍රවෘත්ති ව්‍යාප්ත නොවේ. පාසල පිළිබඳව ප්‍රචාරණයක් ලබා දීමට ඔබට පහත ක්‍රමවලින් කිහිපයක් භාවිත කළ හැකිය.
**සභාවන් වෙත යාම :** නගරයේ සිටින සියලුම සභාවෙන්ගේ ලයිස්තුවක් ලබාගන්න. දුරකථන නාමාවලියක් තුළින් හෝ සභාවන් ලියාපදිංචි කරන රාජ්‍ය ආයතනයක් මගින් ඔබට එවැනි ලයිස්තුවක් ලබාගත හැකිය. සෑම සභාවකම සභාපාලකවරයාට කතාකර දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය පිළිබඳ දර්ශනය බෙදාගන්න. සාමාන්‍ය දේව මෙහෙයකදී ඔහුගේ සාමාජිකයන් සමග එය බෙදාගැනීමට ඔබට ඉඩ දෙන ලෙස ඔහුට පවසන්න.

**සභාවේ නිවේදන පත්‍රිකාව :** ඔබේ නගරයේ සභාවන් සාමාජිකයන්ට සතිපතා නිවේදන පත්‍රිකාවක් ලබා දෙයි නම්, සභාවේ නිවේදන පත්‍රිකාව තුළ අන්තර්ගත කළ හැකි කුඩා පත්‍රිකාවක් සකස් කරන්න (මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය කිරීම" සඳහා කොටසේ ඇති ආකෘතිය බලන්න).

**පුවත්පත් වාර්තාවන් :** ප්‍රාදේශිය පුවත්පත් සඳහා පාසල පිළිබඳ පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. මුදල් ගෙවා ප්‍රචාරය කරන දැන්වීමක් සඳහා වැයවන මුදල පිළිබඳව ද විමසන්න (පුවත්පත් වාර්තාවක් පිළිබඳ ආදර්ශයක් සඳහා "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටස බලන්න).

**පෝස්ටර් :** පාසල පිළිබඳ ප්‍රචාරය කිරීමට පෝස්ටරයක් සූදානම් කරන්න. පුද්ගලයන් ඇතුලු වන විට හා පිටවන විට ඔවුන්ට දැක ගත හැකි පරිදි සභාවක් ඉදිරිපිට පෝස්ටර් අලවන්න. කාර්යබහුල වීථියකට මුහුණලා පිහිටි වීදුරු දොරටු හෝ ජනේල දේවස්ථාන තුළ තිබේ නම් දේවස්ථානය පසුකර යන පුද්ගලයන්ට දැකගත හැකි පරිදි පෝස්ටර් අලවන්න.

ප්‍රාදේශිය කිතුනු පොත් හල්, කිතුනු ව්‍යාපාර ස්ථාන ,පාසල් ආදියෙහි දැන්වීම් පුවරු මත ජනේලවල පෝස්ටර් ඇලවීමට ඔවුන්ගෙන් අවසර ලබා ගන්න. වෙළඳසැල්, බැංකු ආදී ජනයා රැස්වන ඕනෑම ස්ථානයක පෝස්ටර් අලවන්න. පෝස්ටර් ඇලවීමට පෙර හිමිකරුවන්ගෙන් අවසරය ලබා ගැනිමට සහතික වන්න. එවැනි පෝස්ටර් තහනම් කරන රජය මගින් පැනවූ නීති නොමැති බව තහවුරු කර ගන්න.

**කිතුනු වැඩසටහන් :** ඔබගේ ප්‍රදේශය තුළ ඇදහිලිවන්තයන් සහභාගි වන රැස්වීම්, ප්‍රසංග හෝ සමුළු ආදිය සැළසුම්කර තිබේ නම්, එම වැඩසටහන තුළදී පුහුණු මධ්‍යස්ථානය පිළිබඳව නිවේදනය කරන ලෙස නායකයන්ගෙන් ඉල්ලන්න.

**සභා සාමාජිකයන්:** පෝස්ටර් හෝ අත් පත්‍රිකා බෙදා දෙන ලෙස සභා සාමාජිකයන්ගෙන් ඉල්ලන්න. සභාවේ දැන්වීම් පත්‍රිකාව තුළ ඇතුළත් කළ පත්‍රිකාවම අත්පත්‍රිකාව ලෙස යොදාගත හැකිය.

**සේවකයන්ගේ සහභාගිත්වයන් :** නගරය තුළ සේවකයන්ගේ කවුන්සිලයක් හෝ සහභාගිත්වයක් තිබේ නම්, නායකයන් සමග කතා කර ඔවුන්ගේ රැස්වීමකදී පුහුණු මධ්‍යස්ථානය පිළිබඳව කරුණු බෙදාගැනීමට කාලය ඉල්ලා ගන්න. සෑම සේවකයෙකුටම ලබා දීමට පෝස්ටර්, අත්පත්‍රිකා හා නිවේදන පත්‍රිකා තුළ ඇතුළත් කරන පත්‍රිකා ඔබ සමග තබාගන්න.

**නිකායේ ලයිස්තුව:** ඔබේ නිකායට අයත් සෑම සභාපාලකවරයෙකුටම හා සභාවකටම ලිපියක් යවන්න. තමන්ගේ නිකායන් තුළ ඇති ලයිස්තු ඔබ වෙත තැපැල් කරන ලෙස අනෙකුත් සභාපාලකවරුන්ගෙන් ඉල්ලන්න.

**ප්‍රාදේශිය කිතුනු සංවිධාන :** ඔබේ ප්‍රදේශයේ ඇති ප්‍රාදේශිය කිතුනු සංවිධානවල නායකයන් සමග කතා කරන්න. උදාහරණ ලෙස යෞවන කිතු මග, කැම්පස් කෲසේඩ්, Young life, Full Gospel, Businessmens' Fellowship, Women's Aglow, Teen challenge යනු එවැනි ආයතන කිපයකි. නායකයන් හමුවී ඔවුන්ගේ සාමාන්‍ය රැස්වීමකදී දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය පිළිබඳව ප්‍රවෘත්තිය බෙදාගැනීමට අවසර ලබාගන්න.

## 8. පළමු සැසිවාරය මෙහෙයවන්න

පුහුණු මධ්‍යස්ථානයේ පළමු සැසිය ඉතා වැදගත් වේ. එය ප්‍රදේශයේ සිටින සභාපාලකවරුන්ට හා ඇදහිලිවන්තයන්ට විවෘත විය යුතුය. සැසිවාරය තුළ පහත දේවල් අන්තර්ගත විය යුතුය.

1. ගුරුවරු හා සේවක මණ්ඩලය හඳුන්වා දිම.
2. පුහුණු මධ්‍යස්ථානයේ අරමුණ පැහැදිලි කිරීම.
3. පාසල තුළ භාවිත කරන ඉගැන්වීම් විෂය මාලාව පිළිබඳ හැඳින්වීමක්
4. යාච්ඥාවේ, ප්‍රශංසාවේ හා ගීතිකා ගායනා කිරීමේ කාලයක්
5. පාසල තුළින් ඉදිරිපත් කරන දේවල් පිළිබඳව උනන්දුව ඇතිකරන ඉගැන්වීම් සැසියක්
6. සියලු පහසුකම් හා ගුරුවරු කැපකරන අවසන් යාච්ඥාවක්

7. පුහුණු වැඩසටහනට සහභාගි වීමට අවශ්‍ය අය ලියාපදිංචි කිරීම. පළමු සැසිය අවසානයේ විසිර යාමට පෙර ලියාපදිංචිය සිදු කළ යුතුය. ශිෂ්‍යයන්ට ගුරුවරු හමුවී, ඉගැන්වීම් විෂය මාලාව පිළිබඳ හැඳින්වීමක් ලබාගෙන, ආදර්ශ ඉගැන්වීමක් ලබා ගත හැකි වේ.

සම්පූර්ණ පුහුණු පාඨමාලාවට ඇතුළත් වීමට මෙමගින් ඔවුන්ව උනන්දු කළ යුතුය (මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටසේ ඇති ආදර්ශ ඇතුළත් කරගැනීමේ අයදුම්පත බලන්න).

## 9. ක්‍රමානුකූල පන්ති සැසිවාර:

ක්‍රමානුකූල පන්ති සැසිවාර මෙහෙයවීම සඳහා මාර්ගෝපදේශ කිහිපයක් පහත දැක්වේ :

1. සූදානම් වී සිටින්න : සෑම ගුරුවරයෙකුම තමන් ඉගැන්වීමට බලාපොරොත්තු වන විෂය හොඳින් දැන සිටිය යුතුය. සෑම පන්ති වාරයක් සඳහාම අවශ්‍ය නිසි සටහන් හා ද්‍රව්‍ය සූදානම්ව තිබිය යුතුය. සෑම පාඩමක් සඳහාම ඔහුට නිශ්චිත අරමුණු තිබිය යුතුය. ඔබ හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ඉගැන්වීම් යොදාගන්නේ නම්, සෑම පරිච්ඡේදයක් ආරම්භයේදීම අරමුණු ලයිස්තුගත කර තිබේ. පන්ති කාමර ශිෂයන් සඳහා සූදානමින් ඇති බව සැක හැර දැනගන්න. සෑම ශිෂ්‍යයෙක් සඳහාම පෙළපොත් සූදානම් කර තබන්න. ඔබට අවශ්‍ය උපකරණ තිබේ නම් ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සවන්දීමේ/නැරඹීමේ මධ්‍යස්ථාන සූදානම් කළ හැකිය. ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටිගත කරන ලද උපදෙස්වලට ශිෂ්‍යයන්ට සවන් දිය හැකිය.

2. නිසි වෙලාවට වැඩ කරන්න : ශුද්ධාත්මයාණන්වහන්සේ වෙනත් දෙයකින් මඟපෙන්වන්නේ නැතිනම්, පන්ති සැසිවාර නිසි වෙලාවට ආරම්භ කර වෙලාවට අවසන් කරන්න.

3. යාච්ඤා කරන්න : පන්තිය යාච්ඤාවෙන් පටන්ගෙන යාච්ඤාවෙන් අවසන් කරන්න.

4. නැවත මතක් කරන්න සහ සාරාංශගත කරන්න : පසුගිය සැසියේදී උගන්වනු ලැබූ දේවල් කෙටියෙන් මතක් කරමින් සෑම පන්ති සැසිවාරයක්ම ආරම්භ කරන්න. එම සැසිය තුළ උගන්වනු ලැබූ දේවල්වල සාරාංශයක් සමග සෑම පන්තියක්ම අවසන් කරන්න.

5. විවිධ ඉගැන්වීම් ක්‍රම පාවිච්චි කරන්න : මෙම ක්‍රම පිළිබඳ පුහුණුවක් සඳහා හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ඉගැන්වීම් උපක්‍රම"* නමැති පාඨමාලාව අධ්‍යයනය කරන්න.

6. ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වයට විවෘත වන්න : පාඩම සම්පූර්ණ කිරීමට හෝ සැලසුම් කරන ලද න්‍යාය පත්‍රයක් අනුගමනය කිරීමකට වඩා මෙය වැදගත් වේ.

7. උගන්වනු ලැබූ දෙය අත්දකින්නට ශිෂ්‍යයන්ට මගපෙන්වන්න : උදාහරණයක් ලෙස ඔබ සුවකිරීම පිළිබඳව උගන්වන්නේ නම්, පැමිණ සිටින රෝගී අය උදෙසා යාච්ඤා කරන්න. ශුද්ධාත්මයෙන් බව්තිස්ම වීම පිළිබඳව උගන්වන්නේ නම්, එය ලබා නොමැති අයට එම අත්දැකීම වෙත මඟපෙන්වන්න.

8. පන්ති කාමරයෙන් පිටත ඉගෙනුම් අත්දැකීම් සැළසුම් කරන්න : පන්ති සැසිවාර අතරතුරදී සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන්ට අධ්‍යයන පැවරුම් ලබාදෙන්න. ඔවුන්ගේ සභාව හා සමාජය තුළ සිදු කෙරෙන ප්‍රායෝගික සේවයන් හරහා තමන් ඉගෙන ගන්නා දේ ප්‍රායෝගිකව යෙදවීමේ අවස්ථාව ඔවුන්ට ලබා දෙන්න.

   මතක තබාගන්න : පාසලේ අරමුණු ශුභාරංචිය ව්‍යාප්ත කිරීම උදෙසා සංස්කෘතික හා භූගෝලීය සීමාවන් ඉක්මවා යාමට ගෝලයන් සන්නද්ධ කිරීම වේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. එපිසියේ ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට පාවුල් යොදාගත් ක්‍රම මොනවාද?

3. එපිසියේ තිබූ පුහුණු මධ්‍යස්ථානය විස්තර කරන්න.

4. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක අරමුණ කුමක්ද?

5. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සම්බන්ධව මෙම පරිච්ඡේදයේ දී ඇති උපදෙස් සාරාංශ කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. පරණ ගිවිසුම තුළ එලියා ප්‍රොපේතවරු උදෙසා පාසලක් සංවිධානය කළ අතර ඔහු එහි ප්‍රධානියා විය (2 රාජාවලිය 2:4 බලන්න). ප්‍රොපේතවරුන්ගේ සේවය පිළිබඳව සලකන විට ඔබ සිතන ආකාරයට මෙම පාසල උදෙසා වූ ඉගැන්වීමේ විෂය මාලාව තුළට කවරාකාර පාඨමාලාවන් අන්තර්ගත වූයේද?

2. මෙම පාඨමාලාව තුළ ඔබ කොටසක් ලෙස ඉගෙන ගන්නා දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් තුළ පාවිච්චි කළ හැකි පුහුණු පාඨමාලාවක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය විසින් සපයා දෙයි. මෙම ආයතනය දෙවියන්වහන්සේ විසින් සේවය තුළ බලවත් ලෙස පාවිච්චි කරනු ලැබීමේ ආශාව ඇති කිතුනු ගිහි පුද්ගලයන් උදෙසා සැලසුම් කරන ලද ජංගම පුහුණු වැඩසටහනකි. එමගින් අවධානය යොමු කරනුයේ, ගිහි පුද්ගලයන්ව බලය ප්‍රදර්ශනය කරමින් ශුභාරංචි පණිවුඩය තම ලෝකය පුරා ගෙනගිය තමන් වැනිම වූ අය බිහි කිරීමේ හැකියාව ඇති ඇදහිලිවන්තයන් ලෙස වෙනස් කිරීමට යේසුස්වහන්සේ විසින් ඉගැන්වූ දේවල් වෙත වේ. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ ඉගැන්වීමේ විෂය මාලාව හැඳින්වීමේ අත්පොතක් හා මූලික පුහුණුව පිළිබඳ මොඩියුල හයක් ලෙස බෙදා ඇත. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා අපගේ කාර්යාලය වෙත ලිපියක් එවන්න.

3. දුරස්ථ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කරගැනීමේදී පාවිච්චි කිරීමට උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

**පුවත්පත් ලිපියකට උදාහරණයක් පහත දැක්වේ :**

(දිනයන්) වලදී තම නගරයට පැමිණෙන හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සමග එක්වන ලෙස (නගරයේ නම) ප්‍රදේශයේ සභාව ඔබට ආරාධනා කරයි.

ප්‍රාදේශිය සංවිධාන කමිටුවේ සභාපති වන (සභාවේ ප්‍රාදේශිය සභාපාලකවරයාගේ නම) ට අනුව, හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සියලු නිකායන්ට අයත් කිතුනු සේවකයන් උදෙසා විවෘත වේ.

එම ආයතනය (සතියේ දින හා වේලාව) යන දිනවලදී (ස්ථානය) හිදී පන්ති පැවැත්වේ.

පුහුණු සැසිවාර හා ගුරුවරයන් ලෙස (සියලු පාඨමාලාවන්ගේ හා ගුරුවරුන්ගේ ලයිස්තුවක් ඉදිරිපත් කරන්න. උදාහරණයක් ලෙස, ගරු. ජිම් ස්මිත්, පළමු සභාවේ සභාපාලක විසින් උගන්වනු ලබන "ඇදහිල්ලේ අත්තිවාරම්" ආදි වශයෙනි.

වැඩිදුර විස්තර සඳහා (අතිරේක තොරතුරු සඳහා සම්බනධ කරගත යුතු පුද්ගලයන්ගේ නම්, ලිපිනය, දුරකථන අංකය) හා සම්බන්ධ වන්න.

**ගුවන් විදුලි හා රූපවාහිනි නිවේදනයක ආකෘතිය :**

(දිනයන්) වලදී තම නගරයට පැමිණෙන හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සමග එකතු වන ලෙස (නගරයේ නම) ප්‍රදේශයේ සභාව ඔබට ආරාධනා කරයි.

ප්‍රාදේශිය සංවිධාන කමිටුවේ සභාපති වන (සභාවේ ප්‍රාදේශිය සභාපාලකවරයාගේ නම) ට අනුව, හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය සියලු නිකායන්ට අයත් කිතුනු සේවකයන් උදෙසා විවෘත වේ.

පුහුණු සැසිවාර හා ගුරුවරයන් ලෙස (සියලුම පාඨමාලාවන්ගේ හා ගුරුවරයන්ගේ නම් ලයිස්තුගත කරන්න) අන්තර්ගත වේ.

පන්ති සැසිවාර (සතියේ දින හා වේලාව) යන දිනවලදී (ස්ථානය) හිදී පැවැත්වේ. වැඩිදුර විස්තර සඳහා (අතිරේක තොරතුරු සඳහා සම්බන්ධ කරගත යුතු පුද්ගලයාගේ නම, ලිපිනය, දුරකථන අංකය) හා සම්බන්ධ වන්න.

**ලියාපදිංචිවීමේ පත්‍රිකාවක ආකෘතිය :**

---

## භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය
## ලියාපදිංචිය

නම : ____________________

ලිපිනය : ____________________

දුරකථන අංකය : ____________________ වයස : ____________________

සභා නිකාය : ____________________

දැනට ඔබ ඔබේ සභාවේ දරන නායකත්ව තනතුර කුමක්ද?

____________________

ඔබේ අධ්‍යාපන පසුබිම කුමක්ද? ____________________

ඔබ හොඳින් කතාකරන, කියවන හා ලියන භාෂාව කුමක්ද? ____________________

(ඔබ කැමති වෙනත් අංගයක් ඔබට මෙම ලියාපදිංචි කිරීමේ පත්‍රිකාවට ඇතුළු කළ හැකිය)

____________________

**සභාපාලකවරු සඳහා උපදෙස් :**

භාවස්ට්ටයිම් ආයතනයේ තොරතුරු සමග සියලු ප්‍රාදේශිය සභාවන්ගේ සභාපාලකවරු වෙත මෙම ලිපිය යැවිය හැකිය.

හිතවත් සභාපාලකතුමනි :

ඔබේ සභාවේ කිතුනු නායකයන් හා ගිහියන් පුහුණු කිරීම සඳහා ඔබට හමුවන ඉතාමත් අනර්ඝ අවස්ථාවක් අපි ඔබ අත තබන්නෙමු.

භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය විසින් (නගරයේ නම) වෙත ගෙන එන මෙම විශේෂ පුහුණුවෙන් වාසි ලබාගත හැකි ආකාර පහත දැක්වේ.

1. මේ සමග එවා ඇති දේවල් ප්‍රවේසමෙන් කියවා බලන්න. විශේෂ ආරාධනාවක් හා ආයතනය පිළිබඳ පත්‍රිකා කිහිපයක් අප විසින් එවා ඇත.

2. ආයතනය පිළිබඳව නිවේදනය කරන පත්‍රිකාවේ පිටපතක් ඔබේ සභාවේ සිටින සෑම වැඩිහිටි සාමාජිකයෙකු අතටම ලැබෙන බව සැකහැර දැනගන්න.

3. පත්‍රිකාව ඔබේ සභාව තුළ පෝස්ටරයක් ලෙස පාවිච්චි කරන්න. ඇතුලුවන ස්ථාන හා පිටවන ස්ථාන සමීපයේ එකක් ප්‍රදර්ශනය කරන්න.

4. ඔබගේ සභාව යටතේ ශාඛා සභාවන් තිබේ නම් හෝ ඔබේ සභාවට ලිපි යැවීමේ ලැයිස්තුවක් තිබේ නම්, ඔවුන්ගේ සාමාජිකයන් සඳහා ලබාදීමට පත්‍රිකා ඔවුන් වෙත යවන්න.

5. ඔබ සහභාගි වන හෝ දේශනා කරන ඕනෑම සභාවක් මේ නම්, නිවේදන පත්‍රිකාවක් රැගෙන ගොස් මෙම අවස්ථාව අනෙකුත් සභාවන් සමග බෙදා ගන්න.

6. ඔබ රැස්වීමක්, සමුළුවක්, කඳවුරක්, සංගීත වැඩසටහනක්, සම්මන්ත්‍රණයක් හෝ සහභාගිත්ව රැස්වීමක් පවත්වන්නේ නම්, එයට පැමිණෙන අය අතර බෙදා දීමට නිවේදන පත්‍රිකා රැගෙන යන්න.

7. නගරයේ හෝ නිකායේ ප්‍රාදේශිය සේවකයන්ගේ සහභාගිත්වයක සාමාජිකයෙකු නම්, සාමාජිකයන්ට ආයතනය පිළිබඳව නිවේදනය කර පත්‍රිකා බෙදා හරින්න.

අතිරේක පත්‍රිකා ලබා ගැනීම සඳහා සම්බන්ධ කරගන්න.

(සම්බන්ධ කරගත යුතු පුද්ගලයාගේ නම, ලිපිනය, දුරකථන අංකය)

**ආයතනය පිළිබඳව නිවේදනය කරන පත්‍රිකාවක ආකෘතිය :**

හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය පිළිබඳව නිවේදනය කරන පත්‍රිකාවක් පහත දැක්වේ. ඔබේ ආයතනය පිළිබඳ තොරතුරු මෙයට ඇතුළත් කරන්න.

## හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය . . . මැඩේරා නගරයට පැමිණේ . . . එවැන්ජලිස්ත කිතුනුවන්ට කෙටි කාලීන පුහුණුවක්.

දිනයන් : සැප්තැම්බර් 13-ජනවාරි 5
වේලාවන් : සඳුදා-බදාදා-සිකුරාදා : ප.ව. 6.30 සිට ප.ව. 9.30 දක්වා
ස්ථානය : මහජන ශාලාව, 114, N.G.St., Madera .

**අන්තර්ගත පාඨමාලාවන් . . .**

ආත්මික අස්වැන්න උදෙසා වූ උපක්‍රම
ඇඳහිල්ලේ අත්තිවාරම්
දේවරාජ්‍යය තුළ ජීවත්වීම
ආත්මික සංග්‍රාමය
ශුද්ධාත්මයාණන්ගේ සේවය
දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීම
බයිබල් අධ්‍යයන ක්‍රම
බයිබල් සමීක්ෂණය
මුහුන් වැනි ශුභාරංචි සේවය
බයිබලීය ගෝලීය දැක්ම
ඉගැන්වීමේ උපක්‍රම
ගුණනය වීමේ ක්‍රමවේද
බලය පිළිබඳ මූලධර්ම
බයිබලීය කළමණාකරණ මූලධර්ම
පරිසරය විශ්ලේෂණය කිරීම
අරමුණු මගින් කළමනාකරණය
ක්‍රියාකාරී වීම සඳහා සන්නද්ධ කිරීමේ ක්‍රම වේද
ශරීරය උදෙසා වූ සටන

## උපදේශකයන් :

ගරු. බිල් ස්මිත්, මෙඩෙස්ට්‍රෝ හි පළමු සභාවේ සභාපාලක, සභාපාලක ස්මිත් මූඩි බයිබල් ආයතනයේ උපාධිධාරියෙකු වන අතර ශුභාරංචි සේවය උදෙසා අධික ලෙස ලෝකය පුරා සංචාරය කර තිබේ.

ගරු. ටිම් ජෝන්ස්, චීනය වෙත ගිය මිෂනාරි සේවකයෙකි. ආසියානු රටවල් පුරා සභාවන් රෝපණය කිරීමේ නිරත වූ අයෙකි.

ජෝඇන් ටූලි, යෝරුබා ඉන්දියානුවන් අතර සේවය කර ඇති, මැඬේරාහි දෙවන සභාවේ තරුණ අධ්‍යක්ෂකවරයාය.

- සියලු නිකායන්ට අයත් සියලු කිතුනුවන්ට විවෘත වේ. සම්පූර්ණ කළ බවට සහතික පත් පිරිනැමේ.
- ඇතුල්වීමේ ගාස්තු රහිතය (නොඑසේ නම් ගාස්තුව - )

වැඩිදුර විස්තර සඳහා : නම, ලිපිනය, දුරකථන අංකය . . .

**ආරාධනා කිරීමේ ලිපිය :**

සියලුම ප්‍රාදේශිය ඇදහිලිවන්තයන් වෙත යැවීමට ලිපියක් පහත දැක්වේ. මෙහි දී ඇති ආදර්ශ තොරතුරු වෙනුවට ඔබේ ආයතනයේ තොරතුරු ඇතුළත් කිරීමට මතක තබාගන්න.

හිතවත් මිත්‍රය :

ඔබේ ජීවිතයේ සෑම විනාඩියක්ම දෙවියන්වහන්සේ උදෙසා වටිනා කාලයක් බවට පත්කරගන්නේ කෙසේදැයි දැනගැනීමට ඔබට අවශ්‍ය වේද? ඒ කෙසේදැයි . . . හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේදී ඔබට ඉගෙන ගත හැකිය. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේදී ඔබ මෙවැනි පාඩමලාවන් ඉගෙන ගනු ඇත.

ආත්මික අස්වැන්න උදෙසා වූ උපක්‍රම
ඇදහිල්ලේ අත්තිවාරම
දේවරාජ්‍යය තුළ ජීවත්වීම
ආත්මික සංග්‍රාමය
ශුද්ධාත්මයාණන්ගේ සේවය
දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීම
බයිබල් අධ්‍යයන ක්‍රම
බයිබල් සමීක්ෂණය
මුහුන් වැනි ශුභාරංචි සේවය
බයිබලීය ගෝලීය දැක්ම
ඉගැන්වීමේ උපක්‍රම
ගුණනය වීමේ ක්‍රමවේද
බලය පිළිබඳ මූලධර්ම
බයිබලීය කළමණාකරණ මූලධර්ම
පරිසරය විශ්ලේෂණය කිරීම
අරමුණු මගින් කලමනාකරණය
ක්‍රියාකාරි විම සඳහා සන්නද්ධ කිරීමේ ක්‍රම වේද
ශරීරය උදෙසා වූ සටන

ආයතනයේ කාර්යය මණ්ඩලය තුළ පහත උපදේශකයන් අන්තර්ගත වේ.

ගරු. බිල් ස්මිත්, මෙඩෙස්ටෝ හි පළමු සභාවේ සභාපාලක, සභාපාලක ස්මිත් මූඩි බයිබල් ආයතනයේ උපාධිධාරියෙකු වන අතර ශුභාරංචි සේවය උදෙසා අධික ලෙස ලෝකය පුරා සංචාරය කර තිබේ.

ගරු. ටිම් ජෝන්ස්, චීනය වෙත ගිය මිෂනාරි සේවකයෙකි. ආසියානු රටවල් පුරා සභාවෙන් රෝපණය කිරීමේ නිරත වූ අයෙකි.

ජෝඇන් ටුලි, යෝරුබා ඉන්දියානුවන් අතර සේවය කර ඇති, මැඩේරාහි දෙවන සභාවේ තරුණ අධ්‍යක්ෂකවරයායා.

භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය දේවධර්ම ශාස්ත්‍රාලයක් නොවේ. . . එය, ඵලදායි කිතුනු ජිවිතයක් ගත කරන ආකාරය හා දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇති සේවය සම්පූර්ණ කරන ආකාරය ඔබට උගන්වන කෙටිකාලින සේවය පිළිබඳ පුහුණුවකි. ආයතනය පැවැත්වෙන දින නම්, සැප්තැම්බර් 13 සිට ජනවාරි 5 දක්වා වේ. සඳුදා, බදාදා හා සිකුරාදා යන දිනවල ප.ව. 6.30 සිට ප.ව. 9.30 දක්වා මඩේරා හි, 114. N.G.St. Madera හි පිහිටි මහජන ශාලාවේදී සැසිවාර පවත්වනු ලැබේ. ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් (559)661-1126 අංකයෙන් මා ඇමතිමට මැලි නොවන්න. ආයතනයේ පළමු රාත්‍රිය වන සැප්තැම්බර් 13 වන සඳුදා දිනයේදී ලියාපදිංචි කටයුතු සිදු කෙරෙනු ඇත.

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය

1. **මා අනුව එන්න. මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් වෙන්ට සලස්වන්නෙමියි ඔවුන්ට කී සේක.**
   **(මාර්ක් 1:17)**

2. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දුන් මුල්ම හා අවසාන ආඥාව නම් ආත්මිකව ගුණනය වීමයි. මාර්ක් 1:17 හා ක්‍රියා 1:8 බලන්න.
3. ගුණනය වීම යනු තමන් වැනිම වූ අය බිහිකිරීම තුළින් ආත්මිකව වර්ධනය වීමයි. ගුණනය වීම යනු වැයවීමේ ක්‍රියාවලියයි. යමක් ගුණනය වන විට එය එකම ස්වභාවයෙන් යළි යළිත් බිහිකරනු ලැබේ.
4. ආත්මික ගුණනය වීම සිදුවන්නේ ආත්මිකව තමන් වැනි අය බිහි කිරීමෙනි. අන් අය සමග ශුභාරංචිය බෙදා ගැනීමෙන්, ඔවුන් ඇදහිලිවන්තයන් වීමට මගපෙන්වීමෙන් හා ඔවුන් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් ලෙස පිහිටුවීමෙන් ඇදහිලිවන්තයෙකු තමන් වැනි අය බිහි කරයි.
5. "ක්‍රමය" යනු නිශ්චිත ඉලක්කයක් වෙත ළඟා වීමේ සැලැස්මයි.
6. "ක්‍රමවේදයන්" යනු ඉලක්කයක් වෙත ළඟා වීම සඳහා ඒකාබද්ධ කළ හැකි ක්‍රම පද්ධතියකි.
7. ආත්මික "ගුණනය වීමේ ක්‍රමවේද" යනු ආත්මිකව තමන් වැනි අය බිහිකිරීමේ අරමුණ වෙත ළඟා වීමේ හැකියාව ඇදහිලිවන්තයන්ට ලබා දෙන ක්‍රම පද්ධතියකි.
8. ඔබගේ සාරාංශය පළමු පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව සමග සසඳන්න.

## දෙවන පරිච්ඡේදය

1. **මක්නිසාද කුඩා දේවල දවස හෙළාදැක්කේ කවුද? (සෙකරියා 4:10).**
2. ඔබගේ සාරාංශය දෙවන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව සමග සසඳන්න.
3. භූගෝලීය වර්ධනය, ජන වාර්ගික වර්ධනය, සංඛ්‍යාත්මක වර්ධනය, ආත්මික වර්ධනය
4. පහත බයිබල් කොටස්වලින් ඕනෑම එකක් යොදාගත හැකිය.
   ගණන් කථාව 1:1-3, 2:23-24, 26:1-4, මතෙව් 9:13, ලූක් 15:7, 19:10, ක්‍රියා 1:15, 2:41, 4:4, 6:7, 9:32, 12:24, 16:5, 19:20, 28:30-31, යොහන් 3:16, 2 පේත්‍රුස් 3:9
5. ඔබගේ සාරාංශය දෙවන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව සමග සසඳන්න.
6. අ. අසත්‍යය ආ. අසත්‍යය

## තුන්වන පරිච්ඡේදය

1. **ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කී සේක. (මාර්ක් 4:33)**
2. උපමාවක් යනු ආත්මික සත්‍යයක් නිරූපණය කිරීම සඳහා ස්වභාවික ලෝකයේ උදාහරණයක් යොදාගන්නා කතාවකි. "උපමාව" යන පදයේ සැබෑ අර්ථය "සංසන්දනය කිරීම සඳහා එක ළඟ තැබීම" යන්නයි. උපමා කතාවලදී යේසුස්වහන්සේ ස්වභාවික උදාහරණ යොදා ගනිමින් ඒවා ආත්මික සත්‍යයන් සමග සංසන්දනය කළ සේක. උපමාවක් යනු ස්වර්ගික තේරුමක් ඇති ලෞකික කතාවකි.
3. ගෝලයන්ට ආත්මික මතයක් තිබූ බැවින් උපමා කතා තුළින් උගන්වන ලද ආත්මික සත්‍යයන් ගෝලයන්ට තේරුම්ගත හැකි විය. ආත්මික මතයක් නොමැති අය උපමා කතාවලට සවන් දුන් නමුත් ඔවුන්ට එය තේරුම්ගත නොහැකි විය.
4. තුන්වන පරිච්ඡේදයේ ඇති උපමා කතා පිළිබඳ සාකච්ඡාව බලන්න.

## හතරවන පරිච්ඡේදය

1. **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාර දෙන්න. (2 තිමෝති 2:2)**
2. "සාක්ෂිදැරීම" යනු ඔබ විසින් දැක ඇති, අසා ඇති හෝ අත්දැක ඇති දෙය පැවසීමයි. අධිකරණයකදී සාක්ෂිකරුවෙකු යනු යම් කෙනෙක් හෝ යම් දෙයක් ගැන සාක්ෂි දෙන අයෙකි. සාක්ෂිකරුවන් ලෙස අප යේසුස්වහන්සේ ගැනත් සියලු මනුෂ්‍ය වර්ගයාට ගැලවීම ගෙන දෙන පිණිස ඇති උන්වහන්සේගේ සැලැස්ම පිළිබඳවත් සාක්ෂි දැරිය යුතුය.
3. "ගිහිබව" යන වචනයේ අර්ථය "දෙවියන්වහන්සේගේ තෝරාගත සෙනඟට අයත්" යන්නයි. මෙම වචනයේ මූලික අර්ථය "දෙවියන්වහන්සේගේ සියලු සෙනඟ" යනුයි. සභාව තුළ විශේෂ පූර්ණ කාලීන ක්‍රියාවන්හි නිරත නොවන්නන් හැඳින්වීමට "ගිහියා" යන වචනය භාවිත විය.

4. “පූජ්‍ය” යන වචනය වර්ධනය වුයේ සභාවේ වෘත්තිය සේවකයන් හඳුනාගැනීම උදෙසාය. පූජ්‍ය යන වචනයෙන් අදහස් වනුයේ සේවය තම වෘත්තිය ලෙස සලකන හා සාමාන්‍යයෙන් සභාව මගින් පූර්ණකාලීනව සේවයේ යොදවා ඇති අය වේ.

5. ගිහිබවේ කැඳවීම යනුවෙන් අදහස් වන්නේ “පූජකයෙකු” හෝ නොඇදහිලිවන්තයන් උදෙසා ශුභාරංචි සේවකයෙකු වීමට ඇති කැඳවීම වේ.

6. දෙවියන්වහන්සේගේ සැලැස්ම ක්‍රියා 1:8 තුළ සාරාංශ කර තිබේ. ගුණනය වීමේ ක්‍රියාවලිය පසුපස ඇති දිව්‍යමය බලය ශුද්ධාත්මයාණන්වහන්සේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පණිවුඩයේ අන්තර්ගතය විය යුතු අතර මුළු ලෝකයම පණිවුඩය ලබාගන්නන් විය යුතුය. ඇදහිලිවන්තයන් ගුණනය වීමේ නියෝජිතයන් විය යුතුය. දෙවියන්වහන්සේගේ ක්‍රමය නම් සෑම ඇදහිලිවන්තයෙකුම ශුභාරංචිය පණිවුඩය ගැන “සාක්ෂි” දැරීම හා අන් අයට ඉගැන්වීමේ හැකියාව ඇති අයට ඉගැන්වීම වේ. 2 තිමෝති 2:2

7. ඇන්ඩෘ හා අනනියස්

8. ඥාතීන්, මිතුරන් හා ඔබ සමග වැඩ කරන අය සමග ශුභාරංචිය බෙදාගැනීමට පටන් ගන්න. පවතින සමාජීය ජාලයන් හරහා ශුභාරංචිය වඩාත්ම වේගයෙන් ව්‍යාප්ත වේ.

## පස්වන පරිච්ඡේදය

1. **මම නුඹට කියමි: නුඹ පේතෘස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි; පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. (මතෙව් 16:18)**

2. දෙවියන්වහන්සේගේ රාජයයට නැවත උත්පාදනය ලබා ඇති යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින සියලුම සැබෑ ඇදහිලිවන්තයන්ය.
3. පෙන්තකොස්ත දවසේදී ශුද්ධාත්මයාණන් විසින් සභාව උපද්දවන ලදී. ක්‍රියා 4 බලන්න.
4. පස්වන පරිච්ඡේදය තුළ ඇති උදාහරණ ලයිස්තුවත් සමග ඔබේ පිළිතුර සසඳන්න.
5. නමස්කාරය, සේවය, සහභාගිත්වය, මෙහෙවර
6. පස්වන පරිච්ඡේදය තුළ ඇති සාකච්ජාව බලන්න.
7. පස්වන පරිච්ඡේදය තුළ ඇති සාකච්ජාව බලන්න.

## හයවන පරිච්ඡේදය

1. **මක්නිසාද උන්වහන්සේ තුළ මුළු පූර්ණකම පැවතීමටත්, උන්වහන්සේගේ කුරුසියේ ලෙයින් සමාදානය උපදවා (කොලොස්සි 1:19).**
2. අභ්‍යන්තර වර්ධනය යනු සභාවේ සාමාජිකයන්ගේ ආත්මික වර්ධනය හා සංවර්ධනයයි. ඉන් අදහස් වනුයේ ප්‍රමාණයෙන් සිදුවන වර්ධනයට වඩා ගුණාත්වයෙන් සිදුවන වර්ධනයයි.
3. ආත්මික වර්ධනය යනු ආත්මික පරිණතභාවයේ සිදුවන වැඩිවීමක් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇදහිලිවන්තයා තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය වර්ධනය වේ.
4. හයවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව බලන්න.
5. හයවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව බලන්න.
6. හයවන පරිච්ඡේදයේ ඇති සාකච්ජාව බලන්න.

## හත්වන පරිච්ඡේදය

1. **තවද දෙවියන්වහන්සේගේ වචනය පතළ වී ගියේය. ගෝලයන්ගේ ගණන යෙරුසලමේ අතිශයින්ම වැඩි විය... (ක්‍රියා 6:7).**
2. ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේ තුළට නව ඇදහිලිවන්තයන් දිනා ගනිමින් ඔවුන්ව තම ප්‍රාදේශිය සභාව සමග සහභාගිත්වයට ගෙන ආ විට ව්‍යාප්ත වීම තුළින් සිදුවන වර්ධනය හට ගනී. එහි ප්‍රතිඵලය ප්‍රාදේශිය සභාව ගණනින් වැඩි වීමයි.
3. ඔබගේ සාරාංශය හත්වන පරිච්ඡේදයේ සාකච්ජාව සමග සසඳන්න.
4. ඔබගේ පිළිතුර හත්වන පරිච්ඡේදයේ සාකච්ජාව සමග සසඳන්න.

## අටවන පරිච්ඡේදය

1. **මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි ස්ථිරව, දවස්පතා ගණනින් වැඩිවූහ. (ක්‍රියා 16:5)**

2. සභාවක් සමාන සංස්කෘතියක් තුළ තවත් සභාවක් ආරම්භ කළ විට පැතිරීම තුළින් වන වර්ධනය ඇති වේ. ස්වභාවික ලෝකය තුළ දරුවකු යනු දෙමාපියන්ගේ ශාරීරික පැතිරීමක් වන්නා සේම, නව සභාව "මව්" සභාවේ පැමිණීමකි.

3. සභාවේ පැතිරීම තුළින් හා සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනය විස්තර කිරීමට සභාවන් රෝපණය කිරීම යන්න භාවිත වේ. ස්වභාවික ලෝකය තුළ ගොවියෙකු බීජයක් රෝපණය කරන අයුරින්ම කෙනෙකු සභාවක් රෝපණය කරයි. බීජය පැමිණ "මව්" ශාකය වැනිවූ ශාකයක් එමගින් බිහි කරනු ඇත.

4. පීඩා කිරීම නිසා යෙරුසලමේ සභාවේ සාමාජිකයෝ විසිර ගියහ. ඔවුන් වචනය දේශනා කරමින් සැමතැනම ගමන් කළ අතර නව ඇදහිලිවන්තයන් බිහිවන විට. නව සභාවන් බිහිවිය.

5. පැතිරීම තුළින් බිහිවන සභාවක් ආරම්භ විය හැකි ආකාරයන් මෙසේය.
   - එක් සභාවක් තවත් සභාවක් ආරම්භ කිරීම
   - එක් සභාවක් ආරම්භ කිරීමට සභාවන් කිහිපයක් සහයෝගය දැක්වීම.
   - සභාවන් දෙකක් හෝ කිහිපයක් බිහි කිරීමට විශාල සභාවක් බෙදීයාම.
   - සභාවක් ආරම්භ කිරීම සඳහා තනි ඇදහිලිවන්තයෙකුට නිශ්චිත ප්‍රදේශයක් වෙත මඟපෙන්වනු ලැබීම.

6. පැතිරීමෙන් බිහිවන සභාවන්ගේ පොදු වර්ග මෙසේය.
   - නිශ්චිත ජන සමාජයකට සේවය කරන සභාවන්
   - නිශ්චිත ජන වර්ගයකට සේවය කරන සභාවන්
   - විශේෂ අරමුණු සහිත සභාවන්

7. බයිබලය ප්‍රමුඛතාව දෙන පරිදි නව සභාවන් රෝපණය කළ යුත්තේ ළඟා නොවූ ප්‍රදේශවල, පිළිගැනීමට සූදානම් ප්‍රදේශවල, නගරවල හා ඉන් අනතුරුව දුෂ්කර ප්‍රදේශවලය.

8. නව සභාවන් බිහි කරන පණිවුඩය බයිබලය මත පදනම් වූ ක්‍රිස්තුස්වහන්සේ කේන්ද්‍ර කරගත්, අවශ්‍යතාව කේන්ද්‍රකරගත් පණිවුඩයයි.

## නවවන පරිච්ඡේදය

1. **...මා කෙරෙහි ඇදහීමෙන් ඔවුන් පව්-කමාව ද පිරිසිදු කරනු ලැබූ අයවලුන් අතරෙහි උරුමයක්ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්නට... (ක්‍රියා 26:17,18)**

2. වෙනස් සංස්කෘතියක් තුළ නව සභාවක් බිහි කිරීම සඳහා සභාවක් විසින් ජාතික, භාෂාමය හෝ වාර්ගික සීමා ඉක්මවා යන විට සම්බන්ධවීම තුළින් සිදුවන වර්ධනය හටගනී.

3. ක්‍රියා 1:8, ශුභාරංචිය යෙරුසලමේ පටන් "පොළොවේ සීමාවන් දක්වා" ව්‍යාප්ත කරනු ලැබීය.

4. ප්‍රේරිත පාවුල්

5. ඔබේ සාරාංශය නව වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමග සසඳන්න.

## දහවන පරිච්ඡේදය

1. **එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

2. "හැරුණු" යන වචනයෙන් අදහස්වන්නේ යේසුස්වහන්සේ කෙරෙහි අදහස ඇදහිල්ලෙන් නැවත උත්පාදනය ලබා දේව රාජ්‍යයේ කොටසක් බවට පත්වූ පුද්ගලයන්ය.

3. "ගෝලයෙකු" යනු කිතුනු ඇදහිල්ලේ මූලිකාංග තුළ පිහිටුවනු ලැබූ හා නව ඇදහිලිවන්තයන් බිහිකිරීමේ හා ඔවුන්ව ගෝලයන් ලෙස පුහුණු කිරීමේ හැකියාව ඇති ඇදහිලිවන්තයන්ය. "ගෝලයා" යන වචනයේ අර්ථය ඉගෙන ගන්නා තැනැත්තා, ශිෂ්‍යයා හෝ අනුගමනය කිරීමෙන් ඉගෙන ගන්නා තැනැත්තා යනුයි. එය දැනුමට වඩා වැඩි දෙයකි. එය කෙනෙකුගේ ජීවන රටාවට බලපෑම් කරන හා එය වෙනස් කරන ඉගැන්වීමකි.

4. ගෝලත්වය උදෙසාවූ කැඳවීමේ වැදගත් අංග තුනක් නම්, මිළයක් ගෙවීමට තිබීම, නිසි ප්‍රමුඛතාවන් හා නියත ඉලක්කයන්ය.

4. ගෝලත්ව පුහුණුවක වැදගත් ප්‍රතිපත්ති නවය නම් :
   තෝරාගැනීම
   ඇසුරුකිරීම
   කැපවීම

දර්ශනය
උපදෙස් දීම
ආදර්ශයෙන් පෙන්වීම
සහභාගිවීම
අධීක්ෂණය
පවරාදීම

6. ගෝලයෙකු විසින් පහත දේවල් කරනු ලැබේ.
සියල්ල අත්හැර දමයි
තමකම නසයි
යේසුස්වහන්සේව අනුගමනය කරයි
දේව රාජ්‍යයට ප්‍රමුඛතාව දෙයි
දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රදර්ශනය කරයි
වචනය තුළ පවති
කීකරුවේ
සේවකයෙකු වේ
ඵලදැරීම තුළින් දෙවියන්වහන්දේව මහිමයට පත් කරයි.

7. ගෝලත්වය පිළිබඳ සැබෑ පරීක්ෂණය නම් ඔබ ඔබේ ගෝලයන් සමග තවදුරටත් නොසිටින විට කුමක් සිදුවේද යන්නයි. ඔවුන් දිගින් දිගටම විශ්වාසවන්තව සිටිමින් ගුණනය වීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට හැකියාව ඇති අයට ඉගැන්වීමේ නිරත වනවාද?

## එකළොස් වන පරිච්ජේදය

1. **දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ උන්වහන්සේ ව්‍යවස්ථාව රෑ දාවල් මෙනෙහිකරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය. ඔහු දිය ඇළවල් ළඟ හිඳවූ නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය. ඔහු කරන සියල්ල සඵලවෙයි. (ගීතාවලිය 1:1-3)**
2. ස්වභාවික ලෝකය තුළ වර්ධනය ඇනහිට ඇති විට ශරීරය එහි නිසි ප්‍රමාණයට වර්ධනය නොවේ. ආත්මිකව වර්ධනය ඇනහිට ඇති විට, පුද්ගලයන් පරිණත නොවන අතර සභාව වර්ධනය නොවේ.
3. අ. උදාහරණය : වරදට පත්වූ සහෝදරිය මතෙව් 18:15-17 හි ඇති මගපෙන්වීමේ අනුගමනය කළ යුතුය.
ආ. උදාහරණය : සභාව තුළ "යන්න" යන ප්‍රතිපත්තියට වඩා "එන්න" යන ප්‍රතිපත්තිය පැවතිය හැකිය. කප්පාදු කළ යුතු ඵල නොදරන ක්‍රියාකාරකම් පැවතිය හැකිය.
ඇ. උදාහරණය : මෙම සභාව නව ඇදහිලිවන්තයන්ව ගෝලයන් වීමට පුහුණු නොකරනවා විය හැකිය.

## දොළොස්වන පරිච්ජේදය

1. **නුමුත් සමහරු මුරණ්ඩුව, අකීකරුව, සමූහයා ඉදිරියෙහි ඒ ලබ්ධි මාර්ගය ගැන දොස් කී කල්හි ඔහු ඔවුන් ළඟින් අහක්ව, ගෝලයන් වෙන්කරගෙන, තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දවස්පතා තර්ක කරමින් සිටියේය. මෙය දෑවුරුද්දක් කෙරීගෙන ගියේය. මෙසේ ආසියාවේ විසූ සියල්ලෝ වන යුදෙව්වරුද ග්‍රීක්වරුද ස්වාමින්වහන්සේගේ වචනය ඇසූහ. (ක්‍රියා 19:9-10)**

2. පාවුල් පෞද්ගලික අත්දැකීම් තුළින් (ක්‍රියා 19:2-8), ආදර්ශයෙන් (ක්‍රියා 19:11-12) හා පුහුණු කිරීමේ පාසල තුළ (ක්‍රියා 19:9) ඉගැන්වූයේය.
3. පුහුණු මධ්‍යස්ථානය යනු ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා සංස්කෘතිකමය හා භූගෝලිය ලෙස සේවය කිරීමට ගෝලයන් පුහුණු කර වසර දෙකක පාඨමාලාවක් විය.
4. ව්‍යාප්ත වීමේ පුහුණු මධ්‍යස්ථානයක අරමුණ ගෝලයන් පුහුණු කිරීම හා සේවයේ කාර්ය උදෙසා ඔවුන් සන්නද්ධ කිරීමයි.
5. ඔබගේ සාරාංශය දොළොස්වන පරිච්ජේදයේ සාකච්ජාව සමග සසඳන්න.